316 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 316 - இல. 05
Volume 316 - No. 05

2025 ජනවාරි 21වන අඟහරුවාදා
2025 சனவரி 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st January, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 594-635]

**වරප්‍රසාද:**
ඉන්දියාවට සංචාරය කිරීම නැවැත්වීමට ගුවන් තොටුපොළ නිලධාරීන් උත්සාහ කිරීම [තීරුව 635]

**කල් තැබීමේ යෝජනාව:**
ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන [තීරු 640-756]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 757– 820]

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 594-635]

**சிறப்புரிமை:**
இந்தியப் பயணத்தை நிறுத்த விமான நிலைய அதிகாரிகள் முயற்சி [ப: 635]

**ஒத்திவைப்புப் பிரேரணை:**
கிளீன் ஸ்ரீ லங்கா வேலைத்திட்டம் [ப: 640-756]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப:757– 820]

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Cols. 594-635]

PRIVILEGE:
Attempt by Airport Officials to Prevent Travelling to India [Col. 635]

ADJOURNMENT MOTION:
Clean Sri Lanka Programme [Cols. 640-756]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 757– 820]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ජනවාරි 21වන අඟහරුවාදා***
*2025 சனவரி 21, செவ்வாய்க்கிழமை*
*Tuesday, 21st January, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Deputy Speaker, I present the -

(i) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 22 of the Foreign Exchange Act, No. 12 of 2017 and published in Gazette Extraordinary No. 2415/56 of 19th December, 2024;

(ii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 read with Sections 4(1) and 14 of the aforesaid Act and published in Gazette Extraordinary No. 2415/35 of 18th December, 2024; and

(iii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 read with Sections 4(1) and 14 of the aforesaid Act and published in Gazette Extraordinary No. 2416/11 of 24th December, 2024.

I move that the Order and the Regulations be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

Sir, I present the Report on the submission of observations and steps taken in terms of Standing Order 119(4) of Parliament with regard to the matters mentioned on the Ministry of Finance, Planning and Economic Development and the institutes coming under its purview in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Master of Science in Electronics and Communications Engineering Degree awarded by SLT Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2373/36 of 29th February, 2024;
- Orders made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Data Science Degree awarded by Horizon College of Business and Technology (Private) Limited and the Bachelor of Education Honours in Sports and Physical Education Degree awarded by CINEC Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2375/22 of 12th March, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Data Science Degree awarded by KIU Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2379/04 of 08th April, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Degrees awarded by Institute of Chartered Accountants of Sri Lanka (ICASL) and published in Gazette Extraordinary No. 2382/24 of 03rd May, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Master of Education in Educational Management and Leadership Degree awarded by National School of Business Management Limited and published in Gazette Extraordinary No. 2383/28 of 08th May, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Degrees awarded by International College of Business and Technology Limited and published in Gazette Extraordinary No. 2383/45 of 11th May, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Arts Honours in English Studies Degree awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited and published in Gazette Extraordinary No. 2384/28 of 16th May, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Technology in Information Technology and Communication Degree awarded by Sri Lanka International Buddhist Academy (SIBA) and published in Gazette Extraordinary No. 2384/29 of 16th May, 2024;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Laws Honours Degree awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited and published in Gazette Extraordinary No. 2388/12 of 10th June, 2024;

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

- Order made by the then Minister of Education under Section 27(1) (b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Degrees awarded by Sri Lanka International Buddhist Academy (SIBA) and published in Gazette Extraordinary No. 2389/23 of 20th June, 2024;
- Order made by the then Minister of Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Business Management Honours Degree awarded by The British School of Commerce (Private) Limited and published in Gazette Extraordinary No. 2389/24 of 20th June, 2024;
- Order made by the then Minister of Education under Section 27(1) (b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Degrees awarded by National School of Business Management Limited and published in Gazette Extraordinary No. 2392/47 of 11th July, 2024; and
- Order made by the then Minister of Education under Section 27(1) (b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Education Honours in Early Childhood Education Degree awarded by CINEC Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2403/17 of 25th September, 2024. - [The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 160අ, 161ආ, 161ඇ, 161ඈ, 161ඉ, 161ඊ, 161උ, 161එ, 161ඔ සහ 161ඕ වගන්ති සමඟ කියවිය යුතු 204 වගන්තිය යටතේ එවකට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ඔක්තෝබර් 22 දිනැති අංක 2407/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ලංකා රජය සහ IMF අතර ගිවිසුම: විස්තර
### இலங்கை அரசாங்கத்திற்கும் IMFஇற்கும் இடையிலான ஒப்பந்தம்: விபரம்
### AGREEMENT BETWEEN GOVERNMENT OF SRI LANKA AND IMF: DETAILS

134/2024

**1. ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

(ii) එම ගිවිසුමේ ඇති කොන්දේසි හේතුවෙන් ජනතාව විශාල පීඩනයකට ලක් වී තිබෙන බව දන්නේද;

(iii) ඉහත ගිවිසුම සංශෝධනය කර යම් සහනයක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை அரசாங்கத்துக்கும் சர்வதேச நாணய நிதியத்துக்கும் இடையே உடன்படிக்கை கைச்சாத்திடப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அவ்வுடன்படிக்கையிலுள்ள நிபந்தனைகள் காரணமாக மக்கள் பெருமளவில் பாதிக்கப்பட்டுள்ளார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி உடன்படிக்கையைத் திருத்தி ஏதேனும் நிவாரணத்தை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the date on which the Agreement between the Government of Sri Lanka and the International Monetary Fund (IMF) was inked;

(ii) whether he is aware of the immense pressure that has been exerted on the people due to the terms of the Agreement;

(iii) whether the said Agreement will be amended, giving them some relief; and

(iv) if so, the measures that will be taken in that regard?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ මාස 48ක දීර්ඝ වැඩ පිළිවෙළක් අනුමත කරන ලද අතර, ඇමෙරිකානු ඩොලර් 333ක් පමණ වූ එහි පළමු වාරිකය 2023 වසරේ මාර්තු මස 20 වන දින ලබා දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩකටයුතු ආරම්භ කරලා ගිවිසුම් සූදානම් කරලා තිබෙනවා.

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන යටතේ වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඊට හැඩගැසීම සඳහා ජනතාව මත යම් පීඩනයක් එල්ල වී ඇත. බදු ප්‍රතිසංස්කරණ, උපයෝගිතා ගාස්තු වැඩි කිරීම සහ සහනාධාර ඉලක්කගත පිරිසකට පමණක් ලබා දීම මේ අතරින් විශේෂයි. මෙයට හේතු වූයේ 2022 වසරේදී ඇති වූ ආර්ථික අර්බුදය සහ වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වූ ප්‍රතිපත්තිමය වැරදි පියවරයන්ය.

රටේ ආර්ථිකය කඩා වට්ටලා දමා, රටේ ණය තිරසර බව නැති කරලා, රට අතිශය විනාශකාරී තත්ත්වයකට පත් කරලා තිබෙන වෙලාවක රටේ ජනතාව අතිශයින් දුෂ්කරතාවට ලක් වී තිබෙනවාද කියන එක අහන්න දෙයක් නොවෙයි.

නමුත් ඒ වාගේ කාල සීමාවක් තුළ එයින් එළියට ඒම සඳහා, ගොඩ ඒම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් සමඟ තමයි මේ වැඩකටයුත්ත සූදානම් කෙරුණේ. නමුත් එහි තිබුණු අන්තර්ගතයට අනුව ජනතාවට ඊට වඩා වැඩි සහනයක් ලබා දිය යුතුයි කියන පදනමින් එම කොන්දේසිවල තිබෙන රළු බව යම්කිසි මට්ටමකට හෝ සමනයකට පත් කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් වර්තමාන රජය විසින් සූදානම් කර තිබෙනවා.

ඒ අතර දැනට උපයන විට ගෙවීමේ බද්දේ බදු රහිත සීමාව රුපියල් 100,000 සිට රුපියල් 150,000 සීමාව දක්වා වැඩි කරන්නට කටයුතු කර තිබෙනවා.

ඊට අමතරව, දරුවන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා යෝගට් සහ අනෙක් දේශීය නිෂ්පාදන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කර තිබෙනවා. ඊළඟට, පසුගිය රජය IMF සමඟ ගිවිසුම්ගත වී තිබුණේ, අපනයන සේවා සඳහා සියයට 30ක බද්දක් අය කිරීමට. එය සියයට 15 දක්වා අඩු කර තිබෙනවා.

ආර්ථික අපහසුතා ඇති පාසල් යන දරුවන්ට උපකාර කිරීම සඳහා එක් දරුවෙකුට රුපියල් 6,000ක දීමනාවක් ලබා දීමට කටයුතු සූදානම් කර තිබෙනවා. විශාල ප්‍රමාණයකට මේ වෙනකොට එම දීමනාව ලබා දීලා අවසන් කර තිබෙනවා. අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමයේ පද්ධතිය තුළ නැති දරුවන්ටත් ඒ අදාළ දීමනාව ලබා දෙන්නට අවශ්‍ය වැඩකටයුතු සූදානම් කර තිබෙනවා.

ඊළඟට, 2024 ඔක්තෝබර් මාසයේ සිට ඒ දක්වා පැවැති පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කරලා මේ ඔබතුමන්ලා අහන, අපහසුතාවට පත් වෙලා ඉන්න පිරිසට සහන සැලසීම සඳහා වැඩකටයුතු සූදානම් කර තිබෙනවා.

ඊට අමතරව රටේ ධීවර ප්‍රජාවට භූමිතෙල් ලීටරයක් සඳහා සහනාධාරය වශයෙන් රුපියල් 15ක් දින 25ක් සඳහා ලබා දෙන්නට සූදානම් කර තිබෙනවා. ඒ වාගේම බහුදින යාත්‍රා සඳහා ඩීසල් සහනාධාරය රුපියල් ලක්ෂ තුනක් දක්වා ලබා දීලා තිබෙනවා. කඩා වැටුණු ආර්ථිකය තුළ හිතා මතා දුෂ්කරතාවන්ට පත් කරපු ඒ ජනතාවට අවශ්‍ය සහන දෙන්න මේ මුදල් ප්‍රමාණය මදි. නමුත් ආරම්භයක් විධියටයි රජය විසින් මේ වැඩකටයුත්ත ආරම්භ කරලා තිබෙන්නේ.

(iii) මේ අභියෝගවලට මුහුණ දීම සඳහා දැනට කරන ලද සංශෝධනයන් සහ වැඩ කටයුතු තමයි මම ඉහත කාරණාව සම්බන්ධයෙන් පැහැදිලි කළේ. නමුත් ඉදිරි කාල සීමාව තුළදී මේ සඳහා කළ හැකි ගැළපීම්, reviews - සමාලෝචනයන් - කරලා ඒකට සුදුසු වාතාවරණයක් යටතේ තවදුරටත් සහන ලබා දීමට සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට රජය ඇප කැප වී සිටිනවා.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා ]

(iv) දැනටත් පැහැදිලි කළා වාගේ විශේෂයෙන් අවධානයට ලක් විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම කරනවා. ඔබතුමන්ලා දන්නවා, අපහසුතාවට පත් වෙලා සිටින පිරිසට දෙන්න කියලා වෙන් කරපු - allocate කරපු - මුදල පවා පසුගිය රජය තිබෙන අවස්ථාවේදී - පසුගිය කාල සීමාව තුළ - දුන්නේ නැති බව. නව රජය පත් වෙලා ඉතා කෙටි කාලයකින් අපි කාර්යක්ෂමව ඒ මුදල් - disbursements - ලබා දීම කඩිනම් කරලා ඒ අතිදුෂ්කරතාවට පත් වෙලා හිටපු ජනතාවට ඒ සහන ලබා දුන්නා.

අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ආධාර කිරීම ඉලක්කගත ආධාර වැඩසටහනක් හඳුන්වා දීම, රාජ්‍ය මූල්‍ය වගකීම සහ මහජන සුබසාධනය අතර සමතුලිතතාවක් ඇති කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්ති නැවත සලකා බැලීම සහ ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම ද සිදු කර තිබෙනවා.

ඊළඟට, අස්වැසුම ආධාර බෙදා හැරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අස්වැසුම සඳහා සුදුසුකම් ඇති නමුත් තවමත් ප්‍රතිලාභ ලැබී නැති අය ඇතුළත් කර ගැනීම තහවුරු කිරීම සඳහා පද්ධතිය හරහා ලැබෙන තොරතුරු මේ වන විට නැවතත් පරීක්ෂණය ආරම්භ කර තිබෙනවා, තොරතුරු ගොනු කරගෙන තිබෙනවා. විශාල පිරිසක් එහි අභියාචනා, නැත්නම් දුක්ගැනවිලි ඉදිරිපත් කර තිබෙනවා. ඒවා නැවත වතාවක් නිසි ලෙස, නිසි ක්‍රමවේදයකට අනුව සමාලෝචනය කරලා 2024 වසර සඳහා වූ මුදලට වඩා වැඩි ප්‍රමාණයක් 2025 වර්ෂයේදී, ඒ කියන්නේ රුපියල් බිලියන 232.5ක් දක්වා ප්‍රමාණයකට වැඩි කරලා තිබෙනවා.

මේ වාගේ ප්‍රතිසංස්කරණ තුළින් මහ ජනතාවට සිදු වන අනවශ්‍ය දුෂ්කරතා අවම කර ගනිමින් වඩාත් ශක්තිමත්, ඔරොත්තු දෙන ආර්ථිකයක් සඳහා ක්‍රමවේදයක් සූදානම් කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කර තිබෙනවා. විශේෂයෙන්ම ජනතාව අන්ත අසරණභාවයට පත් වෙන ආර්ථික ක්‍රමයක් හදනවා වෙනුවට ජනතාව රැක බලාගෙන, ආර්ථිකයට සහභාගි වෙන අවස්ථා සහිත ආර්ථිකයක් ගොඩනැංවීම තුළින් රටේ ජනතාවට ඇති දුෂ්කරතා අවම කිරීමට වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා.

(ආ) පැන නොනඟී.

මේ පිළිබඳ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය ඇහුවේ මේ රජයේ ඉදිරි අරමුණු සහ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද කියලා අපිට දැනගන්න අවශ්‍ය නිසා.

සිදු වෙච්ච දේවල් අපි දැන් දන්නවා. ඒ සම්බන්ධයෙන් ජනතාව පිළිතුරු දීලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ඉදිරි අරමුණු මොනවාද කියලා දැන ගන්නයි අපි කැමැති. නමුත්, ඔබතුමන්ලා පසුගිය රජයවල වැරැදිම නේ කියන්නේ. මගේ ප්‍රශ්නයේ (ii) කොටස යටතේ අහලා තිබෙන්නේ, "එම ගිවිසුමේ ඇති කොන්දේසි හේතුවෙන් ජනතාව විශාල පීඩනයකට ලක් වී ඇති බව ඔබතුමා දන්නවාද?" කියලායි. ඒකට දීපු උත්තරයෙන්ම කාරණය මොකක්ද කියලා අපට තේරෙනවා. ඒ ගැන ඔබතුමා දන්නවාද, නැද්ද කියලාවත් මට වැටහුණේ නැහැ. ඒ ගැන ඔබතුමා දන්නවා ඇති කියලා මම විශ්වාස කරනවා. ඒ ගැන මතක් කරපු නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. එහෙම නම්, ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අංක 105 පිටුවේ කියා තිබෙන ඔක්කොම අසත්‍යයි නේද? එතකොට, පිළිගන්න වෙනවා නේද ඔබතුමන්ලා මේ රටට අසත්‍ය කිව්වා කියලා? ඔබතුමාට මතක නැත්නම් මම ඒක කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "ණය තිරසර බව පවත්වා ගැනීම හා දරාගත හැකි මට්ටමක ණය පොලී තබා ගැනීම ඉලක්ක කරගනිමින්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම (DSA)"

මේ ඔක්කෝම අසත්‍ය දේවල් කියලා ඔබතුමා පිළිගන්නවා ද? මගේ පළමුවන අතුරු ප්‍රශ්නය එයයි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට මීට කලින් කිහිප වතාවක්ම මේ පාර්ලිමේන්තුවේදීම පිළිතුරු සැපයුවා. මම දන්නේ නැහැ ඒ පිළිතුර දෙන වෙලාවේ ඔබතුමා කොහේද හිටියේ කියලා. නමුත්, නැවත වතාවක් ඒ ප්‍රශ්නයම අහන නිසා මම ඒකට උත්තරය දෙන්නම්. ඒ අවස්ථාවේත් රජය කල්පනා කළා ඒ පාරට පිවිසුණේ ඇයි කියලා. අපි ඒ සම්බන්ධයෙන් බොහොම පැහැදිලි ලෙස කරුණු පැහැදිලි කළා, මේ ගරු පාර්ලිමේන්තුවට. ඒ වැඩකටයුත්ත ඒ විධියට කළේ, කඩා වට්ටලා තිබෙන මේ ආර්ථිකය තුළ අතිශය දුක් විඳින ජනතාවට අවශ්‍ය කරන සහන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා ඉදිරියට යන්නයි.

අපි දන්නවා මේ පාරත් කකුලෙන් අදින්න වැඩ කරලා නැවත වතාවක් ජනතාව වට්ටන්න, පීඩනයට පත් කරන්න ඔබතුමන්ලා කැමැත්තෙන් ඉන්නවා කියලා. නමුත්, ඒ වළේ වැටෙන්න අපි සූදානම් නැහැ. අපි ඇවිල්ලා ඉන්නේ විසඳුම ක්‍රියාත්මක කරන්නයි. ඔබතුමන්ලා හදලා තිබෙන ප්‍රශ්නයෙන්, දශක ගණනක් තිස්සේ බලයේ සිටි ආණ්ඩු එකතු වෙලා වට්ටලා තිබුණු තැනින් මේ රට ගොඩ ගන්නට අවශ්‍ය විසඳුම ක්‍රියාත්මක කිරීමට තමයි ජනතාව තුනෙන් දෙකක වරමක් දීලා මේ වතාවේ මේ පාර්ලිමේන්තුවේ සංයුතිය සකස් කර දී තිබෙන්නේ. ඔය කාරණය සම්බන්ධයෙන් මීට කලින් වාර ගණනාවකදී කරුණු පැහැදිලි කළා. අපේ බලාපොරොත්තුව ඉදිරිය focus කරලා - අවධානය යොමු කරලා - මේ රට වට්ටලා තිබෙන තැනින් ගොඩ අරගෙන බොහොම සාර්ථකව ආර්ථිකය ස්ථායීකරණ මට්ටමකට ගෙන ඒමයි. ඒ සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු අපි සූදානම් කර තිබෙනවා. මෙය තවදුරටත් සවිමත් කරමින් ඉදිරියට යන වැඩ පිළිවෙළ දියත් කරන්නට තමයි මේ වැඩසටහන තනිකරම සූදානම් කර තිබෙන්නේ.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න මතු වන්නේ එතුමා ලබා දෙන මූලික පිළිතුරත් සමඟ. ඇත්තටම මම ලියාගෙන ආපු අතුරු ප්‍රශ්නය නොවෙයි එතුමාගෙන් ඇහුවේ. එතුමා කියපු කථාවට අදාළවයි මා එය ඇහුවේ. අසත්‍ය කිව්වා කියලා එතුමා පිළිගන්නවා කියලා මට හිතෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. උපයන විට ගෙවීමේ බද්ද, - PAYE Tax - ගැන එතුමා ඉතාම සන්තෝෂයෙන් කථා කළා; ඒක අඩු කළා කිව්වා. නමුත්, රඳවා ගැනීමේ බදු වැඩි කළ එක ගැන කථා කරන්නේ නැහැ. මට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒකේ තිබෙන refund system එකේ requirements ටිකක් තිබෙනවා. මම ඔබතුමාට ඒවාත් මතක් කරලා ඉන්නම්. එය මෙසේයි සඳහන්ව තිබෙන්නේ: "The requirements to claim a refund under this mechanism include the following: the applicant must be a resident individual and a Sri Lankan citizen who is 60 years old or above, with an annual income not exceeding Rs. 1.2 million."

Senior citizensලාට මේ සම්බන්ධයෙන් තිබෙන දැනුම ඉතාම අඩුයි; මෙය නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් තිබෙන දැනුම ඉතාම අඩුයි. ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්න වෙනවා. ඒ වාගේම දැනුම තිබෙන senior citizensලා මේ සඳහා apply කළත් මේ වන කොට මෙය හිර වෙලා තිබෙන නිසා ඒ අය සෑහෙන කාලයක් බලාගෙන ඉන්නවා, ඒ refund එක ලබා ගැනීමේ හැකියාවක් නැතිව. මේ සම්බන්ධව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නට අරමුණක් තිබෙනවා ද? එහෙම නම්, කරුණාකර එයට කාල නිර්ණයක් දෙන්න. කිසිම කාල රාමුවක් කියන්නේ නැතිව ඉදිරි ක්‍රියාමාර්ග ගැන කියන්න එපා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

මම හිතනවා, ඒ කරුණු factually incorrect කියලා. ප්‍රශ්නයක් ඉදිරිපත් කරන මුවාවෙන් ඉදිරිපත් කරපු ඒ කරුණු වැරදි සහගතයි. ඒ බද්දට අදාළව සියයට 5 සිට සියයට 10 දක්වා වන වැඩි කිරීම ක්‍රියාත්මක කෙරෙන්නේ එය මේ ගරු පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුවයි. ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. නමුත්, කවුරු හරි කෙනෙකු කරුණු හරිහැටි නොදැන චෝදනාවක් කරනවා නම්, වැඩිපුර කපන නිසා දැනටමත් යම් යම් අය අපහසුතාවට පත් වෙලා සිටිනවා කියලා කියනවා නම්, ඒ පිළිබඳව තොරතුරු ලබා දුන්නොත්, රජයේ නියමයන්ට පටහැනිව, එසේ වැරදි විධියට කටයුතු කරන්නේ කොයි මූල්‍ය ආයතනය ද කියලා සොයා බලන්න අපට පුළුවන්. නමුත්, ඉදිරියේදී ඒකට සුදුසු වැඩ පිළිවෙළක් -අවශ්‍ය පිරිසට අවශ්‍ය සහනය ලබා දීමේ වැඩ පිළිවෙළක්- කරුණු සහිතව ඉදිරිපත් කරනවා.

## කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය: වර්තමාන තත්ත්වය

களுத்துறை மாவட்ட விளையாட்டுக் கட்டிடத்தொகுதி: தற்போதைய நிலை

KALUTARA DISTRICT SPORTS COMPLEX: CURRENT STATUS

148/2024

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ඉදි කර ඇති කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණය ඉදි කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් එම ක්‍රීඩා සංකීර්ණය පරිහානියට පත් වී ඇති බව දන්නේද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණයේ ඇති මීටර් 400 ධාවන පථය නිසි ප්‍රමිතියට සකස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) එම ක්‍රීඩා සංකීර්ණයේ ආරක්ෂිත තාප්පයෙන් පිටත ඇති, එයට අයත් භූමිය රථවාහන නතර කිරීම සඳහා සුදුසු වන පරිදි සකස් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ඇති කර ගෙන ඇති ගිවිසුම පිළිබඳව දන්නේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ ඇති ක්‍රීඩාංගනය, ක්‍රිකට් ක්‍රීඩා කිරීම සඳහා සුදුසු වන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එක්ව සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தின், பண்டாரகமவில் நிர்மாணிக்கப்பட்டுள்ள களுத்துறை மாவட்ட விளையாட்டுக் கட்டிடத்தொகுதி திறந்து வைக்கப்பட்ட திகதி யாது;

(ii) அவ்விளையாட்டுக் கட்டிடத்தொகுதியை நிர்மாணிப்பதற்காக செலவு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவு;

(iii) முறையாகப் பராமரிக்கப்படாமையின் காரணமாக மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதி சேதமடைந்துள்ளது என்பதை அறிவாரா;

(iv) அவ்விளையாட்டுக் கட்டிடத்தொகுதியிலுள்ள 400 மீற்றர் ஓட்டப் பாதையை உரிய தரத்துக்கமைய அமைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(v) அவ்விளையாட்டுக் கட்டிடத்தொகுதியின் பாதுகாப்பு மதிலுக்கு வெளியிலுள்ள, அதற்குரித்தான காணியில் வாகனங்களை நிறுத்துவதற்காகப் பொருத்தமான வகையில் அமைப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அவ்விளையாட்டுக் கட்டிடத்தொகுதி தொடர்பில் இலங்கை 'கிரிக்கெட்' நிறுவனத்துடன் விளையாட்டு அபிவிருத்தித் திணைக்களம் ஏற்படுத்திக்கொண்டுள்ள ஒப்பந்தம் தொடர்பில் அறிவாரா;

(ii) அவ்விளையாட்டுக் கட்டிடத்தொகுதியிலுள்ள விளையாட்டு மைதானத்தை, 'கிரிக்கெட்' விளையாட்டை விளையாடுவதற்கு உகந்ததாக இலங்கை 'கிரிக்கெட்' நிறுவனத்துடன் இணைந்து அபிவிருத்தி செய்வதற்காகச் சமர்ப்பிக்கப்பட்ட முன்மொழிவுகள் நடைமுறைப்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the date on which the Kalutara District Sports Complex constructed in Bandaragama within Kalutara District was declared open;

(ii) the amount that was spent for the construction of the Sports Complex concerned;

(iii) whether he is aware that the condition of the Sports Complex has deteriorated due to poor maintenance;

(iv) the steps that will be taken to improve its 400-metre running track to the proper standard; and

(v) whether steps will be taken to develop the land belonging to the Sports Complex, which is situated outside its security wall, in order to make the land concerned suitable for parking vehicles?

(b) Will he also inform this House -

(i) whether he is aware of the agreement which the Sports Development Department has reached with Sri Lanka Cricket pertaining to the Sports Complex; and

(ii) the reasons for not implementing the proposals made for developing the playground of the Sports Complex in collaboration with Sri Lanka Cricket to make it suitable for playing cricket,?

(c) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2017 ජුනි 29වන දින. පිහිනුම් තටාකය 2018.05.09 වැනි දින විවෘත කර තිබෙනවා.

(ii) වැය කරන ලද මුදල රුපියල් මිලියන 241.314කි.

(iii) පරිහානියට පත් වී නැත. දැනටත් එහි ක්‍රීඩා කටයුතු සිද්ධ වෙනවා. අවබෝධතා ගිවිසුමක් මඟින් බාහිර පාර්ශ්ව සඳහා ක්‍රීඩා සංකීර්ණය පැවරීමට වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. පසුගිය අවුරුද්දේ අලුත්වැඩියා කටයුතු සිදුවෙලා නැහැ. ඉදිරියේදී අලුත්වැඩියා කටයුතු කරන්න මුදල් වෙන්කර තිබෙනවා. දැනට අපි ඒ ගැන සොයා බලමින් පවතිනවා.

වර්තමාන තත්ත්වය ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) මේ ප්‍රශ්නයේම තිබෙනවා නිසි ප්‍රමිතියට හදලා නැහැ කියලා.

කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ස්ථාපිත මීටර් 400 ධාවන පථය සම්බන්ධව ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ තාක්ෂණ නිලධාරි මඟින් වාර්තාවක් ලබා ගැනීමට තීරණය කර තිබෙනවා. එම වාර්තාව පදනම් කරගෙන ක්‍රීඩාංගණයේ ඉදිරි සංවර්ධන කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

(v) ඔව්. ඒ සඳහා පියවර ගන්න පුළුවන්. මොකද, ඒකෙන් එහා පැත්තේ විශාල ඉඩක් නිකම් තිබෙනවා. අපි ඒක බැලුවා. අපි ප්‍රාදේශීය සභාවත් එක්ක කථා කරලා, එතැන රථ වාහන නතර කරන්න සුදුසු තත්ත්වයට සකස් කරන්න පියවර ගන්නවා.

(ආ) (i) කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ගිවිසුමකට එළැඹ නැත.

(ii) එම යෝජනා ක්‍රියාත්මක නොකිරීමට හේතුව මේකයි. අපි බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒක ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරන්න කියලා. නමුත්, තවම ඒ පැවරීම නිසියාකාරව සිද්ධ වෙලා නැහැ. ඒ එකඟතාව ගන්න අපි කටයුතු කරනවා.

ඒ වාගේම, කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ක්‍රීඩා පිටියේ හා එහි අවට කොටස්වල සියලු නඩත්තු කටයුතු සිදු කිරීම කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය තමයි කරන්නේ. ඒ ශ්‍රම දායකත්වය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා භූමි සහායකයන් විසින් ලබා දෙනවා.

(ඇ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය නැඟීමෙන් පසුව, ඔබතුමා කාර්ය මණ්ඩලයත් එක්ක ක්‍රීඩාංගණයට ගිහිල්ලා එම ක්‍රීඩාංගණය පෞද්ගලිකවම පරීක්ෂා කරලා ඒ පිළිබඳව වගකීමෙන් යුතුව සොයා බැලීම ගැන මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එය වගකිව යුතු ඇමතිවරයෙකුගේ වගකිව යුතු ලක්ෂණයක්. මම එය විශේෂයෙන් අගය කරනවා. ඒ වාගේම ඔබතුමා එම ස්ථානයට ගිය නිසා, මම ප්‍රශ්නය නඟනකොට තිබුණු අඩු පාඩු විසඳිලා තිබුණා. ඒ පිළිබඳවත් බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, එහි තවත් ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මම හිතන විධියට ඒවා ඔබතුමාගේ අවධානයට ලක් නොවෙන්න ඇති. මීටර් 400 ධාවන පථයේ සියයට 20ක පමණ ප්‍රමාණයක තණකොළ නැහැ. ඒ වාගේම වතුර බසින්නේ නැහැ. භූගත පද්ධතියේ තණකොළ සහ පස් සිරවීම නිසා වතුර බැසීම අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම පස් දියවී යෑම නිසා මීටර් 400 ධාවන පථයේ ආනතිය වෙනස් වෙලා තිබෙනවා. එහි නිසි ආනතියක් තිබෙන්නට ඕනෑ. එය ඉදිකරලා මේ වෙනකොට අවුරුදු 7ක් ගතවෙලා තිබෙනවා. 2017 වසරේ ඉදිකරපු වෙලාවේ ඒක හොඳට තිබුණා. නමුත්, අවුරුදු 7ක් ගතවීමත් එක්ක පොළොවේ තත්ත්වය වෙනස් වෙලා අද එම ධාවන පථයේ ප්‍රමිතිය වෙනස්වෙලා තිබෙනවා. මේ වන විට අවුරුද්දකට දසදහස් ගණනක පිරිසක් එම ක්‍රීඩාංගණය පාවිච්චි කරනවා. ලංකාවේ තිබෙන දිස්ත්‍රික් ක්‍රීඩාංගණවලින් වැඩියෙන්ම භාවිත වන ක්‍රීඩා සංකීර්ණය ඒක. එම නිසා එහි අඩු පාඩු නිවැරදි විය යුතුයි. මම

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේවා ඔබතුමාගේ අවධානයටයි සඳහන් කරන්නේ. ඒ වාගේම එහි පිහිනුම් තටාකය නිසි පරිදි නඩත්තු වෙන්නේ නැහැ. නඩත්තු නොවීම නිසා එහි ප්‍රමිතිය ගැන ගැටලුවක් තිබෙනවා. ඒත් එක්කම ක්‍රීඩාංගණය තුළ ක්‍රීඩකයින්ට ඇඳුම් මාරු කර ගැනීම සඳහා changing room එකකුත් නැහැ.

ඒ වාගේම පළාත් සභාවේ නිලධාරිනුත් එම ස්ථානයේ ස්ථානගත වෙලා ඉන්නවා. නමුත් පළාත් සභාවට අයිති ක්‍රීඩා භාණ්ඩ තබා ගැනීමට නිශ්චිත ස්ථානයක් නැහැ. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවත්, පළාත් සභා නිලධාරිනුත් අතර යම් පරස්පරතාවක් ඇතිවෙලා තිබෙනවා. ඒ අය සුහදව කටයුතු කළ යුතුයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සවස් වරුවේ එහි ගිය නිසා ක්‍රීඩාගාරයේ වහලය ඔබතුමාගේ නිරීක්ෂණයට හසු වෙන්න නැතුව ඇති. එහි වැහි පීලි දිරා යෑමක් සිද්ධවෙලා තිබෙනවා. මේ කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please pose your Supplementary Questions clearly.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
විනාශ කර තිබෙන සියල්ල ගැනම අපි අවධානය යොමු කරමින් ඒවා යථා තත්ත්වයට පත් කරන්න වැඩ කටයුතු කරමින් සිටිනවා. ඒක අපේ වගකීම. එම ධාවන පථයත් විනාශ වෙමින් තිබෙන්නේ. ඒ ධාවන පථය විතරක් නොවෙයි, තවත් බොහෝ තැන්වල තත්ත්වයත් එහෙමයි. ඒ සඳහා අපි කටයුතු කරමින් යනවා. මේ අවුරුද්දේ අය වැයෙන් ක්‍රීඩා සංවර්ධන කටයුතු වෙනුවෙනුත් අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අනෙක් ක්‍රීඩා සංකීර්ණවල නැති මෙහි තිබෙන විශේෂත්වය තමයි, එහි ක්‍රිකට් ක්‍රීඩා කිරීමට හැකි වීම. ඇත්තටම ක්‍රිකට් ක්‍රීඩාව සඳහා අදාළ වන එක් boundary එකක්, ඒ කියන්නේ ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ නැඟෙනහිර පැත්තේ තිබෙන boundary එක පටුයි. එම boundary එකේ තිබිය යුතු සම්මත දුර නැති නිසා පළමු පෙළ ක්‍රිකට් තරග පවත්වන්න බැහැ. පළමු පෙළ පාසල් තරග පවත්වනවා. නමුත්, පළමු පෙළ club cricket ගහන්න බැහැ. ඒ සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් එක්ක සාකච්ඡාවක් පවත්වලා තිබුණා, ඒ අයගේ වියදමින් කරන්න. මම කරුණු දන්නා නිසා ඔබතුමාට පහසු වීම පිණිසයි කියන්නේ. ක්‍රීඩාංගණයේ නැඟෙනහිර පැත්තේ තිබෙන ක්‍රීඩාගාරය වෙනස් කරලා, ඒ කියන්නේ ටිකක් පිටුපසට අරගෙන ගිහිල්ලා ඉතිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කරන මුදල් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලබා දෙන්න ඔවුන් වසර කිහිපයකට කලින් එකඟ වුණා. මම මේ ප්‍රශ්නය යොමු කළාට පසුවත් සොයා බැලුවා, එම එකඟතාව තවමත් තිබෙනවාද කියලා. ඔවුන් කියා සිටියා, තවමත් ඔවුන්ගේ එකඟතාව තිබෙනවා කියලා. මොකද, එහෙම වුණොත් එම ස්ථානයේ පළමු පෙළ ක්‍රිකට් තරග පවත්වන්න පුළුවන්. එය කොළඹට ආසන්නයේ තිබෙන වැදගත් ස්ථානයක්. එම නිසා පළමු පෙළ ක්‍රිකට් සඳහා සුදුසු පරිදි එම ක්‍රීඩාංගණය දියුණු කරන්න පුළුවන්. ඔබතුමා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කැඳවලා ඔවුන්ගේ අරමුදල් සහ සහාය ලබාගෙන එම ක්‍රීඩාංගණය දියුණු කිරීමට කටයුතු කරනවාද?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
අපි ඒ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කරනවා. මොකද, අපි දැනට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එක්ක එවැනි සාකච්ඡාවකට ගිහිල්ලා නැහැ. එවැනි අවස්ථාවක් තිබෙනවාද කියලා අපි බලන්නම්. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ සාකච්ඡා කළත්, නොකළත් එම ක්‍රීඩාංගණයේ සංවර්ධන කටයුතු අපේ අමාත්‍යාංශය මැදිහත් වෙලා කරනවා.

## රජය සතු සමාගම්, සංස්ථා සහ වාණිජ ආයතන: ලාභ, අලාභ සහ ආයෝජන

அரசாங்கத்துக்குச் சொந்தமான கம்பனிகள், கூட்டுத்தாபனங்கள் மற்றும் வர்த்தக நிறுவனங்கள்: இலாபம், நட்டம் மற்றும் முதலீடு

GOVERNMENT-OWNED COMPANIES, CORPORATIONS AND COMMERCIAL ESTABLISHMENTS: PROFIT, LOSS AND INVESTMENTS

175/2024

**3. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන රජය සතු සමාගම්, සංස්ථා සහ අනෙකුත් වාණිජ ආයතන සංඛ්‍යාව;

(ii) පසුගිය වසර 15 තුළ මෙම ආයතන විසින් ජනනය කරන ලද මුළු ලාභය/අලාභය සහ ආයෝජන මත ප්‍රතිලාභය;

(iii) මෙම ආයතනවල වාණිජ මෙහෙයුම් ආරම්භයේ සිට මේ දක්වා සමුච්චිත හෝ ඒක රාශි වූ ලාභ/ අලාභ;

(iv) කෙටි කාලීන සහ දිගු කාලීන පදනමින් මෙම ආයතනවල ආයෝජනය කර ඇති ප්‍රාග්ධනයේ සහ ණයවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது தொழிற்படுகின்ற அரசாங்கத்துக்குச் சொந்தமான கம்பனிகள், கூட்டுத்தாபனங்கள் மற்றும் ஏனைய வர்த்தக நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) கடந்த 15 வருடங்களில் இந்த நிறுவனங்களினால் உருவாக்கப்பட்ட மொத்த இலாபம்/நட்டம் மற்றும் முதலீட்டின் மீதான வருமானம் யாதென்பதையும்;

[ගරු රවි කරුණානායක මහතා]

(iii) இந்த நிறுவனங்கள் அவற்றின் வர்த்தக நடவடிக்கைகளை ஆரம்பித்தது முதல் இற்றைவரையில் அடைந்த, மொத்தத் திரட்டிய அல்லது சேர்ந்த இலாபம்/நட்டம் யாதென்பதையும்;

(iv) குறுகிய கால மற்றும் நீண்ட கால அடிப்படையில் இந்நிறுவனங்களில் முதலீடு செய்யப்பட்ட மூலதனம் மற்றும் கடன்களின் பெறுமதி யாதென்பதையும்?

அவர் இச்சபைக்கு வெவ்வேறாக அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House, separately -

(i) the Government-owned companies, corporations and other commercial establishments functioning in Sri Lanka as at today;

(ii) the total profit/loss and return of investment (ROI) earned by them for the last 15 years;

(iii) the total cumulative or accumulated profit/ loss of the above institutions from the day it started commercial operations till today; and

(iv) the value of the capital and loans invested in these institution on short-term basis and long-term basis?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන රජය සතු සමාගම්, සංස්ථා සහ අනෙකුත් වාණිජ ආයතන සංඛ්‍යාව 90කි. ඒවායින් ආයතන 52ක් උපාය මාර්ගිකව අතිශය වැදගත් වේ.

(ii) පසුගිය වසර 15 තුළ එම ආයතන විසින් ජනනය කරන ලද මුළු ලාභය/අලාභය සහ ආයෝජන මත ප්‍රතිලාභය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි. අවුරුදු 15ක් තිස්සේ එම ආයතන අවභාවිත කළ ආකාරය, අකාර්යක්ෂම අයුරින් කටයුතු කළ ආකාරය සහ ඒවායින් ලැබුණු ප්‍රතිඵල විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම විස්තර ඇමුණුම 01 ලෙස දක්වා තිබෙනවා.

(iii) මෙම ආයතනවල වාණිජ මෙහෙයුම් ආරම්භයේ සිට මේ දක්වා සමුච්චිත හෝ ඒක රාශි වූ ලාභ/ අලාභ ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඒකටත් ඒ වාගේමයි. ඒ කාලයටත් වඩා ආරම්භ කළ අවස්ථාවේ සිට තිබෙන විස්තර අහලා තිබෙනවා.

(iv) කෙටි කාලීන හා දිගු කාලීන පදනමින් මෙම ආයතනවල ආයෝජනය කර ඇති ප්‍රාග්ධනයේ සහ ණයවල වටිනාකම ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

ඇමුණුම් 1, 2 සහ 3 **සභාගත*** කරමි.

(ආ) පහත සඳහන් ආයතනවල මූල්‍ය ප්‍රකාශන පහත හේතූන් මත සකස් කර නොමැත.

| අංකය | ආයතනය | හේතුව |
|---|---|---|
| 01 | සීමාසහිත රාජ්‍ය පොහොර සමාගම | 2024 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ඒකාබද්ධ සමාගමකි. |
| 02 | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | අවසන් මූල්‍ය වාර්තා සකස් කර නොමැත. |
| 03 | සහස්‍යා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | මේ දක්වා මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැත. |
| 04 | ලංකා ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දත්ත නොමැත. |
| 05 | එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | ක්‍රියාකාරී නොවන ආයතනයකි. |
| 06 | හෙලිටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | මෙම සමාගම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වත්කම් සහ සේවකයින් යොදා ගන්නා බැවින් මෙම ගිණුමේ තොරතුරු ආයතනයේ මෙහෙයුම් නියමාකාරයෙන් පිළිබිඹු නොවේ. |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙවැනි ප්‍රශ්න ඉදිරිපත් කරලා උත්තරයක් ලබා ගන්නේ ඒකෙන් අතුරු ප්‍රශ්න අහන්නයි. දැන් මේ පිළිතුරට අදාළ ලේඛන සභාගත කළාම ඒ ලේඛනවල අන්තර්ගතය අපි දන්නේ නැහැ. අඩු ගණනේ මීට පෙර හෝ ඔබතුමා අපට පිළිතුර එව්වා නම් හොඳයි. නැත්නම් ප්‍රශ්න ඇසීම සීමා වෙනවා. ඔබතුමා කියන දේ ගැන විතරයි අපට ප්‍රශ්න අහන්න ලැබෙන්නේ.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

පසුගිය කාල සීමාව තුළ අදාළ අමාත්‍යාංශවල, රජයට සම්බන්ධ ආයතනවල ව්‍යුහයට සම්බන්ධ වෙලා හිටපු මැති ඇමතිවරු අක්‍රමික ලෙස ආයතන පරිපාලනය කරපු හැටි අපට පෙනෙනවා. වසරින් වසර, එකින් එක විස්තර කියන්න ගියොත්, ආයතන 90ක වසර 15ක් පිළිබඳ විස්තර තමයි මේ උත්තරවල සඳහන් වෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

2024 වසරේ විස්තර,-

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ආයතන 90ක් තිබෙනවා. ඔබතුමාට මොන ආයතනය ගැන ද කියන්න ඕනෑ? නැත්නම් ආයතන 90 ගැනම කියන්න ඕනෑද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රීලන්කන් ආයතනය, RDA එක සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගැන කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමාට මම සඳහන් කළා වාගේ මේ ලැයිස්තුවේ ආයතන 90ක් ගැන විස්තර තිබෙනවා. එක එක ඇමුණුම යටතේ දීලා තිබෙන list එක ගත්තොත්, ඒක පිටු 10ක විතර report එකක්. එහි හුඟක් විස්තර තිබෙන නිසා ඒ ආයතන ටික හොයන්න ගියොත් ටිකක් වෙලා යයි. එම නිසා කාල වේලාව ගැන හිතලා ගරු මන්ත්‍රීතුමාට මම යෝජනා කරනවා, කරුණාකර මේක go thorough කරලා තවත් විස්තරයක් අවශ්‍ය නම් සඳහන් කරන්න කියලා. මම ඒකට අවශ්‍ය පිළිතුර ලබා දෙන්නම්. මොකද, එතැන කියවන්න තිබෙන විස්තර ප්‍රමාණය වැඩියි. පිටු 10ක report එකක ආයතන 90ක් අතරින් ඔය කියන ආයතන පිළිබඳව හොයන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, shall we proceed with the first Supplementary Question, please? You may pose your first Supplementary Question.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I think the Hon. Leader of the House mentioned about ensuring that information is provided.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

Up to the year 2023, I have the details. මම කියවාගෙන යන්නම්, විස්තර ලැයිස්තුව. I am referring to the Profit After Tax.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, I would like to have information about the SriLankan Airlines, the National Water Supply and Drainage Board and the Ceylon Electricity Board. I need a brief clarification. You may table it and send me a copy. Then, I think we can interact with a more vibrant discussion**.**

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

My suggestion, Hon. Member, is also to do it that way. But, since you are asking for information, I am trying to locate those particular entities in this list of 90 entities. Let me see whether I can locate those entities. Since you are insisting, I am going through this list of 90 entities.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, once the Questions for Oral Answers are over, I will ask the Supplementary Questions.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Then, can we proceed to Question No. 4, please?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, since the Hon. Deputy Minister has already tabled the Answer, before the tenth Question is asked, I will ask the Supplementary Questions.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

මම නියෝජ්‍ය ඇමතිතුමාට උදව් කරන්නම්. Hon. Suriyapperuma, the SriLankan Airlines is in row No. 28.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

With regard to the SriLankan Airlines, in the year 2022, a loss of Rs. 73.264 billion was reported and in the year 2023, a profit of Rs. 3.8 billion was reported.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, just before the last Question is asked, I will pose my Supplementary Questions. I think it will make things easier and will also save time. Also the Leader of the House might -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may pose your Supplementary Question. - *[Interruption.]*

The Hon. Leader of the House.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අයිතිවාසිකම රැකෙන්නත් අවශ්‍යයි. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා අපට පාර්ලිමේන්තුවේ පැයක කාලයක් තමයි වෙන් කර තිබෙන්නේ. ඒ නිසා අපි ගරු නියෝජ්‍ය ඇමතිතුමාට උදවු කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විස්තර අහන ආයතන මොනවාද? අපි ඒ ප්‍රශ්නවලට දැන් උත්තර දෙන්නම්. නැත්නම් ඕක වෙන practice එකක් වෙන්න පුළුවන්. හැම වෙලාවේම අනෙක් මන්ත්‍රීවරුනුත් ඔය අවස්ථාව entertain කරන්න පුළුවන්. ඒ ගැනත් අපි බලන්න ඕනෑ නේ. ඔබතුමා Sri Lankan Airlines එක ගැන කිව්වා. ඔබතුමාට Ceylon Petroleum Corporation එක ගැනත් දැනගන්න ඕනෑද? The information regarding the Ceylon Petroleum Corporation is given in the 26th row of the list. එතුමා අහන අවුරුද්ද ගත්තොත්, fourth page එකේ විස්තරය බැලුවා නම් හරි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
The Ceylon Petroleum Corporation, in the year 2022, has recorded a loss of Rs. 617 billion and in the year 2023, has made Rs. 120 billion Profit After Tax. Perhaps, I could read the whole list to make it easier.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Finally, giving information regarding the Ceylon Electricity Board would be sufficient.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
In the year 2022, the Ceylon Electricity Board had recorded a loss of Rs. 298 billion, whereas in the year 2023, it had recorded a profit of Rs. 61.235 billion. Do you want to know about any other entities, Hon. Member?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, that is sufficient. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. ඔය ආයතන 90හි සම්පූර්ණ අලාභය 2022දී මම හිතන විධියට රුපියල් බිලියන 820යි -කෝටි 8,200යි. ඊට සාපේක්ෂව 2023දී ලාභය රුපියල් බිලියන 784යි -කෝටි 7,840යි. දැන් ඔබතුමා ලබා දුන් පිළිතුරෙන් ආයතන 3ක විස්තර අපි දැනගත්තා. 2022දී මේ ආයතන තුනෙන් රුපියල් ට්‍රිලියනයක අලාභයක් තිබුණත්, 2023 වර්ෂය වෙනකොට රුපියල් බිලියන 200ක -කෝටි 2,000ක- ලාභයක් ලබන ආයතන බවට ඒවා පත්ව තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ පසුගිය පාලනය තුළ මූල්‍ය විනයක් නොතිබුණු නිසාද, නැත්නම් රජය අසාධාරණ ලාභයක් ඇති කරපු නිසාද? අසාධාරණ ලාභයක් ඇති කරලා තිබෙනවා නම්, රුපියල් 160කින් තෙල් මිල අඩු කරනවා කියපු පොරොන්දුව ඉටු කරන්නේ කවදාද කියන එක පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
මේ ආයතනවල බොහොම අදූරදර්ශී කළමනාකරණයක් තිබුණු නිසා තමයි එවැනි අලාභයක් ලබන තත්ත්වයට පත් වෙලා තිබුණේ. නමුත්, ඒවායේ pricing තීරණය කිරීමේදී cost recovery method එකකට යෑමේ අවශ්‍යතාව තිබෙනවා. Cost එක කිව්වාම නිෂ්පාදන පිරිවැය තිබෙන්න පුළුවන්. ඒක බලන්නට ඕනෑ. ඊළඟට, අතීතයේ තිබුණු financial cost එක බලපාන්න පුළුවන්. ඒ වාගේ සියලු කරුණු පදනම් කරගෙන තමයි මිල තීරණය කළ යුත්තේ. ජනතාව පිට බර පැටවෙන එම රාජ්‍ය ආයතන නිසි ලෙස කළමනාකරණය කළ යුතුයි. එම නිසා මෙම cost recovery basis එක අනුව ජනතාව වෙත බර පටවනවා වෙනුවට, සහන දෙන්න පුළුවන් ලෙස උපරිම මට්ටමට මිල තීරණය වන ආකාරයට තමයි මේවායේ මිල කටයුතු ඉදිරියට තීරණය කරන්නට සූදානම් කර තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may pose the second Supplementary Question, please.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the answer to the first Supplementary Question is evasive. But, let me get to the second Supplementary Question.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් වැනි ආයතන අදූරදර්ශීව පාලනය වීම නිසා අලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබුණු බව ඔබතුමා කිව්වා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඔබතුමන්ලා අත්සන් කර තිබෙන ගිවිසුම අනුව අලාභ ලබන රාජ්‍ය ආයතන වාණිජකරණය හෝ පෞද්ගලීකරණය කරනවාද? එහෙම නැත්නම් ඒ ඇති වන අලාභය ඔබතුමන්ලා දරාගෙන එම ආයතන ඉදිරියට ගෙනියනවාද? කරුණාකරලා අතීතයට බණින්නේ නැතුව ඔබතුමන්ලාගේ ආණ්ඩුව අනාගතයේ මොනවාද කරන්නේ කියලා කිව්වොත් වඩා ලෙහෙසියි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු මන්ත්‍රීතුමනි, අතීතය පදනම් කරගෙන තමයි අනාගතය බිහි වෙන්නේ. හැබැයි, ඔබතුමන්ලා කැමැති ඇති, අතීතය අමතක කර දමා අනාගතය පිළිබඳව බලනවා නම්. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයට පමණක් aircraft තුනක් ගෙනැල්ලා පාවිච්චියට නොගෙන hangersවල park කරලා අවුරුදු ගණනක් තිබුණා. ඒවායේ lease එක වෙනුවෙන් විතරක් මාසයකට ඩොලර් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ගෙවා තිබෙනවා. ඇයි මෙලෙස තියාගෙන ඉන්නේ කියා අහන්න කිසි කෙනෙක් උත්සාහ කළේ නැහැ. මොන ඩීල් නිසාද කවුරුත් ඒවා දිහා බැලුවේ නැත්තේ? රටේ ජනතාව තමයි ඒවායේ බර ගෙව්වේ. ඔබතුමන්ලාගේ සංස්කෘතිය තුළ තිබුණේ ආයතන පාඩු ලබන මට්ටමට තල්ලු කර දමා එම ආයතන විකුණා දැමීම. අපේ ප්‍රතිපත්තිය ඒක නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒවාට අද වෙනත් alternatives තිබෙනවා. අකාර්යක්ෂම කළමනාකරණය වෙනුවට මේවා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරන්නේ කොහොමද කියලා බලන්න අධ්‍යක්ෂ මණ්ඩල පත් කරලා, ඒ සඳහා අවශ්‍ය වැඩකටයුතු සූදානම් කරන්න

දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී පෞද්ගලික ආයෝජන කැඳවනවාද, Public-private partnerships හරහා ද එම ආයතන ක්‍රියාත්මක කළ යුත්තේ කියන මූලික අධ්‍යයනවලින් පසුව රජය දැනුවත් කරන ලෙස අදාළ අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කරලා තිබෙනවා. ඒ කටයුත්ත බොහොම සාර්ථකව මේ වනවිට සිදු වනවා. ඉදිරියේදී එම ආයතනවලින් ලැබෙන මූල්‍ය ප්‍රකාශනවලින් අපට ඒවායේ ප්‍රතිඵල බලන්නට පුළුවන්.

## රජයේ රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන්: නව "END POST" තනතුරු

அரச வைத்தியசாலைகளில் விசேட வைத்திய நிபுணர்கள்: "END POST" எனும் புதிய பதவிகள்

SPECIALIST DOCTORS AT GOVERNMENT HOSPITALS: NEW "END POST" POSITIONS

240/2024

**4. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට රජයේ ඇතැම් ප්‍රධාන රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් සඳහා "End Post" නමින් නව තනතුරු නිර්මාණය කර ඇති බව දන්නේද;

(ii) එම තනතුරු නිර්මාණය කිරීම සිදු කරනු ලබන විද්‍යාත්මක පදනම කවරේද;

(iii) නොඑසේ නම්, සමහර නිලධාරීන්ගේ අභිමතය පරිදි අභිමත අවස්ථාවලදී පමණක් එම තනතුරු නිර්මාණය කරන්නේද;

(iv) ඒ සඳහා විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ පුද්ගල අභිමතයන්ට අනුව හැසිරවිය නොහැකි ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் சில பிரதான அரச வைத்தியசாலைகளில் விசேட வைத்திய நிபுணர்களுக்காக "End Post" எனும் பெயரில் புதிய பதவிகள் உருவாக்கப்பட்டுள்ளதை அறிவாரா;

(ii) அப்பதவிகள் உருவாக்கப்படுவதன் விஞ்ஞான ரீதியான அடிப்படை யாது;

(iii) இன்றேல், சில உத்தியோகத்தர்களின் விருப் பத்துக்கமைய விரும்பிய சந்தர்ப்பங்களில் மாத்திரம் மேற்படி பதவிகள் உருவாக்கப் படுகின்றனவா;

(iv) அதற்காக முறையான, வெளிப்படைத் தன்மை மிக்க மற்றும் தனிநபர் விருப்பங்களுக்கமைய கையாள முடியாத முறைமையொன்றை உருவாக்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா;

(v) ஆமெனில், அக்காலப்பகுதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Media:

(a) Will he inform this House -

(i) whether he is aware that a new post styled "End Post" has been created for specialist doctors at certain major government hospitals;

(ii) the scientific basis for creating the post concerned;

(iii) or else, whether those are created only as and when so desired by some officers;

(iv) whether he will take steps to formulate for it a formal and transparent methodology which cannot be manipulated according to personal desires; and

(v) if so, the timeframe for formulating such a methodology?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayathissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අංක 1176/15 - 2001.03.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව රජයේ ශික්ෂණ රෝහල්වල සේවා අවශ්‍යතාව මත 'END POST' තනතුරු නිර්මාණය කර ඇත.

(ii) 1. වෛද්‍ය විද්‍යා හා තාක්ෂණයේ දියුණුවත් සමඟ රටේ වෛද්‍ය සේවාවේ දියුණුවක් ඇති කිරීමට හා විශිෂ්ටත්වයෙන් යුතු වෛද්‍ය මධ්‍යස්ථාන බිහි කිරීම.

2. රෝහල්වල ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හා සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.

3. විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් එක් වෛද්‍යවරයෙකුට සිටින රෝගීන් ප්‍රමාණය අඩු වීම මඟින් වඩා සුරක්ෂිත සේවාවක් ලබා දීම.

4. උපාධි සහ පශ්චාත් උපාධි සිසුන්හට ගුණාත්මක පුහුණුවක් ලබා දීම.

5. විශේෂඥ වෛද්‍යවරුන්ගේ බුද්ධි ගලනය අවම කිරීම.

(iii) නැත.

(iv) මේ සඳහා දැනටමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවතින අතර, ඒ අනුව කටයුතු කරනු ලැබේ.

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළ පිළිතුර සම්බන්ධව තව පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. විශේෂයෙන්ම විදේශගත පුහුණුවෙන් පසුව ලංකාවට එන ඒ විශේෂඥ වෛද්‍ය කණ්ඩායම් ස්ථානගත කිරීමේ ක්‍රියාවලියක් තිබෙනවා. නමුත් පසුගිය කාලය පුරාම ඔවුන් නැවත මේ රට අත්හැර යන තැනට තමයි ඒ ස්ථානගත කිරීම් ක්‍රියාවලිය පවා සකස් වෙලා තිබුණේ. මේ ස්ථානගත කිරීමේ තිබෙන දුර්වලතා නිසා වාගේම ඔවුන්ට ඒ අවශ්‍ය පහසුකම් නොලැබීම නිසාත් කියන මේ කාරණා සියල්ල පදනම් කරගෙන ඔවුන් බොහෝ පිරිසක් පසුගිය කාලය පුරා නැවත රට හැර ගිහිල්ලා තිබෙනවා. මෙන්න මේ තත්ත්වය සමහර විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවලට සෘජුව බලපාමින් තිබෙනවා. උදාහරණයක් විධියට, උගුර, කන, නාසය ආශ්‍රිත රෝග පිළිබඳ ක්ෂේත්‍රයක් සම්බන්ධව ගත්තොත්, ඒ සම්බන්ධව සිටින විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණය, ඒ වාගේම රට හැර ගිහිල්ලා සිටින ප්‍රමාණය, ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පැමිණීමට නියමිත විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රමාණය වාගේ දේවල් ගැන අදහසක් මේ වෙනකොට අරගෙන ඒ කණ්ඩායම ස්ථානගත කිරීමේදී මතු වෙන ගැටලු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ මැදිහත්වීම ගැන අදහසක් බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය ගත්තොත්, ඇත්තටම මම ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් සඳහන් කළා. අපට මේ End Post තනතුරු යම්කිසි ආකාරයක විද්‍යාත්මක පදනමකින් රටේ අවශ්‍යතාව මත නිර්මාණය කරගත යුතු වන්නේම ඔබතුමා කියපු ප්‍රශ්නයට එක උත්තරයක් හැටියටයි. ඒ කියන්නේ සමහර ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥ පුහුණුව ලබාගෙන එන වෛද්‍යවරුන්ගේ සේවාව ගත්තොත්, ඒ රෝගීන්ටත්, අපේ වෛද්‍යවරුන්ටත්, වෛද්‍ය ශිෂ්‍යයන්ගේ අනාගත පුහුණුව සඳහා ඒ සේවය ලබා ගන්නත් එවැනි තනතුරු නිර්මාණය කර ගත යුතු වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය මේ වන විට මේක යම්කිසි ආකාරයකට විධිමත් කර ගැනීම සඳහා වූ කාරණා ගැන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය එක්කත්, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඇතුළු වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් සංගම් එක්කත් සාකච්ඡා කරමින් සිටිනවා. ඔබතුමා ඒ ගැන දන්නවා. ඒ නිසා අපේ බලාපොරොත්තුව වන්නේ, විශේෂයෙන් ශික්ෂණ රෝහල් පදනම් කර ගත් මේ ක්‍රියාවලිය යම් විධිමත් කිරීමකට ලක් කරලා, දැනට විශේෂඥ වෛද්‍යවරුන් නොමැති තැන්වලට මේ අය යවා ගැනීම සඳහා වුණු ක්‍රමවේදයක් සකස් කිරීමයි.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. සෞඛ්‍ය අමාත්‍යාංශය ඊයේ දවසේ විශේෂයෙන්ම පිළිකා රෝගීන් සම්බන්ධව දැවැන්ත ක්‍රියාවලියකට අත ගැහුවා. ඒක තමයි linear accelerator, එහෙම නැත්නම් පිළිකා සෛල විනාශ කිරීම සඳහා අවශ්‍ය උපකරණ පද්ධතිය රෝහල් ගණනාවක ස්ථාපිත කරන්න අවශ්‍ය පදනම ඊයේ දවසේ සකස් කර ගත්තා කියන කාරණය. මේ project එකෙන් කොපමණ රෝහල් ප්‍රමාණයක් ආවරණය වෙනවාද? ඒ වාගේම කොපමණ කාලයක් තුළ මෙහි ප්‍රතිඵල මහ ජනතාවට භුක්ති විඳිය හැකි ලෙස සකස් කර ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නයත් මා අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, පිළිකාව කියන්නේ අපේ රටේ බරපතළ සෞඛ්‍ය ප්‍රශ්නයක් බව. විශේෂයෙන්ම අපේ රටේ වාර්තා වන කාන්තා මරණ වැඩිම ප්‍රමාණයකට හේතු වන්නේ මේ පිළිකා රෝගී තත්ත්වයයි. අපි මධ්‍යස්ථානයක්, දෙකක් පිළිකා රෝග සඳහා ප්‍රතිකාර කිරීම වෙනුවෙන් පවත්වාගෙන යැමෙන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මොකද, පිළිකාවක් හැදුණාම ඒ රෝගියා පමණක් නොවෙයි, ඒ පවුලේ සියලුදෙනාටමත් ඒ තුළින් දැඩි ආර්ථික, සමාජයීය බලපෑමක් ඇති කරනවා. ඒ නිසාම තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2013දී මේ පිළිකා ප්‍රතිකාර ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා යම් ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබුණේ. මේක phases දෙකකින් යුක්ත ඩොලර් මිලියන 29ක ව්‍යාපෘතියක්. එතකොට Cobalt-60 machines replace කරලා linear accelerator machines ගේන්න තමයි මේ ව්‍යාපෘතිය සකස් කරලා තිබුණේ. නමුත් ඒ Phase I එකෙත් සැලකිය යුතු මට්ටමක ප්‍රමාදයක් සිද්ධ වෙලා තිබෙනවා. යාපනය, මඩකලපුව, ගාල්ල, නුවර සහ අපේක්ෂා රෝහලට මේ machines ලබා දීලා තිබුණා. හැබැයි, එසේ ලබා දෙනකොටත් සිදු වෙච්ච සමහර ප්‍රමාදයන් නිසා මේ සම්බන්ධ ප්‍රතිකාර තාක්ෂණය වේගයෙන් දියුණු වෙලායි තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආවාට පසුව Phase II එක කඩිනම් කරන්න කටයුතු කර තිබෙනවා.

ඒ අනුව, හම්බන්තොට, රත්නපුර, අනුරාධපුරය, කුරුණෑගල සහ බදුල්ල කියන රෝහල්වල මේ Phase II එක ක්‍රියාත්මක වනවා. අපි බලාපොරොත්තු වෙනවා, මාස 8ක කාලයක් ඇතුළතදී මේ සියලු machines replace කරලා මේ ප්‍රතිකාර ක්‍රමය ලබා දෙන්න. ඇත්තටම මේකේ ප්‍රමාදය නිසා අනුරාධපුර සහ බදුල්ලේ රෝගීන්ට මාස කිහිපයකට මේ දුෂ්කරතාවට මුහුණ දෙන්නත් සිද්ධ වෙනවා. අපට මේ ප්‍රතිකාර ක්‍රමය වැඩිදියුණු කිරීම machine එක ඉවත් කරනකොටම කරන්න පුළුවන්කම ලැබුණා නම් ඒ රෝගීන්ට ඒ දුෂ්කරතාව විඳින්න සිද්ධ වෙන්නේ නැහැ. නමුත්, ඒක අවම කර ගනිමින් දැනට මේ පහසුකම තිබෙන අපේක්ෂා රෝහලට මේ රෝගීන් යොමු කරමින් ඉතිරි phase එක ක්‍රියාත්මක කරන්න තමයි බලාපොරොත්තු වන්නේ. ඒකට අදාළ ගිවිසුම ඊයේ දිනයේ අත්සන් කළා.

## කොළොන්නාව ප්‍රා.ලේ. කොට්ඨාසය: නාගරික සංවර්ධන සැලැස්ම
## கொலன்னாவை பிரதேச செயலாளர் பிரிவு: நகர அபிவிருத்தித் திட்டம்
## KOLONNAWA DS DIVISION: URBAN DEVELOPMENT PLAN

244/2024

**5. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා නාගරික සංවර්ධන සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) එම සැලසුම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொலன்னாவை பிரதேச செயலாளர் பிரிவுக்காக நகர அபிவிருத்தித் திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்திட்டம் யாதென்பதையும்;

(iii) அத்திட்டத்தை செயற்படுத்துவதற்கு எதிர்பார்க் கப்படும் காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether an urban development plan has been formulated for the Kolonnawa Divisional Secretary's Division;

(ii) if so, what that plan is; and

(iii) the timeframe according to which the plan concerned is expected to be implemented?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කොට්කාවත්ත ප්‍රාදේශීය සභාව සහ කොළොන්නාව නගර සභාව යන පළාත් පාලන ආයතන දෙක ක්‍රියාත්මක වේ.

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙනුවෙන් 2023-2033 කාල සීමාව සඳහා සංවර්ධන සැලැස්ම සකසා අවසන් බවත්, එය අවසන් අදියරේ තිබෙන බවත්, එය ගැසට් කිරීමට නියමිත බවත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා සිටී. කෙසේ වුවත්, ගැසට් කිරීමට කලින් ඒ පිළිබඳ නැවත review එකක් කරලා ඉක්මනින්ම ගැසට් කරන්න කටයුතු කරන බව දන්වා සිටී.

කොළොන්නාව නගර සභා බලප්‍රදේශය සඳහා (2013-2025) සංවර්ධන සැලසුම් කෙටුම්පත මඟින් හා ඉන්ධන ගබඩා ආරක්ෂිත කලාපය සඳහා අංක 1435/24 දරන ගැසට් පත්‍රය මඟින් දක්වා ඇති නියාමන භාවිත කරන අතර, කොළොන්නාව නගර සභා සීමාව සඳහා 2024-2034 කාල සීමාව වෙනුවෙන් නව සංවර්ධන සැලැස්මක් කෙටුම්පත් කරමින් සිටින බවත්, එය 2025 වසර තුළ ගැසට් කිරීමට යෝජිත බවත්, ආරක්ෂිත කලාපය සඳහා ද නියාමනයන් යාවත්කාලීන කිරීම් සම්බන්ධ කෙටුම්පත් සකස් කරමින් පවතින බවත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් තවදුරටත් දන්වා සිටී.

(ii) සාමාන්‍යයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රදේශයකට සැලසුමක් සකස් කරනකොට ඒ ප්‍රදේශය තුළ නේවාසික සීමා ප්‍රදේශ මොනවාද, කර්මාන්ත සඳහා වෙන් කළ යුතු ප්‍රදේශ මොනවාද, මිශ්‍ර සංවර්ධනය සඳහා වෙන් විය යුතු ප්‍රදේශ මොනවාද, මංමාවත් සහ විනෝදාත්මක කරුණු සඳහා වෙන් විය යුතු ප්‍රදේශ මොනවාද කියන කරුණු ඇතුළත් සැලසුමක් තමයි සකස් කරන්නේ. ඒ අනුව කොට්කාවත්ත ප්‍රදේශීය සභා සංවර්ධන සැලැස්ම (2023-2033 කාලය සඳහා) ගැසට් කිරීමට නියමිතව තිබෙනවා. කොලොන්නාව නගර සභා සංවර්ධන සැලැස්ම (2024 - 2034) සකස් කරමින් පවතිනවා.

(iii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මෙතැන එක ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයක තමයි පළාත් පාලන ආයතන දෙකක් තිබෙන්නේ. ඉතින්, - අතුරු ප්‍රශ්නයකට වඩා මම මේ ඔබතුමාට යෝජනාවක් කරන්නේ - එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් නිසා මේක කොටස් දෙකකට කඩන්නේ නැතිව එක සැලසුමකට ගියා නම් මීට වඩා ප්‍රතිඵලදායකයි කියලා මට හිතෙනවා. ඔබතුමා පළමුවැනි ප්‍රශ්නයට දීපු උත්තරයට අනුව 2013 කාලයේ හදපු සැලැස්මට මහජනතාවගේත්, ස්වාමීන් වහන්සේලාගේත්, ඒ ප්‍රදේශවාසීන්ගේත් විරෝධතාවක් එල්ල වුණා. ඊට පසුව තමයි මේක දෙකට කඩලා හදන්න යන්නේ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හැටියට අරගෙන ඒ සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඉෂ්ට කරන්න කියලා. ඒ වාගේම oil refinery එක ආවාම තවදුරටත් කොළොන්නාව තෙල් සංස්ථා භූමිය වාණිජ භූමියක් විධියට එතැනම පවත්වා ගෙන යා යුතුද, නැද්ද කියන එකත් එහිදී reconsider කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමා, මේ පළාත් පාලන ආයතන ප්‍රදේශ දෙක එකම සීමාවක සංවර්ධන සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීමේදී මහජනතාවගෙන්, විශේෂයෙන් ස්වාමීන් වහන්සේලා ඇතුළු කණ්ඩායමකින් විරෝධතාවක් ආවා කියන එක තමයි ඔබතුමාගේ පැහැදිලි කිරීම තුළ තිබුණේ. ඔබතුමා යෝජනා කළ පරිදි, මේ පළාත් පාලන ආයතන දෙක එකතු කරලා පොදු සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කරන්න කලින් ඒ සම්බන්ධයෙන් මහජනතාවගේ අදහස් අරගෙන ඒවාත් සැලකිල්ලට ගෙන ඔබතුමාගේ යෝජනා දෙක සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු ඇමතිතුමනි, මම ඉදිරිපත් කරන මේ අතුරු ප්‍රශ්නයට ඔබතුමාගේ අවධානය යොමු කර ඉක්මනට තීන්දුවක් ගන්න කියලා මුලින්ම මා ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, කොළඹ නගරයේ නිවාස සංකීර්ණ රාශියක් තිබෙනවා. ඒ කාලයේ එම නිවාස සංකීර්ණ හදනකොට, විශේෂයෙන් වාතාශ්‍රය ලැබීම සඳහා හුහක් ඉඩකඩම් හිස්ව තබා, ගස් එහෙම වැවෙන්න තබා තමයි ඒවා හදා තිබෙන්නේ. ඒ වාගේම ඒ නිවාස සංකීර්ණවල ඉන්නා අයට වාහන ගාල් කරන්න රථගාල් හදා තිබෙනවා. මාළිගාවත්ත නිවාස සංකීර්ණය ගත්තාම, ඊට අදාළව රථගාල් තුනක් විතර තිබෙනවා. ඒවා තිබෙන්නේ එම නිවාස සංකීර්ණයේ ඉන්නා උදවියට ඔවුන්ගේ වාහන park කරන්න. විශේෂයෙන් මාළිගාවත්ත, රම්‍යා පෙදෙසේ විශාල රථගාලක් තිබෙනවා. පසුගිය 2020-2024 කාලය තුළදී එවකට හිටපු ඇමතිතුමා හෝ ඒ හිටපු නිලධාරින් එම රථගාල පෞද්ගලික කෙනෙකුට බදු දීලා තිබෙනවා. එය බදු ගත් පුද්ගලයා එහි ලොකු warehouse එකක් හදනවා. ගෙවල් එක්දහස් ගණනක් පමණ තිබෙන එම නිවාස සංකීර්ණයේ රථගාල අවට තව මහල් නිවාස සංකීර්ණ 4ක්, 5ක් විතර තිබෙනවා. ඒ මැද අර පුද්ගලයා warehouse එකක් හදා පාවිච්චි කරන්න හදනවා.

ගරු ඇමතිතුමනි, ඒක වැරදියි. මොකද, මම කරුණු සොයා ගත් විධියට පසුගිය 2020-2024 කාලය තුළ තමයි එය පෞද්ගලික ආයතනයට හෝ යම් පුද්ගලයෙකුට බදු දී තිබෙන්නේ. ඊට එහා අරලිය උයන කියලා ground එකක් තිබෙනවා. එම ground එක එම නිවාස සංකීර්ණයේ ඉන්නා ළමයින් හවසට සෙල්ලම් කරන තැනක්. ඒකත් බදු දෙන්න යනවා කියලා දැනට පොඩි ආරංචියක්, කථාවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, එම නිවාසවල සිටින අයට පාවිච්චි කරන්න තිබෙන ඒ රථගාල් ටික ආරක්ෂා කර ඒ ජනතාවට නැවත ලබා දීම සඳහා වහාම මැදිහත් වෙන්න කියලා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ මූලික ප්‍රශ්නය යොමු වුණේ කොළොන්නාව නගර සංවර්ධන සැලැස්ම සම්බන්ධයෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරන කරුණු කොළොන්නාව නගර සංවර්ධන සැලැස්මට අදාළ නොවුණත්, ඒ මතු කළ කරුණු සම්බන්ධව පොදු මහජනතාවට තිබෙන වැදගත්කම සලකා බලා, ඒ පිළිබඳව සොයා බලන්නම්. පොදු මහජනතාවගේ කිසියම් කටයුත්තක් සඳහා වෙන් කළ ප්‍රදේශයක් වෙනත් කාර්යයක් සඳහා භාවිත කරන්න අපි ආණ්ඩුවක් හැටියට කිසි සේත්ම අවසර දෙන්නේ නැහැ. එසේ භාවිත කිරීමට බලාපොරොත්තු වෙන්නේත් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -253/2024- (1), ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න කරුණු විශාල ප්‍රමාණයක් එකතු කරගන්න අවශ්‍ය නිසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් සතියක කාලයක් ඉල්ලා තිබෙනවා. එම නිසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි තත්ත්වයක් තුළ පැන නැඟුණු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. නියෝජ්‍ය ඇමතිතුමා මා අහපු ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා සිටීම මම පිළිගන්නවා. නමුත්, මම මේ වෙලාවේ අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් විමසනවා. පසුගිය කාල සීමාවේදී ඇති වුණු අයහපත් කාලගුණ තත්ත්වයත් එක්ක විශේෂයෙන් අම්පාර වාගේ ප්‍රදේශවල ගොවීන්ට බලපෑම් ඇති වුණා. අම්පාර සේනානායක සමුද්‍රය වාන් දැමුවා. ඒ වාන් දැමීම නිසා ගොවීන්ගේ කුඹුරුවලට හානි වී ඇති බව වාර්තා වෙනවා. ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය මොකක්ද සහ ඒ සම්බන්ධ දැනුවත් ද කියන දේ මට විමසන්න තිබෙනවා.

ඒකත් එක්කම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක මම අහපු ප්‍රශ්නයට අදාළ නැහැ. නමුත් මම ඒ ප්‍රශ්නය යොමු කරපු හේතුව මෙයයි. අපි දන්නවා, වගා කරන ඉඩම් තිබෙන බව. රජයේ ඉඩම්වල, LRC ඉඩම්වල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම්වල පාරම්පරිකව කාලයක් තිස්සේ වගා කරන ගොවියෝ ඉන්නවා. ඒ අය මේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න රට වෙනුවෙන් වැඩක් කරනවා. නමුත් ඒ ගොඩාක් තැන්වල විශේෂයෙන් මා නියෝජනය කරන හපුතලේ ආසනයේ, හල්දමුල්ල කලාපයේ නැවිආර, උණකන්ද, අලුත්වෙල, උස්ඇල්ල වාගේ ප්‍රදේශවල ඒ අදාළ ගොවීන්ට බලපත්‍ර මොකුත් නැහැ. ඒ නිසා පොහොර සහනාධාර, වගා ණය, වගා වන්දි වාගේ දේවල්වලදී එය බලපානවා. මගේ ප්‍රශ්නය මෙයයි. ඒ තත්ත්වයන් රජය අවබෝධ කරගෙන, පාරම්පරිකව වගා කරපු ඒ ගොවීන් සඳහා යම් සහනයක් දෙන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ඒ වාගේම ජාවාරම්කාරයන් විසින් පාවිච්චි කරපු ඉඩම් තිබෙනවා. LRC ඉඩම්, අක්කර 20, 40, 50, 100 වාගේ වගා කරන්නේ නැති, දේශපාලන හිතවත්කම් මත ලබා දුන් ඉඩම් තිබෙනවා. ඒවා සම්බන්ධව විමර්ශනයක් තිබෙනවාද? ඒවා සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සම්බන්ධයෙන් විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය යොමු කරන්නේ. පසුගිය කාලයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ලබා දීමේදී සහ ඒවා භාවිත කිරීමේදී ඇති වී තිබෙන ගැටලු සම්බන්ධව පරීක්ෂා කරන්න, කැබිනට් මණ්ඩල තීරණයක් අනුව තීන්දුවක් අරගෙන තිබෙනවා.

ඒ අනුව අපි කමිටුවක් පත් කරලා තිබෙනවා, 2015 සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබා දුන්නු ඉඩම් සම්බන්ධව පරීක්ෂා කරලා වාර්තාවක් ලබා දෙන්න කියලා. මාස 3ක් ඇතුළත ඒ පරීක්ෂණය අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වනතෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉඩම් ලබා දීම තාවකාලිකව නවත්වා තිබෙනවා. ඒ පරීක්ෂණය මාස 3ක් යන්නට කලින් අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම තමයි ඒ ඉඩම් සම්බන්ධ බලපත්‍ර හෝ වෙනත් කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන්න වෙන්නේ. ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කරන, ව්‍යාපෘති යෝජනා දෙන පාර්ශ්වයන්ට යම් අපහසුතාවක් සිද්ධ වෙනවා කියලා අපි දන්නවා. නමුත්, මේ සිදු වී තිබේ යැයි කියන කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. ඒ නිසා තමයි මේ කාලය ගනිමින් තිබෙන්නේ. ඒ සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා; ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමා කාලීන ප්‍රශ්නයක් යැයි කියමින් විශේෂ කාරණයක් ඉදිරිපත් කළා. මේ දවස්වල පවතින වර්ෂාපතනයත් එක්ක අපේ රටේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති වැව් බොහොමයක් වාන් දමමින් තිබෙනවා; රට පුරා ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ ගල්ඔය ආශ්‍රිතව ඉවුරු කැඩී යෑමේ තත්ත්වයක් නිසා කුඹුරු අක්කර විශාල ප්‍රමාණයක් යට වෙලා තිබෙනවා. අද වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කළාම දැන ගන්නට ලැබුණා, වර්ෂාවේ යම් අඩුවක් තිබෙනවා කියලා. ඒ වාගේම, අම්පාර දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 3,000කට ආසන්න ප්‍රමාණයක් ජලයෙන් යට වෙලා තිබෙනවා; ආපදාවට ලක් වෙලා තිබෙනවා. මේ වන විට වතුර බැස යෑමේ අඩුවක් තිබෙනවා කියලා වාර්තා කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ සම්බන්ධයෙන් වැඩිමනත් විධියට වාරිමාර්ග දෙපාර්තමේන්තුව හැටියට මැදිහත් වෙලා කරුණු සොයා බලන්න සහ අදාළ ක්‍රියාමාර්ග ගන්න. ඒ වාගේම, අම්පාර දිස්ත්‍රික්කයේ ඇති වෙලා තිබෙන මේ තත්ත්වය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම මොනවාද සිද්ධ වෙන්නේ කියන එක සම්බන්ධයෙන් කරුණු අවශ්‍ය නම්, අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විධියට කටයුතු කරන අපේ වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර ඉදිරිපත් කරාවි.

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා, විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ ගල්ඔය ගහ දෙපස ගොවි ජනතාවට. මෙය අම්පාර දිස්ත්‍රික්කයට බලපෑ ඇති විශේෂ තත්ත්වයක් නිසා මෙම තත්ත්වය ගැන පැහැදිලි කරන්න මට විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩී.එස්. සේනානායක සමුද්‍රය අක්කර අඩි 770,000ක ධාරිතාවකින් යුක්තයි. මේ වන කොට සේනානායක සමුද්‍රය අක්කර අඩි 730,000ක් ජලයෙන් පිරී තිබෙනවා. උස මට්ටම ගත්තොත්, උස අඩි 110යි. එයින් අඩි 108.3ක් මේ වන විට පිරිලා තිබෙනවා. නමුත්, පවතින රෙගුලාසිවලට අනුව උස මට්ටම අඩි 104 ඉක්මවපු ගමන් වාන් දොරටු අරින්න ඕනෑ. මේ වන කොට අඟල් 15 ගණනේ වාන් දොරටු 5ක් විවෘත කරලා තිබෙනවා. ඒ හරහා තත්පරයට ඝන අඩි 1,176ක ජල ධාරිතාවක් ගල්ඔය ගහට මුදා හරිනවා. ඊට අමතරව නාමල් ඔය වාන් දැමීමත්, අනෙකුත් ජලාශවලින් වතුර එකතු වීමත් නිසා තත්පරයට ඝන අඩි 3,000ක ජල ප්‍රමාණයක් ගල්ඔය ගහට මුදා හරිනවා. ගල්ඔය ගහ මුහුදට වැටෙන ස්ථානය දක්වා කිලෝමීටර 50ක් පමණ දිගකින් යුක්ත වෙනවා. ගල්ඔය ගහ කිලෝමීටර 30කට ආසන්න වන විට නෙයිනකාඩු ප්‍රදේශයේදී එහි වැව් බැම්ම බිඳී යෑම නිසා ඒ ප්‍රදේශය ජලයෙන් යට වෙලා කුඹුරු අක්කර 3,000ක් පමණ -පූදින ගොයම වාගේම කිරට නැමුණු ගොයම- යට වෙලා තිබෙනවා. හැබැයි, මේ මොහොත වන කොට ජලය බැස යෑම නිසා කුඹුරු අක්කර 1,000ක් පමණ ආරක්ෂා වෙලා තිබෙනවා. කාලගුණ තත්ත්වය අනුව අපේ ඉංජිනේරු මහත්වරුන් කියන විධියට අපි විශ්වාස කරනවා, ඉදිරි කාලය තුළ තවත් කුඹුරු අක්කර 1,000ක් විතර බේරා ගන්න අපට පුළුවන් වෙයි කියලා. කොහොම වුණත් කුඹුරු අක්කර 1,000කට වැඩි ප්‍රමාණයක් හානියට ලක් වෙලා තිබෙනවා. මේකට විශේෂ හේතු කිහිපයක්ම බලපා තිබෙනවා. ඇත්තටම අවුරුදු ගණනක් තිස්සේ ගල්ඔය ගහෙහි ඉවුරු දෙපැත්ත සංරක්ෂණය කිරීමක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා දුර්වල තැන්වලින් කඩාගෙන බිඳගෙන යන අවස්ථා නිරන්තරයෙන් ඇති වෙනවා. මේ තත්ත්වයෙන් හෝ එය බේරාගෙන තිබෙන්නේ දිසාපතිතුමාත්, වාරිමාර්ග ඉංජිනේරුවරුත්, ත්‍රිවිධ හමුදාව සහ පොලීසියත් මැදිහත් වෙලා, වැලි කොට්ට ගහලා එම ඉවුරුවල දුර්වල තැන් ආරක්ෂා කර ගනිමින් තිබෙන නිසායි.

මේ වන විටත් ඒ සියලුදෙනා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒ වාගේම, ඒ ප්‍රදේශයට අදාළ මාවඩිපල්ලිය පාර, කිට්ටන්ගේ නාවිදන්වෙලි පාර, ආලයඩිවෙම්බු පාර, සාගම පාර, කල්මුණේ උතුර වැනි පාරවල් විශාල ප්‍රමාණයක් කැඩිලා බිඳිලා ගිහිල්ලා තිබෙනවා. ඒවා වහලා දාලා තිබෙනවා, මේ වන කොට. ඒ වාගේම, පසුගිය කාලයේ පැවති වර්ෂාව නිසා ඒ ප්‍රදේශවල වාරිමාර්ග පද්ධතියට, ඒ වැව් බැම්වලට විශාල හානි සිද්ධ වුණා. අපි ඒ සියල්ල නිරීක්ෂණය කළා. ඒ වෙනුවෙන් තාවකාලිකව කරන්න පුළුවන් දේවලුත් පසුගිය කාලයේ කළා. දැන් ඒවාට අදාළ ඇස්තමේන්තු සකස් කරමින් ස්ථිර විසඳුම් ලබා දෙන්නත් කටයුතු කරනවා.

ඒ වාගේම, අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ විශේෂ කමිටුවක් පත් කළා, දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කරන්න සැලැස්මක් හදමු කියලා. ඒ කමිටුව දැන් ක්‍රියාත්මකයි. ඒ වාගේම, ගල්ඔය ගහ සංරක්ෂණය කරන්නත් අදාළ කමිටුවක් පිහිටෙව්වා. ඒ කමිටුවත් දැන් ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේදී මේ තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය කිරීම සඳහා අපි ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඉතිහාසයේ එවැනි කළමනාකරණයකට ලක් නොවෙච්ච නිසා සිද්ධ වෙච්ච දේවල් විධියට තමයි අප මේ ප්‍රශ්න දකින්නේ. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 7 - 259/2024 - (1), the Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගේ සංචාර පිළිබඳවයි. මාස 24ට එතුමා සංචාර 25ක් විතර ගිහිල්ලා තිබෙනවා. සංචාරයෙන් සංචාරය ගැන බලලා ගිය වියදම් ගණනය කරන්න ඕනෑ. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අංක SC FR 55/2019 දරන නඩුවේ පෙත්සම්කරුවන්: විස්තර
## வழக்கு எண் SC FR 55/2019இன் மனுதாரர்கள்: விபரம்
## PETITIONERS OF CASE NO. SC FR 55/2019: DETAILS

316/2024

**8.** **ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පෙත්සම්කාර මුතුතන්ත්‍රිගේ නිලංක දිල්ශාන් කුරේ සහ තවත් පෙත්සම්කරුවන් හතර දෙනෙකු විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ අංක SC FR 55/2019 සහ 2019 පෙබරවාරි 13 දිනැති නඩුව එකී පාර්ශ්වකරුවන් ඉදිරියේ සමථයකට පත් වී ඇති බව දන්නේද;

(ii) එකී සමථය ප්‍රකාරව, 1 වැනි පෙත්සම්කරු ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලාව හැදෑරීම සඳහා 2019 වර්ෂයේ දී ඇතුළත් කර ගෙන තිබේද;

(iii) අංක 2 සිට 5 දක්වා වූ පෙත්සම්කරුවන් ඔවුන්ගේ විභාග කටයුතු පවත්වා අවසන් කර තිබේද;

(iv) ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් මේ වන විට පියවර ගෙන තිබේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மனுதாரர் திரு. முதுதந்திரிகே நிலங்க தில்சான் குறே மற்றும் இதர நான்கு மனுதாரர்களால் சுகாதார அமைச்சுக்கு எதிராக உயர் நீதிமன்றத்தில் தாக்கல் செய்யப்பட்ட SC FR 55/2019ஆம் இலக்கமுடைய 2019 பெப்ருவரி மாதம் 13ஆம் திகதிய வழக்கு சம்பந்தப்பட்ட தரப்பினர்களின் முன்னிலையில் மத்தியஸ்தம் செய்யப்பட்டுள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி மத்தியஸ்தத்தின்படி, 01ஆம் மனுதாரர் ஆயுர்வேத கல்விசார் கற்கைநெறியைத் தொடர்வதற்கு 2019ஆம் ஆண்டில் அனுமதிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(iii) இலக்கம் 2 தொடக்கம் 5 வரையான மனுதாரர்கள் தங்களது பரீட்சைகளை முடித்துள்ளனரா என்பதையும்;

(iv) ஆயுர்வேத கல்விசார் கற்கைநெறியை ஆரம்பிப்பதற்கு ஆயுர்வேத திணைக்களத்தால் இன்றளவில் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House whether -

(i) he is aware that the case No. SC FR 55/2019 dated 13th February, 2019 filed before the Supreme Court by Petitioner Muthuthanthrige Nilanka Dilshan Cooray and four other Petitioners against the Ministry of Health has been settled before the said parties;

(ii) the 1st Petitioner was admitted to study the Ayurveda Shastri course in the year 2019, as per the settlement concerned;

(iii) Petitioners number 2 to 5 have completed their examinations; and

(iv) steps have been taken by the Department of Ayurveda to commence the Ayurveda Shastri course as of now?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 1 වන පෙත්සම්කරු විසින් ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලාව සම්බන්ධයෙන් අයදුම්පතක් මෙතෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැත.

(iii) <u>2 වන පෙත්සම්කරු</u>

ගම්ලත්ගේ චන්දන කුමාර දැරණියගල - ප්‍රාරම්භක පරීක්ෂණය සමත්ව ඇති අතර 2024 වර්ෂයේ මධ්‍යම පරීක්ෂණයට පෙනී සිට අසමත්ව ඇත.

3 වන පෙත්සම්කරු

වෙලපහල ආරච්චිගේ බුද්ධික එරංග පෙරේරා - ප්‍රාරම්භක පරීක්ෂණය සමත්ව ඇති අතර 2021 වර්ෂයේ මධ්‍යම පරීක්ෂණයට පෙනී සිට අසමත්ව ඇත.

4 වන පෙත්සම්කරු

දසනායක මුදියන්සේලාගේ ධනුර්දා විෂ්මි දසනායක - ප්‍රාරම්භක හා මධ්‍යම පරීක්ෂණ සමත්ව 2021 වර්ෂයේදී අවසාන පරීක්ෂණය ද සමත්ව විභාගය සම්පූර්ණ කර ඇත.

5 වන පෙත්සම්කරු

සඳලි හංසනී වික්‍රමාරච්චි - ප්‍රාරම්භක පරීක්ෂණය සමත්ව ඇත. 2022 වර්ෂයේ මධ්‍යම පරීක්ෂණය සඳහා අයදුම් කර පැමිණ නොමැත.

(iv) ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලා පැවැත්වීම ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකරන අතර, ඊට අදාළ පරීක්ෂණ පැවැත්වීම පමණක් සිදු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ නඩුව සමථයකට පත් වෙලා තිබෙනවා. හැබැයි, බඳවා ගැනීම් නතර වෙලා. අදාළ බඳවා ගැනීම් සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු මන්ත්‍රීතුමා, අපි ඒ සම්බන්ධයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. මම ඊළඟ වාරයේදී දැනුම් දෙන්නම් මේ පිළිබඳ අවසාන උත්තරය මොකක්ද කියන එක.

## 2016.01.01 සිට 2019.12.31 දක්වා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප: සංශෝධන අත්හිටුවීම

### 2016.01.01 முதல் 2019.12.31 வரை ஓய்வுபெற்றோரினது ஓய்வூதியம்: திருத்தங்கள் இடைநிறுத்தம்

PENSION OF RETIREES BETWEEN 01.01.2016 TO 31.12.2019: SUSPENSION OF REVISIONS

318/2024

**9. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රා.ප.ච. 03/2016හි වැටුප් පරිමාණයන් 2020.01.01 සිට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමත් සමඟම 2016.01.01 සිට 2019.12.31 දක්වා වූ කාලය තුළ විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප ඒ අනුව සංශෝධනය කරන ලද බවත්;

(ii) 2019.11.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රා.ප.ච. 35/2019 නිකුත් කර ඇති බවත්;

(iii) එය තාවකාලිකව අත්හිටුවීමට 2020.01.02 අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත්;

(iv) ඒ හේතුවෙන්, 2016.01.01 සිට 2019.12.31 දක්වා විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන්ට 2020.01.01 සිට ලැබිය යුතුව තිබූ විශ්‍රාම වැටුප අහිමි වීමෙන් අගතියට පත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) 2020.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර 2019.11.11 දිනැති තීරණය බලාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) 2020.01.01 සිට ලැබිය යුතු විශ්‍රාම වැටුප 2025 වර්ෂයේ සිට ගෙවීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා 2025 වර්ෂයේදී වෙන් කළ යුතු මුදල කොපමණද;

(iv) ඉහත (අ) (iv) අනුව අගතියට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් මිය ගොස් ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொ. நி. சு. 03/2016இன் சம்பள அளவுத்திட்டம் 2020.01.01ஆம் திகதி தொடக்கம் முழுமையாக அமுல்படுத்தப்பட்டதைத் தொடர்ந்து 2016.01.01ஆம் திகதி தொடக்கம் 2019.12.31ஆம் திகதி வரையான காலப்பகுதியில் ஓய்வுபெற்றோரினது ஓய்வூதியமானது அதற்கேற்ப திருத்தப்பட்டது என்பதையும்;

(ii) 2019.11.11ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின் பிரகாரம் 35/2019ஆம் இலக்க பொ. நி. சு. வெளியிடப்பட்டது என்பதையும்;

(iii) 2020.01.02ஆம் திகதி அதனைத் தற்காலிகமாக இடைநிறுத்துவதற்கான அமைச்சரவைத் தீர்மானம் மேற்கொள்ளப்பட்டது என்பதையும்;

(iv) இதன் காரணமாக 2016.01.01ஆம் திகதி தொடக்கம் 2019.12.31ஆம் திகதி வரை ஓய்வெடுக்கச் செய்யப்பட்ட ஓய்வூதியதாரர்களுக்கு 2020.01.01ஆம் திகதி தொடக்கம் கிடைக்கவேண்டிய ஓய்வூதியம் கிடைக்காததால் அவர்கள் பாதிக்கப்பட்டுள்ளனர் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) 2020.01.02 ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தை இரத்துச்செய்து 2019.11.11ஆம் திகதிய தீர்மானத்தை பயனுறுத்த நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) 2020.01.01 ஆம் திகதி தொடக்கம் கிடைக்கவேண்டிய ஓய்வூதியத்தை 2025ஆம் ஆண்டிலிருந்து செலுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அதற்காக 2025ஆம் ஆண்டில் ஒதுக்கப்படவேண்டிய நிதி எவ்வளவு என்பதையும்;

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

(iv) மேற்படி (அ) (iv)இன் பிரகாரம் பாதிக்கப்பட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) அவர்களில் மரணமடைந்துள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he accept that -

(i) the pension of the pensioners who had retired from 01.01.2016 to 31.12.2019 was revised along with the operation of the salary scales specified in Public Administration Circular No. 03/2016 in full from 01.01.2020, accordingly;

(ii) Public Administration Circular No. 35/2019 had been issued as per the decision of the Cabinet of Ministers dated 11.11.2019;

(iii) the Cabinet of Ministers decided to suspend it temporarily on 02.01.2020; and

(iv) because of that, the pensioners who had retired from 01.01.2016 to 31.12.2019 are aggrieved on account of losing the pension they should have received from 01.01.2020?

(b) Will he state -

(i) whether steps will be taken to enforce the decision of the Cabinet of Ministers dated 11.11.2019 by cancelling the decision dated 02.01.2020;

(ii) whether steps will be taken to pay the pension receivable from 01.01.2020 starting in 2025;

(iii) if so, the sum of money which should be allocated for that in 2025;

(iv) the number of aggrieved persons as per (a) (iv) above; and

(v) the number of deceased persons, out of that above number?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ (අ) හි (i), (ii), (iii), (iv) කොටස් එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා ඊට අදාළව මම පිළිතුරක් ඉදිරිපත් කරනවා.

(අ) (i) (ii) (iii) (iv)

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට අදාළව සිදු කරන ලද වැටුප් සංශෝධනයට සමගාමීව 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ද අදියර 5ක් ඔස්සේ සංශෝධනය කිරීමට තීරණය වී ඇත. ඒ සඳහා 2017.02.08 දිනැතිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(II) නිකුත් කර ඇත. එසේ වුවත් 2017.02.28 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් අනුව ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(II) හි විධිවිධාන අත්හිටුවීමට කටයුතු කර ඇත.
- ඉන් පසුව 2019.05.31 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 මඟින් 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු රාජ්‍ය නිලධරයන්ගේ විශ්‍රාම වැටුප 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි සඳහන් 2017.01.01 දිනට හිමි විය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීමට රජය තීරණය කර ඇත. ඒ අනුව, 2016.01.01 දිනට පෙර හා 2016.01.01 දින සිට 2017.01.01 දින දක්වා විශ්‍රාම ගනු ලැබූ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016හි විධිවිධාන අනුව 2017.01.01 දිනට හිමි වැටුප් පරිමාණය මත පදනම්ව මේ වන විට සංශෝධනය කර ඇත.
- 2019.11.11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දුන් අනුමැතිය අනුව 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි උපලේඛන I අනුව 2020.01.01 දිනට හිමි වන සම්පූර්ණ වැටුප පදනම් කර ගනිමින් විශ්‍රාම වැටුප ගණනය කර එදින සිට ගෙවීම සඳහා 2019.12.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 35/2019 නිකුත් කර ඇත. එසේ වුවත්, සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉදිරි අය වැයවලදී විසඳෙන තෙක් අංක 35/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමට 2020.01.02 දින රැස්වූ එවකට පැවති අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර, ඒ අනුව 2020.01.20 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 35/2019(I) නිකුත් කර ඇත.
- ඉහත කරුණු අනුව 2016.01.01 දිනෙන් පසුව 2019.12.31 දක්වා විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි විධිවිධාන අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමට තීරණය වූ අදියර පහෙන් අදියර දෙකක් ඔස්සේ විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම මේ වන විට සිදු කර ඇති බවත්, ඉතිරි අදියර තුන යටතේ විශ්‍රාම වැටුප් සංශෝධන සිදු කිරීමට පවතින බවත් සඳහන් කරමි.

(ආ) (i) මේ පිළිබඳව සලකා බැලීමට තීරණය කර ඇත.

(ii) මෙම කාරණය සම්බන්ධයෙන් මේ වන විට අංක 386/2021 (F/R) යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතින අතර, එම

කාරණයද ඇතුළත්ව මේ පිළිබඳ සියලු කරුණු සලකා බැලීමෙන් පසුව එම තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ගෙවීම් කටයුතු පිළිබඳව තීරණයක් ගැනීම එම අවස්ථාවේදී සිදු කළ යුතුය.

(iii) • රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016හි විධිවිධාන අනුව පළමු අදියර හා දෙවන අදියර යටතේ සිදු කළ යුතු විශ්‍රාම වැටුප් සංශෝධනය මේ වන විට සිදු කර අවසන් කර ඇත. දැනට සිදුකළ යුතුව ඇත්තේ 2018.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත සිදු කළ යුතු තුන්වන අදියරෙහි සංශෝධනය, 2019.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත සිදු කළ යුතු හතරවන අදියරෙහි සංශෝධනය හා 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත සිදු කළ යුතු පස්වන අදියරෙහි සංශෝධනයයි.

2016.01.01 දිනට පසුව 2020.01.01 දින දක්වා විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන් සඳහා ඉහත සඳහන් තුන, හතර හා පහ අදියරවල සංශෝධන සිදු කිරීම සඳහා වාර්ෂිකව අවශ්‍ය වන අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 7,704කි. ඇමුණුමෙහි විස්තර සඳහන්ව ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) 2016.01.01 දිනෙන් පසුව සහ 2020.01.01 දින දක්වා කාල සීමාව තුළ විශ්‍රාම ගනු ලැබූ විශ්‍රාමිකයන් සංඛ්‍යාව 112,984කි.

(v) 2016.01.01 දිනට පසුව 2020.01.01 දින දක්වා විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන් අතරින් මේ වන විට මියගොස් ඇති විශ්‍රාමිකයන් සංඛ්‍යාව 1,254කි.

(ඇ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ அமைச்சர் அவர்களே, இந்தச் சுற்றுநிருபம் திருத்தப்பட்டு, ஏற்கெனவே பாதிக்கப்பட்டவர்கள் தொடர்பில் எடுக்கப்பட்டுவரும் நடவடிக்கைக்கு நன்றி! இச்சுற்றுநிருபம் திருத்தப்படுவதனூடாக அவர்களுக்கு வழங்கப்படவிருக்கின்ற தொகையுடன், 2020இலிருந்து இன்றுவரை அவர்களுக்கு வழங்கப்படவேண்டிய arrearsஐயும் - மிகுதித் தொகையையும் - இந்த வருடத்திலோ அல்லது அடுத்த வருடத்திலோ கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමා, අධිකරණ ක්‍රියාමාර්ගයක් සිදු වෙමින් පවතින නිසා ඊට අනුකූලව අවශ්‍ය සංශෝධන කිරීමට කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, if you have a second Supplementary Question, you may pose that. Otherwise, we will move on to the next Question.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Deputy Speaker, I have already obtained permission from the Hon. (Dr.) Pathmanathan Sathiyalingam to raise the Second Supplementary Question, which pertains to the same Ministry.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙළින්ම මෙතැනට සම්බන්ධ නොවුණාට පාර්ලිමේන්තුවේ සිටින සියලු මන්ත්‍රීවරුන් පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මම ඒක සිංහල භාෂාවෙන් කියලා දෙමළ භාෂාවෙන් කියන්නම්.

මන්නාරම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්ට මා විසින් මාගේ නිල මුද්‍රාව සහිතව, පාර්ලිමේන්තු මුද්දර ගසා ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපිය කච්චේරියෙන් භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබෙනවා, ගරු ඇමතිතුමනි. என்னுடைய உத்தியோகபூர்வ seal உடன் பாராளுமன்ற முத்திரையிட்டு பதிவுத் தபாலில் அனுப்பப்பட்ட கடிதம், கச்சேரியால் பாரமெடுக்க முடியாதென்ற endorseஉடன் திருப்பி அனுப்பப்பட்டு இருக்கின்றது. මම දන්නවා, ඔබතුමාට මේකට කෙළින්ම පිළිතුරක් දෙන්න බැරි වෙයි. නමුත් එතැන ඉතා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි මන්නාරම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්, නැත්නම් දිස්ත්‍රික් ලේකම්තුමා මාගේ නිල මුද්‍රාව සහිතව, පාර්ලිමේන්තු මුද්දර ගසා ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපිය භාර ගැනීම ප්‍රතික්ෂේප කළේ? ඒ පිළිබඳව සොයා බලන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. Sir, I table* that letter.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සිදු වූ අපහසුතාව ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව අපි පරීක්ෂා කරලා සුදුසු ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 10 - 321/2024 - (1), the Hon. Ajith Gihan.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුව මම ප්‍රශ්නයක් අහන්නයි හිතුවේ. කැමතිද උත්තරයක් දෙන්න?

ගරු ඇමතිතුමනි, මම ඊයේත් ඔබතුමාට කථා කළා. දැන් කළමනාකරණ සහකාර තනතුරු සම්බන්ධයෙන් විශාල අර්බුදයක් මතුවෙලා තිබෙනවා. ඒක ඔබතුමාත් දන්නවා. ඇත්තටම කළමනාකරණ සහකාර සේවයේ තිබෙන පුරප්පාඩු පිළිබඳව අමාත්‍යාංශය සතුව හරිහමන් වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ සමහර අය වෙනත් රාජකාරිවලට ගිහිල්ලා තිබෙනවා, සමහර අය පිට රට ගිහිල්ලා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා]

තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. ඒ විභාගය ලියපු අයගෙන් ලකුණු 116ට වැඩි අය තමයි දැනට බඳවාගෙන තිබෙන්නේ. සම්ප්‍රදායයක් තිබුණා, ලකුණු 100ට වැඩියෙන් ගත්ත සියලුදෙනා බඳවා ගන්න. ඇත්ත වශයෙන්ම දැනටමත් කළමනාකරණ සහකාර තනතුරුවල පුරප්පාඩු 5,000කට අධික සංඛ්‍යාවක් තිබෙනවා. ඇත්තටම කාර්යාල කාර්ය සහායකවරු වාගේ අයට යන්න පුළුවන් උපරිම ස්ථානය ඒක. ඔබතුමා ඊයේත් මේ සම්බන්ධව ඉතා හොඳ පැහැදිලි කිරීමක් කළා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දීලා, ලකුණු 100ට වැඩියෙන් ලබාගත් අයටත් ඒ අවස්ථාව සලසා දෙන්න කියලා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කාලාන්තරයක් තිස්සේ බඳවා ගැනීම්වලදී සිදු වූ විවිධ අකටයුතුකම්, අක්‍රමිකතා පිළිබඳ ප්‍රශ්නය තමයි මෙතැන තිබෙන්නේ.

ඒ නිසා ඒ කණ්ඩායම්වලට අගතියක් නොවන විධියට අපි කටයුතු කරනවා. ඒ වාගේම තමයි, ලකුණු සීයය පිළිබඳ ප්‍රශ්නයත්. කිසියම් වර්ෂයක විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමේ cut-off marks අනුව බඳවා ගත්තා කියලා, ඊට පසු වර්ෂයකත් ඒ මට්ටම පවත්වා ගෙන යන්නේ නැහැ. ඒ නිසා තිබෙන පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව ලකුණු තීරණය කරන්න වෙයි. ඒ අනුව, ඔවුන්ට අගතියක් නොවන විධියට කටයුතු කරනවා.

## සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් ඉඩම්: වැලි කැණීම සහ පොල් ඵලදාව

## வ/ப சிலாபம் பெருந்தோட்டக் கம்பனிக்குச் சொந்தமான காணிகள்: மணல் அகழ்வு மற்றும் தேங்காய் விளைச்சல்

## LANDS BELONGING TO CHILAW PLANTATIONS LIMITED: SAND MINING AND COCONUT YIELD

321/2024

**10. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය කාලයේදී, සීමාසහිත හලාවත වැවිලි සමාගම සතු ඉඩම්වල වැලි කපා අළෙවි කරනු ලැබූ බව දන්නේද;

(ii) එසේ නම්, එම වැලි අළෙවි කිරීමේ අරමුණු කවරේද;

(iii) පාරිසරික වශයෙන්ද අහිතකර මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සමාගමේ පොල් වතුවලින් උපයන වාර්ෂික ආදායම කොපමණද;

(ii) ඉහත සමාගම සතු පොල්වතු ඉන්දියාවේ අමුල් සමාගමට ලබා දීමට පසුගිය රජයන් විසින් කටයුතු කරමින් සිටි බව දන්නේද;

(iii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ඉහත සමාගමේ පොල් වතුවල පොල් ඵලදාව අඩුවීමට හේතු කවරේද;

(v) එම පොල්වතුවල පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த காலத்தில், வரையறுக்கப்பட்ட சிலாபம் பெருந்தோட்டக் கம்பனிக்குச் சொந்தமான காணிகளில் மணல் அகழப்பட்டு விற்பனை செய்யப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மணல் விற்பனையின் நோக்கங்கள் யாவையென்பதையும்;

(iii) சுற்றாடல் ரீதியாகப் பாதகமான இச்செயற்பாடு தொடர்பில் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கம்பனியின் தென்னந்தோட்டங்களிலிருந்து ஈட்டப்படுகின்ற வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி கம்பனிக்குச் சொந்தமான தென்னந்தோட்டங்களை இந்தியாவின் அமுல் கம்பனிக்கு வழங்குவதற்கு கடந்த அரசாங்கங்களால் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டிருந்ததை அறிவாரா என்பதையும்;

(iii) அதன் தற்போதைய நிலைமை யாதென்பதையும்;

(iv) மேற்படி கம்பனியின் தென்னந்தோட்டங்களில் விளைச்சல் குறைவடைவதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) மேற்படி தென்னந்தோட்டங்களின் விளைச்சலை அதிகரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that sand was extracted from lands belonging to Chilaw Plantations Limited during the recent past and sold;

(ii) if so, what were the objectives of selling that sand; and

(iii) the measures that have been taken regarding this course of action, which is also environmentally harmful?

(b) Will he also inform this House -

(i) the annual income earned from the coconut estates of the aforementioned company;

(ii) whether he is aware that previous governments had been engaged in handing over the coconut estates of the aforementioned company to Amul Company in India;

(iii) what its present status is;

(iv) the reasons for the decline in coconut yield in the coconut estates of the aforementioned company; and

(v) the measures that will be taken to increase the coconut yield in those estates?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එම වැලි අළෙවි කරලා හලාවත වැවිලි සමාගම සඳහා ආදායමක් ලබා ගැනීම හා පොල් වගාව සඳහා පතස් නිර්මාණය කරලා පොල් වගාවේ ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

(iii) ඔව්, මෙතැනදී පරිසරය සම්බන්ධව යම් හානියක් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අදාළ ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වෙලා නැහැ කියලා අමාත්‍යාංශය නිරීක්ෂණය කරලා තිබෙනවා. අයථා ගනුදෙනුවකුත් එතැනදී සිදු වී ඇති බවට නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ අනුව අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, සීමාසහිත හලාවත වැවිලි සමාගමේ පාලන අධිකාරියට අපි දැනුම් දීලා තිබෙනවා, එම ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා අදාළ පරීක්ෂණ කටයුතු කරන්න කියලා. ඒ තීන්දුව අරගෙන තිබෙනවා.

(ආ) (i) මේ සඳහා විස්තරාත්මක පිළිතුරක් තිබෙන්නේ.

සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් පොල් වතුවලින් පහත සඳහන් පරිදි වාර්ෂික ආදායම් උපයා ඇත.

| වර්ෂය | උපයන ලද පොල් ආදායම (රු.) | උපයන ලද සමස්ත ආදායම (රු.) |
|---|---|---|
| 2019 | 348,349,082 | 506,641,013 |
| 2020 | 592,179,338 | 790,907,817 |
| 2021 | 801,718,449 | 1,210,896,497 |
| 2022 | 882,287,388 | 1,156,642,401 |
| 2023 | 756,680,740 | 993,707,915 |

(ii) එහෙම තොරතුරක් අපට වාර්තා වී නැහැ.

(iii) අදාළ නොවේ.

(iv) සීමාසහිත හලාවත වැවිලි සමාගමේ පොල් වතුවල පොල් අඩුවීම පහත පරිදි පෙන්වා දිය හැකිය.

| වර්ෂය | පොල් ඵලදාව (ගෙඩි) |
|---|---|
| 2019 | 14,993,952 |
| 2020 | 11,943,494 |
| 2021 | 14,715,763 |
| 2022 | 15,172,334 |
| 2023 | 11,728,576 |

ඒ සඳහා බලපා ඇති හේතු:

- සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් වතු කොට්ඨාස අතරින් වැඩි වතු කොට්ඨාස ප්‍රමාණයක් වියළි හා අතරමැදි තෙත් කලාප තුළ පිහිටා ඇත. එසේම වියළි කලාපයේ පිහිටා ඇති වතු සඳහා ප්‍රශස්ත වර්ෂාපතනය නොලැබීම වතුවල ඵලදාව අඩුවීමට බලපා ඇත. පොල් ගසේ ඵලදාව තීරණය කරන සාධක ගණනාවක් ඇති අතර, එහි ප්‍රධානතම සාධක උෂ්ණත්වය සහ වර්ෂාපතනය වුවද,

  - පොල් මලක නිපදවන ගැහැනු මල් සංඛ්‍යාව,
  - පොල් මල විවෘතවීමට පෙර මාස 03ක කාලගුණික තත්ත්වය,
  - පොල් මල විවෘතවීමෙන් පසු මුල් මාස 03 තුළ ඇති වන නියඟ හා උෂ්ණත්ව තත්ත්වයන්වල බලපෑම සහ
  - පසෙහි යෝග්‍යතාව සහ කෘෂිකාර්මික නඩත්තුව යන සාධක පොල් ඵලදාවේ විචලනයන් සඳහා හේතු සාධක වේ.

කොහොම නමුත්, 2023 වසරේ පොල් අස්වැන්න ගෙඩි මිලියන 11.7යි.

එය පසුගිය 2024 වසර වෙනකොට පොල් ගෙඩි මිලියන 10ට වඩා පහළට ඇවිල්ලා තිබෙනවා. ඒ විධියට පොල් අස්වැන්න විශාල වශයෙන් අඩුවෙලා තිබෙනවා.

ඒ වාගේම පොල් පළදාව අඩු වීමට හේතු විශාල ප්‍රමාණයක් තිබෙනවා.

- පසුගිය වසර 5ක කාලය තුළ සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් වතු කොට්ඨාසවල පොහොර යෙදීම නිසි පරිදි සිදු වී නොමැති අතර, මේ සඳහා කොවිඩ් වසංගතය, රට තුළ පැවැති අර්බුදකාරී තත්ත්වය සහ අධික ලෙස පොහොරවල මිල ගණන් ඉහළ යෑම යන කරුණු බලපා තිබෙනවා.

ඊට අමතරව දේශගුණික තත්ත්වයන්ද බලපා තිබෙනවා. කළමනාකාරිත්වයේ දුර්වලතා බලපා තිබෙනවා. ඒ වාගේම යම් යම් අකටයුතුකම් සහ දූෂිත ක්‍රියාවන් බලපා තිබෙනවා.

ජාතික මට්ටමින් සලකා බලන විට 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ජාතික පොල් නිෂ්පාදනය සියයට 12කින් අඩු වී ඇත. එය එලෙසින්ම සීමාසහිත හලාවත වැවිලි සමාගමටද බලපා ඇත.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා ]

(v) සීමාසහිත හලාවත වැවිලි සමාගම විසින් පොල් වතුවල පොල් අස්වැන්න ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග:

1. ප්‍රමිතියෙන් යුක්ත පොහොර නිසි පරිදි අදාළ වතු කොටස් සඳහා යෙදීම
2. ජල සංරක්ෂණ හා ජල සම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම
3. පැළ වගාවේ ගහන ඝනත්වය නිසි පරිදි පවත්වා ගැනීම
4. රෝග සහ පළිබෝධ නිසි පරිදි පාලනය කිරීම
5. නිසි පරිදි වල් මර්දනය කිරීම
6. තෙතමන සංරක්ෂණ කටයුතු සඳහා පොල් ලෙලි වැළලීම
7. ආවරණ බෝග වගා කිරීම
8. කෘෂිකාර්මික කටයුතු නිසි පරිදි අධීක්ෂණය කිරීම
9. කාබනික පොහොර යෙදීම
10. අතුරු බෝග වගා කිරීම
11. පාංශු ඛාදනය වැළැක්වීම
12. වසුන් යෙදීම
13. වර්ෂාවෙන් ලැබෙන ජලය එක්රැස් කිරීම
14. අදාළ වතු කොටස්වල කළමනාකරණ කටයුතු නිසි පරිදි සිදු කිරීම හා අස්වනු හානිය අවම කිරීම

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු අමාත්‍යතුමනි, වැවිලි සමාගම වැලි අළෙවි කිරීම සම්බන්ධයෙන් කථා කරනකොට, විශේෂයෙන්ම අවසර ලබා දී ඇති එම වැලි අළෙවි කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක වෙලාද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. වැලි අළෙවි කිරීමේ ක්‍රියාවලියේදී වංචා සිදුවෙලා තිබෙනවාද කියන කාරණයත්, නැවත පොල් ඉන්දන ක්‍රියාවලිය සිදු වෙලා තිබෙනවාද, එහෙම නැත්නම් ව්‍යාපෘති ලබා දීලා තිබෙන්නේ කුමක් සඳහාද කියන කාරණා සඳහාත් මම ඔබතුමාගෙන් පිළිතුරු දැන ගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විගණන පරීක්ෂණ ගණනාවක් සිදු කළා. දැනටත් පරීක්ෂණ කිහිපයක් සිදු වෙමින් පවතිනවා. ඒ අනුව පසුගිය කාලය තුළ සීමාසහිත හලාවත වැවිලි සමාගම වැලි කැණීම් කරලා වැලි අළෙවි කරන්න තීන්දු කරලා තිබෙනවා. මම මීට ඉස්සෙල්ලාත් මේ සම්බන්ධයෙන් පිළිතුරක් දුන්නා. එහි එක අරමුණක් වුණේ, ආදායම් ලබා ගැනීමයි. ලබාගෙන තිබෙන ආදායම ගැනත් මම කියන්නම්. 2021දී වැලි කැණීම් ටෙන්ඩර් කරලා කොන්ත්‍රාත්කරුවන් වෙත දීලා තමයි ඒවා අළෙවි කරලා තිබෙන්නේ. ඒ අනුව 2021 අවුරුද්දේ වැලි විකුණලා ආදායම ලෙස සමාගම රුපියල් මිලියන 47.2ක් ලබාගෙන තිබෙනවා. 2022 දී වැලි අළෙවි කරලා රුපියල් මිලියන 61.2ක ආදායමක් ලබාගෙන තිබෙනවා. 2023 දී වැලි අළෙවි කරලා රුපියල් මිලියන 24.4ක ආදායමක් ලබාගෙන තිබෙනවා. ඒ අනුව එම සමාගම ලබාගෙන තිබෙන මුළු ආදායම රුපියල් මිලියන 132.8යි. හැබැයි විගණන වාර්තා විසින් පෙන්වා දෙනවා, මෙතැන සුවිශාල වංචාවක් සිද්ධවෙලා තිබෙනවා කියලා. අපි ළඟදීත් ඒ සඳහා පරීක්ෂණ කණ්ඩායම් යැව්වා. ඒ අනුව මුක්කුතොඩුවාව කියන ප්‍රදේශයේ වැලි කැණීම්වලින් රජයට අහිමිවෙලා තිබෙන මුදල, නැත්නම් සීමාසහිත හලාවත වැවිලි සමාගමට අහිමිවෙලා තිබෙන මුදල රුපියල් මිලියන 746.6ක්. එවැනි වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, සීමාසහිත හලාවත වැවිලි සමාගමට අක්කර 14,000ක් තිබෙනවා. එම අක්කර 14,000න් 2023 අවුරුද්දේ පොල් අළෙවි කරලා ලබාගෙන තිබෙන්නේ රුපියල් මිලියන 756ක ආදායමක්. වැලි වංචාව නිසා අපට අහිමි වෙලා තිබෙන ආදායමත් ඒ හා සමානයි. වැලි වංචාව නිසා රුපියල් මිලියන 746.6ක මුදලක් අහිමිවෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, අපි තව කාරණයක් අධ්‍යයනය කරමින් යනවා. එය සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් පලෙයි කියන ප්‍රදේශයේ පොල් වගාව හා සම්බන්ධ කාරණයක්. එතැනත් අවසර දුන් ප්‍රමාණයට වඩා වැලි කැණීම් සිද්ධ කරලා තිබෙනවා. විශාල වංචාවක් සිදු වූ බවට වාර්තා වෙනවා. දැනට එය පරීක්ෂණ මට්ටමේ තිබෙනවා. අපට මූලික වශයෙන් වාර්තා වෙනවා, එතැන දූෂිත ගනුදෙනුවක් -වංචාවක්- නිසා රුපියල් මිලියන 400කට ආසන්න මුදලක් අහිමි වෙලා තිබෙන බව. ඒ අනුව එම වංචාවට අදාළ වගඋත්තරකරුවා කවුද කියලා දැනට කියන්න බැරි වුණත්, ප්‍රසිද්ධ දේශපාලනඥයන් දෙදෙනෙක් සම්බන්ධයෙනුත් තොරතුරු වාර්තා වෙනවා. ඒ වාගේම කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙක් සම්බන්ධයෙනුත් අපට තොරතුරු වාර්තා වෙනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු අමාත්‍යතුමනි, අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ගය කුමක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

මෙය දැනට පරීක්ෂණ මට්ටමේ තිබෙනවා. මේ වෙනකොට අපි නීති විරෝධී වැලි කැණීම් නවත්වා තිබෙනවා. ලබා දුන් බලපත්‍රයේ ප්‍රමාණයට වඩා වැඩියෙන් ගොඩ දමා තිබෙන වැලි කියුබ් ප්‍රමාණය කොච්චරද කියලා අපි නිවැරදි තොරතුරු එළියට ගන්න ඕනෑ. අපි ඒක කරනවා. වංචා සිදු වන නිසා අරගෙන යන ලොරි ප්‍රමාණය කොච්චරද කියලා බලන්න CCTV cameras පවා සවි කරලා නිරීක්ෂණය කරලා තිබෙනවා. කියුබ් තුනේ trucksවලින් තමයි වැඩි හරියක් වැලි එළියට අරගෙන ගිහින් තිබෙන්නේ. දවසකට ලොරි 30ක්, 40ක් වැඩ කරලා තිබෙනවා. සමහර වෙලාවට CCTV cameras සවි කරපු පාරවල්වලින් නොවෙයි වැලි ටික අරගෙන ගිහින් තිබෙන්නේ. තවත් සමහර වෙලාවට CCTV cameras අක්‍රිය තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ විධියට විශාල වංචාවක් සිදුවෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වන මූලික පරීක්ෂණ කටයුතු දැන් සිදු වෙමින් තිබෙනවා. දැනට කැණීම් කරන්න ඉඩ දීලා නැහැ. ඒ අනුව අපි ඉදිරි නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගන්න සූදානම් කරලා තිබෙනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, have you finished asking your second Supplementary Question?

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

අපි දන්නවා, පොල් ඵලදාව අඩුවීම කථා බහට ලක් වුණු බව. ඒ සම්බන්ධව අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ අර්බුදය නිර්මාණය වීමට හේතුව කවරේද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දුන්නොත්, ඔව්, එය මේ වෙනකොට රටේ ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, මෙතුමා අමතර ප්‍රශ්නයක් ඇහුවේ. මෙතුමා අහපු ප්‍රශ්නය වැදගත් නිසාත්, එය රටේ සාකච්ඡා වෙන කාරණයක් නිසාත් මම කෙටි උත්තරයක් ලබා දෙන්නම්, ගරු සභානායකතුමනි.

පොල් සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් රටේ තිබෙනවා තමයි. ඒකට ප්‍රධාන හේතුව මම ඉස්සරවෙලා කිව්වා. රජය සතු පොල් ඉඩම් අක්කර 39,883ක් තිබෙනවා. ඒවාට අවුරුදු 5කින් පොහොර දමා නැහැ කියන්නේ අස්වැන්න අඩු වෙනවා කියන එක ගැන අහන්න, බලන්න දෙයක් නැහැ. ඒ වාගේම මේවාට දේශගුණික තත්ත්වයනුත් බලපෑවා. දැන් අපේ නව රජය උත්සාහ කරනවා, මේවාට පිළිතුරු සොයන්න. අවුරුදු 5ක් පොහොර දැමුවේ නැතත්, වර්තමාන රජය රුසියාවේත් ආධාර උපකාර සහිතව පොහොර සහනාධාර නැවක් ලබා ගත්තා. විශේෂයෙන්ම, MOP පොහොර මෙට්‍රික්ටොන් 55,000ක් මේ වෙනකොට ලංකාවට ගොඩ බා තිබෙනවා. ඒකෙන් හරි අඩක් - මෙට්‍රික්ටොන් 27,500ක් - අපි පොල් සඳහා වෙන් කරලා තිබෙනවා. ඉදිරියේදී අක්කර 5ට අඩු පොල් වතු හිමියන් සඳහා නොමිලේ පොහොර ලබා දෙන්න අපි තීන්දු කරලා තිබෙනවා. ඒ වාගේම, මේ අවුරුද්දේ අපි උතුරු පොල් ත්‍රිකෝණයේ අක්කර 40,000ක් ආරම්භ කරන්නත් නියමිතයි. මේ සඳහා වැය කරන්න රුපියල් මිලියන 1,437ක් අවශ්‍යයි කියලා අපි අය වැයෙන් ඒ මුදල ඉල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ පොල් හිටෙව්වා කියලා ලබන අවුරුද්දේ පොල් කඩන්න බැහැ. වසර තුනක්, හතරක් යනකොට මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලීන විසඳුමකට ආ හැකියි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Question of Privilege to be raised by the Hon. Sivagnanam Shritharan.

## වරප්‍රසාද: ඉන්දියාවට සංචාරය කිරීම නැවැත්වීමට ගුවන් තොටුපළ නිලධාරින් උත්සාහ කිරීම
## சிறப்புரிமை: இந்தியப் பயணத்தை நிறுத்த விமான நிலைய அதிகாரிகள் முயற்சி
## PRIVILEGE: ATTEMPT BY AIRPORT OFFICIALS TO PREVENT TRAVELLING TO INDIA

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் எனக்குரிய சிறப்புரிமையை மீறும் வகையில் கடந்த வாரம் இடம்பெற்ற ஒரு சம்பவம் பற்றி இந்தச் சபையில் தெரிவிக்க விரும்புகிறேன்.

யாழ்ப்பாணத் தேர்தல் மாவட்டத்தின் பாராளுமன்ற உறுப்பினரான சிவஞானம் சிறீதரன் ஆகிய நான், தமிழ் நாடு அரசின் ஒழுங்கமைப்பில் 2025.01.11ஆம், 2025.01.12ஆம் திகதிகளில் சென்னை நந்தம்பாக்கத்தில் நடைபெற்ற "அயலகத் தமிழர் தினம்" நிகழ்வில் சிறப்பு விருந்தினராகப் பங்கேற்கும் பொருட்டு, 2025.01.10ஆம் திகதி கட்டுநாயக்க விமான நிலையத்தினூடாக இந்தியாவுக்குப் பயணமாகவிருந்தேன். அன்றைய தினம் மாலை 6.35 மணிக்கு SriLankan Airlinesஇன் UL0123ஆம் இலக்க விமானம் புறப்படத் தயாராக இருந்த நிலையில், எனது கடவுச்சீட்டில் குறைபாடுள்ளதாகவும் பயங்கரவாதக் குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரின் விசாரணைகளுக்கு என்னை உட்படுத்த வேண்டுமெனவும் தெரிவித்த விமான நிலைய அதிகாரிகள், எனக்குப் பயணத் தடை விதிக்கப்பட்டிருப்பதாகவும் தெரிவித்திருந்தனர். இதன்போது, என்னுடன் இணைந்து பயணம் செய்வதற்காக விமான நிலையம் வருகை தந்திருந்த சக பாராளுமன்ற உறுப்பினரும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவருமான கௌரவ ரஊப் ஹகீம் அவர்கள் மேற்கொண்ட முயற்சிகளின் பலனாக, நீண்ட நேர விசாரணைகளின் பின்னர் விமானம் புறப்படத் தயாராகிய இறுதி நேரத்தில் என்னை இந்தியப் பயணத்திற்கு அனுமதித்திருந்தனர்.

எனினும், 2025.01.13ஆம் திகதி நான் இந்தியாவிலிருந்து மீளவும் நாடு திரும்பியபோது, குறித்த பயணத் தடை தொடர்பில் சம்பந்தப்பட்ட அதிகாரிகளிடம் வினவியவேளையில், அவ்வாறான பயணத் தடை ஏதும் என்மீது விதிக்கப்படவில்லை எனத் தெரிவித்திருந்தனர். நீதிமன்றக் கட்டளைகள் ஏதுமின்றி, கௌரவ சபாநாயகராகிய தங்களின் ஆலோசனை எதுவுமின்றி எனக்குப் பயணத் தடை விதிக்கப்பட்டுள்ளதெனக் குடிவரவு, குடியகல்வுத் திணைக்கள அதிகாரிகளால் தெரிவிக்கப்பட்டமை திட்டமிட்ட வகையில் மேற்கொள்ளப்பட்ட ஒரு சிறப்புரிமை மீறல் என்றே நான் கருதுகிறேன். மக்களால் தெரிவுசெய்யப்பட்ட ஒரு பாராளுமன்ற உறுப்பினராக எனக்கிருக்கும் அடிப்படைச் சிறப்புரிமையை மீறும் வகையில் மேற்கொள்ளப்பட்ட மேற்படி விசாரணைகளின் பின்னணி குறித்துப் பாராளுமன்றத்தில் நான் கேள்வியெழுப்ப விழைகிறேன்.

அத்துடன், இது தொடர்பான இன்னுமொரு முக்கியமான விடயத்தையும் நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகிறேன். அதாவது, கடந்த இரண்டு நாட்களுக்கு முன்னர் யாழ்ப்பாணத்தில் தனியார் ஊடகமொன்றுக்குப் பேட்டியளித்த முன்னாள் நாடாளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள், "சிறீதரன் அவர்கள் கனடாவில் இருக்கும் தடைசெய்யப்பட்ட ஓர் அமைப்போடு பேச முனைந்தார்; அதற்காகத்தான் அவர் சென்னை செல்லவிருந்தார்; அந்தக் காரணத்தின் அடிப்படையில்தான் அவரை விமான நிலையத்தில் தடுக்க முயற்சி செய்தார்கள்" என்று தனது செவ்வியில் குறிப்பிட்டிருந்தார். மேலும், இது தொடர்பாக தனக்குச் சிறீதரன் தெரிவிக்கவில்லை என்றும் தெரிவித்திருந்தார். நான் கௌரவ சுமந்திரன் அவர்களைச் சென்னையில் சந்தித்தபொழுதுகூட அவர் இதைப்பற்றி என்னிடம் எதுவும் கேட்கவில்லை. அத்தோடு, இந்த விடயத்தை ஊடகங்களின்மூலம் தான் தெரிந்துகொண்டதாகவும் சிலவேளை ஏதேனுமோர் ஊகத்தின் அடிப்படையில் சிறீதரனை அவர்கள் மறித்திருக்கலாமென்றும் அவர் குறிப்பிட்டிருந்தார். ஆகவே, இந்த விடயம் தொடர்பில் சுமந்திரன் அவர்களை விசாரணை செய்து, எந்தெந்த ஊடகங்களில் இந்தச் செய்தி வெளிவந்திருக்கின்றதென்று அறிந்து, அந்த ஊடகங்களின் பிரதானிகளை விசாரிப்பதன்மூலம் உண்மையைக் கண்டறிய முடியும் என்று நான் நம்புகிறேன். இதனை எனக்கெதிராகச் செய்யப்பட்ட

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

மிகப் பெரிய சதியாக நான் கருதுகிறேன். நான் பாராளுமன்றத்தின் Foreign Relations and Protocol Officeஇல் அனுமதியைப் பெற்று, பாராளுமன்ற உறுப்பினர்கள் செல்லும் VIP நுழைவாயிலினூடாகத்தான் சென்றேன். அந்தப் பயணச்சீட்டின் பிரதியைச் சபாபீடத்தில் *சமர்ப்பிக்கிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வடக்கு மாகாண சபையில் தமிழ்த் தேசிய கூட்டமைப்பின் ஓர் உறுப்பினராக இருந்த ஐயூப் அஸ்மின் அவர்கள் அன்றைய தினம் -10ஆம் திகதி - தன்னுடைய முகநூல் பக்கத்தில், “கடந்த நாட்களில் எந்தவொரு பாராளுமன்ற உறுப்பினருக்கும் விமான நிலையத்தில் எவ்வித இடையூறுகளும் எவராலும் ஏற்படுத்தப்படவில்லை. அவ்வாறு பரப்படுகின்ற செய்திகளில் உண்மைகள் எதுவுமில்லை - விமான நிலைய உயர் அதிகாரி” என்ற செய்தியைப் பதிவிட்டிருக்கின்றார். அத்தோடு, நான் இந்தியாவில் இருக்கின்ற பிரபல அரசியல் தலைவர் ஒருவரான ‘செந்தமிழன்’ சீமான் அவர்களோடிருக்கும் ஒரு புகைப்படத்தையும் பதிவிட்டு, எனக்கு எதிரான குறித்த செய்தியைப் பரப்பியிருக்கின்றார். அஸ்மின் அவர்களும் சுமந்திரன் அவர்களும் நெருங்கிய நண்பர்கள். ஆகவே, சுமந்திரன் சொன்ன விடயத்திற்கும் அஸ்மின் முகநூலில் பதிவிட்ட செய்திக்கும் இடையில் ஏதோவொரு சங்கதி இருப்பதுபோல எனக்குத் தெரிகிறது. ஏனென்றால், சீமான் அவர்களுக்கும் ஸ்டாலின் அவர்களுக்கும் இடையில் நல்ல உறவு இல்லை என்று கூறப்படுகிறது. ஆகவே, இந்தப் புகைப்படத்தைப் பதிவிட்டு, என்னை அந்த நிகழ்வுக்குப் போகவிடாமல் தடுப்பதற்கான ஒரு முயற்சி மேற்கொள்ளப்பட்டதாகவே நான் நினைக்கிறேன். ஆகவே, தயவுசெய்து இந்த விடயம் தொடர்பில் அதிக கவனமெடுத்து, விசாரணை மேற்கொள்ள வேண்டுமென்பதை நான் குறிப்பிட விரும்புகிறேன். அஸ்மின் அவர்கள் முகநூலில் பதிவிட்ட புகைப்படத்துடன்கூடிய செய்தியின் பிரதியையும் நான் சபாபீடத்தில் *சமர்ப்பிக்கிறேன்.

அடுத்து, கடந்த இரண்டு ஆண்டுகளுக்கும் மேலாக என்னுடைய மெய்ப்பாதுகாவலராக இருந்த - Personal Security Officer ஜீ.ஜீ.பீ. ரத்னகுமார (PS 68690) என்பவர் சென்ற வாரம் திடீரென மாற்றப்பட்டிருக்கிறார். இது தொடர்பான கடிதம் ஒன்றைக் கடந்த 2025.01.08ஆம் திகதி புதன்கிழமை காலை 9.30 மணிக்கு பொலிஸ்மா அதிபருக்கு நான் நேரடியாகவே வழங்கியிருந்தேன். ஆனால், இதுவரை அவர் மீண்டும் எனது மெய்ப்பாதுகாவலராக நியமிக்கப்படவில்லை. அந்தக் கடிதத்தின் பிரதியையும் நான் சபாபீடத்தில் *சமர்ப்பிக்கிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுமந்திரன் அவர்களுடைய செவ்வியின் 'வீடியோ' பதிவினைக்கொண்ட - நிரல் திரட்டி - pen driveஇனையும் நான் சபாபீடத்தில் *கையளிக்கின்றேன்.

தயவுசெய்து இதுதொடர்பில் எனக்கொரு நீதி கிடைக்க வேண்டும். நான் சர்வதேச பாராளுமன்றம், Amnesty International, Human Rights Watch ஆகியோரிடமும் இந்தக் கோரிக்கைகளை முன்வைக்கின்றேன். இவ்விடயத்தில் இந்தப் பாராளுமன்றத்தால் எனக்கொரு நீதி கிடைக்குமென்று நான் நம்புகிறேன். இது என்மீது புனையப்பட்டிருக்கின்ற மிகப்பெரிய மோசடி. நான் எந்தவொரு காலத்திலும் இலங்கையில் தடைசெய்யப்பட்ட, கனடாவில் இருக்கின்ற எந்தவோர் அமைப்போடும் பேசுவதற்குத் தயாராகவில்லை; அப்படி யாரும் என்னிடம் கேட்டதுமில்லை; அவ்வாறான முயற்சிகள் எதுவும் மேற்கொள்ளப்படவுமில்லை. அரசாங்கத்தினுடைய பேச்சாளர்போல அல்லது அரச புலனாய்வுத் துறையின் பேச்சாளர்போல ஊகத்தின் அடிப்படையில் ஊடகங்களில் வெளிவந்ததென்று சுமந்திரன் அவர்கள் குறிப்பிட்டிருப்பது மிகப்பாரதூரமானதாகும். இச்சம்பவத்தின்போது பாராளுமன்ற உறுப்பினர் கௌரவ ரவூப் ஹகீம் அவர்களும் அந்த இடத்தில் இருந்தார். என்னுடையது பழைய passport என்றும், systemஇல் error இருக்கிறதென்றும் பலவற்றை அங்குள்ள அதிகாரிகள் சொன்னார்கள். தயவுசெய்து இவ்விடயத்தை நீதியானதும் நேர்மையானதுமானதொரு விசாரணைக்கு உட்படுத்துமாறு நான் இந்த உயர்ந்த சபையிடம் கேட்கின்றேன், அல்லது இதற்கான நீதியைப் பெறுவதற்கான ஒரு வழிமுறையை நீங்கள் எனக்குச் சொல்லவேண்டும் என நான் இந்த இடத்தில் வெளிப்படையாகப் பதிவுசெய்து, இதனை வெளிப்படுத்த எனக்கு அனுமதி தந்தமைக்கு நன்றி கூறி, நிறைவுசெய்கிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sivagnanam Shritharan, this matter will be brought to the notice of the Hon. Speaker for necessary action.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Rauff Hakeem?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Deputy Speaker, since my name was mentioned, I must explain.

මෙම සිද්ධිය වෙද්දී මමත් මේ මන්ත්‍රීතුමා එක්ක ගුවන් තොටුපොළ ප්‍රභූ පර්යන්තයේ සිටියා. තමිල්නාඩුවේ මහ ඇමතිතුමාගේ ඇරයුමක් පිට ඉන්දියාවට යෑමට සිටියදී තමයි මේ සිද්ධිය වුණේ. ප්‍රභූ පර්යන්තයේ ඉන්න ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙතුමාට විරුද්ධව විදේශ ගමන් තහනමක් තිබෙන බව කියද්දී මම එතුමන්ලා එක්ක සාකච්ඡා කරලා යම් ඉල්ලීමක් කළා. මොකද, යම් ගුවන් ගමන් තහනමක් තිබෙනවා නම් ඒ පිළිබඳව නඩුවක් තිබෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තවමත් අර ත්‍රස්ත විරෝධී පනත ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ පනත යටතේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට අවශ්‍ය පරිදි හිතාමතා මෙවැනි කටයුතු කරන්නට බැහැ. මොකද, මෙවැන්නකට උසාවි නියෝගයක් තිබිය යුතුමයි. නමුත්, ඒ අවස්ථාවේ ප්‍රශ්න කරද්දී උසාවි නියෝගයක් පිළිබඳව සඳහන් කළේ නැහැ. මේක ඇත්තටම මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් විතරක් නොවෙයි, එතුමාට සිදු වුණු විශාල අසාධාරණයක්. අපි සාකච්ඡා කරලා ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගත්තාට, මේ පිළිබඳව නිවැරැදි විමර්ශනයක් කරලා දැනුම් දීමක් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ඇත්තටම දැනට ටික වෙලාවකට කලින් තමයි අපි දැනගත්තේ. ගුවන් තොටුපොළ සභාපතිතුමාට මේක සෘජුව සම්බන්ධ නැති වුණත්, මේ සිද්ධිය වුණේ ගුවන් තොටුපොළේදී නිසා මම එතුමාටත් කිව්වා, මේ පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න කියලා. ඒ වාගේම මෙතුමා කථා කරන්න කලින්ම නියෝජ්‍ය ආරක්ෂක ඇමති මේජර් ජෙනරාල් අරුණ ජයසේකර මහතාටත් මම දැනුම් දුන්නා, මේ ප්‍රශ්නය පිළිබඳව සොයා බලන්න කියලා. මේක, Department of Immigration and Emigration සම්බන්ධ කාරණයක් නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ ප්‍රශ්නය එම Department එකට යොමු කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වරප්‍රසාද කමිටුවට ලබා දුන් ලිපිය අපට ලබා දුන්නොත්, නියෝජ්‍ය ඇමතිතුමා මඟින්ම එය අපට යොමු කරන්න පුළුවන්. අපි කනගාටු වෙනවා, ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට මුහුණ දෙන්න සිදු වුණු අපහසුතාව පිළිබඳව. නමුත්, මේක ත්‍රස්ත විරෝධී පනත භාවිත කිරීමක් කියන එක පැහැදිලි නැහැ. ඒක එතුමා කියන්නේත් නැහැ. ඒ වාගේම තමයි, නැවත ලංකාවට එනකොට එතුමා මෙහෙම දෙයකට ලක් වෙලාත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය රජයේ ප්‍රතිපත්තියක්වත්, රජයේ මහ පෙන්වීමක් මත කරන දෙයක්වත් නොවෙයි. එතුමාත් කරුණු ගොඩක් පැහැදිලි කළා. මේවායේ රජයේ අය විතරක්ද ඉන්නේ, වෙනත් අයත් ඉන්න පුළුවන්ද වාගේ කාරණාත් එතුමා මතු කළා. නමුත්, එතුමාගේ වරප්‍රසාද ආරක්ෂා කරන බවට අපි ගරු සභාවට පොරොන්දු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ත්‍රස්ත විරෝධී පනත සම්බන්ධයෙන් කියන්න තිබෙන එකම දේ තමයි, ඒක අපේ අභිලාෂයවත්, ප්‍රතිපත්තියවත් නොවෙයි කියන එක. නමුත්, අලුත් පනත් කෙටුම්පතක් සකස් කර ගන්න කල් රටේ තිබෙන නීතිය අපට ඉතාම පරිස්සමෙන් පාවිච්චි කරන්න වෙනවා. මොකද, අපි ආණ්ඩුව පවත්වාගෙන යන්න ඕනෑ, පනත් සම්මත කර ගන්න කල්. ඒ සම්බන්ධව අධිකරණ අමාත්‍යවරයා ගරු සභාවට පිළිතුරු දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ එම ලිපිය ඔබතුමාගෙන් අපට ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වෙලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 5, පරිපූරක මුදල පිළිබඳ යෝජනා සම්මතය ඉල්ලා අස්කර ගැනීමට මා අවසර පතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***අවසර දෙන ලදුව යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.***
*பிரேரணை, அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.*
*Motion, by leave, withdrawn.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Adjournment Motion to be moved by the Hon. Asitha Niroshana Egoda Vithana.

## "ක්ලීන් ශ්‍රීලංකා" වැඩසටහන
## கிளீன் ஸ்ரீலங்கா வேலைத்திட்டம்
## CLEAN SRI LANKA PROGRAMME

[පූ.භා. 11.17]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "සියලු ශ්‍රී ලාංකිකයන් ජාති, ආගම්, කුල භේද කිසිවකින් තොරව, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් සිය පරමාධිපත්‍ය බලය යොදා ගනිමින් විශාල ජන වරමක් වර්තමාන ආණ්ඩුව වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

එම ජනතා අභිලාෂ යථාර්ථයක් කිරීම පිණිස ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන වැඩසටහන් තුන අතුරින්, 2025.01.01 දින ගරු ජනාධිපතිතුමා විසින් නිල වශයෙන් දියත් කරන ලද Clean Sri Lanka වැඩසටහන වෙත මේ වන විට සියලු ජනතාවගේ සහ ජන මාධ්‍යයන්හි විශේෂ අවධානයට ලක්ව ඇති අතර, වැඩසටහනේ ප්‍රචාරක කාල සීමාවේදීම ඒ සඳහා සම්බන්ධ වීමට විශේෂ උනන්දුවක් දක්වනු පෙනෙන්නට තිබේ.

සුන්දර දිවයිනක්, ප්‍රීතිමත් ජනතාවක් යන දැක්ම අනුව, ශ්‍රී ලංකාවේ තිරසාර සමාජ, සංස්කෘතික වෙනසක් ඇති කිරීමට, ප්‍රධාන අරමුණු හතරක් සහිතව ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ සමාජීය, පාරිසරික සහ සදාචාරාත්මක යන ප්‍රධාන කුලුනු තුන කෙරෙහි මූලික අවධානය යොමුකොට ඇත.

තනි පුද්ගලයෙකුගේ වෙනසෙහි සිට ප්‍රතිපත්තිමය වෙනස් කිරීම් දක්වා විශාල වපසරියක විහිදී මෙම වැඩසටහන සාර්ථක කර ගනිමින් එහි ධනාත්මක ප්‍රතිඵල තනි තනිවත්, සමාජයේ සියලුදෙනාටමත්, සමස්ත රටට ලබා දීමටත්, ලෝකයට ආදර්ශයක් වීමටත්, ව්‍යවස්ථා සම්පාදකයන් ලෙස සියලු ගරු මන්ත්‍රීවරුන්ටත්, සමස්ත පොදු ජනතාවටත් වගකීමක් තිබේ.

ඒ අනුව, Clean Sri Lanka වැඩසටහනේ අරමුණු මුදුන්පත් කර ගනිමින් සුන්දර දිවයිනක් - ප්‍රීතිමත් ජනතාවක් යන දැක්ම වෙනුවෙන්, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේත්, සමස්ත පොදු ජනතාවගේත්, මෙම ගරු සභාව නියෝජනය කරනු ලබන සියලු මන්ත්‍රීවරුන්ගේත් සහාය Clean Sri Lanka වැඩසටහන වෙත ලබා දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් නියෝජනය කරනු ලබන මේ දසවන පාර්ලිමේන්තුව, විශේෂිත පාර්ලිමේන්තුවක්.

එක පැත්තකින් ගත්තොත්, සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව මුළුමහත් ජාතියම එක අරමුණකට ඇවිල්ලා, ඉතිහාසයේ පළමු වතාවට සියලු ජනතාවගේ අරමුණු, අභිලාෂයන් නියෝජනය කරමින් ගොඩනැඟුණු ශක්තිමත් පාලනයක් තමයි මේ දසවන පාර්ලිමේන්තුව කියන්නේ. එක පැත්තකින්, ආණ්ඩු පක්ෂයේ ඉන්න අපි වාගේම විපක්ෂය නියෝජනය කරමින් මේ සභා ගැබේ ඉන්න සියලු මන්ත්‍රීවරු මේ ඓතිහාසික භූමිකාව නියෝජනය කිරීමට ඒ අවස්ථාව සලසා ගත් වාසනාවන්ත මිනිසුන් බවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, අපි කවුරුත් ජීවත් වෙන්නේ ඉතාම කෙටි ආයු කාලයක් බව. ලංකාවේ අපි අවුරුදු 60ක්, 70ක්, 75ක් ජීවත් වෙයි. සාමාන්‍යයෙන් කියනවා, විශ්වයේ ආයු කාලය එක්ක ගනිද්දී, මිනිසා මේ මිහිමත පෙනී ඉන්නේ එක් ක්ෂණයක් විතරයි කියලා. ඒ නිසා අපට අහම්බෙන් ලැබිච්ච මේ කෙටි මිනිස් ජීවිතය ඉදිරි සමාජ ප්‍රගමනය වෙනුවෙන්, මුළුමහත් විශ්වයේ පැවැත්ම වෙනුවෙන්, ඊළඟ පරම්පරාවේ අරමුණු, අභිලාෂයන් වෙනුවෙන් යොදා ගන්න පුළුවන් නම්, අපි හිතනවා, ඒක තමයි මිනිසෙක් ලෙස අපට පැවරිලා තිබෙන ඓතිහාසික කාර්යභාරය කියලා. අපි අසා තිබෙනවා, ශ්‍රේෂ්ඨ කියමනක්. ඒ තමයි මිනිස් සංහතියට සේවය කිරීම පිණිස අයෙක් තමන් කැමැතිම වෘත්තිය තෝරා ගන්නේ නම්, එහි බර විසින් ඔහු වෙහෙසට පත් කරන්නේ නැහැ කියන එක. ඒ නිසා අපි කවුරුත් මේ අරමුණ නියෝජනය කරන, මේ මිනිස් සංහතියට සේවය කිරීම පිණිස, ශ්‍රී ලාංකීය සමාජය මේ වැටිලා තිබෙන අඳුරු ඉරණමෙන් එළියට ගැනීම වෙනුවෙන්, අපේ ජනතාවට අලුත් ජීවිතයක් ලබාදීම වෙනුවෙන් සිය කැමැත්තෙන් දේශපාලනය නැමැති වෘත්තිය තෝරා ගත් මිනිස්සු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඈත පිටිසර ගම්වල ඉන්න මිනිස්සු ගැන විතරක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කය ඇතුළේ ඉන්න ජනතාවගේ ජීවිත පිළිබඳවත් කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපි දන්නවා. අපේ කලින් පරම්පරා ගණනාවක් මේ දුකේම ඉපදිලා, මේ දුකේම ජීවත් වෙන හැටි අපි ඇස් දෙකෙන් දැකලා තිබෙනවා. ඒ වාගේම අපට කලින් අපේ වැඩිහිටි පරම්පරාවත්, අපේ මව්පියන්ගේ පරම්පරාවත් මේ දුකේම ඉපදිලා, මේ දුකේම ජීවත් වෙලා, දුකෙන්ම මිය යනවා අපි, අපේ ඇස් දෙකෙන් දැකලා තිබෙනවා. ඒ යථාර්ථය වෙනස් කිරීම තමයි මේ දසවන පාර්ලිමේන්තුවේ ඓතිහාසික වගකීම බවට පත් වෙන්නේ. ඒ නිසා වර්තමාන ජනාධිපතිතුමා විසින් මේ වසරේ පළමුවෙනි දවසේම ඒ වෙනුවෙන් දැවැන්ත සංකල්පයක් සමාජගත කළා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වෙනවා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියලා. පොහොසත් රටක් හැදීම වෙනුවෙන් අපට බොහෝ භෞතික කාරණා එක්ක හැප්පෙන්න වෙනවා; වෙනස් කරන්න වෙනවා. ඇත්ත ආර්ථික ජයග්‍රහණයක් අපි අත්පත් කර ගත යුතුයි. ඒ වාගේම ලස්සන ජීවිතයක් උදා කර ගැනීම වෙනුවෙන් තමයි මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ අපේ සමස්ත ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ස්ථානගත වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තියුණු අවස්ථා උදා වෙනවා. ඉතිහාසය විසින් අපට බල කරලා කියනවා, ඒ තියුණු හැරවුම ඒ සමාජ පැවැත්ම වෙනුවෙන් ගන්න කියලා. දශක ගණනාවක් තිස්සේ වැරදි ආර්ථික ප්‍රතිපත්තියක් අරගෙන ගිය අපේ ආදරණීය රට ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්තියෙන් මුදාගෙන රටත්, සමාජයත් වෙනුවෙන් නිවැරදි හැරවුමක් ලබා ගැනීමේ ඓතිහාසික මොහොතක් දැන් අපට එළඹිලා තිබෙනවා. ඒ නිසා මොන තරම් දුෂ්කර වුණත්, මොන තරම් අසීරු වුණත්, මොන තරම් බාධක ආවත්, ඒ අසීරුම මොහොතේ, ඒ අවශ්‍යම මොහොතේ ඒ තියුණු හැරවුම අපි ලබා ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආර්ථිකමය නොවන පැතිකඩ ආවරණය කරමින් වර්තමාන ආණ්ඩුව විසින් ගෙන යන වැදගත්ම සංකල්පය තමයි Clean Sri Lanka වැඩ පිළිවෙළ. ඒ වැඩ පිළිවෙළේ අන්තර්ගතය ඇතුළේ තිබෙන්නේ අපේ රට පිළිබඳව, අපේ රටේ පුරවැසියා පිළිබඳව, රට තුළත්, ජාත්‍යන්තරය තුළත් මේ ගොඩනැඟිලා තිබෙන වැරදි මතයන්, අවාසිසහගත තත්ත්වයන් වෙනස් කිරීමයි. එනම්, ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් කිව්වාට පස්සේ සිදු වෙන නොසලකා හැරීම, රටක් විදියට බංකොලොත් රාජ්‍යයක් බවට පත් වෙලා මුළු ලෝකයෙන්ම ප්‍රතික්ෂේප වන තත්ත්වයන්, මේ රට පිළිබඳව ගොඩනැඟී තිබෙන මේ වැරදි සහ අයුක්තිසහගත තත්ත්වයන් වෙනස් කිරීම තමයි මෙහි මූලික අරමුණ බවට පත් වෙන්නේ.

නව මිනිසෙක් ගොඩනැඟිය යුතුයි. නව සමාජයක් ගොඩනැඟිය යුතුයි. පැරණි සමාජයත්, පැරණි මිනිසාත් සමඟ තවදුරටත් ඉදිරියට යන්න අපට හැකියාවක් නැහැ. අනෙකා පිළිබඳව හිතන සමාජයක්, පරිසරයට ආදරය කරන සමාජයක්, අනෙකාගේ දුක, වේදනාව පිළිබඳ සංවේදී මනුෂ්‍යයෙක්, ගහ කොළ, සතා සිවුපාවාට ආදරය කරන සමාජයක්, ඒ වෙනුවෙන් සංවේදී සහකම්පනයක් සහිත සමාජයක් අපි ගොඩනැඟිය යුතුයි. ඒ වෙනුවෙන් තමයි මේ වැඩ පිළිවෙළ නිර්මාණය වෙන්නේ. ඉතිහාසයේ පැවති ආණ්ඩු ගෙනාපු විවිධ වර්ගයේ සංකල්ප බොහෝදුරට media shows බවට පත් වුණා. නමුත්, Clean Sri Lanka වැඩ පිළිවෙළ එවැනි එකක් නොවෙයි. මේක අපේ රට දියුණු රාජ්‍යයක්, දියුණු සංස්කෘතියක්, අභිමානවත් දේශයක්, සංවර්ධිත දේශයක් බවට පත් කරන්න හැකියාව ලැබෙන තාක්කල් අරගෙන යා යුතු, ඒ වෙනුවෙන් සකස් කරන ලද වැඩ පිළිවෙළක්. මේක වසරකට දෙකකට, මැතිවරණයක් වෙනුවෙන් ඉලක්ක කරගත් නිකම්ම නිකම් හිස් යෝජනාවක් නොවෙයි. මේක ඉතාම විධිමත්, වැදගත් යෝජනාවක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩි කීයක්ද තිබුණේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සම්පූර්ණ කාලය විනාඩි 12යි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි ජීවත් වන රට දැනට ගොඩබිම ඉන්න විශාලම සත්වයාගෙන් වාගේම කුඩාම සත්වයකුගෙනුත් මිනිසුන් මිය යන රටක්. 2023 අවුරුද්දේ අපේ රටේ මිනිසුන් 180දෙනෙක් මිය යනවා, අලින්ගේ ප්‍රහාරවලට ලක් වීම හේතුවෙන්. ඒ වාගේම කුඩාම සත්වයෙක් වෙච්ච මදුරුවා නිසා ඩෙංගු රෝගයෙන් අපේ රටේ 50දෙනෙක් මිය ගොස් තිබෙනවා. ඒ නිසා ඉතා අවාසනාවන්ත ලෙස මිනිසුන් මිය යන රටක්, මේක.

Global Climate Risk Index එකට අනුව, 2000 වසරේ සිට 2019 දක්වා වූ වසර 19 ඇතුළත ආන්තික කාලගුණ සිදුවීම්වලින් වැඩි වශයෙන් පීඩාවට ලක් වූ රටවල් 184න් අපි 23වන ස්ථානයේ සිටිනවා. ගංවතුර, නායයෑම් වැනි ස්වාභාවික විපත් කියන්නේ, උත්තර නැති ප්‍රශ්න නොවෙයි. නමුත්, දශක ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්නවලට විසඳුම් නැතිව අපේ රටේ ජනතාව අතිවිශාල වශයෙන් පීඩාවට පත්ව සිටිනවා. වසරකට ස්වාභාවික ව්‍යසන නිසා සිදු වන හානිය ඩොලර් මිලියන 300කට වැඩියි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විශාල අර්බුදයක් සහ ගැටලුවක්. ඒ නිසා Clean Sri Lanka වැඩ පිළිවෙළ ගොඩනැගෙන්නේ මේ සියලු තත්ත්ව පිළිබඳව සමාලෝචනය කිරීමෙන් අනතුරුවයි.

මම දැක්කා, පසුගිය පාර්ලිමේන්තුව තුළ මේ පිළිබඳ ඉතා වැරදි සහගත මත මුදා හරිනවා. විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා Clean Sri Lanka වැඩ පිළිවෙළේ ආරම්භක උත්සවය වෙනුවෙන් වියදම් කළ මුදල රුපියල් ලක්ෂ 70කට අධිකයි කියලා ඉතා වැරදි, අසත්‍ය මතයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එතුමා ඒ තරමටම විශාල බොරුවක් සමාජගත කළා. නමුත්, රුපියල් ලක්ෂ 9කට ආසන්න මුදලක් පමණයි ඒ ආරම්භක උත්සවය සඳහා වෙන් කර තිබුණේ. තවම ඒකේ මුදල් ගෙවලාත් නැහැ. ඒ නිසා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, මේ රට ගොඩනැඟීම වෙනුවෙන් වත්මන් ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද මේ ඉතාම කාලෝචිත, වැදගත් වැඩ පිළිවෙළට එකතු වෙන්න කියලා.

ඔබතුමන්ලා සම්ප්‍රදායක් හැටියට ආණ්ඩු පක්ෂය තුළ ඉඳගෙන, වෙනත් ආණ්ඩුවක් බලයට පත් වෙලා ඉන්නකොට ඒ ආණ්ඩුව විසින් සිදු කළ සියලු ව්‍යාපෘතිවලින් සිදු වූ වංචා, දූෂණ පිළිබඳව ප්‍රශ්න කළා. නමුත්, මේ තිබෙන්නේ ජාතික ජන බලවේගයේ පාලනයක්. ඒ නිසා ජනාධිපතිවරයාගේ සිට මේ ඇමතිවරු, මන්ත්‍රීවරු සියලුදෙනාගේ මුළු දේශපාලන දේහයම ගොඩනැඟිලා තිබෙන්නේ හොරකමට, වංචාවට, දූෂණයට එරෙහිවයි. ඒ නිසා ඔබතුමන්ලා කොච්චර zoom in කළත්, කොච්චර නිරීක්ෂණය කළත්, මේ ආණ්ඩුකරණය ඇතුළේ කිසිදු අමාත්‍යාංශයක, කිසිදු විශේෂ වැඩ පිළිවෙළක වංචාවක්, දූෂණයක් ඔබතුමන්ලාට හමු වෙන්නේ නැහැ. ඒ හමු වෙන්නේ නැත්තේ ඔබතුමන්ලාට ඒක අහු වෙන්න බැරි විධියට කරලා නොවෙයි. මේ දේශපාලන ව්‍යාපාරය ගොඩනැඟිලා තිබෙන්නේම ඒකට එරෙහිව නිසා. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, සාම්ප්‍රදායික ලෙස ඒ වැඩ පිළිවෙළට අභියෝග කරනවා වෙනුවට ඔබතුමන්ලාට පැවරුණු මේ ඓතිහාසික කාර්යභාරය වෙනුවෙන් දායක වෙන්න කියලා. මොකද, ඔබතුමන්ලාත් මේ පාර්ලිමේන්තුවේ නියෝජිතයන්, ඔබතුමන්ලාත් විශේෂ පුද්ගලයන්, දෙකෝටි විසිලක්ෂයක ජනතාවගෙන් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙච්ච මහජන නියෝජිතයන්. ඔබතුමන්ලාත් විශේෂ නිසා තමයි මේ ස්ථානය නියෝජනය කරන්නේ.

ඒ නිසා ඔබත්, අපි කවුරුත් නියෝජනය කරන මේ දසවන පාර්ලිමේන්තුවේ අපට පැවරී තිබෙන ඓතිහාසිකම කාර්යභාරය තමයි මේ රටේ ජනතාවගේ ජීවිත වෙනස් කිරීමේ අභියෝගය. Zoom in කරලා, zoom in කරලා ඒත් සොයා ගන්න නැති කැල්ලක් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ අසත්‍ය ප්‍රචාර මුදා හරිනවා වෙනුවට කරුණාකර මේ වැදගත්, සංවේදී වැඩ පිළිවෙළ වෙනුවෙන් ඔබගේ දායකත්වය ලබා දෙන්න කියා අපි ඔබට ආරාධනා කරනවා. ඒ සඳහා ඕනෑම පුරවැසියෙකුට, පෞද්ගලික අංශයේ ඕනෑම සමාගමකට, ඕනෑම රාජ්‍ය ආයතනයකට, ඕනෑම ස්වේච්ඡා සංවිධානයකට, ඕනෑම විදේශගත පුරවැසියෙකුට, විශේෂඥ දැනුම තිබෙන ඕනෑම කෙනෙකුට, තනි තනි පුද්ගලයන්ට පවා දායක වීමේ සැලැස්මක් මේ වැඩ පිළිවෙළ ඇතුළේ අන්තර්ගත වෙනවා. ඒ වාගේම ඔබට ලබා දිය හැකි දායකත්වය ලබා දීමට ඩොලර් ගිණුමක් සහ රුපියල් ගිණුමක් විවෘත කරලා තිබෙනවා. ඒ දෙයට දායක වෙලා මේ දසවැනි පාර්ලිමේන්තුව ඓතිහාසික පාර්ලිමේන්තුවක් බවට පත් කරමු කියන යෝජනාව මේ සභාව හමුවේ තබමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Muneer Mulaffer to second the Adjournment Motion.

[පූ.භා. 11.30]

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමන් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳවයි අද දින මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ. විශේෂයෙන් මෑත කාලවකවානුව තුළ ජනමාධ්‍ය තුළත්, ඒ වාගේම ජනතාව අතරත් විශාල වශයෙන් කතිකාවට ලක් වෙච්ච මාතෘකාවක් බවට Clean Sri Lanka වැඩසටහන පත් වුණා.

අපි සියලු දෙනාම දන්නවා, Clean Sri Lanka වැඩසටහන තුළින් බලාපොරොත්තු වෙන්නේ හැම කෙනාටම පොහොසත්

[ගරු මුනීර් මුලාෆර් මහතා]

රටක් ලස්සන ජීවිතයක් උරුම කර දීම බව. පසුගිය දවස්වල සමහර මාධ්‍ය ආයතන, සමහර බංකොලොත් දේශපාලන නායකයන්, ඒ දේශපාලන පක්ෂවල පිරිස් Clean Sri Lanka කියන මේ වැඩසටහන පටු කරන්න හැදුවා. එහෙම නැත්නම් ඒ ගොල්ලන් දේශපාලනය තුළ හැම දාම කරපු විධියට පටු තැනකින් අල්ලා ගත්තා. ත්‍රිරෝද රථවල සමහර කැලි ගලවන තත්ත්වයට, එහෙම නැත්නම් බස්වල කැලි ගලවන තත්ත්වයට ඒගොල්ලන් Clean Sri Lanka වැඩසටහන පටු කරන්න ගත්තා. හැබැයි, අවුරුදු 76ක් තිස්සේ ආර්ථික වශයෙන් බංකොලොත් කර, සාමාජීය වශයෙන් පිරිහීමට පත් කර විනාශ කරපු මේ රට ඒ අඩියෙන් වෙනස් තලයකට ගෙනැවිත් රටේ සියලු ජනතාවගේ ජීවිත යහපත් තැනකට පත් කරන්න අවශ්‍ය අඩිතාලම දමා ගන්නා ප්‍රධාන පියවරවලින් එකක් බවට මේ Clean Sri Lanka වැඩසටහන පත් වෙනවා.

Clean Sri Lanka වැඩසටහන පිළිබඳ සමාජය තුළ කතිකාවත් ගොඩනැඟෙන විට මම හරි ලස්සන සටහනක් සමාජ මාධ්‍ය තුළ දැක්කා. ඒ තමයි, "ශිෂ්ට සම්පන්න සමාජයක් ආරම්භ වීමේදී වැඩියෙන්ම කලබලයට පත් වෙන්නේ අශිෂ්ට සමාජයක් තුළ සිය පැවැත්ම තහවුරු කර ගත්තවුන්ය" කියන සටහන. ජාති, කුල මල භේදයකින් තොරව, පක්ෂ භේදයකින් තොරව මේ රටේ හැම කෙනාගේම බලාපොරොත්තුව තමයි සදාචාර සම්පන්න, ශිෂ්ට සම්පන්න, නීතිගරුක සමාජයක් බිහිවිය යුතුයි කියන එක. හැබැයි, අශිෂ්ට සමාජයක් නිර්මාණය කරපු, ඒ අශිෂ්ට සමාජය වෙනුවෙන් පෙනී හිටපු, ඒ අශිෂ්ට සමාජය තවදුරටත් පවත්වා ගැනීමට වෙර දරන පිරිස්වලට මේ සමාජය ශිෂ්ට වීම පිළිබඳ විශාල ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව නිසා තමයි ඒගොල්ලන් පසුගිය දවස්වල Clean Sri Lanka වැඩසටහන අතැනට තල්ලු කරන්න හැදුවේ.

Clean Sri Lanka වැඩසටහන තිරසාර රාමුවක් මත ගොඩනැගෙනවා. එයින් අපේක්ෂා කරන වෙනස මතු පිට වෙනසක් නොවෙයි. ඒ වෙනස පරම්පරාගත වෙනසක්. ඒ වාගේම එය වසර කිහිපයක වෙනසක් නොව, විශේෂයෙන්ම සමස්ත මානව සමාජයේ වෙනසක් බවට පත් කිරීමයි අපේ බලාපොරොත්තුව. මම දැක්කා සමහරු Clean Sri Lanka වැඩසටහන පිළිබඳව කථා කරද්දී "clean" කියන වචනය පිළිබඳවත් මාධ්‍ය තුළ අදහස් දක්වා තිබුණු ආකාරය.

විශේෂයෙන්ම අපි මෙතැනදී මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. ශ්‍රේෂ්ඨ ආගම් කිහිපයක් නියෝජනය කරන රටක් වන අපේ රටේ එම ඉතිහාසය දෙස බලන විට අපට පෙනී යනවා, ඒ ශාස්තෘවරුන්ගේ ප්‍රධාන වගකීම බවට පත් වුණේත් සමාජය එක්තරා විධියකට clean කිරීම බව. ඒ ශාස්තෘවරුන් පවා සමාජය පවිත්‍ර කිරීම වෙනුවෙන්, සමාජයේ පිවිතුරුභාවය වෙනුවෙන් විශාල වෙහෙසක් ගත් පිරිසක් බව අපට බය නැතුව කියන්න පුළුවන්. Clean Sri Lanka වැඩසටහන ඔස්සේ විශේෂයෙන්ම මේ රටේ ක්ෂේත්‍ර ගණනාවක් අලුත් තැනකට, නිවැරදි තැනකට, හරි තැනකට පත් කළ යුතුයි.

අද බොහෝ දෙනා ප්‍රශ්න කරනවා, අපි බලයට පත් වෙලා මේ කාලය තුළ මොකක්ද කළේ කියලා. හැබැයි, එසේ ප්‍රශ්න කරන අයට ඒ පිළිබඳව අවබෝධයක් නැති වුණාට, අපව විශ්වාස කරමින්, බලාපොරොත්තු තබා ගනිමින් අපට ඡන්දය දීපු රටේ සියලු ජනතාවගේ විශ්වාසය කඩ නොකර එලෙසින්ම තබා ගනිමින් එම විශ්වාසය සාක්ෂාත් වන අයුරින් වැඩ කරන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා.

පසුගිය දවස්වල පාර්ලිමේන්තුව තුළ සමහරුන්ගේ කෙඳිරිගෑමක් අපට ඇහුණා, අපි මාධ්‍ය මර්දනය කරනවා කියලා, අපි මාධ්‍ය මර්දනය සඳහා සූදානම් වෙනවා කියලා. හැබැයි, එසේ කෙඳිරි ගාන අයට අමතක වෙලා තිබෙනවා, 2008 වසරේ අධිආරක්ෂිත කලාපයේදී මාධ්‍යවේදීන් ඝාතනය වීම පිළිබඳව, පහර දීම් පිළිබඳව, මාධ්‍ය ආයතනවලට ගිනි තැබීම් පිළිබඳව, බෝම්බ ගැසීම් සිද්ධ කළේ කාගේ යුගයේ ද, මාධ්‍යයට එතරම් දැඩි ප්‍රහාර එල්ල කළේ කාගේ යුගයේ ද කියන කාරණා පිළිබඳව. ඒවා අර කෙඳිරි ගාන අයට අද අමතක වෙලා තිබෙනවා.

Clean Sri Lanka වැඩසටහන මේ රටේ වෙසෙන කිසිම කෙනෙකුට එරෙහි වැඩසටහනක් නොවෙයි. මේ වැඩසටහන සියල්ලන් වෙනුවෙන් ගොඩනඟපු වැඩසටහනක් කියන එක මා ඉතා පැහැදිලිව කියන්න කැමැතියි. ඒ නිසා කවුරුත් කලබල වෙන්න අවශ්‍ය නැහැ. අපි දන්නවා, ජාතික ජන බලවේගයේ ජයග්‍රහණයට අපේ ත්‍රිරෝද රථ රියැදුරු මහත්වරුන් විශාල කැප කිරීමක් කළ බව, අපට විශාල සහයෝගයක් ලබා දුන් බව. ඒ වාගේම, බස් කර්මාන්තයෙහි යෙදෙන රියැදුරු මහත්වරුන්, කොන්දොස්තර මහත්වරුන් අපට විශාල සහයෝගයක් ලබා දුන් බව අපි හැම කෙනාම මතකයේ තබා ගෙන ඉන්නවා. සමහරු විවිධ දේවල් කථා කළාට, කෙඳිරි ගෑවාට ඒ සියලුදෙනාත් දන්නවා, ජාතික ජන බලවේගය කියන මේ ආණ්ඩුව ජනතා විරෝධී හෝ මොනයම් හෝ පාර්ශ්වයකට විරුද්ධ ආණ්ඩුවක් නොව, සියලු ජනතාව ඒක රාශි කරමින්, එකට ගමනක් යන ආණ්ඩුවක් බව. අපට ඒක පැහැදිලිව කියන්න පුළුවන්. ඒ නිසා කිසි කෙනෙක් Clean Sri Lanka වැඩසටහන පිළිබඳව කලබල විය යුතු නැහැ. විශේෂයෙන්ම ඔබ අප හැම කෙනාම දන්නවා, ඉතිහාසය පුරාවට මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් ඇතැම් අය යම් යම් පාර්ශ්ව ඈත් කර තබා විවේචනය කරමින්, සැකය ඇති කරලා, ඒ වාගේම අවිශ්වාසය ගොඩනඟලා බලය ලබා ගත්තා කියන කාරණය.

හැබැයි, ජාතික ජන බලවේගය - අපි - බලය ලබා ගැනීම වෙනුවෙන් හැම දාමත් ජනතාව අතර විශ්වාසය ගොඩ නැඟුවා. අපේ ව්‍යාපාරය ජනතාව අතර මානව බැඳීම් ශක්තිමත් කරපු ව්‍යාපාරයක් ලෙස අපට ආඩම්බරයෙන් හඳුන්වන්න පුළුවන්. ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා, "මානව ලෝකය යනු තනි මනුස්සයෙක් වාගෙයි" කියලා. අපේ ශරීරයේ එක කොටසකට වේදනාවක් දැනුණා නම් මුළු ශරීරයම ඒ වේදනාව අත් විඳිනවා. ඒ වාගේම තමයි, මේ ශ්‍රී ලාංකික සමාජය තුළ යම් පිරිසක් ඈත් කර තබා මේ රට නිවැරදි තැනකට තල්ලු කරන්න අපට බැහැ. ඒක තේරුම් ගත් ව්‍යාපාරයක් ලෙස Clean Sri Lanka වැඩසටහන තුළ අප සියලු දෙනා ඒක රාශි කරගෙන යන වැඩ පිළිවෙළක් තිබෙනවා. අප බලය ලබා ගත්තාට පස්සේ විවිධ ක්ෂේත්‍රවලට ලබා දෙන්න පුළුවන් උපරිම සහන ලබා දී තිබෙනවා. ඉදිරියේදීත් එලෙසින්ම ඒ සහන ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

Clean Sri Lanka වැඩසටහන තුළින් අප බලාපොරොත්තු වන ප්‍රධාන කරුණුවලින් එක් කාරණාවක් මා කියන්නම්. ඇයි අපට clean ශ්‍රී ලංකාවක් අවශ්‍ය වන්නේ? එවැන්නක් අවශ්‍ය හේතුව මෙයයි. අපේ රට සමාජයීය වශයෙන්, පාරිසරික වශයෙන්, සදාචාරාත්මක වශයෙන් කොතැනට වැටී තිබුණා ද කියන එක අපි හැම කෙනාම දන්නවා. සහකම්පනයක් නොමැති සමාජයක් අපට ඉතිරි කළා. ඒ වාගේම, එකිනෙකාට ගෞරවය නොමැති සමාජයක් අපට ඉතිරි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පරිසරය පිළිබඳව නොසැලකිල්ලෙන් කටයුතු කරන සමාජයක් අපට ඉතිරි වෙලා තිබෙනවා. මේ සියල්ල වෙනස් කළ යුතුයි; වෙනස් විය යුතුයි. නබිතුමන්ගේ ප්‍රසිද්ධ වදනක් තිබෙනවා, "ශරීරයේ මස් කැබැල්ලක් තිබෙනවා. ඒක පවිත්‍ර වුණා නම් මුළු ජීවිතයම පවිත්‍ර වෙනවා. මුළු පරිසරයම පවිත්‍ර වෙනවා. ඒක අපවිත්‍ර වුණා නම් මුළු ජීවිතයම අපවිත්‍ර වෙනවා. ඒ වාගේම මුළු පරිසරයම අපවිත්‍ර වෙනවා" කියලා.

Clean Sri Lanka වැඩසටහන යනු ත්‍රීවිල්වල හෝ බස්වල තිබෙන කැලි අයින් කරන දෙයක් කියන පටු තැනකට යන්න හොඳ නැහැ. එය තනි පුද්ගල, පවුල්, ආයතන, රටම වෙනස්ම තැනකට පත් කරන ව්‍යායාමයක් කියන එක මා ඉතා පැහැදිලිව කියන්න කැමැතියි. ඒ ව්‍යායාමයට මේ රටේ සමස්තයම කැමැතියි. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි හැම කෙනාම කැමැතියි, පවිත්‍ර තැනකට යන්න; පවිත්‍ර ප්‍රදේශවලට යන්න. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" අපට උරුම වෙන්න ඕනෑ නම් ශ්‍රී ලාංකිකයන් ලෙස අපට තිබෙන ප්‍රධාන වගකීම තමයි අපි මේ රට clean කරන එක. සෑම ක්ෂේත්‍රයකම clean කළ යුතුයි. ඒ වෙනුවෙන් අප හැම කෙනාම එකතු වෙලා ජාති, කුල, ආගම් භේදයෙන් තොරව, භාෂා භේදයෙන් තොරව, දේශපාලන භේදයෙන් තොරව අපට ලැබී තිබෙන මේ ස්වර්ණමය අවස්ථාව පාවිච්චි කරමින් එකමුතුව මේ රට හරිම තැනට ගෙන යමු, දුක් විඳින, පීඩා විඳින හැම කෙනාටම ඒ ලස්සන ජීවිතය උරුම කර දීම වෙනුවෙන් කටයුතු කරමු කියා ආරාධනා කරමින් මම නතර වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Nalin Bandara Jayamaha. You have 12 minutes.

[පූ.භා. 11.42]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ස්තුතිවන්ත වෙනවා, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වන Clean Sri Lanka වැඩසටහන පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව උදා ලබා දීම ගැන. Clean Sri Lanka වැඩසටහන පිළිබඳ ආණ්ඩුවේ දැක්ම, මෙහෙවර මොකක්ද කියන එක පිළිබඳව අපට තවම හරි අවබෝධයක් නැහැ. ඒ වාගේම රාජ්‍ය යන්ත්‍රණයේ ඉන්න රාජ්‍ය නිලධාරින්ට, ආණ්ඩුකාරවරුන්ට, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට මේ පිළිබඳ හරි දැනුවත්භාවයක් නැහැ. මම දන්නේ නැහැ, අද මේ විවාදය පැවැත්වෙන්නේ ඒ දැනුවත්භාවය මේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න ද කියලා. මේ පිළිබඳ දැක්ම නිවැරැදිව කියවා ගන්න පුළුවන් වුණොත්, මෙහෙවර නිවැරැදිව හඳුනා ගන්න පුළුවන් වුණොත්, මෙය කුමන මට්ටමක එකක් ද, මෙහි value එක මොකක්ද කියන එක පිළිබඳව අවබෝධ කර ගන්න පුළුවන් වුණොත්, ඒ වාගේම මෙයට තිබෙන බාධා, ශක්තීන්, දුර්වලතා, තර්ජන අවස්ථා හඳුනා ගන්න පුළුවන් වුණොත් අපට නිවැරැදි විවාදයකට යන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම, මේ සඳහා තවත් ඉතාම වැදගත් දෙයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනවා කරන්න ගියත් අරමුදලක් තිබෙන්න ඕනෑ; Vote එකක් තිබෙන්න ඕනෑ. එක්කෝ, රජයෙන් මුදල් වෙන් කරන්න ඕනෑ. එහෙම නැත්නම්, පරිත්‍යාගශීලීන්ගෙන් මුදල් ලැබෙන්න ඕනෑ. ඒ දවස්වල ඔබතුමන්ලා කිව්වේ ඩොලර් 500 ගාණේ පිට රට ඉන්න අයගෙන් ගෙන්වා ගන්නවා කියලයි. එවැනි මොකක් හෝ ක්‍රමයකින් මේකට මුදල් අවශ්‍යයි. ඒ මුදල් ලබා ගන්නේ කොහොමද? ඊයේ-පෙරේදා ඇමෙරිකාවේ වර්තමාන ජනාධිපතිතුමා "America the Beautiful" කියලා මේ වාගේම concept එකක් ගෙනාවා. ඒකේ activity list එකක් තිබෙනවා. ඒකේ කරුණු එක, දෙක, තුන, හතර කියලා, 10ක, 12ක විතර activity list එකක් තිබෙනවා. මෙන්න මේ කරුණු මූලික කරගෙන තමයි "America the Beautiful" කියන වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. දැන් මොකක්ද ඔබතුමන්ලාගේ activity list එක? ඒක එක එක්කෙනාට එක එක විධියට පේනවා. පොලීසියේ අයට පේනවා, ත්‍රීවිල්වල කැලි ගලවන එක, බස්වල කැලි ගලවන එක තමයි Clean Sri Lanka වැඩසටහන කියලා. රාජ්‍ය සේවකයන්ට පේනවා, ටයි එක දාගෙන පාර ශුද්ධ කරන එක, කාණු ශුද්ධ කරන එක Clean Sri Lanka වැඩසටහන කියලා. සමහර ඇමතිවරුන්ට පේන්න පුළුවන් වැවේ, කාණුවේ පාසි ඉවත් කරන එක, සැල්විනියා ඉවත් කරන එක Clean Sri Lanka වැඩසටහන කියලා. එම නිසා මේ සමස්ත වැඩසටහන පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ඉතාම වැදගත්. අපි දැක්කා, ගිය බදාදා සමහර රාජ්‍ය ආයතනවල නිලධාරින් තමන්ගේ ආයතන ශුද්ධ කළ ආකාරය. එතකොට ඒ රාජ්‍ය ආයතතනවල නිලධාරින් ඊළඟ බදාදාත් මේ විධියට ශුද්ධ කරනවා ද? ශුද්ධ කරන ඒ කුණුවලට මොනවාද ඊළඟට කරන්නේ? දැන් වාහනවල spare parts ගැලෙව්වා. මේ spare parts රටට ගේන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා වාගේම ඒ සමහර ඒවා රට තුළ නිෂ්පාදනය වෙනවා. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ අනවශ්‍ය කොටස් රට ඇතුළට එන එක නතර කරලා අපට Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න පුළුවන්. එහෙම නැත්නම්, ඒ නිෂ්පාදන අධෛර්යවත් කරන්න පුළුවන්. එතකොට පොලීසියට මේ අනවශ්‍ය කැලි ගලවන්න වෙන්නේ නැහැ. ඒ නිසා අපට පේන්නේ නැහැ, මෙතැන නිවැරදි වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා කියලා.

ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, ඔබතුමන්ලාට Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න නිවැරදි තැනක් තිබුණා. අපි හිතුවා ඔබතුමන්ලා එතැනින් පටන් ගනීවි කියලා. ඒ මොකක්ද? ඔබතුමාම පසුගිය කාලයේ මහා අඩබෙරයක් ගහලා කිව්වා, වයින් සටෝර්ස් බලපත්‍ර විශාල ප්‍රමාණයක්, -300ක් ද, කීයක් ද කියලා මම දන්නේ නැහැ- දේශපාලන හිතවතුන්ට, හෙංචයියන්ට දීලා තිබෙනවා කියලා. ඔබතුමා කිව්වා, ඒ තොරතුරු පහුව දාට සභාගත කරනවා කියලා. හැබැයි, ඒ ලැයිස්තුව බලපුවාම දේශපාලන නම් දෙකක්, තුනක් තිබුණා. අනෙක් නම් කාගේද කියලා සොයා ගන්න බැහැ. ඒ නම් අතර එක නමක් තිබෙනවා මම දැක්කා, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයකුගේ නමට සමපාත වෙන නමක්. මම කියන්නේ නැහැ ඒ තිබුණේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයාගේ නම කියලා. මම හිතන්නේ නැහැ ඒ එතුමා කියලා. ඊට පස්සේ අපි කිව්වා, ඒ හරි නම් ටික හොයලා දෙන්න කියලා. හැබැයි, ඒ ගැන මොකුත් කථාවක් නැහැ. ඊළඟට අපි ඇහුවා, ඔබතුමා ඒ වයින් සටෝර්ස් බලපත්‍ර අහෝසි කරනවා ද කියලා. අහෝසි කරනවා කියලා කිව්වා ඒ වෙලාවේ. දැන් ඒ ගැන හාවක් හුවක් නැහැ. ඔබතුමන්ලාට Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න තිබුණා, එතැනින්. රනිල් වික්‍රමසිංහ මහත්මයා දේශපාලන හෙංචයියන්ට වයින් සටෝර්ස් බලපත්‍ර 300 ගාණක් දුන්නා නම්, ඔබතුමන්ලාට එතැනින් Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න තිබුණා. ඒක වුණේ නැහැ නේ. දැන් අපට හිතෙන්නේ නැද්ද මේ බාර්කාරයෝ මේ ආණ්ඩුවත් අල්ලාගෙන කියලා? එහෙම හිතන්න පුළුවන් නේ. අපි පැත්තකට දාන්නකෝ. ඔබතුමන්ලාට ඡන්දය දුන්නු ජනතාවට හිතෙන්න පුළුවන් නේ, බාර් ලයිසන් අයින් කරනවා කියලා කිව්වා, නමුත් ඒක වෙලා නැහැ නේ කියලා. Clean Sri Lanka වැඩසටහන එතැනින් පටන් ගන්න තිබුණා නේ.

ඊළඟට, ඔබතුමන්ලා ETCA ගැන කථා කළා. ETCA කියන්නේ දැවැන්ත, භයානක, බූවල්ලෙක්, භූතයෙක්, පෙරේතයෙක් විධියට තමයි දැක්කේ. ඔබතුමන්ලා කියපු විධියට ඔබතුමන්ලාට ETCA එක වෙනස් කරන්න තිබුණා. Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න තිබුණා ETCA එකෙන්. ජනාධිපතිතුමා ඉන්දියාටත් ගිහිල්ලා ආවා නේ. ඒ වාගේම සිංගප්පූරු ගිවිසුම මහා භයානක රකුසෙක් කියලා පෙන්නුවා. Clean Sri Lanka එතැනින් පටන් ගන්නත් තිබුණා නේ. ඒ ගිවිසුම් වෙනස් කරන්න තිබුණා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ඒ වාගේම තමයි, හාල් මාෆියාව. Clean Sri Lanka වැඩසටහනට මේ මාෆියාවත් ඇතුළත්. හාල් මාෆියාව ශුද්ධ කරන එක, හාල් මාෆියාව නතර කරන එකත් මේකට ඇතුළත්. ඔබතුමන්ලාට ඒකවත් නතර කර ගන්න බැරුව ගියා නේ.

එවැනි තවත් මාෆියා ගණනාවක්ම තිබෙනවා. එකක් තමයි, විදුලි මාෆියාව. ඔබතුමන්ලාගේ විදුලිබල ඇමතිවරයා ගිය සතියේ කිව්වා, අවුරුදු 3ක් යනකම් විදුලි බිල අඩු කරන්නේ නැහැ කියලා.

හැබැයි, ඔය කියන 76 අවුරුදු ශාපය ඇතුළේ එදා කරු ජයසූරිය විදුලිබල ඇමතිවරයා විධියට ගෙනාපු PUCSL එකෙන් විදුලි බිල අඩු කළා. විදුලි බිල අඩු කළා! ඇමතිවරයා කිව්වා අඩු කරන්නේ නැහැ කියලා. හැබැයි අවුරුදු 76 ශාපය තුළ මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරපු PUCSL එකට පින් සිද්ධ වෙන්න මේ රටේ ජනතාවගේ විදුලි බිලට සහනයක් ලැබුණා. ඒක ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ලැබුණා, වතුකරයේ ඉන්න ජනතාවටත් ලැබුණා, කර්මාන්තකරුවාටත් ලැබුණා. ඒ නිසා ඒ මාෆියා සුද්ධ කරන එක හරි වැදගත්.

ඊළඟට ඖෂධ මාෆියාව. නලින්ද ජයතිස්ස ඇමතිතුමාට විශාල වගකීමක් තිබෙනවා, ඖෂධ මාෆියාව නැති කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. මම කියන්නේ නැහැ මාසෙන්, දෙකෙන් ඖෂධ මාෆියාව නැති කරන්න පුළුවන් වෙයි කියලා. Clean Sri Lanka වැඩසටහන යටතේ මේ වාගේ මාෆියා අවසන් කිරීමත් ඉතා වැදගත්. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නමත් කියපු නිසා මම මේ කථා කරන්නේ. මේ දවස්වල ඖෂධයක් ගැන මහත් ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා නේද, රුපියල් 76,000 එකක් රුපියල් 370ට අඩු වුණා කියලා? ගරු මන්ත්‍රීතුමනි, ඒ සමාගම ගැන ඔබතුමාගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන අලවතුවල මන්ත්‍රීතුමාගෙන් ඇහුවා නම් හරි. එතුමා හොඳටම දන්නවා, ඒ සමාගම මොකක්ද, ඒ සමාගමේ අයිතිකරුවා කවුද, කලින් කොහොමද රුපියල් 76,000ට ගෙනාවේ, දැන් කොහොමද ඒ මිල අඩු වුණේ කියලා. ඒ නිසා වැඩිමනත් විස්තර අලවතුවල මන්ත්‍රීතුමාගෙන් අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මම කැබිනට් ඇමතිවරයා කියලා හිතාගෙනද මන්දා ඔබතුමා එහෙම කියන්නේ. මම කැබිනට් ඇමති නොවෙයි. මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. රුපියල් 76,000 ඖෂධය රුපියල් 370ට අඩු වුණා නම් ඒ ගැන අලවතුවලගෙන්ද, අලකඩවලගෙන්ද අහන එක නොවෙයි, ඔබතුමා අදාළ ක්‍රියාමාර්ග ගැනීමයි වැදගත් වෙන්නේ. ඔය විධියටම තමයි ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, ඔබතුමන්ලා අර බාර් ලයිසන් කථාවේදිත් කිව්වේ. ඔබතුමන්ලා ඒ ලැයිස්තු දෙනවා කිව්වා, අරවා කිව්වා, මේවා කිව්වා. ඊට පස්සේ බෝල පාස් කළා. දැන් බාර්කාරයෝ ආණ්ඩුව අල්ලාගෙනද දන්නේ නැහැ. එහෙම හිතෙනවා නේ අපට. ඒ නිසා වටෙන් ගහන්න එපා. කවුරු හරි වරදක් කරලා තිබෙනවා නම්, වංචාවක් වෙලා තිබෙනවා නම්, මාෆියාවක් තිබෙනවා නම් මාෆියාව නැති කරන්න. ඔබතුමන්ලාට ආසන 159ක බලය දීලා තිබෙනවා. අපේ අතක් උස්සාගන්නේම නැතුව ඔබතුමන්ලාට තනියම වැඩේ කරන්න පුළුවන්. අපේ දශමෙක සහයෝගයක් නැතුව ඔබතුමන්ලාට වැඩේ කරන්න පුළුවන්. ඒ නිසා මෙහේට ඇඟිල්ල දික් කරන්න එපා. 76 වසරක ශාපය ගැන දැන් කියන්නත් එපා. ඔබතුමන්ලාට රටේ ජනතාව - ඇඬෙන්න ඉල්ලුවා නේ - ඇඬෙන්න දීලා තිබෙනවා. දැන් අඬන්න එපා. දැන් අඬන්නේ නැතුව වැඩේ කරන්න. ආයේ කථා කරන්න දෙයක් නැහැ. දැන් එහාට මෙහාට බෝල පාස් කරන්න එපා. අරෙහෙද, මෙහෙද, කුරුණෑගලද කියන ඒවා වැඩක් නැහැ. වැරදිකරුවන් ඉන්නවා නම් දඬුවම් කරන්න, නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, ඔබතුමන්ලාට බලය දීලා තිබෙනවා නේ.

මීට මාස දෙකකට කලින් කියපු බාර් ලයිසන් කතන්දරේ ගැන දැන් කට වහගෙන ඉන්නවා නේ. ඒක ගැන දැන් ඔබතුමා වෙන ඒවා කියනවා. *[බාධා කිරීමක්]* දාන්න ඒ ලැයිස්තු. වෙලාව මොනවාටද මහත්තයෝ තවත්? ආණ්ඩුවට දවස් 120ක් පැනලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* පැය 48න් කරනවා කිව්වේ. දැන් දවස් 120ත් පැනලා; පෝය 4ක් පැනලා. ඒ නිසා මේ බයිලා එපා. ඔබතුමන්ලාගේ කථාව ක්‍රියාවට නැංවීමට දැන් ඕනෑතරම් කාල වෙලාව ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා කථාකාරයෝ, දක්ෂ කථිකයෝ. ඒ කථාව දැන් ක්‍රියාත්මක කරන්න. ඒවා යථාර්ථයක් බවට පත් කරන්න. දැන් ඔබතුමන්ලාට තිබෙන්නේ වැඩ කරන්න. වැඩ කරන්න තිබෙන්නේ. ඒ නිසා ඒවා ක්‍රියාත්මක කරන්න.

ඊළඟට, විදුලි මාෆියාව ගැන කථා කරනවා. අපි දන්නවා, විදුලි මාෆියාවක් තිබෙන බව. මම කියන්නේ නැහැ, ඒකේ ඉන්න සියලු ඉංජිනේරුවෝ සම්බන්ධයි කියලා. ඒකේ වෘත්තීය සමිති නායකයෙක් අපේ රන්ජන් ජයලාල් මහත්තයා. අපි බලාගෙන හිටියා එතුමා ජාතික ලැයිස්තුවෙන් මේ පාර්ලිමේන්තුවට එයි කියලා. අපටත් එතුමාත් එක්ක තිබෙනවා වාදයක්, විවාදයක්, සංවාදයක්. නමුත් එතුමා ගත්තේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
කැපුවා. කැපුවා. හිනාවෙන එක්කෙනා තමයි කැපුවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නමුත් දැන් මට හිතෙනවා එතුමාද විදුලිබල ඇමති කියලා. විදුලිබල ඇමතිවරයාට වඩා බලයක් එතුමා විදුලිබල මණ්ඩලය ඇතුළේ ක්‍රියාත්මක කරනවා. විදුලිබල මාෆියාවට විරුද්ධව කටයුතු කරන්න. ඔය system control එකේ ඉඳන් කරන ගේම් ටිකෙන්, එක්කෙනෙක්, දෙන්නෙක් ගහන ගේමෙන්; රුපියලෙන්, දෙකෙන්, මිලියන, බිලියන ගණන් යන්නේ. ඩීසල් මාෆියාව ගැන අපි දන්නවා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
විදුලි බිල අඩු කළා; අඩු කරලා තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අඩු කළේ ඔබතුමන්ලා නොවෙයි නේ. PUCSL එකෙන් නේ. ඇමතිවරයා ගිය සතියේ කිව්වා නේ, අවුරුදු තුනක් යනකම් විදුලි බිල අඩු කරන්නේ නැහැ කියලා. ඇමතිවරයා බැහැ කිව්වා අඩු කරන්න. අර කුමාර ඉංජිනේරු මහත්තයා කිව්වා බැහැ කියලා. හැබැයි PUCSL එකෙන් අඩු කළා. ඔබතුමන්ලාට දැන් තිබෙන්නේ වැඩ කරන්න. ඒ නිසා ඉස්සෙල්ලාම අපට පැහැදිලිව, හරියට දෙන්න, Clean Sri Lanka කියන්නේ මොකක්ද කියන එක. ඒක ගැන අපි විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඔබතුමන්ලාගේ 159දෙනාවත් හරියට දන්නවාද කියලා මම දන්නේ නැහැ.

මම දැන් එක්කෙනෙකුගෙන් දෙන්නෙකුගෙන් ඇහුවා. එතුමන්ලාටත් මේ ගැන හරියටම පැහැදිලි කරන්න බැහැ. රාජ්‍ය ආයතනවල ඉන්න අය දන්නේත් නැහැ. කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී Clean Sri Lanka ගැන කියන එක නොවෙයි, පුත්තලමට ගිහිල්ලා කියන්නේ. එහෙම වෙන්න බැහැ. දෙකම එකක් වෙන්න ඕනෑ නේ. පුත්තලමේ තිබෙන්නේ, වෙන වටපිටාවක්. කුරුණෑගල තිබෙන්නේ, තවත් වටපිටාවක්. ඒ නිසා මේ පිළිබඳව තවම හරියටම හඳුනා ගෙන නැහැ කියලා අපට පෙනෙනවා. වඩා වැදගත් වෙන්නේ, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ඇති කිරීම. ඒ තුළ Clean Sri Lanka තිබෙන්න ඕනෑ. ඒ තුළ Clean Sri Lanka තිබෙනවා නම්, අකුරක් අකුරක් නැර, ඉස්පිල්ලක්, පාපිල්ලක්, කොමාවක්, කොම්බුවක් නැර ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. අන්න ඒ ක්‍රියාත්මක වීම තුළින් තමයි Clean Sri Lanka වැඩසටහන යථාර්ථයක් බවට පත් වෙනවා කියලා අපි දකින්නේ. ඒකයි වෙන්න ඕනෑ. ඉතින්, ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා කියලා මේ මාස 4දි නම් අපි දැක්කේ නැහැ. ඔබතුමන්ලා වමට සිග්නල් දාලා දකුණට හරවා තිබෙනවා. ඔබතුමන්ලා පිටුපසින් ආපු අය අතර මං වෙලා තිබෙනවා. එහෙම තමයි අපට නම් පෙනෙන්නේ.

ඔබතුමන්ලා ඉන්දියාවට ගිහිල්ලා සියලු එකඟතාවලට අත්සන් කර තිබෙනවා. චීනයට ගිහිල්ලා oil refinery එක ගැන සාකච්ඡා කළා. මමත් නියෝජ්‍ය ඇමතිවරයෙක් විධියට හිටියා, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ. ඔය ආයෝජකයා අපේ කාලෙත් ආයෝජනය කරන්න ආවා. ඒ ගැන කථා කළා. හැබැයි, ක්‍රියාත්මක වුණේ නැහැ. ඊට කලිනුත් ඇවිල්ලා තිබෙනවා; කථා කර තිබෙනවා. හැබැයි, ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මිස මේ ගැන අඩබෙර ගහන එක නොවෙයි වැදගත් වෙන්නේ. ඒ oil refinery එක සම්බන්ධයෙන් agreement එකක් ගැහුවාද? ඒ පිරිපහදු කරන තෙල් ලංකාවේ පාවිච්චි කරනවාද? මම දන්න විධියට නම් ඒ වෙලාවේ ඒ ආයෝජකයා ආවේ ඒක 100 per centම export කරන්න, එහෙම නැත්නම් offshore පාවිච්චි කරන්න. හැබැයි, ඔබතුමන්ලා අපට පෙන්නුවේ, මේ හරහා අපට මහා වරප්‍රසාදයක් ලැබෙනවා, අපේ රටේ ජනතාවට වාසියක් වෙනවා කියලායි. ඒ පිළිබඳව ඔබතුමන්ලා ළඟ පැහැදිලි ගිවිසුමක් තිබෙනවා නම්, ඒක ජයග්‍රහණයක් නම්, ඒක අපට දකින්න දෙන්න. එතකොට අපට පුළුවන් එය සභාගත කරන්න. නමුත්, ඒවා පේන්නේ නැහැ. ඒ නිසා අපට තවම පෙනෙන්නේ නැහැ, මේ Clean Sri Lanka වැඩසටහන මොකක්ද කියලා. ඒකේ තිබෙන පුළුල් චිත්‍රය පෙනෙන්නේ නැහැ. එක එක්කෙනාට එක එක විධියටයි පෙනෙන්නේ.

ඔබතුමන්ලාගේ පැත්තේ වතුකරය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් ඇතුළු කණ්ඩායමක් ඉන්නවා. ඔබතුමන්ලාට මේ වැඩසටහන පටන් ගන්න පුළුවන් ලයින් කාමරයෙන්. මිනිස්සුන්ගේ ජන ජීවිත නම් පිරිසිදු කරන්නේ, සොම්නසින් පිරි ජනතාවක් නම් අපි බලාපොරොත්තු වෙන්නේ, වතුකරයේ ඉන්න ජනතාව ලැයිමෙන් එළියට ගන්න. ඒ සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. මේ අය වැයෙන් ඒවාට මුදල් වෙන් වෙයිද කියලා අපි බලාගෙන ඉන්නවා. කොළඹ නගරය තුළ වතු ජනතාව තවමත් ඉන්නවා. අර වත්ත, මේ වත්ත කියයි. මම ඒවායේ නම් කියන්නේ නැහැ. ඒ ජනතාව එතැනින් එළියට ගන්න. ඒ ජන ජීවිත පහසු කරන්න, ඒ ජන ජීවිත මීට වඩා හොඳ තැනකට ඔසවා තැබීමේ හැකියාවක් මේ වැඩසටහන තුළ තිබෙනවාද? තිබෙනවා නම් ඒ ගැන අපට කියන්න. හැබැයි, එහෙම දෙයක් අපට නම් පෙනෙන්නේ නැහැ.

ජන වරම අනුව කටයුතු කරන්න මේ රජයට විශාල වගකීමක් තිබෙනවා. ගොවි ජනතාව ඔබතුමන්ලාගේ විශාල වපසරියක් ආවරණය කළා. හැබැයි, ගොවි ජනතාවට තවමත් පොහොර ටික ලැබිලා නැහැ. යම් යම් කොටස්වලට කොටස් වශයෙන් ලැබී තිබෙනවා. අස්වැන්න නෙළන්නත් ඔන්න මෙන්න වෙලා. හැබැයි, තවම තවම පොහොර ටික ලැබිලා නැහැ. එහෙම වුණාම ගොවියාගේ හදවතේ සතුට, සොම්නස තිබෙනවාද? දොම්නසක් නේ තිබෙන්නේ. හදවත cleanද? නැහැ. ඒක dirty වෙලායි තිබෙන්නේ. කලකිරීමක් තිබෙන්නේ; වේදනාවක් තිබෙන්නේ. මොකද, වෙලාවට පොහොර ටික ලැබී නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ Clean Sri Lanka වැඩසටහන යථාර්ථයක් බවට පත් කරන්න අවශ්‍ය වැදගත්ම දේ තමයි මේ concept එකේ vision එක, mission එක රටට, ජනතාවට පෙන්වීම. එයට මූල්‍ය අරමුදල් ලැබෙන විධිය පෙන්වන්න. අපි දන්න විධියට මේ වැඩසටහන සඳහා වාහන ආනයනය කරන කිහිපදෙනෙක් රුපියල් මිලියන 5ක් ද 6ක් ද දීලා තිබෙනවා ලු. මේ වාගේ දැවැන්ත ව්‍යාපෘතියක් රුපියල් මිලියන 5න් 6න් කරන්න පුළුවන්ද? ඒ නිසා මේ පිළිබඳ නිවැරදි දැනුවත්භාවයක් මේ පාර්ලිමේන්තුවටත්, රාජ්‍ය යන්ත්‍රණයටත්, රටටත්, ජනතාවටත් ලබා දෙන්න කියලා මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Harshana Nanayakkara. You have 14 minutes.

[පූ.භා. 11.59]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩ පිළිවෙල සම්බන්ධයෙන් තමයි අද දින සභාව කල් තැබීමේ විවාදය පැවැත්වෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කියන ආකාරයටම මේ සම්බන්ධයෙන් යම් ප්‍රමාණයකට හෝ ජනතාව දැනුවත් කළ යුතුයි.

අදටත් ඒ ව්‍යාපාරය සිද්ධ වෙනවා. ජනවාරි 01වෙනි දා සිට පෙබරවාරි 01වෙනි දා දක්වා Clean Sri Lanka Presidential Task Force එක හරහා රජයේ සේවකයන් දැනුවත් කිරීම්, ආයතන දැනුවත් කිරීම් සිදු වෙමින් පවතිනවා. හැබැයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ ආකල්පවල. මොකද, කලින් ආණ්ඩුවල තිබුණු සංදර්ශනාත්මක වැඩ පිළිවෙළවල් නිසා යම් රජයේ ආයතන හෝ පුද්ගලයන් හිතන්නට පුළුවන්, අර්ථකථනය කරන්නට පුළුවන්, මේකත් සුමානයකින් හෝ දෙකකින් අවසන් වෙන ව්‍යාපෘතියක් කියලා. වැරදියි, මේක එහෙම එකක් නොවෙයි. මේ ආරම්භ කරලා තිබෙන්නේ පුද්ගලයන් ජීවිත කාලය තුළම අනුගමනය කළ යුතු, රට ගොඩනැඟීම සඳහා අනුගමනය කළ යුතු වැඩ පිළිවෙළවල්. "Clean" කියපු ගමන්ම ඉස්සෙල්ලාම ඔළුවට එන්නේ මොකක්ද? පරිසරය පිරිසිදු කිරීම. හරි, ඒක මෙහි විශාල කොටසක් බවට පත් වෙනවා. හැබැයි Clean Sri Lanka කියන්නේ ඒක විතරක් නොවෙයි. අපේ ආකල්ප, අපි හිතන පතන විධිය clean කිරීමත් Clean Sri Lanka වැඩසටහනේ එක අරමුණක් වෙනවා. ඒවා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වෙනවා. මොකද, ඒ localities හඳුනාගෙන ඒ අවශ්‍යතා ඉෂ්ට වෙන ආකාරයට මේ ව්‍යාපෘතිය ගෙන යන්නට ඕනෑ.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා ]

Clean Sri Lanka කියන එක අපට හුදෙක් ප්‍රතිපත්ති හැදුවත්, නීති හැදුවත් ඒවායින් විතරක් ක්‍රියාත්මක කරන්න බැහැ. මිනිස්සුත් ඒ අවබෝධය, එසේ වෙනස්වීමට අවශ්‍ය වුවමනාව හදාගෙන තිබෙන්නට ඕනෑ. මේ ව්‍යාපෘතිය ආරම්භයේ යම් යම් පටු අර්ථකථන කිරීම් සිදු වෙනවා අපි දැක්කා. එය හුදෙක්ම ත්‍රී වීල්වල කැලි ගැලවීමටත්, බස්වල කැලි ගැලවීමටත් ලඝු කරන්න උත්සාහ කළා. නමුත්, මේක එතැනින් එහාට ගිය දීර්ඝ වැඩ පිළිවෙළක් බව මා කියන්න ඕනෑ. හැබැයි මේ සියල්ලම ආරම්භ වෙන්න නම් මිනිස්සු හිතන පතන විධියේත් වෙනසක් තිබෙන්නට ඕනෑ. කියන්නත් කනගාටුයි, අද අපේ රටේ වැසිකිළිවල ගහලා තිබෙනවා අපි දැක තිබෙනවා, “භාවිතයෙන් පසු වතුර ගසන්න” කියලා. ජනතාවකට එහෙම කියන්න වෙනවා නම්, ඒගොල්ලන් ඉන්න තැන ගැන අපට පොඩ්ඩක් කල්පනා කරලා බලන්න වෙනවා. ආණ්ඩුවකට පුළුවන්, traffic light එකක් සවි කරන්න. නමුත්, ඒකේ රතු එළිය වැටුණාට පසුවත් දෙපැත්ත බලලා පොලිස් නිලධාරි මහත්මයෙක් පෙනෙන්න නැත්නම් යම් පුද්ගලයකු එය නොතකා ගමන් කරනවා නම් ඒක නීතියෙන් හදන්න පුළුවන් දෙයක් නොවෙයි. නීතියක් වුණත් හරියට ක්‍රියාත්මක වෙන්නේ සමාජය ඒක ක්‍රියාත්මක කරන්න උනන්දුවෙන්, වුවමනාවෙන් බැඳුණොත් විතරයි; වුවමනාවක් ආවොත් විතරයි; ඒ ගැන අධ්‍යයනයක් කර තිබුණොත් පමණයි. අන්න ඒ නිසා තමයි මේක ගැන දැනුවත් කිරීමේ ව්‍යාපාරය සඳහා මාසයක් කල් අරගෙන සෑම මට්ටමින්ම එය සිදු කරගෙන යන්නේ.

අපේ ප්‍රතිවාදීන් විසින් කතන්දරයක් ගොඩනඟන්න හදනවා, "මේ ආණ්ඩුව ආවා, අච්චර බලයක් තිබෙනවා, මෙච්චර බලයක් තිබෙනවා, නමුත් මොකුත් කරන්නේ නැහැ" කියලා. මෙන්න මේක තමයි ප්‍රතිවාදීන් මවන්න හදන පින්තූරය. මම ඉස්සෙල්ලාම පැහැදිලි කරන්නට ඕනෑ, මේ කාරණය. අපි සම්පූර්ණ ආණ්ඩුවක් පිහිටෙව්වේ කවදාද? නොවැම්බර් 18වැනි දා. නොවැම්බර් 14වැනි දා ඡන්දය තිබුණා, 18වැනි දා ආණ්ඩුව පිහිටෙව්වා. දැන් මේ ආණ්ඩුවට මාස 2යි. මේ රට විනාශ කරන්න දායක වුණු, මේ රටේ මුදල් හොරකම් කළ, වංචා කළ පුද්ගලයන්, රට වට්ටන්න ගිය පුද්ගලයන් මාස දෙකෙන් අපිව ප්‍රශ්න කරනවා "ඔයගොල්ලන් මොකද කළේ?" කියලා. ඔව්, අපට කාලය අවශ්‍යයි. අපට ඡන්දය දුන් අය ඡන්දය දුන්නේ අවුරුදු 5ක් තුළ මේ ප්‍රතිපත්ති ක්‍රියාවට නඟන්න, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හදන්න මිසක් මාස දෙකෙන් සියල්ලම කරයි කියලා බලාපොරොත්තුවෙන් නොවෙයි. මම හිතන විධියට කිසිම සාධාරණ මනුස්සයෙක් එහෙම බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒත් අපි කෙටියෙන් ගනිමු, කරපු දේවල්. ගොවි ජනතාවට මේ මාස දෙක ඇතුළත රුපියල් 25,000ක පොහොර සහනාධාරයක් ලබා දීලා තිබෙනවා. භාණ්ඩාගාරයෙන් ඒකට රුපියල් කෝටි 2,000ක් වෙන් කළා. ගොවීන් ලක්ෂ 8.5කට ඒක මේ වෙනකොට ලැබිලා තිබෙනවා. වී සහ වෙනත් භෝග සඳහා අක්කරයකට කිලෝ 12.5 බැගින් MOP පොහොර මෙට්‍රික්ටොන් 55,000ක් නොමිලයේ දීලා තිබෙනවා. ධීවර ජනතාවට භූමිතෙල් ලීටරයකට රුපියල් 25ක් වන ලෙසට දිනකට ලීටර් 15කට යටත්ව මසකට රුපියල් 9,375ක සහ ඩීසල් ලීටරයකට රුපියල් 25ක ඉන්ධන සහනාධාරයක් ලබා දීලා තිබෙනවා. මට මේවා දිගින් දිගටම කියාගෙන යන්න පුළුවන්. තවත් තිබෙනවා, - *[බාධා කිරීමක්]* ඔව්. සමහරුන්ට ලක්ෂ 2ක් දක්වා සහනාධාර ලැබෙමින් තිබෙනවා. මම කියන්නේ මේකයි. අපට කිව්වා නේ, "ඔයගොල්ලන්ගේ සියයට 3යි ඉන්නේ, ඔයගොල්ලන්ට ආණ්ඩු පිහිටුවන්න බැහැ, කවදාවත් ඒක කරන්න බැහැ" කියලා. දැන් ඒ අයම තමයි අපට කියන්නේ, "ඔයගොල්ලන්ගේ Clean Sri Lanka කියන එක අපට තේරෙන්නේ නැහැ, අපි දන්නේ නැහැ, ඔයගොල්ලන්ට ඒක කරන්න බැහැ" කියලා. මම එක දෙයක් පොරොන්දු වෙන්නම්. සියයට 3ක් හිටපු අපි නැහැයි, බැහැයි නොකියා ආණ්ඩු කළා වාගේම, මොන බාධක ආවත් මේ Clean Sri Lanka වැඩසටහන සාර්ථක කරලා මිසක් ආපස්සට හැරෙන්නේ නැහැ. මොකද, මිනිස්සුන්ගේ ආකල්ප වෙනස් කරගන්න එක හොඳ දෙයක්. හැබැයි මේවා කරන්න යනකොට සමහරුන්ට ඇඟේ භූමිතෙල් ගෑවුණු ගතියක් එනවා. එහෙම වෙන්න එපා කියලා මම ඉස්සෙල්ලාම ඉල්ලා සිටිනවා. Clean වෙන්න ඕනෑ. අල්ලස් දෙන එකත් වැරදියි, ගන්න එකත් වැරදියි. ඒවා clean වෙන්න ඕනෑ.

මේ කාලයේදී වුණු තවත් වෙනස්කම් මොනවාද කියලා කිව්වොත්, අපි ඇමති මණ්ඩලවලට ඥාතීන් පත් කරගෙන නැහැ.

ජනාධිපති, අගමැති, නියෝජ්‍ය ඇමති, පෞද්ගලික කාර්ය මණ්ඩල, ප්‍රභූ රථ වාහන අරගෙන යන්නේ නැහැ. අපි එළියට ගියාම මිනිස්සු ඇවිල්ලා කියනවා, "සන්තෝෂයි ඇමතිතුමා, ඔබතුමා මේ කඩේට ඇවිල්ලා අපිත් එක්ක තේ එකක් බොනවා නේ" කියලා. අන්න එහෙමයි, අපි Clean Sri Lanka වැඩසටහන ආරම්භ කරලා තිබෙන්නේ. ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සහ අපේ ආණ්ඩුව විසින් ඒ සඳහා ආදර්ශ පෙන්වා දීලා තිබෙනවා. තානාපති සේවයට අපි ඥාතීන් පත් කරලා නැහැ. ඔක්කෝම නිලධාරින් සුදුසුකම් මත පත් කරලා තිබෙන්නේ. ආණ්ඩුවේ නාස්තිය අපි අවම කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට විදුලි බිල ගැනත් කථා කළා. ඔව්, විදුලි බිල අඩු කරලා තිබෙනවා. දැන් කියනවා, ආණ්ඩුව නොවෙයි අඩු කළේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමයි කියලා. ඒ කොමිසමත් ආණ්ඩුවෙන් තමයි පත් කරන්නේ; ජනාධිපතිතුමා තමයි පත් කරන්නේ. එතකොට ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යභාරය මොකක්ද? ඔවුන් විදුලිය උත්පාදනය කරනවා, ඒ වාගේම බෙදා හරිනවා. තිබෙන නීති රාමු අනුව ඔවුන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට කරුණු වාර්තා කළාම, ඒ දෙන නිර්දේශ අනුව කටයුතු කරන්න ඕනෑ. ඒ අනුව ගෘහස්ථ විදුලි බිල සියයට 20කින් අඩු වෙනවා. ඒ වාගේම හෝටල්වල විදුලි බිල සියයට 30කින් හෝ 31කින් දක්වා අඩු වෙලා තිබෙනවා. අපට මතකයි, එක්තරා අවස්ථාවකදී මහජන උපයෝගිතා කොමිසමේ කලින් හිටපු සභාපති විදුලි බිල අඩු කරන්න කිව්වාම, බිල අඩු නොකළා විතරක් නොවෙයි, දිගටම විදුලියත් කැපුවා. විදුලි බිල වැඩි කරන තෙක් විදුලිය කපන එක නැවැත්තුවෙත් නැහැ. හැබැයි, එහෙම කළා කියලා පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරලා ඒ සභාපතිව ඉවත් කරන්නත් කලින් ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. අන්න එහෙම කටයුතු කරපු ආණ්ඩුවක් තමයි මීට කලින් තිබුණේ. නමුත් මේ මාස දෙකේ ආණ්ඩුව තමයි මහජන උපයෝගිතා කොමිසමේ -අපි පත් කරපු කොමිසමේ- නිර්දේශ අරගෙන ජනතාවට සහන සලසන්න කටයුතු කරන්නේ. කලින් ආණ්ඩුව එහෙම කළේ නැහැ.

විපක්ෂය මොන අභූත චෝදනා කළත්, අපට වංචා, දූෂණ සම්බන්ධයෙන් චෝදනා නැහැ. ඉස්සර ඇහෙන්නේ මොකක්ද? ඇමතිවරයාගේ බලයෙන් අරක කළා, මෙච්චර ටෙන්ඩරයක් කළා ආදී කථා නේ. දැන් ඒවා ඇහෙන්නේ නැහැ. හැබැයි තවමත් අපි කියන්න ඕනෑ, අපේ පක්ෂයේ නොවුණාට මන්ත්‍රී ධුරයක් දෙන්නම් කියලා යම් දේශපාලන පක්ෂයක් විසින් රුපියල් කෝටි 50ක් අරගෙන තිබෙන බව. අපි දන්නවා, ඒ කවුද කියලා. දැන් ඒ කෝටි 50 බෙදා ගත්ත විධියත් අපට හොයාගන්න පුළුවන්, අදාළ පුද්ගලයා ඇවිල්ලා පැමිණිල්ලක් කළා නම්. එහෙම නම් නීතිය ක්‍රියාත්මක වෙන හැටි හැමෝටම බලාගන්න තිබුණා. ඒවාත් clean වෙන්න ඕනෑ. මොකද, මේ ආණ්ඩුවේ අපි කිසිවක් මුදලට කරන්නේ නැහැ. කොටින්ම කියනවා නම්, මම කියන්නේ මේකයි. ඔයගොල්ලන්ගේ යාළුවෝ රාජ්‍ය සේවයේ ඇති,

පොලීසියේ ඇති. ඒගොල්ලන්ගෙන් අහලා බලන්න, ළමයෙක් ඉස්කෝලෙකට දාන්න කියලා ඇමතිවරයෙකුගෙන් ලියමනක් එනවාද කියලා. පොලීසියට ඒගොල්ලන්ගේ රාජකාරිය කිරීමේදී බලපෑමක් කරනවාද? Call එකක් දීලා, හොරු අල්ලන්න එපා කියනවාද? නැහැ. ඒ කියන්නේ අපි රාජ්‍ය යන්ත්‍රණය නිසි ලෙස ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය සියලු සහාය ලබා දෙනවා. ඒක තමයි Clean Sri Lanka වැඩසටහන යටතේ ආණ්ඩුව දෙන ආදර්ශයත්. ආණ්ඩුව ආදර්ශයක් නොදී නීති විතරක් පනවා මේ කටයුත්ත කරන්න බැහැ. අන්න ඒවා ගැන දැනුවත් කරන්න ඕනෑ. මේ ආණ්ඩුව පත් වෙලා තවම මාස දෙකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව වුණු දේවල් මූලිකව ම ගත්තොත්, ඔබතුමන්ලා දන්නවා, පසුගිය සතියේ චීන සමූහාණ්ඩුවේ ආධාර මත ඉදිවුණු අධිකරණ පියස - අභියාචනාධිකරණයේ අලුත් ගොඩනැඟිල්ල- විවෘත කරනු ලැබූ බව. මේ ගොඩනැඟිල්ල විවෘත කරන්න ගරු අගමැතිතුමියත්, මමත්, මගේ නියෝජ්‍ය ඇමතිවරයාත් සහභාගි වුණා. නමුත්, ඒ සමරු ඵලකය දිහා බලන්න. එහි තිබෙන්නේ අපි මෙම ගොඩනැඟිල්ල චීන සමූහාණ්ඩුවේ ආධාර යටතේ හදලා ජනතාවට භාර දුන්නා කියන කාරණාව විතරයි. ඒ ඵලකයේ මගේ නම හෝ ගරු අගමැතිතුමියගේ නම නැහැ. නමුත්, කලින් මේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය මොකක්ද? සමහර වෙලාවට ගොඩනැඟිල්ලට වඩා ලොකුයි සමරු ඵලකය. අහවලාගේ ආරාධනයෙන්, අහවලාගේ උපදෙස් මත, අහවලාගේ ප්‍රතිපාදනවලින් බෝක්කුවක් හදලා, ඒ අවස්ථාවේදීත් ඒ බෝක්කුව වැහෙන්න සමරු ඵලකය ගහනවා. අන්න ඒ වාගේ අවස්ථාවාදී, මෝඩ දේශපාලන සංස්කෘතිය clean කළේත් අපිම තමයි. අන්න ඒකයි වෙනස. මේ මාස දෙකට කරපුවා මොනවාද කියලා අහන නිසායි මේ දේවල් කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතියේ විධානයේ ආධිපත්‍යය අත්‍යවශ්‍යයි. ඒක නැතිව අපට හැකියාවක් නැහැ, කිසිම දෙයක් clean කරන්න. හැබැයි, නීති තිබෙන්නේ වැරදි කරන මිනිස්සුන්ට දඬුවම් කරන්න මිසක්, හොඳ මිනිස්සුන්ට දඬුවම් කරන්න නොවෙයි. දැන් අලුත් කතන්දරයක් ගොඩනඟමින් යනවා. ඒ මොකක්ද? කෝ, හොරු ඇල්ලුවාද අහනවා. එහෙම අහන පුද්ගලයන් ගැන අපි වෙනම කථා කරමු. අපට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා. ඔව්, ඒක ඇත්ත. නමුත්, තුනෙන් දෙකේ බලයක් තිබුණාට අපි කලින් ආණ්ඩු වාගේ නොවෙයි. "මම තමයි හොඳටම කළේ. මගේ කටේ වචනය තමයි, චක්‍රලේඛ මොකටද?" කියන ඒකාධිපති ආණ්ඩුවක් නොවෙයි මේ ආණ්ඩුව. මොකද, බලය තිබෙන අපිත් නීතියේ විධානයේ ආධිපත්‍යයට යට නිසා.

දැන් අපි විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශනවල ප්‍රගතිය මට එළියට වාර්තා කරන්න බැහැ. නමුත් අපි යම් විමර්ශන ප්‍රමාණයක් කඩිනම් කරලා තිබෙනවා. පාස්කු ප්‍රහාරය ඉන් එකක්. අපි කිසි කෙනෙකුගෙන් දේශපාලනිකව පළිගන්නේ නැහැ. නමුත් රටේ නීතිය සැමට පොදුයි කියන එක ඉස්සරවෙලා පෙන්වන්න ඕනෑ. මෙච්චර කාලයක් ඉස්පිරිතාල වාට්ටුවල හිටපු දුමින්ද සිල්වා දැන් ඉන්නේ සෙල් එකේ. අර්ජුන් ඇලෝෂියස්ලාගේ ඉඳලා බදු නොගෙවපු අය හිරේ ඉන්නවා; දඩ අය කරනවා. දැන් ඉස්සර වාගේ බලය ධනය තිබෙන කෙනාට එක නීතියකුත්, බලය ධනය නැති කෙනාට තවත් නීතියකුත් කියන සංකල්පය නැහැ. අපි එය පැහැදිලිවම වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම ජොන්ස්ටන් ප්‍රනාන්දුට අයත් මත්පැන් සමාගම විසින් නොගෙවන ලද බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළේත් අපියි. මෑත ඉතිහාසය ගත්තොත්, සුරාබදු ආදායම රුපියල් කෝටි 20,000ක් වුණේත් මෙවරයි. ඒ වාගේම බිම් මට්ටමේ මත් ද්‍රව්‍ය, පාතාල ක්‍රියාකාරකම් මැඩලන්න, විශේෂයෙන්ම අයිස් වැනි මත් ද්‍රව්‍යය භාවිතය මැඩලන්න අපි හරි වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ කියන්නේ කලින් තිබුණු දේශබන්දුගේ "යුක්තිය" මෙහෙයුම වාගේ එකක් නොවෙයි. ඔහු උසාවියෙන් වැරදිකරු වුණා. ඔහුව ඉවත් කරලා අලුත් IGP කෙනෙක් පත් කළේත් අපි. මේ, මාස දෙකට කරපුවා. ඒ වාගේම පොලීසිය විසින් ලංකාව තුළ සිදු කරන ලද මත් ද්‍රව්‍ය වැටලීම් අතර විශාලතම වැටලීම කරලා එකවර රුපියල් මිලියන 283ක් සොයා ගත්තේත් මේ මාස දෙකේ ළදරු ආණ්ඩුවම තමයි. අපි ළදරුයි. අපි තවම ගත කළේ පොඩි කාලයක්. හැබැයි අපේ අරමුණු පොඩි නැහැ. අන්න ඒ නිසා නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන්න අපි ඒ සම්බන්ධයෙන් විමර්ශන කරනවා. නිසි ලෙස විමර්ශනය නොකර නඩු පැවරුවොත්, විත්තිකරුවන් නිදහස් වෙලා යනවා. ඒ නිසා අපව කලබල කරන අයට අපි කියන්නේ මෙච්චරයි. නීතියට අනුව ඔබතුමන්ලාට ගෙවල්වලට සිතාසියක් එයි, එතකොට එන්න, සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත්වල හරි වෙනත් කොහේ හරි හැංගෙන්නේ නැතුව. ඒක තමයි අපේ ඉල්ලීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අධිකරණ පද්ධතියේ ගැටලු රාශියක් තිබෙනවා. අධිකරණ පද්ධතියෙන් ජනතාවට මීට වඩා සේවයක් ලැබිය යුතුයි කියන මතයේ තමයි අපි ඉන්නේ. ඒ වාගේම නඩු ප්‍රමාද වීම, මිනිස්සු උසාවියේ රස්තියාදු වීම කියන එක දෙයක් සම්බන්ධයෙන්වත් මම විනිශ්චයකාරවරුන්ට හෝ උසාවි කාර්ය මණ්ඩලවලට හෝ නීතිපතිට හෝ විමර්ශන නිලධාරීන්ට විතරක් ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. මේ තිබෙන්නේ දශක ගණනාවක් තිස්සේ කඩා වැටුණු ක්‍රමයක්. මතක තියාගන්න, පොරොන්දු වෙච්ච දේවල් කරන්න, Clean Sri Lanka කරන්න නම් අපි ඉස්සර වෙලාම ඒ සඳහා අවශ්‍ය පරිසරය හදාගන්න ඕනෑ බව.

මේ මාස දෙක තුළේ අපි කළේ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍යාංශවලට ගිහිල්ලා ඒවායේ accounts තියෙන පොත් ඇරලා බැලුවාම ගාසා තීරයට බෝම්බ ගැහුවා වාගේ තත්ත්වයක් තමයි පේන්න තිබුණේ. මෙලෝ දෙයක් ඉතිරි වෙලා නැහැ. මෙහෙම තමයි කලින් අය ආණ්ඩු කළේ. ඉතින් ඉස්සර වෙලාම ඒ දිරාපත් වෙච්ච යන්ත්‍රණය නිසි පරිදි ස්ථාපිත කරගනිමින් තමයි අපට මේ ගමන යන්න වෙන්නේ. ඒ නිසා මා පැහැදිලිව කියනවා, අපි ආරම්භ කළ Clean Sri Lanka වැඩ පිළිවෙළ අපි ගම දක්වාම ගෙන යන බව. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, VFS ගනුදෙනුවට අදාළව අධිකරණය විසින් ලබා දුන් නියෝගය ක්‍රියාත්මක නොකරන ලද හිටපු ආගමන විගමන පාලක ජනරාල්වරයා රක්ෂිත බන්ධනාගාරගත වුණේත් අපේ ආණ්ඩුව තුළයි කියලා. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, අල්ලසක් ගත් යම් මහේස්ත්‍රාත්වරයෙකුගේ සහෝදරයෙකුටත් නීතිය ක්‍රියාත්මක වෙන බව. මෑතකදී ලොහාන් රත්වත්තේට විරුද්ධව නීති විරෝධී වාහන එකලස් කිරීම සම්බන්ධයෙන් වූ නඩුවක් පැවරුවා. ඒක අපේ ආණ්ඩුව පස්සෙන් පන්නාගෙන ගිහිල්ලා දැම්ම නඩුවක් නොවෙයි. රටේ පොලීසියට, රටේ නීති පද්ධතියට අපි සහාය දෙනවා, ස්වාධීනව කටයුතු කරන්න. මේ සියල්ල හරහා තමයි අපි මේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය ස්ථාවර කරන්නේ. ඒ වාගේම මේ දේ කරන්න යම් කාලයක් ගත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කාලය තමයි අපි මේ ඉල්ලන්නේ. නමුත් අපව හදිස්සි කරන්න උත්සාහ කරන අයගේ බලාපොරොත්තුව මොකක්ද? ඒගොල්ලන් හිතනවා, අපි ඒගොල්ලන් දෙන ලුණුව කාලා, හදිසි වෙලා මේක පටලවාගෙන වැටෙයි කියලා. එහෙම තත්ත්වයක් නිර්මාණය වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ.

මට කියන්න තිබෙන්නේ මේකයි. Clean Sri Lanka වැඩ පිළිවෙළ හරහා රට හොඳ තැනක් බවට පත්කර ගන්න පුළුවන්; ලස්සන තැනක් බවට පත්කර ගන්න පුළුවන්; කුණු, කැළි කසළ

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා ]

නැති තැනක් බවට පත්කර ගන්න පුළුවන්; ඒ වාගේම ආකල්පමය වශයෙන් ගත්තත් ජාති ආගම් භේදවලින් තොර තැනක් බවට පත්කර ගන්න පුළුවන්. ආබාධ සහිතද, රහිතද කියන භේදයෙන් තොරව, ලිංග භේදයෙන් තොරව හැමෝටම හොඳ රටක් හදා ගැනීමේ වුවමනාව තමයි අප තුළ තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි එහෙම හිතනකොට සමහරු හිනාවෙනවා, මේක ලංකාව, මේකේ අපට ඕවා කරන්න හැකියාවක් නැහැ යනාදී කරුණු කියමින්. මම කියනවා, මිනිස්සු වෙනස් වෙනවා කියලා. මිනිස්සු වෙනස් වෙච්ච හින්දා තමයි සියයට 3ක ප්‍රමාණයක හිටපු අපි දැන් ආණ්ඩුව කරන්නේ. අපට අපේ රටේ ජනතාව විශ්වාසයි. ඔවුන් නිසි ලෙස දැනුවත් කිරීම සහ පාලකයන් නිසි ආදර්ශයකින් යුතුව කටයුතු කිරීම හරහා අපට හැකියාව ලැබෙනවා, මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න.

මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නවා කියන්නේ, අපේ රටේ ඉදිරි පරම්පරාවලට පොහොසත් රටක් ලස්සන ජීවිතයක්, පිරිසිදු ශ්‍රී ලංකාවක් - a Clean Sri Lanka - ලබා දීමයි. ඒක තමයි අපේ සටන වෙන්නේ. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයත්, ජාතික ජන බලවේග ආණ්ඩුවේ සියලු මන්ත්‍රීවරුනුත් කැප වෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි මේ දේ කියනවා. ඉදිරියටත් අපි මතවාදීව ගැටෙමු, දේශපාලනයෙන් ගැටෙමු, අදහස්වලින් ගැටෙමු, ඒක ප්‍රශ්නයක් නැහැ, ඒකට තමයි අපි මෙතැන ඉන්නේ. හැබැයි, රටකට හොඳක් වෙනවා නම්, ඒකට අකුල් හෙළන්නේ නැතුව ඉඳිමු. මම හිතන්නේ ඔබතුමන්ලාට ඡන්දය දීපු අයත්, එහෙම දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Gnanamuththu Srineshan. You have seven minutes.

[பி.ப. 12.15]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஶ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

நாங்கள் ஒவ்வொருவரும் வீட்டைச் சுத்தமாக வைத்திருக்க வேண்டுமென விரும்புகின்றோம். அதேபோல், எமது நாட்டையும் சுத்தமாக வைத்திருக்க வேண்டுமென விரும்ப முடியும். அந்தவகையில், இந்த Clean Sri Lanka திட்டமென்பது உண்மையிலேயே நல்லதொரு திட்டமாகும். இங்கு Clean Sri Lanka எனச் சொல்லப்படுவது, தூய்மையான நாட்டை உருவாக்குவதாகும். தூய்மையான நாட்டை உருவாக்குவதில் இரண்டு பக்கங்கள் இருக்கின்றன. ஒன்று, புறவயமாக சுத்தத்தை ஏற்படுத்தல். இரண்டாவது, அகவயமாக சுத்தத்தை ஏற்படுத்தல். புறவயமான சுத்தமென்பது, பௌதிக சூழலில் காணப்படுகின்ற குப்பைகூளங்கள், அசுத்தங்களை அகற்றுவதைக் குறிக்கும். அகவயமான சுத்தமென்பது, மனித மனங்களில் காணப்படுகின்ற தீய சிந்தனைகளை நீக்குவதைக் குறிக்கும்.

எமது நாடு ஊழல், மோசடி, இலஞ்சம், வீண்விரயம், திருட்டு, குற்றச்செயல்கள் போன்றவற்றால் நிரம்பிக் காணப்படுகின்றது. கடந்த 77 ஆண்டுகளாக நமது நாட்டைப் பல அரச தலைவர்கள் ஆட்சி செய்திருக்கிறார்கள். அவர்கள் இந்த நாட்டில் சுத்தத்தை ஏற்படுத்தவில்லை, தூய்மையை ஏற்படுத்தவில்லை என்பது இந்த Clean Sri Lanka திட்டத்தின்மூலம் வெளிப்படுகின்றது. ஆகவே, நாங்கள் தூய்மையான விடயங்களை ஆதரித்துத்தான் ஆகவேண்டும். ஊழல் இல்லாத, மோசடி இல்லாத, கையூட்டு இல்லாத, திருட்டு இல்லாத, வீண்விரயம் இல்லாத ஒரு நாடாக இந்த நாட்டை உருவாக்குவதைச் சகலரும் விரும்புவார்கள் என்றே நான் நம்புகின்றேன். கடந்த காலங்களில் பல குற்றச்செயல்கள் இடம்பெற்றிருக்கின்றன. எனினும், அவற்றுடன் தொடர்புடைய குற்றவாளிகள் கைது செய்யப்படவுமில்லை; தண்டிக்கப்படவுமில்லை என்ற குற்றச்சாட்டுக்கள் நிறையக் காணப்படுகின்றன. அவர்கள் பாரிய குற்றங்களைச் செய்துவிட்டு, இன்று கௌரவர்களாக உலாவருவதைக் காணக்கூடியதாக இருக்கின்றது. எனவே, இந்த விடயமும் Clean Sri Lanka திட்டத்துக்குள் உள்வாங்கப்பட வேண்டும்.

அடுத்து, கடந்த காலத்தில் இந்த நாடு புத்திஜீவிகளை இழந்திருக்கிறது. பலர் இந்த நாட்டை விட்டு வெளியேறி இருக்கின்றார்கள். இந்த நாடு Clean Sri Lankaஆக இருந்திருந்தால், அவர்கள் நாட்டைவிட்டு வெளியேறவேண்டிய அவசியமும் ஏற்பட்டிருக்காது; நாட்டில் புத்திஜீவிகள் இல்லாமல் போகின்ற சூழலும் உருவாகியிருக்காது. இன்று நமது நாடு இனவாதம், மதவாதம், மொழிவாதம், பிரதேசவாதம் எனப் பல்வேறு கூறுகளால் அசுத்தமாக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, இந்தக் கூறுகளை வைத்துத்தான் அரசியல்வாதிகள் தேர்தல் பிரசாரங்களைச் செய்கின்ற நிலைமையும் காணப்பட்டது. ஆனால், கடந்த பொதுத் தேர்தல் காலத்தில், தேர்தல் பிரசாரத்தின்போது இவ்வாறான அடிப்படை வாதங்கள் செல்லுபடியற்றிருந்த நிலை காணப்பட்டது. Clean Sri Lanka திட்டத்தைப் பயன்படுத்தி நீங்கள் சுத்தமான நாட்டை உருவாக்க முயற்சித்தால், சுத்தமான வீட்டை விரும்புகின்ற கட்சிக்காரர்கள் என்ற வகையில், நாங்கள் அதனை ஆதரிக்கத் தயாராக இருக்கின்றோம். இந்த Clean Sri Lanka திட்டமானது, கோட்பாட்டு ரீதியில் மட்டும் காணப்படக்கூடாது. அது செயற்பாட்டு வடிவம் பெற வேண்டும்.

" சொல்லுதல் யார்க்கும் எளிய அரியவாம்
சொல்லிய வண்ணம் செயல்"

என்று திருக்குறள் சொல்கின்றது.

விடயங்களைச் சொல்வது எல்லோருக்கும் இலகுவாக இருக்கும். ஆனால், அவற்றைச் செய்வது கஷ்டமாகத்தான் இருக்கும். நீங்கள் இந்தத் திட்டத்தை அமுல்படுத்தி, ஊழலற்ற, மோசடியற்ற, இலஞ்சமற்ற, குற்றமற்ற, குற்றவாளிகளற்ற, போதையற்ற ஒரு சுத்தமான நாட்டை உருவாக்குவது என்பது ஆரோக்கியமான விடயமாக இருக்கும்; நாட்டைப் பலரும் விரும்பக்கூடிய சூழ்நிலையை ஏற்படுத்தும். அதேவேளை, இந்த நாட்டைவிட்டுச் சென்றவர்கள்கூட, மீண்டும் இந்த நாட்டை நாடிவந்து முதலீடு செய்யக்கூடிய சந்தர்ப்பமும் ஏற்படும். அதற்காக முதலில், இன ரீதியான சட்டங்கள், மத ரீதியான சட்டங்கள் போன்ற பாரபட்சமான சட்டங்கள் அகற்றப்பட வேண்டும் எனவும் இனப் பகை, மதப் பகை என்பற்றை ஏற்படுத்தக்கூடிய திட்டங்கள் தீட்டப்படுவது இல்லாதொழிக்கப்பட வேண்டும் எனவும் நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, விவசாயிகளின் விளைபொருட்களுக்கு இந்த Clean Sri Lanka திட்டத்தின்கீழ் உத்தரவாத விலை அளிக்கப்பட வேண்டும். ஒரு பக்கம் விவசாயிகள் கஷ்டப்பட்டு நெல்லை அல்லது உணவுப் பொருட்களை உற்பத்தி செய்யும்போது, மறுபக்கம் அப்பொருட்களை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்து, commissionஐப் பெறுகின்ற நடைமுறைகளும் கடந்த காலத்தில் நடந்திருக்கின்றன. எனவே, விவசாயிகளின் விளைபொருட்களுக்கான உத்தரவாத விலை என்பது மிக அவசியமானதாகும். அவ்வாறு உத்தரவாத விலை அளிக்கப்படாவிட்டால், விவசாயிகள் பயிர்ச்செய்கை நடவடிக்கைகளிலிருந்து ஒதுங்கிக்கொள்ளக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படுவதற்கு வாய்ப்பிருக்கின்றது.

இப்பொழுது நாட்டின் பல பிரதேசங்களிலும் அடிக்கடி வெள்ள அனர்த்தம் ஏற்படுகின்றது. அந்தப் பிரதேசங்கள் சௌகரியமான பிரதேசங்கள், அசௌகரியமான பிரதேசங்கள் எனப் பிளவுபட்டுக் காணப்படுகின்றன. சௌகரியமான பிரதேசங்களில் சுகமான வாழ்க்கையையும், அசௌகரியமான பிரதேசங்களில் கஷ்டமான வாழ்க்கையையும் மக்கள் அனுபவித்துக் கொண்டு இருக்கின்றார்கள். இப்பொழுது வடக்கு, கிழக்கில் பருவ மழை பெய்ய ஆரம்பித்திருக்கிறது. கிரான் பாலம் வெள்ளப் பெருக்கால் சேதமடைந்துள்ளது. அந்தப் பாலத்தைப் புனரமைப்புச் செய்ய வேண்டும். அத்துடன், அங்கு கஷ்டமான பிரதேசங்களில் வாழ்கின்ற மக்களுக்குரிய நிவாரணத்தையும் பெற்றுக்கொடுக்க வேண்டும். எனவே, இந்த விடயத்தை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டுமென நான் இவ்விடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, எமது பிரதேசத்திலுள்ள பல பாதைகள் மிக மோசமான நிலையில் காணப்படுகின்றன. குறிப்பாக, வாகரை பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கட்டுமுறிப்புப் பாதையானது, மிக மோசமான நிலையில் காணப்படுகின்றது. அப்பாதையானது, 18 கிலோமீற்றர் தூரம் காட்டு வழியாகச் செல்கின்ற பாதையாகும். அதில் யானைகளின் தொல்லை காணப்படுகின்றது. அதனை அண்டிய பிரதேசத்தில் பழங்குடி மக்கள், விவசாயிகள், மீனவர்கள் எனப் பலரும் வாழ்கின்றார்கள். அவர்கள் பல்வேறு பாதிப்புக்களுக்கு உள்ளாகின்றார்கள். எனவே, Clean Sri Lanka திட்டத்தின்கீழ் இந்தக் கட்டுமுறிப்புப் பாதையைப் புனரமைத்துக் கொடுத்து, அங்குள்ள மக்கள் சீராகப் பயணம் செய்வதற்கு வழிவகுக்க வேண்டும். சுதந்திரம் அடைந்த காலத்திலிருந்து அந்த மக்கள் இந்தக் கஷ்டத்தை அனுபவித்து வருகின்றார்கள். அதுமட்டுமல்ல, போரதீவுபற்றிலுள்ள மண்டூர் - மூங்கிலாறு வீதியும் மிக மோசமாகப் பாதிக்கப்பட்ட நிலையில் இருக்கின்றது. அதனையும் புனரமைத்துக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, நான் இங்கு The Finance Company பற்றிக் குறிப்பிட வேண்டும். மத்திய வங்கியானது அதன் இயக்குநர் சபையை 2009ஆம் ஆண்டில் நிறுவி, அதற்கான உறுப்பினர்களையும் நியமனம் செய்திருக்கிறது. அதனை நம்பி அதில் 6,400 வைப்பாளர்கள் பணத்தை வைப்புச் செய்திருக்கிறார்கள். அதில் 12,000 மில்லியன் ரூபாய் இருக்கின்றது. இவ்வாறு இருக்கத்தக்கதாக, 2019ஆம் ஆண்டில் நிரந்தர வைப்பில் 10,000 மில்லியன் ரூபாயைச் சேகரிப்பதற்காக விளம்பரம் செய்யப்பட்டிருக்கிறது. இவ்வாறு செய்யப்பட்டு இரண்டு கிழமைக்குள் The Finance Company முடக்கப்பட்டு இருக்கின்றது. இதனால் அதில் பணத்தை வைப்புச் செய்தவர்கள் நிர்க்கதியாக்கப்பட்டு இருக்கின்றார்கள். ஒரு பிரதான நிதி நிறுவனம் முடக்கப்படுவதில் தவறில்லாமல் இருக்கலாம். ஆனால், அதில் பணத்தை வைப்புச் செய்தவர்கள் இன்று தெருக்களில் மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். The Finance Companyஐ நம்பி பணத்தை வைப்புச் செய்தவர்கள், தங்களுடைய வைப்புத் தொகையும், அதற்கான வட்டியும் வழங்க வேண்டுமென மிக உருக்கமாகச் சொல்கின்றார்கள்.

அடுத்து, Bachelor of Education - கல்விமாணி கற்கை நெறியானது 4 ஆண்டுகளில் நிறைவுசெய்யக்கூடிய ஒரு கற்கைநெறியாகும். இந்தக் கற்கைநெறியை நிறைவு செய்தவர்களுக்கு உரிய தொழில்வாய்ப்புகளைக் கொடுக்க வேண்டியது அவசியமாக இருக்கின்றது. இப்போது அவர்களும் தொழில்வாய்ப்பற்ற நிலையில் அங்கலாய்த்துக் கொண்டு இருக்கின்றார்கள். மேலும், கள நுளம்பு ஒழிப்பு உதவியாளர் நியமனம் கொடுக்கப்பட்டு, தற்போது 7-8 வருடங்கள் ஆகின்றன. நான் இந்த விடயத்தை கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடம் கூறியிருக்கிறேன்; கடிதமும் கொடுத்திருக்கிறேன். தயவுசெய்து, அவர்களுக்கு விரைவாக நிரந்தர நியமனங்களை வழங்கி, அவர்கள் தங்களுடைய செயற்பாடுகளை முன்னெடுப்பதற்கு உதவி செய்ய வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ravindra Bandara. You have 12 minutes.

[අ.භා. 12.24]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන කථා කරද්දී, Clean Sri Lanka ව්‍යාපෘතිය පටන් ගන්න ඕනෑ තැන ගැන අපට දැන් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. එතුමා මගේ කථාව අහගෙන ඉන්නවාද කියලා මම දන්නේ නැහැ. එතුමා මේ කථාව අහගෙන ඉන්නවා නම් මම කියන්න ඕනෑ, ඇත්තටම Clean Sri Lanka ව්‍යාපෘතිය පටන් ගන්න මෙතැනත් බොහොම හොඳ තැනක් බව. මොකද, ඒ ගරු මන්ත්‍රීතුමා අපට කියනවා, විදුලි බිල අඩු කිරීම ගැන; විදුලි බිල අඩු කළේ කවුද කියන එක ගැන. මහජන උපයෝගිතා කොමිසමේ තීන්දුව ක්‍රියාත්මක කරමින් රජය මඟින් විදුලි බිල අඩු කළා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, සියයට 30කින් විදුලි බිල අඩු කරනවා කියලා. ඒගොල්ලන් ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවද්දී ඒක දැකලා නැහැ. ඒ වාගේම අපි දන්නවා, ඔය කථා කරන මහත්වරුන් ඒ කාලයේ මහජන උපයෝගිතා කොමිසමෙන් විදුලි බිල අඩු කරන්න කියලා නියෝග දෙනකොට, ඒගොල්ලන් ගෙදර යවපු බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ගැලරියේ පාසල් දරුවෝ ඉන්නවා. ඒ පාසල් දරුවෝ දන්නවා, උසස් පෙළ විභාගය තිබෙන කාලයේදී විදුලිය විසන්ධි කරන්න එපා කියපු බව. විදුලිය විසන්ධි කරන්න එපා කියන නියෝගයට එරෙහිව ගිහිල්ලා විදුලිය විසන්ධි කළා. ඒ වාගේම හිටපු අග්‍ර විනිශ්චයකාරවරුන්ට කරපු දේවල් අපි දන්නවා. එහෙම අය තමයි අද මේ කථා කරන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ ව්‍යාපෘතිය පටන් ගන්න ඕනෑ තැන ගැන එතුමන්ලා කථා කළා. මේක ලැයිම් කාමරයෙන් පටන්

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ගන්න ලු. ඔව්, අපි ඒවා හදනවා. ගෙවල් 4,000ක් මේ අවුරුද්ද ඇතුළත හදනවා. වතුකරයේ පාරවල් හදන්නේ නැතුව, ඒ ලැයිම් කාමරවලම ඔවුන් තියපු මිනිස්සු තමයි, Clean Sri Lanka ව්‍යාපෘතිය පටන් ගන්න ඕනෑ තැන ගැන අපට කියන්නේ.

ඊළඟට, බාර් පර්මිට් ගැන කිව්වා. මතක තබා ගන්න, මේ රජයේ ඉන්න මැති ඇමතිවරු කවදාවත් එහෙම බාර් පර්මිට් දෙන්නේ නැහැ. බාර් පර්මිට් අරගෙන තිබෙන්නේ ඔබතුමන්ලා. ඒවා වෙනස් කරන්න තමයි Clean Sri Lanka හරහා එන්නේ. ඒ විතරක් නොවෙයි, මෙතැනින් එළියේ ඉන්න අයත් විදුලි බිල ගැන කියනවා. මෙතැන ඉඳගෙන අපට උපදෙස් දෙන අයත් ඉන්නවා. ආපනශාලාවේ කෑම ගන්නවා ලු; රටත් කෑම ඔතාගෙන යනවා ලු. පට්ටපල් බොරු ඇදබානවා. ඒගොල්ලන් channelsවල mikes ටික ඉස්සරහා තියාගෙන එහෙම කියනවා මම දැක්කා. මිනිස්සු අතරට යන්න බැහැ. මේ කාටවත් ජනතාව අතරට ගිහිල්ලා ඔය දේවල් කියන්න බැහැ. මොනවාද මේ කියන්නේ? ඒගොල්ලන් කියනවා, විදුලි බිල අඩු කිරීමේ ගරුත්වය එන්න ඕනෑ අපේ බලශක්ති ඇමතිවරයාට නොවෙයි ලු. ඒ වාගේම අගමැතිනියට නොවෙයි ලු. පසුගිය දවස්වල අපි දැක්කා, ඒ කියපු මහත්මයාත් ජනාධිපති අරමුදලෙන් මහ ජනතාවට, දුප්පත් මිනිස්සුන්ට ගන්න තිබෙන සල්ලි ගන්නවා. ඒ list එකේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ list එක අපි තවම දුන්නේ නැහැ. ඒවා ඉස්සරහට එනවා. ඔන්න ඕක තමයි තත්ත්වය.

ආදරණීය දරු දැරියනි, ඔබ දන්නවා, මේ Clean Sri Lanka කියන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ ඇයි කියලා. ඔබ දන්නවා, ගොඩක් පාසල්වල දරුවන්, විශේෂයෙන්ම ගැහැනු ළමයි ඉස්කෝලේ යනකොට වතුර බොන්නේ නැති බව. වතුර බොන්නේ නැතුව තමයි ඔවුන් ඉස්කෝලේ යන්නේ. ඇයි, ඒ? ඉස්කෝලවල තිබෙන වැසිකිළි - කැසිකිළි පද්ධතිය ගැන දන්නා නිසා. ඔවුන් වතුර බොන්නේ නැතුව ගිහිල්ලා නොයෙක් ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. ඒ වාගේම, අද සමාජය තුළ විවිධ දුර්මත තිබෙනවා. අපි දන්නවා, පාසල් යන ළමයි, පන්ති යන ළමයි අතර මතයක් තිබෙනවා පුවක්, එහෙම නැත්නම් බුලත් කාලා ඒවා කටේ තබාගෙන හිටියාම මතක හිටිනවා කියලා. ඒක තමයි කියන්නේ, ආකල්ප වෙනස් වෙන්න ඕනෑ කියලා. මිනිස්සුන්ගේ ආකල්ප වෙනස් කරන්න ඕනෑ. දරුවෝ ටික රැක ගන්න ඕනෑ. ඔවුන් විවිධ රෝගාබාධවලට ලක් වෙනවා. ඒ වාගේ දේවල් ගැන මෙච්චර කාලයක් අවධානය යොමු කළේ නැහැ.

ඒ වාගේම වැසිකිළි - කැසිකිළි පහසුකම් ගැන කථා කරනකොට සංචාරක ව්‍යාපාරය ගැනත් කියන්න ඕනෑ. අද සංචාරකයන් අපේ රටට එනවා. නමුත්, ඒ සංචාරකයන්ට යන්න සුදුසු විධියට, ඒගොල්ලන් කැමැති විධියට වැසිකිළි නැහැ. ඒගොල්ලන් කැමැති වැසිකිළි වියළි ස්වරූපයෙන් තිබෙනවාටයි. ඒවා ගැන කොතැනකවත් හිතලා නැහැ. ඒක තමයි සිද්ධිය. ඒ වාගේම තමයි, ගොඩක් වෙලාවට සංචාරකයෝ මේ රටට එනකොට හිතනවා, අපේ රටේ ආගන්තුක සත්කාර හොඳයි, පරිසරය හොඳයි, හොඳ ඔක්සිජන් තිබෙනවා කියලා. හැබැයි, ඔබතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ කරපු දේවල් නිසා මිනිස්සු ඉන්නේ හරිම stress එකෙන්.

ඒ නිසා ඉස්සර වාගේ "ස්තුතියි" කියන්නේ නැහැ. වරදක් වුණාම “Sorry!” කියන්නේ නැහැ. ඔබතුමන්ලා අන්න ඒ තත්ත්වයට මිනිසුන්ව වෙනස් කළා. ඒ විධියට මිනිසුන්ගේ ආකල්ප වෙනස් කරලා තිබෙනවා. මිනිස්සු හැල්මේ දුවනවා. මහා මාර්ගයේ දුවන බස් එකක් ගත්තොත්, අධික ලෙස horn එක ශබ්ද කරනවා අපට පෙනෙනවා. Bus stand එකට ගිහිල්ලා බැලුවාම පෙනෙනවා, ඉස්සරහා බස් එක යනකල් horn එක ඔබාගෙන ඉන්නවා. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඇයි? ඒගොල්ලෝ ලොකු රේස් එකකට ඇදලා දාලා. ඒගොල්ලන්ට ප්‍රශ්න තිබෙනවා. අපි ඒ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙනවා. අන්න ඒ විධියට තමයි අපි පටන් ගන්නේ. ඒ විතරක් නොවෙයි. අපි දකිනවා, සමහර බස් කොට-කොටා යන හැටි. සමහර ඒවා රේස් යනවා. එතකොට ජීවිත අවදානමක් ඇති වෙනවා. ඔන්න ඔය තත්ත්වය තමයි තිබෙන්නේ. මේ ප්‍රශ්න ඇති කළේ ඔබතුමන්ලා.

දැන් හාල් ගැන කථා කරනවා. ඒ ප්‍රශ්නය ඇති කළේත් ඔබතුමන්ලා. අපි වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කරනවා. ඔබතුමන්ලා අතහැර දමා තිබුණු වී ගබඩා සංකීර්ණ අපි නැවත පවත්වාගෙන යනවා. මේ ප්‍රශ්න අපි අනාගතයට ඉතුරු කරන්නේ නැහැ. ඒ කාරණය මතක තියාගන්න. අපි කියන්නේ මේක මෙතැනින්ම clean වෙන්න ඕනෑ කියන එක. අපි පසුගිය දවස්වල දැක්කා, quotation එකක් අරගෙන ඇවිල්ලා ඒක මෙන්න මෙච්චරයි කියලා කියනවා. ඒ quotation එක මොකක්ද කියලාවත් දන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ඒ වාගේම සමහර අය මේ system change එක, මේ වෙනස ඇති කරන්න මුල් වුණු කලාකාරයින්ට බයයි. මුලින් කිව්වා, සංගීත් වික්‍රමසිංහ කියලා. ඊට පස්සේ කියනවා, සංගීත් විජේසූරිය කියලා. Clean Sri Lanka වැඩසටහනට කිසිසේත්ම සම්බන්ධ නැති අයට මඩ ගැහුවා. සමාජ මාධ්‍ය යොදාගෙන, "හිරු" වාගේ විවිධ මාධ්‍ය යොදාගෙන මඩ ගැහුවා. අන්න ඒ නිසායි අපි කියන්නේ, මේ ඔක්කෝම clean කරන්න ඕනෑ කියලා. මෙතැන විතරක් නොවෙයි, මේවාට සම්බන්ධ මහත්වරු මෙතැනින් එළියේත් ඉන්නවා. විදුලි බලයට සම්බන්ධ හිටපු ඇමති කෙනෙකුත් ඉන්නවා. ඔහුම කිව්වා, "ළාමක ටිංටිං" කියලා. අන්තිමට ඔහුම ළාමක ටිංටිං ට කඩේ ගිහිල්ලා, ඔහු "ළාමක පිංපොං" වුණා. ඒගොල්ලෝ දැන් විදුලි බලය ගැන කියනවා. ඒගොල්ලෝ තමයි ජාතිවාදයේ ඔස්තාර්ලා. රාජපක්ෂලාටත් වැඩිය ජාතිවාදය ඇවිස්සුවේ ඒගොල්ලන්; ඔය පාඨලීලා. ඒගොල්ලෝ reject වුණේ මේ system change එකත් එක්කයි. ඒගොල්ලෝ විතරක් නොවෙයි, ගොඩක් අය reject වුණා. ගම්මන්පිල දැන් තරංගෙට විහිළු සපයමින් ඉන්නවා. ඒ නිසා මේ Clean Sri Lanka ව්‍යාපෘතිය තුළ ඒ සියලු දේ වෙනස් කරමින්, ආකල්පමය වෙනසක් ඇති කරමින් තමයි අපි මේ රට ඉදිරියට අරගෙන යන්නේ.

දැන් සමහර අය එහෙන් මෙහෙන් පොහොර ගැන කථා කරනවා. පොහොර නොලැබුණු අය ගැන දුකෙන් කථා කරනවා. නමුත් ගොවීන්ගෙන් සියයට 95කට පොහොර ලැබුණු එක ගැන කථා වෙන්නේ නැහැ. රුපියල් 15,000ක් ලෙස තිබුණු පොහොර සහනාධාරය රුපියල් 25,000ක් කරපු එක පෙනෙන්නේ නැහැ. බෙහෙත්වල මිල අඩු කරපු එක පෙනෙන්නේ නැහැ. ඒ වාගේම සිමෙන්ති මිල රුපියල් 100කින් අඩු කරපු එක පෙනෙන්නේ නැහැ. අන්න ඒ නිසා ඔබතුමන්ලාගේ හිත් clean වෙන්න ඕනෑ. මේ සමාජයේ ඇත්ත, යථාර්ථය දකිමින් මේ සමාජය උසස් තැනකට ගන්න Clean Sri Lanka ව්‍යාපෘතිය තුළ අපි කටයුතු කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may continue your speech after lunch. The Sitting is suspended for lunch till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවින්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට තවත් විනාඩි 6ක කාලයක් තිබෙනවා. ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු රවින්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, Clean Sri Lanka ව්‍යාපෘතිය සම්බන්ධවයි මම කථා කරමින් සිටියේ. Clean Sri Lanka ව්‍යාපෘතිය කියන්නේ මොකක්ද කියන එක ගැන අපට අවබෝධය නැහැ කියලා ඇතැම් මන්ත්‍රීතුමන්ලා කිව්වා. ඒ ගැන අවබෝධය නැත්තේ ඇත්තටම ඒ කථා කරපු අයටයි. අපි දැක්කා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු voice-cuts දෙනවා. ඒ, මා කලිනුත් කිව්වා වාගේ ජනතාව අතර සිටිමින් නොවෙයි. ඒ අය mikes ටිකක් ගෙනැල්ලා voice-cuts දෙනවා, මේක පාරවල් අතුගාන වැඩක්, පාරේ තිබෙන කුණු ටික අයින් කරන වැඩක් කියලා. අන්න ඒ විධියට තමයි ඒගොල්ලන් මේ Clean Sri Lanka ව්‍යාපෘතිය දකින්නේ. නමුත්, මේ Clean Sri Lanka ව්‍යාපෘතිය ඊට එහා ගිය පුළුල් වැඩ පිළිවෙළක්. ඒ පුළුල් වැඩ පිළිවෙළේ ආරම්භය තමයි මේ සනිටුහන් වෙන්නේ. අර කිව්වා වාගේ මේක යම් නිශ්චිත කාල වකවානුවකදී අවසන් වන දෙයක් නොවෙයි.

ඔබ සැම දන්නවා, මේ රටේ ජනාධිපතිවරයා ආදර්ශ සපයන බව. තමන්ට වැය කරන්නට වෙන් කර තිබෙන රුපියල් බිලියන 140ක් කපා හරිමින් එතුමා ඒ ආදර්ශය ලබා දෙනවා. පිට රටවල ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කටයුතු කරන ආකාරය දැකපු අපි අද ඒ තත්ත්වය ශ්‍රී ලංකාවේත් දකිනවා. පරිවාර රථ පිරිවරාගෙන, ආරක්ෂකයන් පිරිවරාගෙන, වන්දනීය, පූජනීය විධියට මැති ඇමතිවරුන් හිටපු ඒ සංස්කෘතිය දැන් වෙනස් වෙලා තිබෙනවා. ඒක Clean Sri Lanka තුළින් අප ලබා දෙන ආදර්ශයක්. අද විවිධ කැප කිරීම් කරනවා අපි දකිනවා. අද ඇමතිවරුන් නිල නිවාස ගන්නේ නැතුව වැඩ කරනවා. කලින් ඒ නිල නිවාසවලට විශාල වියදමක් දරා තිබුණා. අද අපේ ඇමතිවරු නිල නිවාස ගන්නේ නැතිව වැඩ කරනවා.

මෙහිදී කථා කළා නේ බාර් පර්මිට් ගැනත්. මා කලිනුත් කිව්වා වාගේ අපේ කිසිවෙක් බාර් පර්මිට් ගන්නේ නැහැ. ඒ වාගේම තමයි, කාර් පර්මිට් ඉල්ලලාත් නැහැ, ගන්නේත් නැහැ. ඔය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ කැප කිරීම් කරන්න සිද්ධ වෙනවා. කොමිස් කථා කොහොමත් නැහැ. බාර් පර්මිට් නැහැ; කාර් පර්මිට් නැහැ. මේක මහ ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක්.

අපි දකිනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් යම්කිසි පීඩනයකින් සිටින බව. ආරම්භයේ සිටම ඒ පීඩනය අපි දැක්කා. ඒ පීඩනය තමයි ඔවුන් ගොඩක් වෙලාවට පිට කරන්නේ. මේ සභා ගර්භය තුළදී දැක්කත්, ඉන් පිටතදී දැක්කත් ඔවුන්ගේ පීඩනය අපි දකිනවා. විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරුන්ගේ මුහුණු වෙනස් වෙලා. ගොනා පයින් ගහපු ලන්තෑරුම් වාගේ තමයි ඒ ගොඩක් අයගේ මුහුණු. ඒ පීඩනය තමයි ඔවුන් ඔය පිට කරන්නේ කියා අපි දන්නවා. ඒ පක්ෂවලින් ආපු නවක මන්ත්‍රීවරු අපෙන් අහනවා, ආණ්ඩුවට දින 100යි, හොරු ඇල්ලුවාද කියලා. හොරු අල්ලනවා කියන එක ඇත්තටම මේ කාර්යභාරයේ එක් ප්‍රධාන අංගයක්. ඒක සිද්ධ වෙනවා. හොරු අල්ලනවා කියන්නේ අපි ගිහින් අතින් අල්ලනවා නොවෙයි. ඒ මන්ත්‍රීවරයාට මම කියනවා, වටපිටාව බැලුවා නම් ඔබතුමාට හොරු දකින්න ලැබෙයි කියලා. ඒ හොරු ඔවුන් බව ඉතාම නුදුරු දිනයකදී ඔප්පු වෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව වාගේ ආයතන හරහා තමයි ඒ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ. ඒ ක්‍රියාවලිය කඩිනම් වන බව කවුරුත් දන්නවා. ඒ කියන කාරණා එක්ක බලද්දී, පීඩනයක් තිබෙන නිසාම එතුමන්ලා ගොඩක් වෙලාවට  වෙනස් වෙනස් කථා කියනවා. බොහෝ අය දන්නේ නැහැ පාසල් දරුවන්ට පාසල් උපකරණ ගන්න රුපියල් 6,000ක මුදලක් ලබා දුන් බව. කාටද ඒක ලැබුණේ කියලා විපක්ෂය අහනවා. අස්වැසුම ප්‍රතිලාභ ලැබෙන හැම දෙනාටම ඒ මුදල ලැබුණා. හැබැයි, "අස්වැසුම" ලැබෙන අය සම්බන්ධ lists හැදුවේ ඔබතුමන්ලායි. එය නිවැරදි කිරීම ඉතාම නුදුරේදී සිද්ධ වෙනවා. අස්වැසුම නොලැබෙන පිරිසකට ඒ මුදල ලැබෙනවා. අඩුපාඩු සියල්ල අපි නිවැරදි කරනවා. ඒ වාගේම, ළමයි 300ට අඩු පාසල්වල සියලු සිසු දරු දැරියන් සඳහා ඒ මුදල ලබා දී තිබෙනවා. ළමා නිවාසවල සිටින සහ පිරිවෙන්වල සිටින දරුවන් වෙනුවෙන් ද ඒ මුදල ලබා දී තිබෙනවා. ලංකාවේ මුළු පාසල්වලින් තුනෙන් දෙකකට දැනටමත් ඒ මුදල ලබා දී තිබෙනවා.

ඔබතුමන්ලා යම්කිසි project එකක ඉන්නවා, මේ රජය මාස 6න් වට්ටන්න, අවුරුද්දෙන් වට්ටන්න, අවුරුදු 5න් වට්ටන්න. මතක තබාගන්න, මේ ආණ්ඩුව මාස 6න් වැටෙන්නේ නැහැ, අවුරුද්දෙන් වැටෙන්නේ නැහැ, අවුරුදු 5න් වැටෙන්නේත් නැහැ. යළි කිසි දිනෙක අර ජරාජීර්ණ, කුජීත සංස්කෘතියට නැවත යන්න මේ රටේ මිනිස්සු කැමැති වෙන්නේ නැහැ. ඔබතුමන්ලාට එවැනි සිහිනයක් තිබෙනවා නම් ඒ සිහිනය වෙනස් කර ගන්න. යම්කිසි විධියකින් යළි බලයට පත් වෙන්න ඔබතුමන්ලාට අදහසක් තිබෙනවා නම්, ඔබතුමන්ලා වෙනස් වෙන්න. හිත clean කර ගන්න, ක්‍රියාකාරිත්වය clean කර ගන්න. අන්න ඒක තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ. අප මේ යන ගමනට අකුල් හෙළන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමන්ලාගේ සියලු පක්ෂ එකතු වෙනවා ලු. එහෙම කියනවා අපි දැක්කා. නමුත්, එතුමන්ලාම නේ අපට කිව්වේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක අපි ඩීල් දානවා කියලා. එහෙම කියපු අය දැන් කියනවා, පක්ෂ ඔක්කොම එකතු වෙනවා කියලා. ඉතින් එකතු වෙන්න. අපි ඔය ඔක්කොම එක මිටකට තියලා තමයි පැරැද්දුවේ. ඒ විධියට තමයි අපි තුනෙන් දෙකක බලයක් ගත්තේ. ඒ විධියට තමයි අපි මන්ත්‍රී ධුර 159ක් දිනා ගත්තේ. අපි ඔබතුමන්ලාව එක මිටකට තබා පරද්දලා ඉවරයි. ඔබතුමන්ලා එකතු වුණොත් වෙන්නේ ඔබතුමන්ලා පරාජය කරන එක අපට තවත් ලේසි වන එකයි. එළඹෙන පළාත් පාලන මැතිවරණයේදීත්, ඒ වාගේම පළාත් සභා මැතිවරණයේදීත් මේ ජයග්‍රහණය දෙගුණ, තෙගුණ වන බව ස්ථිරයි. අර කිව්වත් වාගේ, අපට තිබුණු සියයට 3 ඡන්ද ප්‍රතිශතය, සියයට 42 වෙලා, සියයට 50 ඉක්මවලා, සියයට 60 ඉක්මවන විටවත් කරුණු තේරුම් ගන්න ඔබතුමන්ලාට බැරි වුණා. ආන්න ඒ වාගේ තමයි මේ රට හදන විධිය ගැනත් ඔබතුමන්ලාට තේරුම් ගන්න බැහැ. එය තේරුම් ගන්න නම් ඔබතුමන්ලාගේ හිත පිරිසිදු කර ගන්න, clean කර ගන්න ඕනෑ; හිත පිරිසිදු වෙන්න ඕනෑ; මේ අලුත් දේශපාලන සංස්කෘතියට අනුගත වෙන්න ඕනෑ. ඔබතුමන්ලාගේ කැපෙනවා කියන වරප්‍රසාද අපි මේ රටේ දියුණුව සඳහා යොදා ගන්නවා. අපි එකතු වෙලා මේ රට දියුණු කරමු. මේ රට දියුණු කරන සාධනීය යෝජනා ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම මා කරනවා.

හැමෝටම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you. Good afternoon everybody!

It has been one month since I complained in this House that time is not allotted to me to speak in Parliament. On 18th December, I made a written request in that regard and today is 21st January, 2025. More than a month has passed and time has not yet been allotted to me to speak. Therefore, please, kindly consider my request. If you continue doing this, there will be no reconciliation between the two communities which fought a war for 30 years. Madam, I made a request and there is no committee appointed to consider that. Today, I went to a Parliamentary Committee and learnt that there is no committee that has been appointed to take up this matter of Privilege. So, please find -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දී තිබෙන ලිඛිත ලියවිල්ල ගැන ගරු කථානායකතුමා සමඟ සාකච්ඡා කරලා හෙට උදේ තීරණයක් ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ විනාඩි 8 අඩු වුණේ නැහැ නේද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නැහැ, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 1.07]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. Clean Sri Lanka වැඩ පිළිවෙළේ කිසිම ගැටලුවක් නැහැ. ඒක හොඳයි. ලංකාව clean වනවාට අපි කවුරුත් කැමැතියි. පරිසරය විතරක් නොවෙයි, ආධ්‍යාත්මික, සමාජීය ආදි සියලු අංශ clean වීම සිදු වෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා කියපු කථාව හරි. හිත clean කර ගන්නත් ඕනෑ. අපි ඒක කරමු. ඒ සම්බන්ධයෙන් කකුලෙන් ඇදිල්ලක් අපේ නැහැ. නමුත්, අපි තේරුම් ගන්න ඕනෑ, පිරිසිදු කිරීම කියන එක සීමා කරන්න බැරි බව. මේ දක්වා ඔබතුමන්ලා කරපු වැඩවලින් ජනතාව හිතන්නේ මේ යටතේ කරන්නේ environment එක සුද්ද කරන එක සහ ත්‍රීවිලර්, බස් රථවල අනවශ්‍ය උපාංග ඉවත් කරන එක විතරක් කියලායි. ඔබතුමන්ලා Clean Sri Lanka වැඩසටහනට අපේ සහයෝගය ඉල්ලා තිබෙනවා. එයට අපේ සහයෝගය ලබා දෙන්නම්. ඒකේ කිසි අවුලක් නැහැ.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කථා කරන කොට කිව්වා, VFS ගනුදෙනුව සම්බන්ධයෙන් කවුරු හරි රක්ෂිත බන්ධනාගාරගත කිරීමක් කර තිබෙනවා කියලා. ඒක සත්‍යයක්ද, ගරු අධිකරණ ඇමතිතුමනි? Clean Sri Lanka වැඩසටහන අතරවාරයේ එය සිදු වුණා ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඒක Clean Sri Lanka වැඩසටහනේ කොටසක් නොවෙයි. ඒක අධිකරණයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයේ කොටසක්. මගේ කථාවේ කොටස් දෙකක් තිබුණා. එකක් Clean Sri Lanka ව්‍යාපෘතියේ දේවල්. අනෙක් එක, රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය. ඔබතුමා කියන්නේ, ඒ යටතේ කෑල්ලක්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
දැනට එක්කෙනෙක් රක්ෂිත බන්ධනාගාරගත කරලා තිබෙනවාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒ වෙලාවේ දඬුවම් ලැබුණා කියලා මා දන්නවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම හොඳයි. ඒකත් clean කිරීම යටතේ තමයි අප දකින්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, මම පැහැදිලිව මේක කියන්න ඕනෑ. මගේ කථාවේ කොටස් දෙකක් තිබුණා. යුක්තිය පසිඳලීම-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගැටලුවක් නැහැ. මොකද, මා දකින Clean Sri Lanka වැඩසටහන යටතේ දූෂිතයෝ ඔක්කෝම clean කරන්නත් ඕනෑ. දූෂිතයෝ clean කරන එකත් Clean Sri Lanka වැඩසටහනේ කොටසක් වෙන්න ඕනෑ. ඒක කොටස් දෙකකට හදා ගන්න එපා. ගරු ඇමතිතුමා, clean කිව්වාම, ඔබතුමන්ලා කියන්නේත්, අප කියන්නේත් මේ ඔක්කෝම clean කරමු කියන එකයි. ඒ ගැන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී ආන්දෝලනාත්මක ප්‍රශ්නයක් මතු වුණා. පෞද්ගලිකව පොහෝ පීඩා විඳගෙන අපි පිටු 665ක වාර්තාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඉතින් ඒක ක්‍රියාත්මක විය යුතුයි. වීසා ප්‍රශ්නය පිළිබඳවත් සොයා බලන්න ඕනෑ. ඊට අදාළ clean කිරීමේ වැඩේත් කරගෙන යන්න. ඒ ගරු ඇමතිතුමා කථා කරද්දී තවත් දෙයක් කිව්වා. Clean Sri Lanka වැඩසටහන යටතේ -ඒ කොටසට අදාළව- වෙන්න ඕනෑ, ඒකත් කිව්වේ. එතුමා කිව්වා, "ගෙවල් අරගෙන නැහැ. ගෙවල් ගන්නේ නැහැ. Backups දාගෙන යන්නේ නැහැ" කියලා. ඒක හොඳයි. අපිත් ගෙවල් අරගෙන නැහැ. අපිත් backups දාගෙන ගිහිල්ලා නැහැ. ඊළඟට, "ඥාතීන් පත් කරන්නේ නැහැ" කිව්වා. අපිත් කවදාවත් ඥාතීන් පත් කරලා නැහැ, අමාත්‍යාංශයටවත්, පෞද්ගලික කාර්ය මණ්ඩලයටවත්.

නිකම් බෙහෙත් අරගෙන නැහැ කිව්වා. අපිත් එහෙම බෙහෙත් අරගෙන නැහැ. ඊට පස්සේ කිව්වා, අධිකරණ සංකීර්ණය කවුද කළේ කියලා ඒ සමරු ඵලකයට නම දැම්මේ නැහැ කියලා. ඒ වාගේම එතුමා කිව්වා, බෝක්කු හදනකොටත් සමහරු නම් දැම්මා කියලා. අපේ කෝට්ටේ මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමා සහ අපි හොඳට දේශපාලනය කරනවා. කිසිම දවසක විමධ්‍යගත අරමුදලින් යමක් කරලා අපි ඒකට අපේ නම දාලා නැහැ. අපි ඒකට ස්තුති කරලා තිබෙන්නේ බදු ගෙවන ජනතාවට පමණයි.

ඒ වාගේම, ස්වේච්ඡාවෙන් වැඩ කරන උපදේශකවරු ඉන්නවා කිව්වා. ඒක හොඳයි. ඒකට හාන්ස් විජේසූරිය වැනි පුද්ගලයන් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අර Texasවල professor කෙනෙක් එහෙම ඇවිල්ලා තිබෙනවා. එතුමාගේ නම උඩුගමසූරිය වාගේ නමක්. ඒවා හොඳයි. හැබැයි, advertise කළේ නැති වුණාට අපිත් එවැනි හොඳ වැඩ කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත්, මා යටතේ තිබුණු 1990 සුවසැරිය එකේ වැඩ කරපු එකම අධ්‍යක්ෂවරයෙකුටවත් කිසි දවසක පඩියක් ගෙවලා නැහැ; office එකක් අරගෙන නැහැ; allowance එකක් දීලා නැහැ; වාහනයක් අරගෙන නැහැ. මම ඒ අය කවුද කියලා නම් වශයෙන් කිව්වොත් හොඳයි. එක්කෙනෙක් දුමින්ද රත්නායක මැතිතුමා. විජය මලලසේකර මැතිතුමා, එතුමාගේ අභාවය වනතුරු කටයුතු කළා. ඒ වාගේම විශ් ගෝවින්දසාමි මැතිතුමා, මහාචාර්ය අසිත ද සිල්වා මැතිතුමා, සන්ධ්‍යා සල්ගාදු මැතිනිය ඒකේ වැඩ කළා. මම දැක්කා, සන්ධ්‍යා සල්ගාදු මැතිනිය ඔබතුමන්ලාගේ Clean Sri Lanka වැඩසටහනටත් එකතු වෙලා තිබෙනවා. ඉතින් අපි ඒවා advertise කළේ නැති වුණාට කිසිම දවසක ඒ අයට පඩි ගෙවලා, වරප්‍රසාද දීලා, වාහන දීලා නැහැ. ඉතින් සමහර වෙලාවට අපිත් ඒ විධියටම වැඩ කරලා තිබෙනවා. ඒ නිසා තමයි මම කිව්වේ ගරු ඇමතිතුමා, ගරු අගමැතිතුමියනි. අපිත් සූදානම් මේකට එකතු වෙලා වැඩ කරන්න කියලා. ඒ නිසා මම මෙතැනට කියන්න ඕනෑ, clean කරනකොට අපිත් ඇත්ත වශයෙන්ම ඒක හරියට තේරුම් අරගෙන කරන්න ඕනෑ.

මට තව වචනයක් කියන්න ඕනෑ, විදුලි බිල සම්බන්ධයෙන් මෙතැන දිගින් දිගටම කථා වෙච්ච නිසා. දැන් කවුද කෙනෙක් කිව්වා, PUCSL එක ආණ්ඩුවට තමයි අයිති, ඒ නිසා PUCSL එකෙන් දීපු තීන්දුව පිළිගත්තා කියලා. නමුත් එහෙම නොවෙයි මේක කලින් සිද්ධ වුණේ. සභාපතිවරයා කිව්වා, විදුලි බිල සියයට 37කින් වැඩි කරන්න ඕනෑ කියලා. ගරු ඇමතිතුමා මේ සභාවේදී ඒ සම්බන්ධයෙන් කථා කළා. එතකොට මම Privilege matter එකක් මෙතැනට ගෙනාවා, කොහොමද එහෙම කියන්නේ, CEB එකට පාඩුයි කිව්වාට CEB එක පාඩු නැහැ, බිලියන සිය ගණනක් ලාභයි කියලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන්නත් ඕනෑ කියලා මම කිව්වා. සභානායකතුමාත් ඒක පිළිගත්තා. ඉතින් මම දකින විධියට ඒක dirty; that is not clean. ඒ dirty එක clean කරන්න ඕනෑ. මොකද, මතයක් හදන්න උත්සාහ කළා CEB එකට පාඩුයි, ඒ නිසා විදුලි බිල අඩු කරන්න බැහැ කියලා.

විදුලි බිල අඩු කරන්න බැහැ කිව්වා. හැබැයි, සියයට 30කින් අඩු කරනවා කිව්වේ අද හෙට නොවෙයි, අවුරුදු තුනකින්. That is dirty; that is not true and clean. අපි පෞද්ගලිකවත් ගිහිල්ලා, public consultationsවල පෙනී සිටියා. පෙනී ඉඳලා අපි පෙන්වා දුන්නා, ඔබතුමන්ලාගේ මේ calculations සම්පූර්ණයෙන්ම වැරදි බව. මොකද, CEB එකට පුළුවන් අඩුම වශයෙන් සියයට 11කින් මිල අඩු කරන්න. අපි කිව්වා ඊට වඩා මිල අඩු කිරීමත්, tariff අඩු කිරීමත් කරන්න පුළුවන්, ඒ නිසා ඒක කළ යුතුයි කියලා. ඒ නිසා clean කරනකොට මේ සියලු දේම clean වෙන්න ඕනෑ. අපි කවදාවත් PUCSL එකට විරුද්ධව වැඩ කළේ නැහැ. 2002දී තමයි කරු ජයසූරිය ඇමතිතුමා යටතේ ඒක නිර්මාණය කළේ.

තව එකක් මම කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ වාගේම වෙන්න පුළුවන් petroleum pricing එකත්. දැන් petroleum pricing එකේත් transparency එකක් නැහැ. ඒවාටත් consultations තිබෙනවා නම් අපට පුළුවන් ගිහිල්ලා පෙන්වන්න, මේ ඉදිරිපත් කරලා තිබෙන දත්ත හරි නැහැ කියලා. මොකද, ඇත්ත වශයෙන්ම petroleum pricingවල regulatorත් PUCSL එකම තමයි. ගිය ආණ්ඩුව ඒකට වෙනම regulator කෙනෙක් ගේන්න ඕනෑ කිව්වාම අපි ඒකට විරුද්ධ වුණා. අපි කිව්වා, PUCSL එක තිබෙනවා, ඒකට petroleumත් අයිතියි, waterත් අයිතියි, electricityත් අයිතියි කියලා. දැන් එතකොට ජල ගාස්තු හරියට තීරණය වෙනවාද කියන එක ගැන කවුද දන්නේ? පෙට්‍රෝලියම් මිල හරියට තීරණය වෙනවාද කියලා කවුද දන්නේ? ලයිට් බිල හරියට තීරණය වෙනවාද කියලා අපි දැනගෙන හිටියේ නැහැ. ඒගොල්ලන් කියපු දේ තමයි පිළිගත්තේ. හැබැයි, අවසානයේදී public consultation එකෙන් පස්සේ ඒගොල්ලන්ට පිළිගන්න වුණා, ඒගොල්ලන්ගේ dirty වැඩේ clean කරන්න ඕනෑ කියලා. එහෙම නම් පෙට්‍රෝලියම් මිලත් dirty නම් clean කරන්න ඕනෑ. Water tariffsත් dirty නම් ඒවා clean කරන්න ඕනෑ. ඉතින් ඔන්න ඔය කථාව මම මේ අවස්ථාවේදී පැහැදිලි කරලා දුන්නේ මේ නිසායි. මොකද, clean කිව්වාම,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි.

ඇත්ත කථාව තමයි ඉස්සර මිනිස්සු පාරට කුණු දැම්මා. දැන් පාරට කුණු දමන්නේ නැහැ. ඒක හොඳයි, ලස්සනයි. අපේ රට ලස්සනයි. ඒක හොඳයි. කවුරුත් ඒකට කැමැතියි. ඇත්ත වශයෙන්ම මේ සියලු දේට හදවතින්ම අපේ උදවු ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වැඩ පිළිවෙළ හරියට කරගෙන යමු කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.15]

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර ඇති යෝජනාවට අදාළව කරන විවාදයේදී, එහි අරුත, එහි ක්‍රියාකාරිත්වය අපැහැදිලි බව විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රකාශයට පත් කරනවා. කොහොමටත් සමහර ක්‍රියාකාරකම්වලට, සමහර යෝජනාවලට, සමහර ප්‍රතිපත්තිවලට අදාළ තීන්දු ක්‍රියාත්මක වූ තත්ත්වය අනුව මෙවැනි දේවල් තේරුම් ගන්න අමාරුයි. අපි ඒක දන්නවා.

නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, Clean Sri Lanka වැඩසටහන පැහැදිලි නැහැ, බාර් සංස්කෘතියක් නිර්මාණය කර තිබෙනවා, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් වෙනුවෙන් සැලසුම් නිර්මාණය වෙන්නේ නැහැ කියලා. අපි කියනවා, අපේ රටේ clean වෙන්න ඕනෑ ගොඩක් දේවල් clean වෙලා නැති බව. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා වාගේ ඇත්තටම පසුගිය මැතිවරණය ඇතුළේ අපට ගොඩක් දේවල් කර ගන්න තිබුණා. මේ රටේ ජනතාව සමහර දේවල් නිවැරදිව කර ගන්න අසමත් වෙලා තිබෙනවා. ඒක අපි නිවැරදි කර ගන්න ඕනෑ. ප්‍රධාන වශයෙන් Clean Sri Lanka වැඩ පිළිවෙළ පැහැදිලි නැත්නම් අපි ඒක පැහැදිලි කර ගන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ යෝජනාව තුළත්, අපේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් දැක් වූ අදහස් තුළිනුත් ඒක තහවුරු වනවා.

ප්‍රධාන දේ මේකයි. ශ්‍රී ලංකාව අතීතයේ කොතැනද හිටියේ, අපට උරුම වුණු තැන මොකක්ද කියලා අපි දන්නවා. ආසියාව ඇතුළේ 1950 දශකය වනකොට ජපානයට විතරක් දෙවැනි වෙලා තිබුණු ආර්ථිකයක් අපේ රටට උරුම වෙලා තිබුණා. හැබැයි, වසර 2025 වනකොට, අපට බලය ලැබෙනකොට අපේ රට කඩා වැටුණු ආර්ථිකයක් සහිත රටක්, බංකොලොත් රටක්, මන්දපෝෂණයෙන් පිරුණු රටක්, මහ ව්‍යසනවලට ලක් වෙච්ච රටක්. ඒ වාගේම අපේ රටේ තරුණයන්ට රට දාලා යන්න බල කරපු රටක්. මේ රටේ ආදරණීය අම්මලා, තාත්තලාට කිරි දරුවෝ දාලා විදෙස් රටක වහල් සේවයට යන්න බල කරපු රටක්. නේද? මේ රට කර්මාන්ත කඩා වැටුණු, දේශීය වශයෙන් තිබුණු කර්මාන්ත අභාවයට ගිය රටක්. ළමා ගණිකාවන් නිර්මාණය කරපු රටක්, ළමා අපචාරවලට ගොදුරු කරපු රටක්, දෙමාපියන් මහ පාරට ඇදලා දමපු රටක්. නේද? අපි විශ්වාස කරනවා, මෙවැනි තත්ත්වයක් නිර්මාණය කරපු පාලකයන්ට, ඒ දේශපාලන පක්ෂවලට මේ වැඩ පිළිවෙළ පිළිබඳ ගැටලුවක් තිබෙනවා, නොතේරුම් කමක් තිබෙනවා කියලා.

ලෝකයේ රටවල මිනිස්සු ජීවිත විඳින විධිය අපි දැකලා තිබෙනවා. බාර් සංස්කෘතියක් නිර්මාණය කරපු, තමන්ගේ ජීවිත ගොඩනඟා ගන්න ඒවා පාදක කර ගත්ත උදවිය මේ බාර් සංස්කෘතිය පිළිබඳව මහ කනගාටුවකින්, දුකකින් අද කථා කරනවා. නේද? ජීවිත විඳින මිනිස්සු ඉන්න රටවල් ලෝකයේ තිබෙනවා. ඒ රටවල මිනිස්සුගේ ජීවිත ගත වන විධියෙන්ම ඒ මිනිස්සු දන්නවා, ජීවිතය විඳින්නේ කොහොමද කියලා. හැබැයි, පීඩාවට, අසහනයට, දරිද්‍රතාවට පත් වෙච්ච රටක, මානසික බිඳ වැටීම් එක්ක ජීවත් වන මිනිස්සු ඉන්න රටක, පවුල් ජීවිතය කඩා වැටුණු, ආර්ථිකය බිඳ වැටුණු රටක මිනිස්සුන්ගේ සතුට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා ජීවිතය සතුටින් ගත කරන්න බැරි මානව සමාජයක් නිර්මාණය කර තිබෙනවා.

මිනිසුන්ට මත් පැන් බොන්න දීලා, ඒ සංස්කෘතියට හුරු කරලා බාර් එක මොකක්ද, ජීවිතය සතුටින් ගතකරන්න ඕනෑ සීමාව මොකක්ද කියලා හඳුනාගන්න බැරි වෙන තරමට සමාජ ප්‍රශ්න වපුරලා, ඒවා ඔද්දල් කරලා ඒ තත්ත්වය ඇතුළේ මිනිසුන්ට තම ජීවිතය අහිමි කරලා තිබෙනවා. කිසිදු බලාපොරොත්තුවක් නැතිව ලෝකය දිහා බලාගෙන ඉන්න මිනිස්සු නිර්මාණය කරලා, ඒ තුළ විඳවන ජීවිත පහත් විධියට තෘප්තිමත් කරන්න තමයි මේ පාලකයින් ක්‍රියාත්මක වුණේ. ඒ සමාජ ක්‍රමය වෙනස් කරන එක, තෘප්තිමත් මනුස්සයෙක් නිර්මාණය කරන එක, සතුටින් ජීවත් වෙන මනුස්සයෙක් මේ මහ පොළොවේ නිර්මාණය කරන එක අපේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ තිබෙනවා කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මේක ඇතුළේ පරිවර්තනය වෙන්න ඕනෑ කරුණු ගණනාවක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් අපි කාටත් ඕනෑ කරනවා කියලා අපි හිතනවා. ඒ අපේක්ෂාව, බලාපොරොත්තුව වෙනුවෙන් තමයි අපි ඉල්ලුවෙත් නැති, අපි බලාපොරොත්තු වුණෙත් නැති බලයක් මේ රටේ ජනතාව අපට ලබා දුන්නේ. අපි ඒ බලාපොරොත්තුව ඇතුළේ තිබෙන අපේක්ෂාව, අරමුණ, යථාර්ථය, ඒ බලාපොරොත්තුවේ දැස් ඇතුළේ ලියවිලා තිබෙන පණිවුඩය කියවා ගන්න පුළුවන් ව්‍යාපාරයක්; පක්ෂයක්. ඒ නිසා ඒ වෙනුවෙන් අපි ගමන ආරම්භ කරලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

අපි සැප්තැම්බර් මාසයේ 21වන දා ජනාධිපතිවරණය තියලා, නොවැම්බර් මාසයේ 21වන දා පාර්ලිමේන්තුව දිවුරුම් දීලා -අපි ව්‍යවස්ථාදායක බලයේ පිහිටලා- මාස දෙකක කාලයක් සම්පූර්ණ වෙන්නේ හෙට දවසටයි. අපි මේ රට ගොඩනඟන්න ආර්ථික සංවර්ධනය ඇතුළේ, මේ රටේ රැකියා උත්පාදනය ඇතුළේ, මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව ඇතුළේ, මේ රටේ බලශක්තිය, නව නිපැයුම් ඇතුළේ, ලෝකයේ විද්‍යාව තාක්ෂණය මේ රට ඇතුළට ගෙන ඒම ඇතුළේ, ලෝකයේ දියුණු රාජ්‍යයන්ගේ තාක්ෂණය, ප්‍රාග්ධන මැදිහත්වීම ඇතුළේ, මේ රට ගොඩනඟන්න පුළුවන් සීමා ඉලක්ක ඇතුළේ කටයුතු කරනවා. ඒ අනුව අපි මේ රට පෙළගස්වන්න සූදානම් වෙනකොට වසර 76ක ඒ සාපයෙන්, ඒ අදූරදර්ශී පාලනයෙන්, මේ රට කඩා වට්ටපු ඒ දේශපාලන සංස්කෘතියෙන්, ඒ අරමුණෙන් ඔබලාට ගැලවෙන්න පුළුවන්කමක් නැහැ කියලා අපි විශ්වාස කරනවා. ඒක ඉතිහාසයේ ඔබ ඉදිරියෙන් ලියැවෙනවා කියලා අපි විශ්වාස කරනවා. මේ රට කඩා වට්ටපු, මේ රට බිඳ වට්ටපු ඒ දේශපාලන ඉතිහාසය භාර ගන්න ඕනෑ කවුද කියලා ඉතිහාසය ඇතුළේ ලියැවෙනවා. අපි ඒ දේශපාලන සංස්කෘතිය මේ රට ඇතුළේ වෙනස් කරලා තිබෙනවා.

ඔබ දන්නවා, අපි ඉතිහාසය තුළ මැතිවරණ දෙකක් ආසන්නයේම පවත්වපු ආණ්ඩුවක් බව. ශක්තිමත් ජනාධිපතිවරයෙකුගේ මෙහෙයවීම යටතේ මහ මැතිවරණය පැවැත්වුණා. හැබැයි, ලංකා ඉතිහාසයේ ප්‍රචණ්ඩත්වය අඩු වුණු, අන් පාක්ෂිකයන්ට අඩන්තේට්ටම් නොවුණු, කාර්යාල ගිනිබත් නොවුණු, canvassing කරන පාක්ෂිකයන්ට පහර පිට පහර එල්ල නොවුණු ආකාරයේ දේශපාලන සංස්කෘතික පරිවර්තනයක් අපි නිර්මාණය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ දේශපාලන සංස්කෘතිය ඇතුළේ සමහර අය ප්‍රකාශයට පත් කරනවා, අපි කවදාවත් ඇමති නිවාස අරගෙන නැහැ; අපි ඒවා භුක්ති විඳලා නැහැ කියලා. කෙනෙක් එහෙම කියද්දී තව තැනක, තමන් රැකියා අරගෙන නැහැ, තමන්ගේ ඥාතීන් ඒ සඳහා යොදවලා නැහැ

කියලා කියනවා. හැබැයි, ලෝකයේ දියුණු රටවල තානාපති කාර්යාලවල, සංස්ථාවල, දෙපාර්තමේන්තුවල මුල් පුටුවල තමන්ගේ පරපුර වපුරපු, පතුරපු දේශපාලන ඉතිහාසයක් අපට තිබෙනවා. ඒ සංස්කෘතිය අමතක කරලා කෙනෙකුගේ යහපත් ගුණයක් තිබෙනවා නම්, අපි එක හුදෙකලාව අගය කරනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු තමන්ට හිමි වරප්‍රසාද අයුතු විධියට භුක්ති විඳින්නේ නැතිව පොදු අරමුණක්, පොදු සැලැස්මක් අනුව කටයුතු කරන බව අපි කියනවා. අන්න ඒ පොදු ඒකමතිකත්වය තිබෙන ආණ්ඩුවක් හැටියට Clean Sri Lanka වැඩසටහන ඇතුළේ අපි හැමෝම එක විධියට වැඩ කටයුතු කරමින් ඉන්නවා කියලා අපි විශ්වාස කරනවා. දේශපාලන සංස්කෘතිය පරිවර්තනය කර ගන්න එක ගොඩක් අමාරු වැඩක්. අපි ඒ අමාරු වැඩේ කරපු ව්‍යාපාරයක්; ආණ්ඩුවක්; පක්ෂයක්. පිරිසිදු රටක් නිර්මාණය කිරීම වෙනුවෙන්, මේ දේශපාලන පරිවර්තනය වෙනුවෙන් ශක්තිමත් බලයක් නිර්මාණය කළේ ජාතික ජන බලවේගයයි කියා අපි විශ්වාස කරනවා.

එම දේශපාලන සංස්කෘතිය ඇතුළේ තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් කටයුතු කරන්නේ නැති දේශපාලන ව්‍යාපාරයක් අපි නිර්මාණය කළා. එවැනි දේශපාලන සංස්කෘතියක් අපි මේ රට තුළ ගොඩනඟා තිබෙනවා.

සමහර අය පසුගිය කාලය තුළ වී ගැන, හාල් ගැන, පොල් ගැන කථා කරමින් විවිධ තර්ක ගොඩ නඟමින් ඔබලාගේ අර්බුදය අපේ අර්බුදයක් බවට පත් කරන්න කටයුතු කරමින් සිටියා. ඔබ දේශපාලන සංස්කෘතියක් පිළිබඳව කථා කරනවා. මේ රටේ වී ගොවිතැන සිදු කරන ගොවියා මහ මෝල් හිමියන් විසින් මාෆියාවකට යට කර අසරණ කර තිබෙනවා කියලා, ඒ ගැන අපෙන් ප්‍රශ්න කරනවා. මෙන්න, "කෝටි පනහේ මන්ත්‍රී කථාවට විපක්ෂයේ පක්ෂයක ගෝරි" කියලා "ලංකාදීප" පත්තරයේ පළ කර තිබෙනවා. කෘත්‍යාධිකාරී මණ්ඩලයේ මරාගන්න ගිහිල්ලා. ඒ ගැන පරීක්ෂණ තියන්න යෝජනා වෙලා. ඒ ව්‍යාපාරිකයා ඇවිල්ලා එම කාර්යාලයේ යකා නටලා. මෙහේට ඇවිල්ලා මෙහෙම කථා කරනවා. නරි හම; හිවල් හම පොරවා ගෙන හාල් නැහැ කියමින්, ඒ බේදාන්තය; ශෝකය ජනතාව එක්ක බෙදා ගන්න කල්පනා කරන විපක්ෂයේ අයට අපි කියනවා, හාල් මාෆියාවට මුල් වුණු, ඒ මාෆියාව පෝෂණය කළ මහ මෝල්කරුවන් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට අරගෙන එන්න ලැහැස්ති වෙලා හිටපු අය දැන් කිඹුල් කඳුළු හෙළමින්, හිවල් හම් පොරවා ගෙන කටයුතු කරන බව. ඒ මිනිස්සුන්ට අපි කියනවා, එවැනි ව්‍යාජ මේ මහ පොළොව තුළ යථාර්ථයක් කරන්න නොහැකි බව. ඒ නිසා අපි මේ Clean Sri Lanka වැඩසටහන ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ශක්තියෙන්, ධෛර්යයෙන්, විශ්වාසයෙන් අපි මේ ගමන යමු. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් නිර්මාණය කරන්න එන්න කියා අපි මේ රටේ ජනතාවට ආරාධනා කරනවා. ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.27]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ රේගු වෘත්තිය සමිති සියල්ලම රාජකාරිවලින් ඉවත් වෙනවා. ඒකට හේතුව තමයි කන්ටේනර් 270ක් පරීක්ෂාවෙන් තොරව එළියට ගිහින් තිබීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රේගු වෘත්තිය සමිති සන්ධානය විසින් ඒ බව සඳහන් කරමින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට යවා තිබෙන ලිපියේ පිටපතක් මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

ඒ අය අද සිට වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට ඇවිත් තිබෙනවා. මේවා රජයට අය විය යුතුව තිබුණු බදු ආදායම්. මේ කන්ටේනර් 270 අස්සේ මොනවා තිබුණාද කියලා අපි දන්නේ නැහැ. එම වෘත්තිය සමිති ලිපියකින් දන්වා තිබෙනවා, ඔවුන් අද සිට රාජකාරිවලින් ඉවත් වෙනවා කියලා.

Clean Sri Lanka වැඩසටහන යටතේ පළමුවැනි උත්සවයට රුපියල් ලක්ෂ 70ක් වැය කර තිබුණා කියලා මම පාර්ලිමේන්තුවේදී කිව්වා. ඒක මම අදත් කියනවා; හෙටත් කියනවා. ඒක නැහැ කියලා මම කියන්නේ නැහැ. මම 09වැනි දා ඒ ගැන පාර්ලිමේන්තුවේදී කිව්වා. 10වැනි දා උදේ 9.45ට ජනාධිපති ලේකම් විසින් Chief Auditor වන කුමාරසිංහ මහත්මයාව ගෙන්වා තිබෙනවා, මේසයට. ඒ වාගේම Accountant ලෙස කටයුතු කරන තාරක මහතාත් මේසයට ගෙන්වා කථා කරලා මේවා වෙනස් කර තිබෙනවා. එහෙම කරලා වියදම ලක්ෂ 9ට හැදුවා; ලක්ෂ 70 ලක්ෂ 9ට අඩු කරලා හැදුවා. මම එදා ඒ ගැන කථා කළ නිසා ලක්ෂ 61ක් ආණ්ඩුවට, රටට ඉතුරු වුණා. ඒක මම කියනවා. ඒක මම ඕනෑම තැනකදී කියනවා. *[බාධා කිරීම්]* ඒ විතරක් නොවෙයි, - *[බාධා කිරීම්]* ඒක විතරක් නොවෙයි, අහගන්න. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නත්තලට ඩුප්ලිකේෂන් පාරේ, ගෝල් ෆේස් එකේ ලයිට් දැම්මා; ඩ්‍රෝන සන්දර්ශන දැම්මා. ඒ විතරක් නොවෙයි, ITN එකෙන් බෑන්ඩ් එකක් ගහලා සන්දර්ශන දැම්මා. ඒවාට කවුද ගෙව්වේ? ආණ්ඩුව ගෙව්වේ නැහැ. ඔයගොල්ලන්ගේ හනීෆ් යූසුෆ් ආණ්ඩුකාරයා සල්ලි ගෙව්වේ. හනීෆ් යූසුෆ්ට මොකක්ද තිබෙන අමාරුව? හනීෆ් යූසුෆ්ට මොකක් හරි වුවමනාවක් ඇති, මේ ආණ්ඩුවට සන්දර්ශන පෙන්වා ආණ්ඩුවේ - අපි නම් දන්නේ නැහැ, ආණ්ඩුකාරවරුන් ඇවිල්ලා එහෙම සන්දර්ශන පෙන්වා, වියදම් කළේ කොහොමද කියලා. නත්තලට ලයිට් දමපු ඒවාටයි, ඔක්කෝටම හනීෆ් යූසුෆ් තමයි වියදම් කර තිබෙන්නේ. ඒකත් අපි මේ වෙලාවේදී කියන්න ඕනෑ.

මම Clean Sri Lanka වැඩසටහන නරකයි කියන්නේ නැහැ, ඒක හොඳයි. ජනවාරි මාසයේ 01වැනි දා තමයි Clean Sri Lanka වැඩසටහන පටන් ගත්තේ. අධිකරණ ඇමතිතුමා, ඔබතුමාගේ කථාව ලස්සනයි; සුන්දරයි. හැබැයි, අධිකරණ ඇමතිතුමා, මේ කාලය තුළ වෙඩි තැබීම් 10ක්, මනුෂ්‍ය ඝාතන 07ක් සිද්ධ වෙලා තිබෙනවා.

ලේ තැවරීම් සිදු වී තිබෙනවා. ජනවාරි මාසයේ 1වැනි දා ඉඳලා 15වැනි දා වෙනකොට තමයි මෑත ඉතිහාසයේ වැඩිම වෙඩි තැබීම් සිදු වෙලා තිබෙන්නේ. අන්න ඒවාත් clean වෙන්න ඕනෑ. මිනිසුන්ට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයකුත් රටේ හැදෙන්න ඕනෑ. එතකොට තමයි රටත් clean වෙන්නේ; මිනිසුනුත් clean වෙන්නේ; මිනිසුන්ගේ නිදහසත් clean වෙන්නේ; මිනිසුන්ගේ ජීවත් වීමේ අයිතියත් clean වෙන්නේ. එතකොට තමයි Clean Sri Lanka වෙන්නේ. නැතුව Clean Sri Lanka වෙන්නේ නැහැ. Clean Sri Lanka වැඩසටහන නිවැරැදිව ක්‍රියාත්මක වෙනවා නම්, මුලින්ම මේ සමාජයෙන් පාතාලය අයින් කරන්න; කුඩුකාරයන් අයින් කරන්න. කුණු අදින එක අපි පස්සේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කරමු. කුඩුකාරයන් ටික අයින් කරන්න. පිලිපීනයට ගිහිල්ලා බලන්න. පිලිපීනයේ හිටපු ජනාධිපති නියෝග කළේ එවැනි පුද්ගලයන් මුහුදට අරගෙන ගිහිල්ලා දමන්න කියලායි. පිලිපීනය හැදුණේ එහෙමයි. ඉස්සර පිලිපීනයේ ජනතාවට නිදහසේ පාරේ බැහැලා යන්න බැහැ. අද ඒ ජනාධිපති බයිසිකල් රයිඩර් කෙනෙක්. එතුමාගේ දුව උප ජනාධිපතිවරියක්. අද ඒ රටේ ජනතාව නිදහසේ ඉන්නවා. පිලිපීනය හැදුණේ එහෙමයි. මීට අවුරුදු 4කට කලින් පිලිපීනියේ තිබුණු තත්ත්වය වෙනස්. අන්න පිලිපීනය clean වෙලා තිබෙනවා. දැන් "Clean Philippine" වෙලා තිබෙනවා. ඒ විධියට හරි කමක් නැහැ, මේ රටේත් එහෙම කරනවා නම්. අපි කියන්නේ නැහැ, කුඩුකාරයෝ, පාතාලකාරයෝ ඉතුරු කරන්න කියලා. ඔක්කෝටම ඉස්සෙල්ලා ඔවුන් අයින් කරන්න ඕනෑ. අන්න ඒකත් මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

මට මේ වෙලාවේදී කියන්න තවත් දේවල් තිබෙනවා. *[බාධා කිරීමක්]* හොයන්න, හොයලා පෙන්වන්න. Clean Sri Lanka කරන්න කලින් මේ දේවල් ගැනත් බලන්න. ඌව පළාත් සභාවේ ඉහළ පුටු දෙකකට දෙන්නෙක් පත් කරලා තිබෙනවා. ඒ අය වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් විධියට හිටපු කාලයේ කරපු ඒවා ගැන අපි දන්නවා. ඒ දවස්වල ගස් හැංගුණා. ඒගොල්ලන් එනකොට ඒ කාලයේ ගස් හැංගිලා තිබ්බේ. අන්න ඒ අය තමයි අද ඌව පළාත් සභාවේ ප්‍රධාන පුටුවලට පත් කරලා තිබෙන්නේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ තිබෙනවා, ෆයිල් පිටින්. එහෙම නිලධාරින් පත් කරන්න එපා, තනතුරු තානාන්තරවලට. එතකොට clean වෙන්නේ නැහැ. ජනාධිපතිතුමා මොන තරම් මහන්සි වුණත් වැඩක් නැහැ, අනෙක් පැත්තෙන් ගලවාගෙන යනවා නම්. සභානායකතුමා මොන තරම් කැප වුණත්, ඔබතුමන්ලා මොන තරම් කැප වුණත් වැඩක් නැහැ, වැඩේ හරියට කරන මිනිස්සු පත් කරන්නේ නැත්නම්. ඒකයි අපි කියන්නේ. අපට වෙන දෙයක් වැඩක් නැහැ.

මම මේවා කියන්නේ ජනාධිපති පුටුවේ වාඩිවෙන්න නොවෙයි. අපි විපක්ෂයේ ඉන්නකොට හොයා ගන්න දේවල් පාර්ලිමේන්තුවේ කියන්න තමයි අපව පත් කරලා තිබෙන්නේ. ජනාධිපතිතුමා තරුණයි. මේ ජනාධිපතිතුමා තමයි මෙතෙක් පත් වෙච්ච ජනාධිපතිවරුන්ගෙන් ළාබාලම ජනාධිපති. ඩී.බී. විජේතුංග, ජේ.ආර්, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන කියන ඔක්කෝටම වැඩිය එතුමා වයසින් අඩුයි. හැබැයි, පත් වෙච්ච ජනාධිපතිතුමා ටිකක් වැඩියෙන් ප්‍රහාර එල්ල කරනවා. ජනාධිපතිතුමා වෙනුවෙන් ප්‍රහාර එල්ල කිරීම ඔබතුමන්ලා භාර ගන්න. ජනාධිපතිතුමාට, ජනාධිපතිතුමා විධියට හැසිරෙන්න කියන්න. ජනාධිපතිතුමා වෙනුවෙන් ගහන්න ඔබතුමන්ලා 159දෙනෙක් ඉන්නවා. මේක එච්චර හොඳ දෙයක් නොවෙයි. ජනාධිපතිතුමා එදා කළුතර බණ්ඩාරගමදී කරපු කථාව දිහා බලන්න. අද සමාජයේ කොච්චර මිනිස්සු ජනාධිපතිතුමාට - *[බාධා කිරීමක්]* මහින්ද රාජපක්ෂගේ ගෙදර ගන්න කියන්නකෝ. ගෙදර අරගෙන රුපියල් ලක්ෂ 44කට කුලියට දෙන්න කියන්නකෝ. එහෙම රුපියල් ලක්ෂ 44කට ඒ ගෙදර කුලියට දෙන්න බැහැ. කොණ්ඩෙ බැඳපු වීන්නුන්ට තමයි ලක්ෂ 44කට කුලියට දෙන්න වෙන්නේ. විජේරාමේ ගෙවල් ගන්න කවුරුවත් නැහැ, ලක්ෂ 44ක මාසික කුලියකට. දීලා පෙන්වන්නකෝ. මාසයකට ලක්ෂ 44ක කුලියට දෙන්නකෝ. කොණ්ඩෙ බැඳපු වීන්නුන්ට තමයි දෙන්න වෙන්නේ.

මහින්ද රාජපක්ෂ හෙට මේ ගෙදරින් එළියට ගියත්, එතුමාට ගෙවල් අරගෙන දෙන්න මිනිස්සු ඉන්නවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට වුණත් එහෙමයි. බණ්ඩාරනායකලා තමයි තමන්ගේ ඉඩම් අක්කර 4,000ක් රටට දුන්නේ; පවුලේ ඉඩම් බෙදලා දුන්නේ. හෙට ගෙවල්වලින් ගියා කියලා ඒ අයගේ නාමය නැති වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ගෙදරින් එළියට ගියා කියලා මහින්ද රාජපක්ෂට ගෙවල් දහයක් අරගෙන දෙන්න මිනිස්සු ඉන්නවා. හෙට මහින්ද රාජපක්ෂගේ security අයින් කරන්නකෝ. දකුණෙන් එයි ඒ මනුස්සයාව බලාගන්න. ඕනෑ තරම් මිනිස්සු එන්න ඉන්නවා; පරිත්‍යාගයෙන් එන්න ඉන්නවා. චන්ද්‍රිකා මැතිනිය වුණත්, මෛත්‍රීපාල සිරිසේන මහතා හෝ කවුරු වුණත් ඒ මේ රටේ හිටපු රාජ්‍ය නායකයෝ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නිකම් තුම්මුල්ලේ විමලේ වාගේ හැප්පෙන්නේ. ඊට වැඩිය හොඳයි තුම්මුල්ලේ විමලේ. *[බාධා කිරීම්]* තුම්මුල්ලේ විමලේ වාගේ කථා කරන්න එපා කියන්න. *[බාධා කිරීම්]* තුම්මුල්ලේ විමලේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැසිරෙන්නේ. එහෙම හැසිරෙන්න මේ රටට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කෙනෙක් පත් කරලා නැහැ. ඒ නිසා ජනාධිපතිතුමාගේ කාර්යභාරය කරන්න කියන්න. *[බාධා කිරීම්]* ආණ්ඩුව security දෙනවා කිව්වා. අපට security ඕනෑ නැහැ.

තව මාස 6කින් ඔයගොල්ලන්ට තමයි security හොයාගන්න වෙන්නේ. ඔයගොල්ලන්ම තමයි කිව්වේ, විනයක් ඇතිව හැසිරෙනවා කියලා. කෝ, දැන් ඒක? හැසිරෙන විධිය පේනවා දැන්. ලජ්ජයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇති. ලජ්ජයි. ආණ්ඩුවට ලජ්ජයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ ඇමතිලා කෑ ගහන්නේ ඉස්සරහ පුටුවල ඉඳගෙන. ඇමතිලා ද මේ? අධිකරණ ඇමති ඔහොමද හැසිරෙන්නේ? ලජ්ජයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පස්ස හැරිලා බලන්න, මොනවාද ගිහිල්ලා තිබෙන්නේ කියලා. බොරුවට දා ගත්තා මහාචාර්ය පට්ටම්. මෙතැනට මහාචාර්ය, ඊට පස්සේ බොරුවට CID එකට ගියා. CID එකට යනවා ද ඇමතිලා? CID යන්නේ මොකටද ඇමතිලා? ඇමති, ඇමතිගේ වැඩේ කරන්න ඕනෑ. මේ වෙලාවේදී මම මේකත් කියන්න ඕනෑ. අපට කවරදාටවත් security ඕනෑ නැහැ. තව මාස 6කින් ඔයගොල්ලන්ට security ඕනෑ වෙයි. ආණ්ඩුවේ ඉන්න සංචාරක ඇමති පසුගිය ඉරිදා දවසක බදුල්ල පොළට ගියාම මොකක්ද කිව්වේ? බදුල්ල පොළේ පලා විකුණපු අම්මලා දෙදෙනෙක්

මොනවාද කිව්වේ කියලා සංචාරක ඇමතිතුමාගෙන් අහගන්න. ඒ ඇමතිතුමා හැමදාම පොළේ යනවා. ඒ මනුස්සයා විතරයි පොළේ යන්නේ. පොළේ යනකොට මොකක්ද කිව්වේ කියලා එතුමාගෙන් අහගන්න. අපි නොවෙයි අහගන්න ඕනෑ.

Clean Sri Lanka වැඩසටහන රටට හොඳයි. අපි ඒක ගැන වරදක් කියන්නේ නැහැ. හොඳ දේවල් සිද්ධ වෙන්න ඕනෑ; හොඳ දේවල් කරන්න ඕනෑ. හනීෆ් යුසුෆ්ලාගේ සල්ලි අරන්, Galle Face එක උපයෝගී කරගෙන, හනීෆ් යුසුෆ්ට ආණ්ඩුකාරකම් දීලා ඒවා කරන්න මොනවාට ද Clean Sri Lanka වැඩසටහන? ඒ නිසා මම මේ වෙලාවේදී ඔයගොල්ලන්ට මේ කාරණයත් කියනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ගේමක් ඉල්ලලා වැඩක් නැහැ. ගේම ඉල්ලන්න පුතාගෙන්. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ දැන් වයස අවුරුදු 80යි. ජනාධිපතිතුමාට කියන්න, මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ගේම ඉල්ලලා වැඩක් නැහැ කියලා. ඒ මනුස්සයා එළියට ඇදලා දාලා වැඩක් නැහැ. චන්ද්‍රිකාත් එක්ක ගේම ඉල්ලලා වැඩක් නැහැ. මේ ඉස්සරහ පේළියේ නායකයෝ වෙන්න පිරිසක් ඉන්නවා. මම ඒ අයගේ නම් කියන්නේ නැහැ. ඒගොල්ලන් එක්ක ගේම ඉල්ලා ගන්න. ඒගොල්ලන් එක්ක ගේම ඉල්ලාගෙන, ඒගොල්ලන් එක්ක ගමන යන්න. නිකම් මේ වයසක මිනිස්සු අල්ලාගෙන ජනාධිපතිතුමා, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ කාලය අවසන් ද? බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමාගේ නම සඳහන් කරමින් එතුමා යම් චෝදනා ප්‍රමාණයක් ඉදිරිපත් කළා. අපි ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමා මේ රටේ කීර්තිමත් පුද්ගලයෙක් බව. එතුමා ආණ්ඩුකාර ධුරයට පත් කරලා තිබෙන්නේ අපේ පක්ෂයේ සාමාජිකයෙක් නිසා නොවෙයි. මේ රටේ ඉන්න ප්‍රධාන පෙළේ සෑම දේශපාලන පක්ෂයකම නායකයෝත්, මේ රටේ ව්‍යාපාරික පෙළැන්තියත් එතුමා ගැන දන්නවා. ඒ වාගේම මහජනතාවත් එතුමා ගැන දන්නවා. එතුමාව පත් කරලා තිබෙන්නේ එතුමාත් එක්ක ව්‍යාපාර කරන්න නොවෙයි. එතුමා ආණ්ඩුවත් එක්ක ව්‍යාපාර කරන්නේත් නැහැ. එතුමා මේවාට ගෙව්වාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත්, එතුමා සම්බන්ධ කරමින් මේ වාගේ අභූත චෝදනා ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි කියන එක කියන්න ඕනෑ. මොකද, එතුමා මේ සභාවේ නැහැ. එතුමාත් මේ රටේ ප්‍රධාන පුරවැසියෙක්. ඒ නිසා ඒක ගැන මට කෙටි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

කලින් කථා කරපු මන්ත්‍රීතුමා Clean Sri Lanka එකට වියදම් වූ මුදල් සම්බන්ධ බිල් ඉදිරිපත් කරනවා කියලාත් කිව්වා. අපි බලාපොරොත්තු වෙනවා, එතුමා ඒවාත් ඉදිරිපත් කරයි කියලා. කවුරු හරි දානපතියෙකුට ගෙවන්න පුළුවන් නම්,- ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒකෙන් මොකක්ද ඔප්පු වෙලා තිබෙන්නේ? අපි ශත 5ක්වත් රටේ සල්ලි -රජයේ මුදල්- වියදම් නොකර තමයි මොනවා හරි දෙයක් කළා නම් කරලා තිබෙන්නේ. ඒ මන්ත්‍රීතුමාත් එහෙම කියනවා. එතුමාට පුළුවන් කරුණු ඉදිරිපත් කරන්න. ඒ නිසා මට කියන්න ඕනෑකම තිබෙන්නේ, නිකම් කටට එන තොරතුරු මතම කටයුතු කරන්න එපා කියලායි. ඒ වාගේම මේ සභාවේ නැති රටේ ප්‍රධාන නිලධාරියෙකු ගැන කියනවා නම්, ඊට වඩා වගකීමක් ඇතිව කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ ලබා ගත් කාලය ආණ්ඩු පක්ෂයට වෙන් වූ කාලයෙන් අඩු කරන්න. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අගමැතිතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.39]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මේ පාර්ලිමේන්තුව රැස් වුණු දවසේ ඉඳන්ම මම කල්පනා කළේ මේ විපක්ෂයේ කාර්යභාරය මොකක්ද කියන එකයි. මේ විපක්ෂය මොන අරමුණකින් කථා කරනවා ද, ඒගොල්ලන්ගේ සැලැස්ම මොකක්ද කියලා තේරුම් ගන්න මම උත්සාහ කළා. මට හිතෙන විධියට අද ඉතාම පැහැදිලි වුණා, ඔවුන්ගේ අරමුණ මොකක්ද කියලා. මම හිතන විධියට, අද මේ විපක්ෂය පාර්ලිමේන්තුවේ ඉන්නේ අපේ රටේ ජනතාවට කොමඩි සපයන්න. මොකද කිසිම තේරුමක් නැතිව, කිසිම බරපතළක් නැතිව, කිසිම කරුණක් නැතිව කියන්නන් වාලේ ඔහේ කෑ ගහනවා. කටේ හයියක් තිබෙන පළියට මේ පාර්ලිමේන්තුවේ තිබෙන ගරුත්වයවත්, පාර්ලිමේන්තුව මොකක් වෙනුවෙන් ද තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ විවාදයක් කරන්නේ මොකක් වෙනුවෙන් ද කියලාවත් තේරුම් ගන්න බැරි, නිකම් ඔහේ කටට එන දේවල් කියන විපක්ෂයක් බවට මේ විපක්ෂය පත්වෙලා තිබෙන එක ගැන ඇත්තටම අපි කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ වෙලාවේදී Clean Sri Lanka වැඩසටහන තුළ අපේ ප්‍රධාන අරමුණක් වෙලා තිබෙන්නේ මේ රටට අවශ්‍ය වෙලා තිබෙන ඒ පරිවර්තනයට මේ රටේ ජනතාව සහභාගි කරවාගන්නේ කොහොමද කියන එකයි. රටක මේ විධියට පරිවර්තනයක් අවශ්‍ය වෙනකොට, මේ විධියේ බරපතළ පරිවර්තනීය වෙනසක් සිද්ධ වෙනකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය හොඳින් දන්නවා, ඒක ආණ්ඩුවකටවත්, රජයේ නිලධාරින්ටවත් තනියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි කියන එක. ඒකට ජනතාවගේ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය ]

සහභාගිත්වය අවශ්‍යයි; ජනතාවගේ එකඟතාව අවශ්‍යයි. ජනතාව තුළ සංවාදයක් අවශ්‍ය වෙනවා, ඒ පරිවර්තනය කුමක්ද, ඒ පරිවර්තනය කෙසේ විය යුතුද කියන කාරණා සම්බන්ධයෙන්. මේ සියල්ලම ජන සහභාගිත්වය තුළිනුයි සිද්ධ විය යුත්තේ. අපේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක්. ජනතාවාදී ආණ්ඩුවක් වැඩ කරන සංස්කෘතියක් තිබෙනවා. ඒකට ජනතාවත් සහභාගි වෙනවා. ජනතා විරෝධී ආණ්ඩුවල හිටපු අයට, තමන්ගේ අතිශයින්ම පෞද්ගලික න්‍යාය පත්‍රයන් වෙනුවෙන් ජනතාව පාවිච්චි කරපු ආණ්ඩුවල හිටපු අයට ඒක තේරුම් ගන්න බැරි වෙන එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. නමුත් අද මේ රටේ සිද්ධ වෙලා තිබෙන වෙනස ගත්තාම, මේක ජන සහභාගිත්වයත් එක්ක කෙරෙන වැඩ පිළිවෙළක්.

Clean Sri Lanka වැඩසටහනේ ප්‍රධාන අරමුණක් වෙන්නේ මේ සමාජ පරිවර්තනයට ජනතාව සහභාගි කරවාගන්න එකයි. ඒ සහභාගිත්ව වැඩසටහන තමයි අපි ජනවාරි පළමුවැනි දා ඉඳන් ආරම්භ කළේ, අර pillars තුන අනුව. ආචාර්යධාර්මික, පාරිසරික සහ සමාජයීය වගකීම දැනෙන සමාජයක් ගොඩනඟන්නේ කොහොමද කියන එකත්, ඒ සමාජ පරිවර්තනයට මුළු සමාජයම සහභාගි කරවාගන්නේ කොහොමද කියන එකත් එක්ක තමයි මේක සිද්ධ වෙන්නේ. මේක නිකම් උඩින් කෙරෙන, නීති දාලා බලෙන් කෙරෙන වැඩක් නොවෙයි. එය ජනතා සංවාද හරහා ජනතාව මේ පරිවර්තනය ගැන තේරුම් ගනිමින්, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙමින් කරන වැඩ පිළිවෙළක්.

පසුගිය නත්තල් සමයේ වුණත්, දෙසැම්බර් මාසයේ 31වැනි දා වුණත්, ජනවාරි පළමුවැනි දා වුණත් මිනිස්සු ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණා තමයි. එලෙස මිනිස්සු ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණා විතරක් නොවෙයි, වියදම් කරලා ඔවුන්ගේ කැමැත්තෙන් දේවල් කළා. මේවා හොඳ දේවල් නේ. මේවා අගය කරන්න ඕනෑ දේවල් නේ. මේවා නේ, මේ රටේ සිද්ධ වෙන්න ඕනෑ. මේ රටේ දානපතීන්, ව්‍යාපාරිකයන් තමන්ගේ සමාජය වෙනුවෙන් කැපවීමක් කරන්න කැමති නම්, තමන්ගේ සමාජය වෙනුවෙන් ඉදිරිපත් වෙන්න කැමති නම්, තමන් උපයා ගත්ත ධනය සමාජය වෙනුවෙන් වියදම් කරන්න සූදානම් නම් ඒක අගය කළ යුතු දෙයක්. එහෙම තමයි මේ රටේ ව්‍යාපාරිකයන් ඉන්න ඕනෑ. එහෙම ව්‍යාපාරිකයන් තමයි අපිට අවශ්‍ය. ඒක තමයි අපි කරන්න උත්සාහ කරන වෙනස.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපිට තේරුම් ගන්න පුළුවන්, පෙර තිබුණු දේශපාලන සංස්කෘතිය තුළ එවැනි ව්‍යාපාරිකයන්ට ඉඩක් තිබුණේ නැහැ කියන එක. ඒ ව්‍යාපාරිකයන් එක්ක හිටපු ආණ්ඩුවල අය සම්බන්ධ වුණේ ඒ ව්‍යාපාරිකයන්, ඒ දානපතීන් සමාජයට යොමු කරන්න නොවෙයි, තමුන්ගේ පෞද්ගලික සාක්කුවලට ඒවා යොමු කර ගන්නයි. ඔවුන් සියලුදෙනාම ව්‍යාපාරිකයන් ළඟට ගියේ, ඒ ව්‍යාපාරිකයන්ට දස වද දුන්නේ තමන්ට ධනය එකතු කර ගැනීම සඳහා, තමන්ට කීයක් හරි කඩාගන්න පුළුවන් වෙන්නේ කොහොමද කියලා බලලා. එහෙම නැතුව ඔවුන් සමඟ සංවාදයක් තුළ ඒ ව්‍යාපාරිකයන් වුණත්, දානපතීන් වුණත් සමාජ වගකීම ඉෂ්ට කරන්නේ කොහොමද කියන සමාජ කතිකාවකට සම්බන්ධ කරන්න නොවෙයි. ඒ නිසා එවැනි දේශපාලන සංස්කෘතියකින් ආපු අයට අද සිද්ධ වෙන මේ වෙනස තේරුම් ගන්න බැරි වෙන එක ගැන අපි නම් පුදුම වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒක තමයි ඒගොල්ලන් දන්නේ; ඒක තමයි ඒගොල්ලන්ගේ ලෝකය; ඒක තමයි ඒගොල්ලන්ගේ දේශපාලන දැක්ම. ඒ නිසා මේ Clean Sri Lanka වැඩසටහන ඒගොල්ලන්ට තේරුම් ගන්න බැරි වන එක ගැන අපි නම් පුදුම වෙන්නේ නැහැ.

මට මේ අවස්ථාවේදී තව කරුණක් මතක් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි පොඩි කාලයේ ඉගෙන ගත්ත කථාවක් තිබුණා. මතකද දන්නේ නැහැ. ඔබතුමියටත් මතක ඇති, මිදි ඇඹුල් - sour grapes - කියපු කථාව. නරියා ඇවිල්ලා grapes කන්න බැරි වුණාම "අම්මෝ මේ මිදි ඇඹුල්" කියලා යන්න ගියා. මට හිතෙන්නේ විපක්ෂයේ කීපදෙනෙකුටත් ඒක තමයි සිද්ධ වෙමින් පවතින්නේ. ඒගොල්ලන්ට කරගන්න බැරි වෙච්ච දේවල් දැන් අපි කරනවා. මේ රට තුළ වෙනසක් සිද්ධ වෙමින් යනවා.

දේශපාලන සංස්කෘතිය වෙනස් වෙනවා. රජයේ නිලධාරින් ස්වාධීනව වැඩ කරන්න මැදිහත් වෙනවා. නීතියේ ආධිපත්‍යය අපට පේන්න තිබෙනවා. රට වෙනස් වෙමින් තිබෙනවා. එතකොට මොකක්ද අපට විපක්ෂයෙන් කියනවා ඇහෙන්නේ? අපිත් ඕවා කරන්න තමයි හිටියේ, අපේ කාලයේ තමයි ඕවා පටන් ගත්තේ ආදී දේවල්. Clean Sri Lanka ව්‍යාපෘතියට බණින ගමන්, ඒකට සම්බන්ධ වෙන අයට විවේචන එල්ල කරන ගමන්, නැහැ, අපි එකඟයි, හොඳ දෙයක් වෙනවා නම් අපි එකඟයි, අපිත් කැමැතියි ඔය විධියට වෙනවා නම් කියලා අනෙක් පැත්තට කියනවා. මොකක්ද මේ කරන්නේ? හරියට මතයක්වත් දරන්න බැහැ. තමන්ට කරගන්න බැරි වෙච්ච දේ සිදු වෙමින් තිබීම දැකගන්න බැරි, ඒක දරාගන්න බැරි වේදනාව තමයි අපට ඔය පැත්තෙන් ඇහෙන්නේ. ඒක හරිම අවාසනාවන්තයි. මොකද, අපිත් කැමැතියි මේ රට හොඳ තැනකට එනවාට, අපිත් කැමැතියි මේ රට වෙනස් වෙනවාට කියලා මතුපිටින් කිව්වාට වැඩක් නැහැ. ඒක ඔබතුමන්ලාගේ, ඔබතුමියලාගේ වචනවලින් පෙන්වන්න; ක්‍රියාවෙන් පෙන්වන්න; මෙතැන හැසිරෙන විධියෙන් පෙන්වන්න. ඒක කරගන්න බැරිව, කැත විධියට බැණගෙන බැණගෙන ගිහිල්ලා, කුණුහරුප කියාගෙන ඇවිල්ලා අන්තිමට, රටට හොඳ දෙයක් වෙනවා නම් අපිත් කැමැතියි, අපිත් ඒකට සහයෝගය දක්වන්නම් කිව්වාට වැඩක් වෙන්නේ නැහැ. මොකක්ද මේ? බොරු නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ ගුරුවරුන් දණ ගස්වපු ඉතිහාසයක් තිබුණා. තමන් තෝරපු ගුරුවරුන් ඉස්කෝලවලට දමාගන්න මන්ත්‍රීවරු අමාත්‍යාංශවලට ගිහිල්ලා තග දාපු කාලයක් තිබුණා. ළමයින්ව ඉස්කෝලේ දමන්න ලියුම් යැවීම ප්‍රධාන වගකීමක් හැටියට දැකපු, එහෙම හිතපු යුගයක් තිබුණා. ඒවා අපි අවසන් කරලා තිබෙන්නේ. එහෙම දේවල් තවදුරටත් සිද්ධ වෙන්නේ නැහැ. ගුරුවරුන්ට අපහාස කරලා, ගුරුවරුන්ව දණ ගස්වපු ඒ යුගය අපි අවසන් කරලායි තිබෙන්නේ. ගුරුවරුන්ට නිදහස්ව, ස්වාධීනව වැඩ කරන්න පුළුවන් පරිසරයක් අපි පාසල් තුළ ගොඩනඟමිනුයි ඉන්නේ. එවැනි දේවල් කරපු අය මෙතැන ඇවිල්ලා යටිගිරියෙන් කෑ ගැහුවාට මේ ව්‍යාපෘතියවත්, මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් යන දේවල්වත් ඔවුන්ට නවත්වන්න බැහැ. ඔවුන්ගේ අරමුණ මොකක්ද කියලාවත් මට තේරෙන්නේ නැහැ. සමහර විට අද රාත්‍රී විකාශනය වන ප්‍රවෘත්ති ප්‍රකාශවල මිනිත්තු 2ක clip එකකට නේ ඔය කෑ ගහන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එච්චරයි, එච්චරයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
අන්න එච්චරයි තිබෙන්නේ. අපේ ජනමාධ්‍ය ඇමති මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. ඕනෑ නම් අපි ටෙලිවිෂන් එකෙන් හරි මොකක් හරි මාධ්‍යයකින් වෙලාවක් අරගෙන දෙන්නම්, ඕනෑ

තරම් ඇවිල්ලා කෑ ගහන්න. ඔච්චර අමාරුවක් තිබෙනවා නම් ඇවිල්ලා ටිකක් කියවන්න. ඒකට අපි වෙලාව දෙන්නම්. හැබැයි, මේ ගරු සභාවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න එපා. මෙතැන අපට ගරුත්වයක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුව තුළ ජනතාව බලාපොරොත්තු වෙන ගුණාත්මක දෙයක් තිබෙනවා නම්, ඒක විනාශ කරන්න එපා, අද හවස විකාශනය වන newsවල මිනිත්තු 2ක වෙලාව ගන්න. එහෙම නැත්නම් සමාජ මාධ්‍ය hits ටිකක් ගන්න. ඒ සඳහා මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න එපා කියන ඉල්ලීම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම කරන්න කැමැතියි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු අගමැතිතුමියනි, මම මෙතැන වාඩි වෙලා බලාගෙන ඉන්නේ ඔබතුමිය විසින් අපට, මේ රටට Clean Sri Lanka concept එක ගැන පැහැදිලි කිරීමක් කරාවිද කියලායි. හැබැයි, අර මන්ත්‍රීවරයාගේ කථාවට ඔබතුමිය පුනපුනාම උත්තර දෙමින් සිටිනවා. කරුණාකර මේ Clean Sri Lanka concept එක ගැන අපට පැහැදිලි කර දෙන්න. මම බලාගෙන ඉන්නේ ඒ ගැන අහන්නයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු මන්ත්‍රීතුමනි, විවාදයක් තුළ පිළිතුරුත් දෙන්න ඕනෑ. එන අභූත චෝදනාවලට පිළිතුරු දෙන්නත් ඕනෑ. පිළිතුරු දෙනකොට ඔබතුමන්ලාට රිදෙනවා නම් ඒකට මට කරන්න දෙයක් නැහැ. මට පෙර කථා කරපු අපේ සියලුදෙනාම Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන පුනපුනා කියන්න ඇති කියන විශ්වාසය මට තිබෙනවා. *[බාධා කිරීමක්]* අගමැතිනිය හැටියට මම මේ ගැන ඇති තරම් කථා කරලා තිබෙනවා. තව කථා කරන්න ඕනෑ නම් මම කථා කරන්නම්. නමුත් අගමැතිනිය හැටියට මගේ යුතුකමක් තිබෙනවා, මේ කරන අභූත චෝදනාවලට පිළිතුරු දීමට.

ඒ නිසා විවාද කරන්න ඕනෑ විධිය ගැන මට උගන්වන්න එන්න ඕනෑ නැහැ, කවුරුවත්. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Point of Order එකක් නොවෙයි නම් මගේ කථාවට ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විවාදයකට යන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
මගේ කාලයෙන් නම් දෙන්න එපා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Point of Order එකක් නැහැ, ඔබතුමාගේ නම කියැවුණේ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන කථා කරනකොට මෙතැන යෝජනා වුණා, මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට සම්බන්ධ වැරදිවලට පිළිපීනය උදාහරණයට ගන්න, ඒ මිනිස්සුන්ව මුහුදට ගෙනිහිල්ලා මරලා දාන්න කියලා. අපේ ආණ්ඩුවට නම් ඒ වාගේ අනීතික විධියට කටයුතු කරන්න කිසිම හේතුවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපි ප්‍රජාතන්ත්‍රවාදී රටක්, නීතියේ ආධිපත්‍යය ගරු කරන රටක්. නැවත වතාවක් මේ රට තුළ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපට අවශ්‍ය විධියට බලය පාවිච්චි කරමින් මිනිස්සු මුහුදේ දාලා මරන සිරිතක් අපට නැහැ. හැබැයි, එහෙම යුගයක් තිබුණා. එක්නැලිගොඩ, රිච්ඩ් ද සොයිසා, ලසන්ත වික්‍රමතුංග, ත්‍රිකුණාමලයේදී මරලා දාපු studentsලා 11දෙනා ගැන අපට කියන්න පුළුවන්. එහෙම යුගයක් පසු කරලා අපි ඇවිල්ලා තිබෙන්නේ. නීතිය අතට අරගෙන ඕනෑ ඕනෑ විධියට තමන්ගේ බලය පාවිච්චි කළ, මේ රටේ නීතියවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවවත් සත පහකට ගණන් ගත්තේ නැති යුගයක් ඉවර කරලායි අපි මේ ආණ්ඩුව පත් කර ගත්තේ. අපි ඒක clean කරලා මේ ඇවිල්ලා තිබෙන්නේ.

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඇහුවා මොකක්ද Clean Sri Lanka කියන්නේ කියලා. අන්න ඒ දේශපාලන වෙනස තමයි ගරු මන්ත්‍රීතුමා, ඒක. නීතිය ගණන් ගන්නේ නැති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගණන් ගන්නේ නැති, ව්‍යවස්ථාවට පයින් ගහන, ඇමතිවරු, මන්ත්‍රීවරු තමන්ට ඕනෑ ඕනෑ විධියට හැසිරෙන යුගය අවසන් කරන, clean කරන එක තමයි Clean Sri Lanka

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

ව්‍යාපෘතියේ මූලික අදහස. ඒක තමයි අපි කරන්නේ. ඒක වෙමින් පවතිනවා. ඔබතුමන්ලාට ඒක දරා ගන්න බැරි වේදනාව අපට තේරෙනවා. හැබැයි ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තු විවාදය තුළ, මේ සභාවේදී මේ විධියට හැසිරෙනවා නම් ඔබතුමන්ලාට සදාචාරාත්මක අයිතියක් නැහැ තවදුරටත් කියන්න, "අපිත් මේ වෙනස වෙනුවෙන් පෙනී ඉන්නවා, අපිත් මේ රටට ආදරෙයි, අපිත් මේ වෙනුවෙන් වැඩ කරන්න අවශ්‍යයි, ඒ වෙනුවෙන් හොඳ දේවල් එක්ක අපිත් එක්ක එකඟ වෙනවා" කියලා. මම හිතන්නේ නැහැ ඔබතුමන්ලාට එහෙම කියන්න අයිතියක් තිබෙනවා කියලා. ඕනෑ නම්, අවශ්‍ය නම් ඒක ඔබේ ක්‍රියාවෙන්, අඩුම තරමේ මේ පාර්ලිමේන්තුව තුළ හැසිරීමෙන් පෙන්නුම් කරන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා.

මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.54]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු අග්‍රාමාත්‍යතුමියගේ කථාවෙන් පසුව වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව පසුගිය දිනෙක ඔබතුමියගේ පක්ෂයේ මන්ත්‍රීවරයකු ප්‍රශ්නයක් ඇහුවාමත් ඔබතුමිය උත්තරයක් දුන්නා. ඒක සාධනීය උත්තරයක්. ගරු අග්‍රාමාත්‍යතුමිය, හැබැයි අපට තිබෙන ප්‍රශ්නය මේකේ සංකල්පය සහ මේ ක්‍රියා කරන ආකාරය පිළිබඳව ඔබතුමියගේ පක්ෂයේ 159දෙනාට සහ එය ක්‍රියාත්මක කළ යුතු ආයතන සහ පුද්ගලයන්ට මනා අවබෝධයක් තිබෙනවාද, නැද්ද කියන එකයි. මොකද, බොහෝ කථිකයන්ගේ කථා අහගෙන ඉන්නකොටත් නොයෙක් අදහස් කියනවා. ඒ වාගේම Clean Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ආකාරය ගැන අඩුම ගාණේ TOR එකක් ඒ ආයතන ප්‍රධානීන්ට යවා තිබෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඒ වාගේම guideline එකක් තිබෙනවාද? මොකද, මිනිස්සු බලාපොරොත්තු වුණේ permanent solutions. දැන් ඔය Clean Sri Lanka කියන එකම තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්තයාත්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙනුත් වෙනත් ක්‍රමයකට කළේ. හැබැයි, ආණ්ඩුව මාරු වුණාම මොකද වුණේ? *[බාධා කිරීම්]* හරි, දැන් අහගන්නකෝ, දැන් අහගන්නකෝ.

කියන කාරණය ඔබතුමන්ලාට තේරෙන්නේ නැති වුණාම ඕක තමයි වෙන්නේ. එදා ඔබතුමන්ලාම තමයි චෝදනා කළේ, හමුදාව දාලා පාරවල් සුද්ද කරවනවා කියලා. එදා ඔබතුමන්ලා තමයි චෝදනා කළේ හමුදාව දාලා කොළඹ නගරය අලංකරණය කරනවා කියලා. එදා ඔබතුමන්ලා තමයි චෝදනා කළේ ත්‍රිවිධ හමුදාව දාලා කොළඹ මං තීරු හදනවා කියලා. හැබැයි, ඒ චෝදනා කරපු ඔබතුමන්ලාම අද Clean Sri Lanka කියලා ඒ වැඩේ ඒ විධියටම කරනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ආණ්ඩුව මාරු වෙනකොට මොකක්ද වෙන්නේ? ආණ්ඩුව මාරු වෙනකොට ඒක නතර වෙනවා. ඒ නිසා තමයි මම කියන්නේ මේකට permanent solution එකක් ගෙනෙන්න, වෙනස් වෙන්නේ නැති වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියලා.

එක පැත්තකින් ඔබතුමන්ලා පොලීසියට කියනවා, ත්‍රී වීලර් නවත්වන්න කියලා. ත්‍රී වීලර් එකේ අමතර කෑලි ටික ගලවනවා. අනෙක් පැත්තෙන්, බස් එකේ අමතර කෑලි ටික ගලවනවා. ගලවලා ප්‍රවාහන පනත පෙන්නලා කියනවා, මුදල් ගෙව්වාම ප්‍රශ්නය හරි කියලා. කලින් කිව්වේ මොකක්ද? මේ එක එක කෑලි සවි කළාම accident වෙනවා කිව්වා. එතකොට මුදල් ගෙව්වාට පස්සේ accident වෙන්නේ නැද්ද? ගරු අගමැතිතුමියනි, ඔබතුමියලා Clean Sri Lanka වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් අඩුම ගණනේ අදාළ නිලධාරින්ව දැනුවත් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන විෂයය භාර ඇමතිවරයා මමයි. මම ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න කැමැතියි. එහෙම මුදල් ගෙව්වාම මේ ප්‍රශ්නය විසඳෙනවා කියලා ඔබතුමාට කිව්වේ කවුද?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු සභානායකතුමනි, ඒ සම්බන්ධව පනත ප්‍රකාරව කටයුතු ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා දැනුවත් කරලා තිබෙනවා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක නොවෙයි මම කිව්වේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මම අහන්නෙත් ඒක තමයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම specifically ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මමත් specifically ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කිව්ව දේ මම අහන්නේ. ඔබතුමා කිව්වා, මුදල් ගෙව්වාම ඒ අමතර කෑලි පිළිබඳ ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා කියලා. අන්න ඒ කිව්ව කෙනා කවුද කියන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
දැන් ඒ කැලි සවි කරන්න බැරි ද, පනත අනුව සවි කිරීමට හැකි කැලි ටික? මම අහන ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කෙටියෙන්. ඔව් ද, නැද්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ඔබතුමා කිව්ව කාරණය ගැන පැහැදිලි උත්තරයක් දෙන්න. දැන් බැරි නම් පස්සේ කියන්න. ඒක කිව්වේ කවුද? මොකද, මම තමයි ප්‍රවාහන ඇමති. ගරු මන්ත්‍රීතුමා, ඒක කියන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමායි, මමයි මේ ගැන වාද කරලා වැඩක් නැහැ, ගරු ඇමතිතුමනි. අපි අහන්නේ පොලිසියෙන්,-*[බාධා කිරීමක්]* පොලිසිය භාර අමාත්‍යවරයා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
පොලිසිය එහෙම මොනවත් කියලා නැහැ. *[බාධා කිරීමක්]* මොන පොලිසිය ද කියලා තියෙන්නේ?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා දන්නේ නැත්නම්-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
නැහැ. නැහැ. දන්නවා, දන්නවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු අමාත්‍යතුමා, මේවා ලියාපදිංචි කරන්න පුළුවන්ද බැරිද? ලියාපදිංචි කළාම accident එක වෙන්නේ නැහැ කියනවා නේ. ඔබතුමන්ලා පුරුද්දට මේ පැත්තට කෑ ගහලා වැඩක් නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමිය විපක්ෂය ගැන කිව්වා නේ. බලන්න, ඔබතුමන්ලාගේ කණ්ඩායම් රැස්වීමේදීත් මේ හැසිරෙන්න ඕනෑ ආකාරය පිළිබඳව,- *[බාධා කිරීමක්]*

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමා, සාධක සහිතව කථා කරන්න. නිකම් කවුරුන් හෝ කියපු එකක් අහලා ඇවිල්ලා මෙතැන කථා කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාලය ගරු මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් අඩු කරන්න එපා. ගරු මන්ත්‍රීතුමනි, මම අහපු කාරණයට ඔබතුමාගෙන් පිළිතුර බලාපොරොත්තු වෙනවා. මට මේ විෂයය භාර දීලා තිබෙන්නේ ජනතාව හරහා ජනාධිපතිතුමා මහිනුයි. ඔබතුමා හෙට දිනයේ දී හෝ කියන්න, කවුද ඒක කිව්වේ කියන කාරණය. *[බාධා කිරීම්]* ඒකෙන් පැනලා යන්න එපා. මම කරුණාකර ඉල්ලා සිටිනවා ඔබතුමාගේ කථාවේදී බැරි නම්, වෙනත් වෙලාවකදී හෝ ඒක කියන්න කියලා. බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු සභානායකතුමනි, පොලිසියෙන් කියන්නේ. ඉතින් ඔබතුමන්ලා,-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මොන පොලිසියෙන්ද?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ශ්‍රී ලංකා පොලිසිය. වෙන පොලිසියක් නොවෙයි. මේ රටේ වෙන පොලිසියක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා මා එක්ක හැප්පිලා වැඩක් නැහැ; මට බැණලා වැඩක් නැහැ. කරුණාකරලා මේ රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයක් ගැන විපක්ෂයෙන් ප්‍රශ්නයක් නැඟුවාම ඇහුම්කන් දෙන්න පුරුදු වෙන්න. බලන්නකෝ, ගරු අග්‍රාමාත්‍යතුමිය අහගෙන ඉන්න විදිය. හැබැයි, අනෙක් අය කලබල වෙලා. පැහැදිලිවම මේක මේ රටේ තිබෙන ප්‍රශ්නයක්. බොරුවක් නොවෙයි. මේක අහගන්න. මේක අර දූෂණ මර්දන කමිටුව වාගේ ඔබතුමන්ලා දාලා දේශපාලන පළිගැනීම් ගන්නා තැනක් නොවෙයි. මේක පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් යම් කිසි කාරණයක් නැඟුවා නම්,-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
බොරුවට පොලිසියට අපහාස කරන්න එපා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
පොලිස් කොමිසමට බැණලා වැඩක් වෙන්නේ නැහැ. දැන් මේක නාමල් රාජපක්ෂ කිව්වා කියලා පොලිස් කොමිසමට බණින්න ලැහැස්ති වෙන්න එපා. මොකද, එක පැත්තකින් පොලිස් කොමිසමට චෝදනා නඟනවා. අනෙක් පැත්තෙන්, රාජ්‍ය නිලධාරින්ට චෝදනා නඟනවා. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා කියනවා, හමුදාව ගිහිල්ලා තුවක්කු පත්තලා මිනී මරනවා කියලා. මොකක්ද, මේකේ තේරුම? මේක රටක්. ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ආරක්ෂක කවුන්සලයේ කථා කර ගන්න. ආරක්ෂක කවුන්සලයේ කියන්න ඕනෑ කාරණා දේශපාලන රැස්වීම්වල කියන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මිනී මරපුවා ගැන අපිට කථා කරන්න එන්න එපා. තාජුඩීන් ඝාතනය ගැන අපිට කථා කරන්න එන්න එපා. කවුද, තාජුඩීන්ලා ඝාතනය කළේ කියලා මේ රට දන්නවා.

තාජුඩීන්ලා ඝාතනය කරපු, ලසන්ත වික්‍රමතුංගලා ඝාතනය කරපු අය කථා කරනවා, ඝාතන ගැන. *[බාධා කිරීම්]* ඝාතන ගැන කථා කරන්න නාමල් රාජපක්ෂලාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද? *[බාධා කිරීම්]* තමුන්නාන්සේලාගේ ආණ්ඩු යටතේ මාධ්‍යවේදීන් ඝාතනය වුණා; ක්‍රීඩකයන් ඝාතනය වුණා; ඇති තරම් ඝාතනය වුණා. අද මෙතැනට ඇවිල්ලා ඝාතන ගැන කථා කරනවා. පොලීසියට චෝදනා එල්ල කරන්න එපා බොරුවට. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා බබා එතකොට.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
බබා වාගේ කථා කරන්න ලෑස්ති වෙන්න එපා. එක්නැලිගොඩලා අතුරුදහන් කරලා -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම ඒ කිව්වේ මා කියපු එකක් නොවෙයි, එතුමන්ලාගේ අතිගරු ජනාධිපතිතුමා කියපු එකක්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා නිහඬ වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු ඇමතිතුමා, දැන් ඔබතුමා පොලිසිය භාර ඇමති. ඒ වාගේම, යහපාලන ආණ්ඩුවේ දූෂණ මර්දන කමිටුවේ සභාපති. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ කාලයේත් මෙතුමා තමයි ඔය පරීක්ෂණ කළේ. *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා කියන්න. ගරු අග්‍රාමාත්‍යතුමිය, මේ ළමයා පොඩ්ඩක් වාඩි කරන්න කෝ. බලන්න කෝ හැසිරෙන විදිය. *[බාධා කිරීම්]* ඔබතුමියට හොඳ නැහැ. *[බාධා කිරීම්]* අපි ඔබතුමන්ලාගෙන් පැහැදිලිවම ඉල්ලන්නේ, මේ ප්‍රශ්න පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා. *[බාධා කිරීම්]* මේ ප්‍රශ්න පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. මේ system එක හදන්න. එහෙම නැතුව ඔබතුමන්ලාගේ ඔළුවට එන කාරණා අනුව මැතිවරණ වේදිකාවේදී එකකුත්, එළියට ගිහිල්ලා තව එකකුත් කථා කරන්න එපා. අපි මඩ ගහන්න ලෑස්ති වෙන්නේ නැහැ නේ. මම ඔබතුමන්ලාට චෝදනා කරන්නේ නැහැ නේ. ඔබතුමන්ලා කියපු කාරණය පිළිබඳව නේ මම ප්‍රශ්න කළේ. එතකොට තරහ ගන්න එපා. ඒක හොඳ නැහැ. *[බාධා කිරීම්]* මා එතුමාගෙන් ප්‍රශ්නයක් නැඟුවාම එතුමාට තරහා යනවා නම් මම මොනවා කරන්නද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? මම මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙක්. අපට වගකීමක් තිබෙනවා, රටේ මිනිසුන්ගේ ප්‍රශ්න ටික අහන්න. අද Clean Sri Lanka ගැන කියනවා. ඉස්සර වෙලා ඔළුගෙඩි ටික clean කර ගන්න. කුහකත්වයයි, වෛරයයි, ඉරිසියාවයි, ක්‍රෝධයයි ඔළුවේ තියාගෙන රටේ මිනිසුන්ට clean වෙන්න කියන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, තවත් විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
රටේ මිනිසුන්ට clean වෙන්න කියන්න එපා- *[බාධා කිරීම්]* ඉස්සර වෙලා ඔබතුමන්ලා ඔබතුමියන්ලා clean වෙන්න. ඔබතුමන්ලා ඔබතුමියන්ලා clean වුණාට පසුව රට clean කරන්න පුළුවන්. *[බාධා කිරීම්]*

එක්කෙනෙක් වැවක බහිනවා. අනෙක් එක්කෙනා ඇළේ බහිනවා. අනෙක් එක්කෙනා බෙරේ බහිනවා. තවත් එක්කෙනෙක් බස් එකේ කැලි ගලවනවා. තවත් එක්කෙනෙක් horn එක ගලවනවා. *[බාධා කිරීම්]* ගලවලා කියනවා, මෙන්න Clean Sri Lanka කියලා. *[බාධා කිරීම්]*

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මම කාලය නාස්ති කරන්න ලෑස්ති නැහැ. ඔබතුමිය අහගෙන ඉන්න හින්දයි මම මේ කියන්නේ. මේ පිළිබඳව රජයේ නිලධාරින් සහ මේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න; මේ සම්බන්ධයෙන් ToR එකක් දෙන්න, guideline එකක් දෙන්න; Clean Sri Lanka පිළිබඳව අරමුණක් දෙන්න. "Clean India" mission එක කළේ එහෙමයි; "America the Beautiful" initiative එක කළේ එහෙමයි; "Clean and Green Singapore" එක කළේ එහෙමයි. ඒ හැම එකකටම වැඩ පිළිවෙළක් තිබුණා; දැක්මක් තිබුණා. *[බාධා කිරීම්]* පෙර පාසලේ දරුවාගේ ඉඳලා ඒක පටන් ගන්න. පෙර පාසලට යන්න කලින් පාර්ලිමේන්තුවේ 159දෙනාගෙන් පටන් ගන්න. මේ 159 දෙනාගෙන් පස්සේ පෙර පාසලට යන්න. එතැනින් යන්න, පාසලට. පාසලෙන් යන්න, විශ්වවිද්‍යාලයට. එතැනින් වෘත්තීය සමිතිවලට යන්න. *[බාධා කිරීම්]* එහෙම නැතුව ඔබතුමන්ලාගේ දේශපාලන අරමුණු ඉටු කර ගන්න Clean Sri Lanka කියමින් විපක්ෂය මර්දනය කරලා, බය කරලා, තර්ජනය කරලා, "බලා ගනිමු" කියලා, "කෙඳිරි ගානවා" කියලා ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා හිතනවා නම් වැඩක් වෙන්නේ නැහැ. අපිත් ඔහොම හිතපු කාලයක් තිබුණා. අපට වැරදුණේ ඒකයි. *[බාධා කිරීම්]* ඒක කරන්න බැහැ. *[බාධා කිරීම්]* අපට ඒක තේරෙනවා. *[බාධා කිරීම්]* ඒ හින්දා තමයි මම මේ පුන පුනා කියන්නේ, ඔබතුමන්ලාටත් වරදින්න කලින් ඉගෙන ගන්න කියලා. අඩු ගණනේ- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අඩු ගණනේ මම ඉගෙන ගත්තා; මම වැරැද්ද පිළිගත්තා. ඔබතුමන්ලාට ඒ වැරැද්ද නොකරන්නයි මම මේ කියන්නේ.

කවුරු පාලනය කළත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේක ලංකාව. මේ රට ආරක්ෂා වෙන්න ඕනෑ. මේ රට රැකෙන්න ඕනෑ. ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ, පොලිස් කොමිසමේ, ස්වාධීන කොමිෂන්වල ගෞරවය රැකෙන්න ඕනෑ. ඒවා කෙලෙසුණොත් රාජ්‍ය යන්ත්‍රණය කඩා වැටෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මේ 159දෙනා ගැන ඔබතුමිය පසුව බලාගන්න. හැබැයි කරුණාකර Clean Sri Lanka පිළිබඳව guideline එකක් රාජ්‍ය ආයතනවලට යවන්න; ToR එකක් යවන්න. ඒ පිළිබඳව regulation එකක් හදන්න. එහෙම කරලා අවංකව හොයලා බලන්න, ඔබතුමියන්ලා බලාපොරොත්තු වන කාරණා ඉෂ්ට වෙනවාද, නැද්ද කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද, point of Order එක?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඔබතුමාට වැඩක් නැහැ ඒක. ඔබතුමා ඉන්න කෝ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි point of Order එකක් නඟන්න ඉල්ලුවාම අවස්ථාව දෙන්නේ නැහැ. එතුමා කථා කරන කොට දෙනවා. අහන්න ඒකත් මොකක්ද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
Point of Order එකක් නොවෙයි නම් මූලාසනයෙන් මට කියාවි, point of Order එකක් නොවෙයි කියලා. එච්චරයි. *[බාධා කිරීමක්]* මට පොඩි කාලයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා ඉක්මනට කියලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කථාවක් දෙන්නේ නැහැ නේ. කථාවක් දෙන්නේ මාස දෙකකින් විතර. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක විපක්ෂයේ- [බාධා කිරීමක්]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
පුළුවන් නම් දීලා බලන්න විනාඩියක්. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අර මන්ත්‍රීතුමා විනාඩි කීයක් තිස්සේ ඉන්නවාද mike එකේ? *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කථා කරන්න.*[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ආණ්ඩුවෙන් අහනවා,- *[බාධා කිරීමක්]* පුළුවන් නම් මට විනාඩියක් දීලා බලන්න. ඔයගොල්ලන්ට කොන්ද පණ තිබෙනවා නම් විනාඩියක් දීලා බලන්න. *[බාධා කිරීමක්]*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම අහගෙන හිටියා, අපේ නාමල් මන්ත්‍රීතුමා පුදුමාකාර විදියට පාළු ගෙයි සැහෙන්න වළං මුට්ටි බින්දා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
What is the point of Order in this?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඔබතුමා තේරුම් ගන්න, ඔබතුමාගේ තාත්තලා, බාප්පලා, පුතාලා- *[බාධා කිරීමක්]* ඒ වාගේම, සීයලා- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මොකක්ද මේ?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද මේ? මෙහෙම කථා කරන්න පුළුවන් ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා- *[බාධා කිරීමක්]*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඒ ගොල්ලන්ගේ අතීතය, වර්තමානය, අනාගතය පිළිබඳව- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමිය තීන්දුවක් ගන්න- *[බාධා කිරීමක්]* එතුමා මෙහෙම කථා කරන කොට ප්‍රශ්නයක් නැද්ද?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මේ රටේ මිනිස්සු සැප්තැම්බර් 21යි, නොවැම්බර් 14යි තීන්දුව දීලා අවසානයි.*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මෙහෙම කථා පවත්වන්න පුළුවන්ද? ඔබතුමිය තීරණයක් ගන්න. ඔබතුමියට බැරිද තීන්දුවක් ගන්න?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
අර මන්ත්‍රීතුමා අඩුම ගණනේ නිකම්වත් දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලට, ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්වලට එන්නේ නැහැ. එහෙම එන්නේ නැතුව ඉඳලා නිකම් මෙතැන වළං බිඳිනවා. ඉතිහාසයේ කුණු බක්කියට ඔබතුමන්ලා ගිහිල්ලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා මගේ නම සඳහන් කළා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මගේ නම සඳහන් කරපු නිසා මම මේක කියන්නේ. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා එතුමාගේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් සහ මගේ ගමේ මා ගරු කරන කෙනෙක් හින්දා මම මොකුත් කියන්න යන්නේ නැහැ. වළං බිඳින්න පුළුවන් වෙලා තිබෙන්නේ වළං හිස් හින්දා. එච්චරයි මම කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.07]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම හිතනවා, අද දවසේ ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා ගෙනාපු සභාව කල් තැබීමේ යෝජනාව මේ රටේ අනාගතය තීන්දු කරනු ලබන වැදගත් යෝජනාවක් කියලා. අපි දන්නවා, 2022දී මේ රටේ මහජන අරගළයක් මෝදු වුණා. ඒ අරගළයේ ප්‍රධාන තේමාවක් වෙලා තිබුණා, system එක change වෙන්න ඕනෑ කියලා, පවතින ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ කියලා.

පාලකයන් වෙනස් වුණු පමණින් ක්‍රමයක් වෙනස් වෙන්නේ නැහැ. සමස්ත සමාජ ක්‍රමයක් වෙනස් කරන්න නම්, ඊට දැවැන්ත ව්‍යාපෘතියක් අවශ්‍ය වෙනවා. ඒ හින්දා වර්තමාන ජාතික ජන බලවේගය ආණ්ඩුව, මේ පවතින දූෂිත සමාජ ක්‍රමය මානවවාදී සමාජ ක්‍රමයක් බවට පත් කරලා, ලෝකයේ දියුණු සමාජ ක්‍රමයක් අත් පත් කර ගන්න තමයි Clean Sri Lanka ව්‍යාපෘතිය ගෙන එනු ලැබුවේ. එහෙම නම්, මේ ව්‍යාපෘතිය ඕපපාතිකව ආවා නොවෙයි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණා වාගේ. මේකට දැක්මක් තිබෙනවා. මේකට වැඩ පිළිවෙළක් තිබෙනවා. මේකට භාවිත වන ක්‍රියාකාරකම් තිබෙනවා. මේකට අරමුදල් තිබෙනවා. මේකට අදාළ යන්ත්‍රණය සකස් වෙමින් තිබෙනවා.

මෙහි වැඩ ආරම්භ වුණේ ජනවාරි 01වැනි දා. අද ජනවාරි 21වැනි දා. දැන් මේ වැඩසටහන එළාගෙනයි යන්නේ. දරුවෙකු ඉපැදුණු ගමන් සියලු අංගෝපාංග සම්පූර්ණ වෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා මේ ව්‍යාපෘතියේ අවසානය තවම දැකලා නැහැ. ඒ හින්දා සමහර කෙනෙකුට මේක නොතේරෙන්න පුළුවන්. හැබැයි, රජය හැටියට මේකට අදාළ සියලු සැලසුම් සකස් කරලා, යාන්ත්‍රණයක් එළලා තිබෙන්නේ. දැන් මෙතැනදී ප්‍රශ්න කළා, මේ ව්‍යාපෘතිය ගෙන යන්නේ කොහොමද කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කථා කරලා පැනලා ගියා. චාමර සම්පත් මන්ත්‍රීතුමා කථා කරලා පැනලා ගියා. අපි කියන්නේ, ඒ නොදන්නා කරුණු අහගන්න එතුමන්ලා සිටියා නම් තමයි හොඳ.

මේ ව්‍යාපෘතියට අදාළව ජනාධිපති කාර්ය සාධක බලකායක් ඇති කරලා තිබෙනවා. ඒකට අදාළ කාර්යාල පහසුකම් හදලා තිබෙනවා. මේකට අදාළ අරමුදල් හදලා තිබෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මේ වනකොට රාජ්‍ය යාන්ත්‍රණයේ Clean

Sri Lanka කමිටු පිහිටුවා තිබෙනවා. මහජන කවුන්සල පිහිටුවා තිබෙනවා. මේ වන කොට වසම දක්වා කමිටු පිහිටුවමින් යනවා. ඒ නිසා යාන්ත්‍රණයක් හැදිලා තිබෙනවා; වැඩ පිළිවෙළක් සකස් කරමින් යනවා. ඒ නිසා මේකට වැඩ පිළිවෙළක් නැහැ කියන්න බැහැ.

කොහොම නමුත්, Clean Sri Lanka වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් කථා කිරීමේදී, මේ වාගේ වැදගත් විවාදයකදී වැරදි ලෙස මතු වන සමහර අදහස් clean කරලා දැමීමත් සාමාන්‍යයෙන් මෙවැනි විවාදයක සම්ප්‍රදායක්. මෙතැන සිටින විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ගරු අග්‍රාමාත්‍යතුමිය දක්වපු අදහස් පිළිබඳවත් විවිධ වැරදි අර්ථකථන දෙන්න මහන්සි ගත්තා. මේක දිහා රටක් බලාගෙන ඉන්නවා. ඒ නිසා විවාදයකදී ඔබ වැරදි මතයක් පෙන්වා දුන්නොත්, නිවැරදි මතයකට මේ රට ගෙන යා යුතුව තිබෙනවා. මේක පුළුල් වුවමනාවක් සහිතව ගෙන ආපු වැඩ පිළිවෙළක් කියන එක මතක් කරමින්, මෙතැනදී මතු වෙච්ච සමහර කරුණු සම්බන්ධයෙන් අපේ අදහස්, ප්‍රතිතර්ක ගෙන ආ යුතුව තිබෙනවා.

අපි මතක් කරන්න කැමැතියි, මේ රටේ ජනතාව අපේ මේ ආණ්ඩුව බිහි කරන්න ඉස්සෙල්ලා Clean Sri Lanka වැඩ පිළිවෙළ ගෙනෙන්න අවශ්‍ය පළමුවැනි වෙනස්කම කරලා දුන්නු බව. මන්ත්‍රීවරුන් 225ක් ඉන්න මේ පාර්ලිමේන්තුව clean කිරීම උදෙසා පවත්වපු මහා ශ්‍රමදානයේදී, නොවැම්බර් 21වැනි දා මෙතැන තිබුණු කැලි 157ක් ගලවා අයින් කළා. ඒ වාහනවල නොවෙයි, ත්‍රීරෝද රථවල නොවෙයි. මෙතැන හිටපු දූෂිත සමහර දේශපාලනඥයන් 157ක් ගලවලා ඉවරයි.

ඕනෑම පිරිසිදු ජලයක වුණත් අපිරිසිදු දෙයක් තිබෙන්න පුළුවන්නේ. තවත් ඒ වාගේ ගැලවිය යුතු කැලි ගණනාවක් මෙතැනත් ඉන්න බව අපි මතක් කරන්න කැමැතියි. ඒවාට අදාළ කටයුතු නීත්‍යනුකූලව ක්‍රියාත්මක වේවි. ඔබ ආණ්ඩු කරපු කාලයේ වාගේ නීතියට ඇඟිලි ගහන්න, පොලීසියට ඇඟිලි ගහන්න ජාතික ජන බලවේග ආණ්ඩුව සූදානම් නැහැ කියන එක අපි භාවිතාවෙන් පෙන්නුම් කරමින් ඉන්නේ.

ඒ වාගේම තමුන්නාන්සේලාට මතක් කළ යුතු තවත් දෙයක් තිබෙනවා. මෙතැන සැහෙන්න සද්දේ දාලා කථා කරපු කට්ටියටයි මම මේ කියන්නේ. අපි Clean Sri Lanka වැඩ පිළිවෙළ ගේනකොට, ඒකට අදහස් දක්වන්න තරම් ඒ අය clean නැහැ. අපේ ඌව පළාතේ හිටපු මහ ඇමතිවරයා විදුහල්පතිවරියක් දණ ගැස්සුවා. ඒ පිළිබඳව ගරු අගමැතිතුමියත් ප්‍රකාශ කළා. ඒ සම්බන්ධයෙන් ඒ විදුහල්පතිතුමිය කරපු පැමිණිල්ලේ සිංහල පිටපත දැන් මගේ ළඟ තිබෙනවා.

බදුල්ල දෙමළ බාලිකා මහා විදුහලේ විදුහල්පතිනිය වන භවානි රඝුනාදන් මහත්මිය මෙන්න මෙහෙම පැමිණිල්ලක් කළා.

> "2018.01.03 දින පෙර වරු 9.30ට පමණ ඌව පළාත් අධ්‍යාපන ලේකම්තුමිය දුරකථනයෙන් අමතා ඌව පළාත් සභාවට පැමිණෙන ලෙස දන්වා සිටින ලදී. නමුත් එම අවස්ථාවේ යා නොහැකි විය. පසුව පෙර වරු 10.30ට පමණ ලේකම්තුමිය නැවත දුරකථන ඇමතුමක් ලබා දී ඉක්මනට පැමිණෙන ලෙස දැන්වූවා. ඒ අනුව මම ලේකම්තුමිය හමුවීමට කාර්යාලයට ගිය අතර, කාර්යාලයේ ලේකම්තුමිය නොසිටි බැවින්, ඒ පිළිබඳව සහකර ලේකම්තුමාගෙන් විමසුවා. ඒ අවස්ථාවේ දුරකථන ඇමතුමකින් දැනගන්නට ලැබුණේ ලේකම්තුමිය මහ ඇමතිතුමාගේ නිල නිවාසයේ සිටින බවයි."

පසුව ලේකම්තුමිය කථා කොට මහ ඇමතිවරයාගේ නිල නිවාසයට පැමිණෙන ලෙස දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව එතුමිය කියනවා, "මහ ඇමතිතුමාගේ නිල නිවසට පැමිණෙන ලෙස ලේකම්තුමිය දැන්වූවත්, මම මහ ඇමතිතුමාගේ නිල නිවස පිහිටා ඇති ස්ථානය නොදන්නා බැවින්, මා හට සේවකයෙක් ලබා දුන්නා. මම ඒ සේවකයා සමඟ මහ ඇමතිතුමාගේ නිල නිවාසයට ගියා. නිල නිවාසයට ඇතුළු වූ අවස්ථාවේ මා හද තුළ ඇති වූ ගැස්මත්, වකිතයත්, භීතියත් පැවසිය නොහැකි තරම් විය. එහි මහ ඇමතිතුමා සමඟ ලේකම්තුමිය වන ජී.ඒ.එම්.එස්.පී. අබන්වල සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් සිටින ලදී. උසස් අධ්‍යාපන නිලධාරින් ඉදිරියේ මහ ඇමතිතුමා මෙසේ පවසන ලදී. ඔයාට මොකටද මගේ සුදුසුකම්. පාසලක නමක් පවසා එහි ගොස් කටයුතු කරන ලෙසත්, මාගේ සුදුසුකම් පරීක්ෂා කර මහ ඇමතිධුරය මා හට ලබා දී තිබෙනවා. මෙසේ මා හට උස් හඬින් කෑ ගසමින්, පරුෂ වචනයෙන් බැණ වදිමින් ප්‍රශ්න කරන්නට විය. ඒ අවස්ථාවේ මහ ඇමති ඉතා කෝපයට පත්ව තව තවත් බැණ වැදුණු අතර, එම අවස්ථාවේ මා හට ඇති වූ පීඩනය, බිය, වකිතය හේතුවෙන් එම වචන මා මතකයේ රැඳුණේ නැත. මේ තත්ත්වය නිසා කර කියාගත නොහැකි අසරණ තත්ත්වයට සහ මරණ බියට පත් වූ කාන්තාවක් වන මා, සමාව ගන්නා ලෙස බලපෑම් කළ අවස්ථාවේ මේ ප්‍රකෝපකාරී ක්‍රියාකලාපයෙන් මිදීමට, "Very sorry, sir." යනුවෙන් පවසා, දණින් වැඳ වැටී සමාව ගනු ලැබීය. "

මේ තිබෙන්නේ, මෙතැන කථා කරපු අය කරපු දේවල්. මෙන්න මේ විධියට පොලිස් පොතේ කට උත්තර ලියැවිලා තිබෙනවා. ඒ වාගේම ඒ පාසලේ ලොග් සටහන්වල ලියැවිලා තිබෙනවා. ඒ මිනිස්සුම ගිහිල්ලා එප්පාවල පොස්පේට් ආයතනයේ සේවකයන්ගේ බෙල්ලෙන් ඇල්ලුවා. එවැනි ජරා වැඩ තමයි කරලා තිබෙන්නේ. නමුත්, Clean Sri Lanka වැඩසටහනට මේවා ඇතුළත් වෙන්නේ නැහැ කියලා ඒ අය තේරුම් ගන්න ඕනෑ. මේවා ඇතුළත් වෙන්නේ නීතිය යටතට. ඒ නීති ඉස්සරහට ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා.

එවකට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු මේ කියපු ලේකම්වරිය එප්පාවල පොස්පේට් ආයතනයේත් සිටියා. එවකට හිටපු මහ ඇමතිතුමා, ඒ මන්ත්‍රීවරයා යන යන තැන ඒ ලේකම්වරිය අරගෙන ගියා. අරගෙන ගිහිල්ලා එප්පාවල පොස්පේට් ආයතනයේ සභාපති කළා. දැවැන්ත මූල්‍ය වංචාවක් කරපු තැනක් ඒ. දැන් අපි ඒවා පරීක්ෂා කරන්න අදාළ තැන්වලට දීලා තිබෙනවා. එප්පාවල පෝස්පේට් ආයතනයේ සිදු වූ වංචාව සම්බන්ධ ලිපි ගොනුව දැන් මගේ ළඟ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ රටේ කීර්තිමත් නඩුවක් අහලා තිබෙනවා. මූලික අයිතිවාසිකම් නඩුවකදී තීන්දුවක් දුන්නා, "එප්පාවල පොස්පේට් නිධිය රටේ ජාතික සම්පතක්. ඒකේ පොස්පේට් ඒ විධියට අපනයනය කරන්න අවසරයක් නැහැ" කියලා. ඒ නඩු තීන්දුව පැත්තකට දාලා, ඒ නඩු තීන්දුව නොසලකා හැරලා නීති විරෝධී ආකාරයෙන් ඔය කියන ඇමතිවරු පොස්පේට් නිධියේ පොස්පේට් වංචනික ආකාරයට රට පැටෙව්වා. ලංකාවේ රොක් පොස්පේට් වෙළෙඳ පොළ තුළ ව්‍යාපාරික කටයුතු කරන එක පැත්තකට දාලා, ටෙන්ඩර් කැඳවන්නේ නැතුව තමන්ට හිතවත් ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුට හිතුමතේ පොස්පේට් රට පටවන්න ඉඩ දුන්නා. ඒ සම්බන්ධ විගණන වාර්තාවල සඳහන් වෙනවා, ඒ හරහා වෙච්ච පාඩුව කොච්චරද කියලා.

ලංකාවේ පොස්පේට් මෙට්‍රික්ටොන් එකක් මේ අය අළෙවි කළේ ඩොලර් 138ට. හැබැයි, ලෝක වෙළෙඳ පොළේ පොස්පේට් මෙට්‍රික්ටොන් එකක් ඒ වෙනකොට ඩොලර් 340යි. නමුත් මෙහෙන් යැව්වේ ඩොලර් 138ට. ඒ වාගේම, 2024 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා ලෝක වෙළෙඳ පොළේ මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 170ට තිබෙනකොට මෙහෙන් පැටෙව්වේ 138ට. ඒ

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා ]

වාගේම පසුගිය අවුරුද්දේ අප්‍රේල් 01 සිට අප්‍රේල් 30 දක්වා ලෝක වෙළෙඳ පොළේ මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 148ට යනකොට මෙහෙන් පැටෙව්වේ ඩොලර් 138ට. ඒ තුළින් ලංකාවට වෙච්ච මුළු පාඩුව රුපියල් මිලියනවලින් කිව්වොත්, රුපියල් මිලියන 786ක්. අන්න, ඒ හිටපු ඇමතිවරු ඇවිල්ලා දැන් මෙතැන කථා කරනවා, බුරනවා, පුරසාරම් දොඩනවා මේ රටේ Clean Sri Lanka වැඩ පිළිවෙළ හරියට කරන්න කියලා. තවම මම මේ කියපු ඒවා clean නොවුණාට, මේවාට අදාළ පරීක්ෂණ අනිවාර්යයෙන්ම කරලා අදාළ තීන්දු ගන්න සූදානම් කියලා අපි මෙතැන සහතික කරලා කියනවා. ඒ නිසා මේවා මෙතැන නිකම් කිව්වේ නැහැ,

හොඳයි, සන්තෝෂයි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අද මේ සභාවේදී ප්‍රසිද්ධියේ පිළිගත්තා, අපට වැරදුණා, අපි ඇන ගත්තා, ඔව් ඒක වැරදුණා කියලා. හැබැයි, එතුමාටත් කියන්න කැමැතියි, තමුන්නාන්සේලා සියලුදෙනාටත් කියන්න කැමැතියි, ජාතික ජන බලවේගය වරද්දාගන්න සූදානම් නැහැ කියලා. වරද්දාගන්න ගමනක නොවෙයි අපි යන්නේ කියන එකත් තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. එයාලා දැන් කියනවා, සිංගප්පූරුව clean කරපු විධියට ලංකාවත් clean කරන්න කියලා. ඉතින්, අවුරුදු 76ක් තිබුණා නේ clean කරලා දමන්න. තමුන්නාන්සේලා ආණ්ඩු කරලා, මේ රට වට්ටලා, නැති බංගස්ථාන කරලා, බින්දුවට වට්ටලා දීපු රටක් හදන්න කටයුතු කරනකොට, ඒකට මඟ පෙන්වන්න. ඒක හොඳයි; විපක්ෂයේ කාර්යභාරය කරන්න. හැබැයි, ඔය පැත්තෙන් මේ පැත්තට කියනවා නම් අපි කුහකකම් කරනවා, ඊර්ෂ්‍යා කරනවා කියලා, මොකක්ද ඔබතුමන්ලාට ඊර්ෂ්‍යා කරන්න අපට තිබෙන අවශ්‍යතාව? මොකටද ඊර්ෂ්‍යා කරන්නේ? අපට හොඳ ශක්තිමත් ආණ්ඩුවක් හැදිලා තිබෙනවා. ඒ ආණ්ඩුව තීන්දු-තීරණ ගන්නවා. ඒ තීන්දු-තීරණ ගන්නකොට රිදෙනවා. මේ කරුණු හෙළිදරව් වෙනවා. ඇත්ත ප්‍රශ්නය එතැනයි තිබෙන්නේ. වර්තමාන ආණ්ඩුව ආපු වෙලාවේ ඉඳලා තමුන්නාන්සේලාට ප්‍රශ්නයක් තිබෙනවා. බය කිහිපයක් ඇවිල්ලා තිබෙනවා. එක බයක් තමයි, තමුන්නාන්සේලා මෙච්චර කල් වහගෙන හිටපුවා දැන් හෙළිදරව් වෙන්න පටන් අරගෙන තිබෙන එක. ඒවා හෙළිදරව් වෙනකොට රිදෙනවා. අන්න, ඒක එක බයක්.

මම වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට පත් වුණාට පසු දැනට මාසයකට වාගේ ඉහතදී මට නිර්නාමික ලිපියක් ආවා. ඒ නිර්නාමික ලිපියේ සඳහන් වෙලා තිබුණා, මේක හිටපු ජනාධිපතිවරුන්ට යැව්වා, හිටපු ඇමතිවරුන්ට යැව්වා, එක් කෙනෙක්වත් ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ කියලා. එතුමා මට එවපු ලිපියේ තිබුණේ මෙහෙම. "ජේවීපීකාරයෙක් ඇමති වෙලා ඉන්න නිසා, කොන්දක් තිබෙනවා නම් කරන්න, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයිති ඔබේ දිස්ත්‍රික්කයේ වතු බංගලා කිහිපයක් දේශපාලනඥයෝ බලහත්කාරයෙන් අල්ලාගෙන ඉන්නවා, පුළුවන් නම් නීතිය ක්‍රියාත්මක කරන්න" කියලා. ඒක නිර්නාමික නිසා මම එච්චර ගණන් ගන්නේ නැතිව පැත්තකින් තියලා, ඇටම්පිටිය ප්‍රදේශයේ වතු බංගලාවක්, හාලිඇල උණගොල්ලවත්තේ වතු බංගලාවක් එහෙම අල්ලාගෙන ඉන්නවා කියපු නිසා ආපසු මම ඒ පැත්තේ කට්ටියට කථා කරලා ඇහුවා, සෙන්දිල් තොණ්ඩමන් කියන නැඟෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාරතුමා -ඌව පළාතේ හිටපු ඇමතිවරයෙක්- මේ වාගේ වතු බංගලාවක් අල්ලාගෙන බලහත්කාරයෙන් ඉන්නවා කියනවා, ඒක ඇත්තද කියලා. ගමේ කට්ටිය කිව්වා, නැහැ, එහෙම එකක් නම් නැහැ, එතුමා කාලයක් තිස්සේ එහේ පදිංචියි, ඒක එතුමාගේ කියලා තමයි ගමේ අය දන්නේත් කියලා. හාලිඇල උණගොල්ලවත්තේ වතු බංගලාවක් වඩිවේල් සුරේෂ් කියන හිටපු ඇමතිවරයා අල්ලාගෙන ඉන්නවා කියලා මේ නිර්නාමික ලිපියේ තිබුණු නිසා, ඒ පැත්තෙන් අහලා බලනකොට එහෙනුත් කිව්වා, නැහැ, එතුමාගේ තමයි බංගලාව, ගමේ කට්ටිය කියන්නෙත්, වත්තේ කට්ටිය කියන්නෙත් ඒක එයාගේ තමයි කියලා.

මොනවා වුණත්, සැකයක් ආපු නිසාත්, මගේ කොන්ද පරීක්ෂා කරන්න ලියුමක් එවපු නිසාත්, ඊට පහුවෙනි දා මම යැව්වා පරීක්ෂණ කණ්ඩායමක්, ඒ ගැන පරීක්ෂා කරලා වාර්තාවක් එවන්න කියලා. ඒ අය ගිහින් පරීක්ෂා කරලා, ඡායාරූප නඟලා, වීඩියෝ කරලා, අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට, ඉඩම් කච්චේරිවලට ගිහිල්ලා ලේඛන ඔක්කොම අරගෙන ආවා. ඒ වාර්තාව අනුව බලනකොට නිර්නාමික පෙත්සමේ කරුණු ඇත්ත. බංගලා දෙකක් බලහත්කාරයෙන් අල්ලාගෙන සිටියා. කවුද අල්ලාගෙන හිටියේ? බදුල්ල, ඇටැම්පිටියේ, දික්වැල්ල වත්තේ, "Deensland" කියන බංගලාව සුවිශේෂ වතු බංගලාවක්. ඔය සෙන්දිල් තොණ්ඩමන් කියන ආණ්ඩුකාරවරයා අවුරුදු 13ක් ඒක අල්ලාගෙන සිටියා. ඒ වාගේම, හාලිඇළ, උණගොල්ලවත්තේ වතු බංගලාවක් අවුරුදු 19ක් හිටපු, හැම ආණ්ඩුවක්ම නියෝජනය කරපු වඩිවේල් සුරේෂ් හිටපු ඇමතිවරයා අල්ලාගෙන සිටියා. මම අමාත්‍යාංශයේ නීති අංශය කැඳෙව්වා. කැඳවලා නීති අංශයට උපදෙස් දුන්නා, සතියක් ඇතුළත බංගලා දෙක ගත්තේ නැත්නම් ගිවිසුම් cancel කරනවා, බංගලා දෙක ආපහු දෙන්න ඕනෑ කියලා ලිපිය ගහන්න කියලා. ඒ ලියුම ගියා වතු කොම්පැනියට. කොම්පැනිය කථා කළා සෙන්දිල්ට, දැන් තිබෙන ආණ්ඩුවෙන් මෙහෙම ලියුමක් ඇවිල්ලා තිබෙනවා, මේක අපේ ගිවිසුමටත් ප්‍රශ්නයක්, ඔබතුමාත් එක්ක තමයි උසාවි යන්න වෙන්නේ, මොකද කියන්නේ කියලා. සෙන්දිල් කිව්වා ලු, ඇවිල්ලා තිබෙන ආණ්ඩුව හොඳ නැහැ, ඒ නිසා මම වත්තේ බංගලාවෙන් අයින් වෙන්නම් කියලා. සතියෙන් සෙන්දිල් තොණ්ඩමන් අවුරුදු 13ක් හිටපු බංගලාවෙන් එළියට දැම්මා. වඩිවේල් සුරේෂ් කිව්වා, එයාට නීත්‍යානුකූල අයිතියක් තිබෙනවා, සතියක් දෙන්න, ලිපි ලේඛන පෙන්වන්න කියලා.

සතියක් කල් දුන්නා. සතිය අවසන් වනකොට ලිපි ලේඛන පෙන්වන්න බැරි වුණා; අවුරුදු 19ක් හිටපු බංගලාවෙන් එළියට දැම්මා. අන්න ඒ විධියට ඒවා පවරා ගත්තා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එම නිසා අපි මෙතුමන්ලාට කියනවා, ඔහොම බලාගෙන ඉන්න, දුන් පොරොන්දු ඔක්කෝම ක්‍රියාත්මක වනවා කියලා. ජනාධිපතිතුමා ඒක තමයි කිව්වේ. ඒවා කියනකොට තමයි රිදෙන්නේ. රිදෙනකොට තමයි ඇවිල්ලා මෙතැන කියන්නේ. කොච්චර රිදුනත්, කොහොම කිව්වත් මේ රටේ ජනතාවට දුන් පොරොන්දු අනිවාර්යයෙන්ම අකුරක් නැර ඉෂ්ට කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුව සූදානම් කියන පණිවුඩය තමුන්නාන්සේලාට දෙන්න අපි සූදානම්. ඔක්කෝම සුද්ද කරනවා.

Clean Sri Lanka වැඩසටහනේ තිබෙන්නේ, නව මිනිහෙක් නිර්මාණය කිරීම. නව මිනිහෙක් නිර්මාණය කරන්න බැහැ, මේ ඔක්කෝම සුද්ද කරන්නේ නැතුව. ඒ නිසා මේවා ඔක්කෝම සුද්ද පවිත්‍ර කරනවා. අර කකුළුවාට වෙච්ච වැඩේ තමයි ඔබතුමන්ලාටත් වෙන්නේ. මොකද, මෙතැන දඟලනවා නේ. "ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ - සැපයක් යැයි විපක්ෂය ඔය දැන් දිය කෙළියේ". ඔහොම දිය කෙළ කෙළම ඉන්න. අනිවාර්යයෙන්ම අපි නීතිය ක්‍රියාත්මක වනවා. මේ රටේ Clean Sri Lanka වැඩසටහන අපි අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා. ඔබතුමන්ලා ඒකට සහාය දෙනවා නම් අපි බොහොම කැමැතියි. එම වැඩසටහන ක්‍රියාත්මක වනවා. එය ක්‍රියාත්මක කරලා, අපේ මාතෘ භූමිය ලෝකයේ තිබෙන දියුණු රටක් බවට පත් කරලා, අපේ දරුවන් වෙනුවෙන් හදලා දෙන්න අපේ ජාතික ජන බලවේග රජය සූදානම් කියන පණිවුඩය ඔබතුමන්ලාට සහ රට වැසියන්ට දෙන්න අපි සූදානම්. ඒවාට තමයි මේ අපි ආවේ.

චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා වයඹ පළාත් සභාවේ මහ ඇමතිවරයා ලෙස සිටියදී මමත් ඒ පළාත් සභාවේ සාමාන්‍ය මන්ත්‍රීවරයෙකු හැටියට හිටියා. අපේ ජයවර්ධන මන්ත්‍රීතුමා මොනරාගල දිස්ත්‍රික්කය නියෝජය කරමින් පත් වෙලා සිටියා. මහ ඇමතිවරයා ඌව පළාත් සභාවේ දරුවන්ට ලැබෙන්න තිබුණු සල්ලි තමන්ගේ පෞද්ගලික ගිණුම්වලට දමා ගත් ලිපි ලේඛන මා ළඟ තිබෙනවා. මේවා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කළා. ඒවා යට ගහ ගත්තා. ලංකා බැංකුව කියන්නේ, රජයේ බැංකුවක්. මහජන බැංකුව කියන්නේ, රජයේ බැංකුවක්. එම බැංකුවල සල්ලි චාමර සම්පත්ගේ ගිණුමට දැම්මේ කොහොමද? අද වන කල් ඒවා යට ගහලා තිබෙන්නේ. ඒ යට ගහපු ෆයිල් ජාතික ජන බලවේග ආණ්ඩුව යටතේ නැවතත් උඩට ගන්නා බව ගරු මන්ත්‍රී චාමර සම්පත් දසනායකට අද මේ සභාවේදීම දැනුම් දෙනවා. තමන්ගේ පෞද්ගලික ගිණුමට ලක්ෂ ගණන් දමා ගත්තා. ඌව පළාත් සභාවේ මුල්‍ය රෙගුලාසි අනුව, මහ ඇමතිවරයාට තමන්ගේ නිල මුද්‍රාව සහිතව තමන්ගේ ලිපි ශීර්ෂ පාවිච්චි කරමින් රාජ්‍ය ආයතනවල මුදල් තමන්ගේ පෞද්ගලික බැංකු ගිණුමට දමන්න කියලා කියන්න බැහැ. එම ලිපි ලේඛන ඔක්කෝම මා ළඟ තිබෙනවා. එම ගිණුම්වලට මුදල් දැමූ බවට සටහන් තිබෙනවා. ඒවා යට ගහගෙන හිටියා. ඔබතුමන්ලා යට ගහපු සියල්ල උඩට ගන්න අපි සූදානම්. ඒවා උඩට ගන්නේ පෞද්ගලික තරහක්-මරහක් නිසා නොවෙයි.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමා මේ රටේ පාතාලය සම්බන්ධයෙන් සාකච්ඡා කළා, පාතාලය මඩින එක මේ රජයේ වගකීමක් කියලා. ඔව්, අපි එතුමාට කියන්න කැමැතියි, එතුමාගේ තාත්තා ජනාධිපති කාලයේ ඒ ජනාධිපතිතුමා තංගල්ලේ හිර ගෙදරට ගිහිල්ලා සිර කුටියේ දොර ඇරලා, "අමරේ එන්න" කිව්වාම, ජුලම්පිටියේ අමරේ - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අපේ ගරු නලින්ද ජයතිස්ස සහෝදරයා ඒ දවස්වල හම්බන්තොට දිස්ත්‍රික්කයේ රැස්වීමකට ගිය වෙලාවේ ඔන්න ඔය ජුලම්පිටියේ අමරේ ඇවිල්ලා ප්‍රසිද්ධියේ අපේ මිනිසුන්ට වෙඩි තබා මැරුවා. ඒ, රාජපක්ෂලාගේ ළඟම, සුවච කීකරු ගෝලයෝ. අද ඉන්නේ හිර ගෙවල්වල. එදා පාතලය හැදුවා; හුරතල් කළා; මිනිස්සු මැරුවා; මාධ්‍යවේදීන් මැරුවා. ඒ සියල්ලට අනිවාර්යයෙන්ම නීත්‍යානුකූලව කටයුතු කරනවා. ඒවාට කලබල වෙන්න දෙයක් නැහැ. ඒ සියල්ල වෙනුවෙන් කටයුතු කරනවා.

අපි මේ රජය පිහිටුවලා තවම මාස දෙකයි. අපි ගමනක් යනවා. අපි මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, වසර 76ක් තිස්සේ විනාශ කරපු රටක් මාස 2කින් ගොඩ ගන්න බැහැ කියලා. සුළුපටු විනාශයක් නොවෙයි කරලා තිබෙන්නේ. හාල්, පොල් නැති ප්‍රශ්න කියනවා. මේ ආණ්ඩුව භාර දෙනකොට භාණ්ඩාගාරය ටිකක් ශක්තිමත් තැනකට ගෙනැල්ලා තිබුණා නම්, වී අලෙවි මණ්ඩලය වී ටිකක් එක්ක භාර දුන්නා නම්, ඔබතුමන්ලාගේ විවේචනය සාධාරණයි. වී අලෙවි මණ්ඩලය දුන්නේ වී නැතුව. වී අලෙවි මණ්ඩලය සතුව තිබුණේ එක ලොරියයි. අපට දුන්නේ හිස් භාණ්ඩාගාරයක්. ණයක් ගෙවා ගන්න බැරි තත්ත්වයට පත් කරලා තමයි අපට රට භාර දුන්නේ. එහෙම දීපු රටක්, මාස දෙකෙන් හදලා දෙන්න කියලා දැන් කියනවා. අවුරුදු 76ක් පාලනය කරපු කට්ටිය තමයි එහෙම කියන්නේ. ඒ පාලනය කරපු ආකාරයේ ප්‍රතිඵල තමයි මේ තිබෙන්නේ.

දැන් මේ රට ටික ටික හිස ඔසවන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටේ ජනතාවට අපි කියනවා, මේ රට ඔබ බලාපොරොත්තු වූ තැනට අපි ගෙනැවිත් දෙන බව. අපි පොරොන්දු වුණා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" මේ රටේ මිනිසුන්ට හදලා දෙනවා කියලා. අන්න ඒකට කුහකකමක්, ඊර්ෂ්‍යාවක් විපක්ෂ පැත්තේ තිබෙන්න පුළුවන්. එතුමන්ලාට බය වෙන්න කාරණා කිහිපයක් තිබෙන බව මම කිව්වා. එකක්, එතුමන්ලා කරපු මහා අපරාධ හෙළිදරව් වනකොට බයක් තිබෙනවා. අනෙක් එක, මේ රට ක්‍රමානුකූලව හදනකොට බයක් තිබෙනවා. ඒ බය ඇති වෙන්නේ ඇයි? නැවත බලය ගන්න නොහැකි වෙයි කියන බය තමයි ඒ ඇති වන්නේ. අපේ 159දෙනා එකතු වෙලා මේ රට හදලා, ඊළඟ මහ මැතිවරණය වනකොට මීට වඩා බලයක් මේ රටේ ජනතාව අපට ලබා දෙන්න සූදානම් තත්ත්වයට අපි මේ රට ගෙනෙනවා. ඒක අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි. කියපු දේ කරනවා නම් මිනිස්සු ආණ්ඩුවක් පන්නන්නේ නැහැ. අපි මේ ආණ්ඩුව බලහත්කාරයෙන් තියා ගන්න ආවේ නැහැ.

එහෙම බලහත්කාරයෙන් ආණ්ඩු තියාගන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ ජනතාවට වෙච්ච පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ. අපට වසර 5ක ජන වරමක් තිබෙනවා. ඒ ජන වරමෙන් අපි තවම සුළු කාලයයි ගත කර තිබෙන්නේ. අපි තවම මුල් අල්ලන කාලය; තවම ශක්තිය හදා ගන්න කාලය; පදනම හදා ගන්න කාලය. අත්තිවාරම දානකොටම "කෝ, තවම ගේ හැදුවේ නැහැ නේ" කියනවා. "වහල ගැහුවේ නැහැ නේ" කියනවා. ඔව්, අත්තිවාරම දාලා දැන් වැඩ පටන් අරගෙනයි තිබෙන්නේ. අපි හරියට ගමන යන්න සූදානම්. මේ රටේ ජනතාවට ඒ වෙච්ච පොරොන්දු ඉෂ්ට කරන්න සූදානම්.

ඉතින් ඒ ගැන කලබල වෙන්න දෙයක් නැහැ. ඒ නිසා කකුලෙන් ඇදිලි, කෙනෙහිලිකම්, ඊර්ෂ්‍යාව කියන ඔය ඔක්කෝම ඔය පැත්තේ තියා ගන්න. අපි ඒවා භාර ගන්න සූදානම් නැහැ. සාධාරණ ලෙස මේ රට ගොඩනැඟීම වෙනුවෙන් ඇප වෙන්න, කැප වෙන්න දැවැන්ත කණ්ඩායමක් මෙතැන ඉන්නවා; එළියේ කණ්ඩායමක් ඉන්නවා. ඔබතුමන්ලා ඔච්චම් මෙච්චම් කළාට අපි ඒක දන්නවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා නේ, ඒ පැත්තෙන් කිව්වා නේ රාජපක්ෂ මහත්තයාට ගෙවල් දෙන්න කට්ටිය ඉන්නවා කියලා. ඔව්, ඔව්, ඉස්සර උදවු පදවු කරපු කට්ටිය දෙන්න සූදානම් වෙලා ඇති. එතුමා ගෙයින් එළියට දාන කථාවක් ජනාධිපතිතුමා කිව්වේ නැහැ. මහින්ද රාජපක්ෂ දැන් ඉන්න ගෙට මාසික කුලිය රුපියල් ලක්ෂ හතළිස්අටක් කියලා තක්සේරු කරලා තිබෙනවා. ඉතින් ඒ තක්සේරුව කළේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව. ඒක රජයේ තක්සේරුව. එහෙම නැත්නම් ඔබතුමන්ලාම හදාගත් නීතිවල තිබෙනවා, විශ්‍රාමික ජනාධිපති කෙනෙකුට ගෙයක් දෙන්නේ නැත්නම් මාසික වැටුපට රුපියල් 30,000ක් දෙන්න ඕනෑ කියලා. ඉතින් ජනාධිපතිතුමා කියපු එකේ වැරැද්ද මොකක්ද? ලජ්ජා වෙන්න ඕනෑ, මාසික කුලිය රුපියල් ලක්ෂ 48ක ගෙදරක ඉන්න එක ගැන. එහෙම මහත්මා ගතියක්, ඔය කියන සදාචාරයක්, ඔය කියන ලොකුකමක්, ඇඳගෙන සිටින සුදු ඇඳුමේ ශුද්ධවන්තකමක් තිබෙනවා නම් ක්‍රියාකාරිත්වයෙන් මෙහෙම හොරකම් කරන්න බැහැ. අම්මා අප්පාගේ සොහොන් ගෙවල් ජනතා බදු මුදලින් හදන්න බැහැ. ඒ ඔක්කෝම එළිදරවු කරනවා නම්, එළිදරවු කරන්න බැරි කමක් නැහැ. අදාළ දේවල් තිබෙනවා.

කොහොම නමුත් අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, දැන්වත් මේ රටේ මිනිස්සුන්ට ආදරයක් තිබෙනවා නම්, මේ රට ගැන කැක්කුමක් තිබෙනවා නම්, මේ වාගේ රටක් ගොඩනඟන දැවැන්ත ව්‍යාපෘතිවලට අකුල් හෙළන්න එපා. ඒවාට ඊර්ෂ්‍යා කරන්න එපා. ඒවාට සහයෝගය දෙන්න. ඔබතුමන්ලා සහයෝගය නොදුන්නත්, ස්වේච්ඡාවෙන් සහාය දෙන මිනිස්සු - මේ රටේ ජනතාව - මේ රට එතැනට ගේනවා. මේ Clean Sri Lanka වැඩපිළිවෙළ දැවැන්ත වැඩපිළිවෙළක් බවට පත් කරලා අපි එය බිමට එළනවා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජනතාව මේ සමඟ එකතු කරනවා. මේ රටේ ඒ සිහින රාජ්‍යය, මේ රටේ මිනිසුන්ගේ සිහිනයක් වෙච්ච, අපේ

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා ]

සිහිනයක් වෙච්ච "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" අනිවාර්යයෙන්ම මේ රටට, මේ රටේ දරුවන්ට උදා කරලා දෙන්න මේ නව රජය සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, මට වේලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ගරු අගමැතිතුමිය ටිකක් වෙලා මෙතැන ඉඳලා යයි කියලා මම හිතුවා. මේ Clean Sri Lanka වැඩපිළිවෙළ පිළිබඳව අද ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළව දවස් දෙකක විවාදයක් පැවැත්වෙනවා. අපි දවස් දෙකකට විශාල මුදලක් වියදම් කරනවා. ඒ නිසා මොකක්ද මේකෙන් කරන්න යන්නේ කියලා කියන්න ඕනෑ. විශ්වවිද්‍යාලයේ හිටපු කාලයේ අපි දන්නවා, සාමාන්‍යයෙන් මොකක් හරි වැඩපිළිවෙළක් හදනවා නම් ඒක කවුරු, කුමට, කොහොමද, කාටද, කවදාද, කෙලෙසද කියන මොකක් හරි වැඩපිළිවෙළක් ගැන concept paper එකක් තිබෙන්න ඕනෑ. ඒක තමයි අපි ක්‍රියාත්මක කරන්නේ.

මේ Clean Sri Lanka පිළිබඳව අපට දැන ගන්න තිබෙන එකම දේ තමයි ජනාධිපතිතුමා කරපු කථාව. ජනවාරි 1වෙනි දා කරපු සමස්ත කථාවේ Clean Sri Lanka කියන එකට එතුමා කාරණා ගණනාවක් ඇතුළත් කරලා තිබෙනවා. නමුත් මේකේ තිබෙන කාරණා එකින් එක අපි දන්නේ නැහැ. එක්කෝ ආණ්ඩුව මේක සකස් කරපු කෙනා ගෙනැල්ලා කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ, මේකේ concept paper එක මේකයි, මේකෙන් ක්‍රියාත්මක කරන්න හදන්නේ මෙන්න මේකයි, මෙන්න මේවා තමයි අපි මේකට සහයෝගය ගන්න හදන ආයතන, මෙන්න මේකයි වැඩපිළිවෙළ කියලා. සම්පූර්ණයෙන් අපට ඒවැනි වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්න අවශ්‍යයි. මේ රටේ, මේ ආණ්ඩුවේ දෙවැනි පුරවැසියා විධියට අගමැතිතුමිය ඒක ඉදිරිපත් කරයි කියලා මම හිතුවා. නමුත් එතුමියත් අර සාම්ප්‍රදායික විධියටම කටයුතු කරපු එක තමයි කළේ. දැන් ඔබතුමන්ලා කියනවා නේ, ඔබතුමන්ලා සාම්ප්‍රදායික නැහැ, අලුත් කට්ටියක් කියලා. නමුත් එතුමියත් අර එක එක්කෙනා අහපු ප්‍රශ්නවලට උත්තර ටිකක් දීලා අත හෝදාගෙන යන්න ගියා.

මම කියන්න කැමැතියි, ලෝකයේ අනෙක් රටවල්වල කටයුතු කර තිබෙන ආකාරය. විශේෂයෙන්ම 1958දී සිංගප්පූරුවේ ලී ක්වාන් යූ මහත්තයා ආවාට පස්සේ, 1968දී එතුමා පටන් ගන්නවා, "Keep Singapore Clean" කියන වැඩසටහන. ඒ වැඩසටහන එතුමා ඉතාම ලස්සන වැඩපිළිවෙළ රාශියක් එක්ක හදනවා. විශේෂයෙන් මහජන සෞඛ්‍ය ප්‍රචාරණ වැඩසටහනක්, නීති ක්‍රියාත්මක කිරීම, සනීපාරක්ෂාව පිළිබඳ යටිතල පහසුකම් දියුණු කිරීම, පොදු ජනයාට නිවාස පහසුකම් ඇති කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමය, මහජන සහභාගිත්වය වැඩිදියුණු කර පිරිසිදු නගර ඇති කිරීම වාගේ කාරණා මත, අවුරුදු 4ක සමීක්ෂණයකින් පසුව තමයි "Keep Singapore Clean" කියන වැඩසටහන පටන් ගත්තේ.

හැබැයි, දැන් ලංකාවේ පටන් ගත්ත මේ ව්‍යාපෘතියට "පිරිසිදු ලංකා" කියලාවත් ලස්සනට නම දැම්මා නම් හොඳයි. මොකද, ඇත්තටම ඔබතුමන්ලා හොඳට සිංහල දන්නා අය නිසා. නමුත්, Clean Sri Lanka කියලායි මේ ව්‍යාපෘතියට නම දාලා තිබෙන්නේ. ඒකට ප්‍රශ්නයක් නැහැ. Clean Sri Lanka හඳුනා ගත් විධියත්, ඒ සඳහා වැඩ පිළිවෙළක් නැති එකත් තමයි මේකට චෝදනා එන්න මූලික හේතුව බවට පත් වුණේ.

මේ ව්‍යාපෘතිය එක එක්කෙනා එක එක විධියට හඳුනා ගත්තා. අලියෙක් අත ගාලා අන්ධයා අලියාගේ හැඩරුව කියනවා වාගේ පොලීසිය තේරුම් ගත්තා, Clean Sri Lanka කියන්නේ ත්‍රීවීලර්වල කැලි ගලවන එක, බස්වල කැලි ගලවන එක, පාට කරලා තිබෙන දොරවල් ගලවලා වීසි කරන එක කියලා. ඊට පස්සේ ටික දවසක් යනකොට උද්ඝෝෂණයක් ආවා, වැඩ වර්ජනයක් ආවා. ආණ්ඩුව කිව්වා, නැහැ, ප්‍රශ්නයක් නැහැ, මාස තුනකට මේ කටයුත්තේ කාලය දික් කරගන්නවා කියලා. දැන් ඒකත් ඉවරයි. දැන් කියනවා, රුපියල් 1,000ක් දීලා ඔය වාගේ කැලි සවි කර ගත්තාට ප්‍රශ්නයක් නැහැ, දැන් මොකුත් ප්‍රශ්නයක් නැහැ කියලා. ඊළඟට මම දැක්කා, සමහර මන්ත්‍රීවරු වැව්වලට බැහැලා ජපන් ජබර ගලවනවා. ඒ අය Clean Sri Lanka එක දැක්කේ ඒ විධියට. තව පිරිසක් ගිහිල්ලා පාරවල් සුද්ද කරනවා. අවුරුදු ගණනාවකින් සුද්ද නොකරපු කොටුව දුම්රිය පොළ සුද්ද කරමින් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් කිව්වා, ඔවුන් දැන් Clean Sri Lanka වැඩසටහනට ඇවිල්ලා තිබෙන්නේ කියලා.

මම ඔබතුමන්ලාට කියනවා, අපි මේ වැඩ පිළිවෙළ කරමු. මම නම් සියයට දෙසියයක් මේකට කැමැතියි. ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා පළමුවෙනි කථාව කරනකොට මම කිව්වා, මම කල්පනා කරන විධියට Clean Sri Lanka වැඩ පිළිවෙළ ඉතාම වැදගත් වැඩ පිළිවෙළක් කියලා. හැබැයි, ඒකට අලුත් system එකක් හදලා දෙන්න ඕනෑ. මම දැක්කා චතුරංග අබේසිංහ මැතිතුමා කියලා තිබෙනවා, "එක එක්කෙනා කියන ඒවා හරියන්නේ නැහැ, ඒකට වැඩ පිළිවෙළක් තිබෙනවා, ඒක කරලා අපි කියන්නම්, මොකක්ද කරන්නේ, ලබන 25වැනි දා තමයි මේ සම්බන්ධ දැනුවත් කිරීම තිබෙන්නේ" කියලා. නාමල් රාජපක්ෂ මැතිතුමාත් කිව්වේ ඒකයි. මේකට ToR එකක් හදන්න. මේ ගැන රජයේ සේවකයන් දැනුවත් කරන්න. ඒ අයට කරන්න තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන්න. අපි දවස් දෙකක් මෙතැන මේ ගැන සාකච්ඡා කරනකොට මේ වැඩ පිළිවෙළ පිළිබඳව තමයි සාකච්ඡා කරන්න ඕනෑ. ඒ ගැන කිසිම වැඩ පිළිවෙළක් නැතිව, අපේ සමන්ත විද්‍යාරත්න මහත්මයා කථා කළේ, හොරට ගත්ත බංගලා ටිකයි, අරවා මේවා ටිකයි clean කරන හැටි. ඒ එතුමා Clean Sri Lanka එක දකින විධිය. මම කියන්නේ ඒක නොවෙයි. හොරකම් අල්ලන එක Clean Sri Lanka කියලා සමහරු හිතන්න පුළුවන්.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කරුණාකරලා මට මගේ වෙලාව තුළ කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා පස්සේ කථා කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා මගේ නම සඳහන් කළ නිසා මට අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙනම්, ඒ වෙලාව ඔබතුමන්ලාගේ පැත්තෙන් ගන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් ආයෙත් ඒක ඇදගන්න එපා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔබතුමා නේ ඉතින් ඇද්දේ. ඔබතුමා මගේ නම සඳහන් කරපු නිසායි මම අවස්ථාව ගත්තේ. ඔබතුමා ඔක්කෝම කියලා, ඔබතුමා තේරුම් ගත්ත විධිය නේ ඔය කියන්න යන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඒක තමයි අපට පෙනෙන්නේ. ඔබතුමා එක එක කෑලි අල්ලාගෙන ඔබතුමා තේරුම් ගත්ත එක කියන්නේ. මම ඔබතුමාට කියන්නේ ඔබතුමා ඔය කෑලි ගලවන්න, ගලවලා අපි මෙතැනදී කියපු හරය ගන්න කියලායි. ඔබතුමාත් වටේ නේ යන්නේ. ගරු සභාවේ කරපු කථාවලදී අපි යමක් කිව්වා. ඔබතුමා ඒක ගත්තේ නැති එක ගැන අපි කනගාටු වෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි. මම තේරුම් ගත්ත විධිය නොවෙයි, ඔබතුමන්ලා තේරුම් අරගෙන කරපු විධියයි මම මේ කිව්වේ. මූලික වශයෙන් අපට කරන්න කාරණා ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ඉන්දියාවේ මේ වැඩ පිළිවෙළ පටන් අරගෙන ඉදිරියට ක්‍රියාත්මක කරගෙන ගියා. ඇත්තටම ඔවුන්ට අවශ්‍ය වෙලා තිබුණා, ඒ ව්‍යාපෘතිය පටන් ගත්තාට පස්සේ යම් ඉලක්කයකට යන්න. 2014දී තමයි ඔවුන් ඒක පටන් ගත්තේ, "Swachh Bharat Mission" කියලා. මේ ව්‍යාපෘතිය පටන් ගත්තාට පස්සේ ඒ රටේ ජනතාව එළියේ මළපහ කිරීම නතර කළා. 2021 වර්ෂය වනකොට වැසිකිළි මිලියන 100ක් හදන්න ඔවුන් සැලසුම් කළා. ඔවුන්ට target එකක් තිබුණා, සියයට 39 ඉඳලා සියයට 100ක් දක්වා අලුත් වැසිකිළි පද්ධති හදලා දෙන්න. මම අහන්නේ, Clean Sri Lanka වැඩ පිළිවෙළ යටතේ තමුන්නාන්සේලා එහෙම target එකක් හදාගෙන තිබෙනවාද, තමුන්නාන්සේලාගේ එම වැඩ පිළිවෙළ මොකක්ද කියලායි. වෙන එකක් නොවෙයි. පටලවා ගන්න එපා.

දැන් බලන්න, මේ ව්‍යාපෘතිය කරන්න අවශ්‍ය ප්‍රධානම ආයතනයක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය සඳහා expertsලා කිහිපදෙනෙක් පත් කරලා තිබුණා. මේ අය පැහැදිලිව කියලා තිබුණා, මේ කටයුත්ත කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට භාර දීලා වැඩක් නැහැ, මේක පළාත් පාලන ආයතනවලට දෙන්න කියලා. මොකද, පළාත් පාලන ආයතනවල තමයි මේ රටේ මේ ක්‍රියාවලිය සම්බන්ධ වැදගත්ම පිරිස ඉන්නේ. එම නිසා ඔවුන්ට චක්‍රලේඛයක් මඟින් මේ පිළිබඳව දැනුම් දීලා එතැනින් පටන් අරගෙන ඉස්සරහට ගෙනියන්න පුළුවන්.

උදාහරණයක් විධියට ගත්තොත්, ලංකාවේ කසළ මෙට්‍රික්ටොන් 10,460ක් එළියට එනවා. හැබැයි, මේ කසළ මෙට්‍රික්ටොන් 10,460න් පළාත් පාලන ආයතන එකතු කරන්නේ මෙට්‍රික්ටොන් 3,600යි. එතකොට ඉතුරු ප්‍රමාණයම මේ රටේ පරිසරයට එකතු වෙනවා. Clean Sri Lanka එක යටතේ තමුන්නාසේලාට මේ සඳහා යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද? මම මෙන්න මේකයි අහන්නේ. එහෙම නැතිව එක එක්කෙනා හිතන විධියට කථා කරන ඒවා ගැන නොවෙයි. විශේෂයෙන්ම මම මේ සම්බන්ධ යෝජනාවක් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් වෙලාව දෙකයි තිස්පහයි. මට විනාඩි කීයක් තිබෙනවාද? මම දෙකයි විසිහතට කථාව පටන් ගත්තේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, ඔබතුමා දෙකයි විසිහතට කථාව පටන් ගත්තේ. ඔබතුමාට වැඩිපුර විනාඩියක් දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇමතිතුමා ගත්ත කාලය එතුමාගෙන් ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වැඩිපුර විනාඩියක් දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි.

දැන් බලන්න, පළාත් පාලන ආයතනවලට බලය දෙන්න කියලා මම කිව්වේ වෙන හේතුවක් නිසා නොවෙයි. දැන් පළාත් පාලන අමාත්‍යවරයාට කිසිම ගැටලුවක් නැතිව චක්‍රලේඛයක් නිකුත් කරන්න පුළුවන්, මේ රටේ සිටින සෑම පවුලක්ම තමන්ගේ නිවස ඉදිරිපිට තිබෙන පාරට මෙහා පැත්තේ තිබෙන කොටස සුද්ද කරගන්න ඕනෑ කියලා. ඒක අනිවාර්යයෙන් කරන්න ඕනෑ, ඒක කළේ නැත්නම් දඩ ගහන්න. අද පළාත් පාලන ආයතනවලට පාරවල් අයිනේ තිබෙන මානා පඳුරු කපන්න සිද්ධ වෙලා තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා. නමුත්, ඒ වැඩ කරන්න අද මිනිස්සු නැහැ. හැබැයි පළාත් පාලන ආයතනවලට බලයක් දුන්නොත් ඔවුන්ට කියන්න පුළුවන්, තමන්ගේ බල ප්‍රදේශයේ තිබෙන සෑම නිවසකටම chit එකක් දීලා - ඒ කාලයේ දීපු chit එක ගැන නොවෙයි මම මේ කියන්නේ - තමන්ගේ නිවස ඉදිරිපිට තිබෙන කොටස සුද්ද කරලා මල් වවාගන්න කියලා. උදාහරණයක් ගත්තොත්, අක්කර 25ක් තිබෙන වත්තක වතු හිමියා වත්ත ඇතුළත සුද්ද කර ගන්නවා, තමන්ට හවසට ඇවිදින්න. නමුත්, පාර දිගේ තිබෙන මානා පඳුරු ටික කපන්න ඕනෑ කවුද? ඒක කපන්න ඕනෑ, ප්‍රාදේශීය සභාව. නැත්නම් මාර්ග සංවර්ධන අධිකාරිය. මම කියන්නේ මේ දේවල් සඳහා අලුත් නීතියක් ගෙනාවොත්, මේ රට සුද්ද කරන වැඩේ අපට එතැනින් පටන් ගන්න පුළුවන්. මේ කටයුත්ත කරලා බලන්න. මාස හයක් ඇතුළත මේ රට සුද්ද කරගන්න අපට පුළුවන්. හැබැයි, සමහර සතුන්ට ඉන්න තැන් නැති වෙයි. ඒ නිසා මෙවැනි කාරණාත් මේ වැඩසටහන තුළින් පටන් ගන්න.

අනෙක් කාරණය තමයි, වැසිකිළි පද්ධති නඩත්තුව. අපි ඉස්සෙල්ලාම කල්පනා කරන්න ඕනෑ, අපි ගොඩ නැඟෙන්න, පිරිසිදුව ඉන්න. බලන්න ගිහින්, මේ පාර්ලිමේන්තුවේ පහළ කොටසේ තිබෙන වැසිකිළි ටික. ඒවා කොයි තරම් ගඳද? ඒවා කවුරුවත් සුද්ද කරනවාද? නැහැ. උඩ කොටස සුද්ද කරනවා. පහළ කොටස, සාමාන්‍ය පුද්ගලයන් යන තැන සම්පූර්ණයෙන් ගන්දස්කාරයි. අඩුම තරමින් ඒ තැන්වල toilet papersවත් තියලා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුව ඇතුළෙන්වත් මේ වැඩසටහන පටන් ගන්නයි තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව එක විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

තමුන්නාන්සේලා අපි කවුරුත් දන්නවා, අපි පාවිච්චි කරන්නේ ඉතාම තෙත වැසිකිළි කියලා. මම නම් ඒකට සූදානම් නැහැ. මම හැම දාම කියන්නේ වැසිකිළිය පිරිසිදුව තිබෙන්න ඕනෑ වාගේම, තෙත් කරන්න - wet කරන්න - එපා කියලායි. අපි පොඩි කාලයේ ඉඳන් එහෙම ඉන්න පුරුදු වෙලා නැහැ. අපි පිරිසිදුව ඉන්න පුරුදු වෙන්න ඕනෑ. එවැනි වැඩ පිළිවෙළක් අපි කුඩා දරුවන් වෙනුවෙන් හදන්න ඕනෑ. කෝටිපති ලොකු මාළිගාවල toilet එකක් ඇතුළට ගිහින් බලන්න, එහි flush කරන කොටස කැඩිලා. එහෙම නැත්නම් ඒකෙන් වතුර වැක්කෙරෙනවා. එක්කෝ නාන්න තිබෙන තැන බාල්දියක් තියලා. ඒක මේ රුපියල් 250ක්, 300ක් වැය වන වැඩක්. මිනිස්සු හදාගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ගැනයි අපි මේ කියන්නේ. මේවාත් Clean Sri Lanka එකට ඇතුළත් වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, මම කල්පනා කරන කාරණයේ එක පැත්තක් තමයි මේ.

ඔබතුමන්ලා කල්පනා කරන විධියට හොරකම නැති කිරීම එක පැත්තක්. ඒකත් හරි. ඒ වාගේම වංචාව, දූෂණය නැති කිරීමත් එක පැත්තක්. ඒකයි මම කිව්වේ ආණ්ඩුව විධියට කරුණාකරලා තමුන්නාන්සේලාගේ concept paper එක ගේන්න කියලා. මේ සඳහා රාජ්‍ය නිලධාරින්ට යම් වැඩ පිළිවෙළක් පවරන්න. පළාත් පාලන ආයතනවලට යම් වගකීමක් පවරන්න. පවරලා මුළු ලංකාවම සුද්ද කරන වැඩ පිළිවෙළක් ගේන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද ඔබතුමන්ලාට ලංකාවේ පැහැදිලිව කරන්න පුළුවන් එක දෙයක් තිබෙනවා. මම මේ ගැන දිගටම කිව්වා. ලංකාවේ තිබෙන ෂෙඩ් ටිකට පොදු වැසිකිළියක් හැදීම අනිවාර්ය කරලා, ඒක සුද්ද කරන්න. මම දැක්කා එක්කෙනෙක් කියලා තිබෙනවා, කිලෝමීටර් 25න් 25ට toilets හදනවා කියලා. ඒක නොවෙයි මම මේ කියන්නේ. ඒකත් කරන්න. ඒ වාගේ වැඩ පිළිවෙළක් අපි සකස් කරමු. ඒක ක්‍රියාත්මක කරමු. මම කියන්නේ තමුන්නාන්සේලාත් පරණ පාර්ලිමේන්තුව වාගේ අරයා කියපු දේයි, මෙයා කියපු දේයි කියලා මඩ ගහන්න පටන් ගත්තාම ඔය වැඩේ වෙන්නේ නැහැ කියලායි. ඒ නිසා කරුණාකරලා, ඉවසලා මේ කාරණයත් අහන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සරෝජා පෝල්රාජ් ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.40]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ Clean Sri Lanka ව්‍යාපෘතිය පිළිබඳ විවාදය ආරම්භ කරන්න කැමැතියි, නෙල්සන් මැන්ඩෙලා මැතිතුමා කළ ප්‍රකාශයකින්. එතුමා වරක් කියලා තිබෙනවා, "යමක් කර නිම වනතුරු එය ඔබට පෙනෙන්නේ කළ නොහැක්කක් ලෙසටයි. එබැවින් අදම ආරම්භ කරන්න" කියලා. Clean Sri Lanka ව්‍යාපෘතිය සම්බන්ධව අද දවස පුරා පැවැත්වුණු විවාදය ගැන සහ ඉන් එහාට ගිහින් කතා කළොත්, මේ මොහොත වනතුරු අපේ විපක්ෂය විසින් අපට කියමින් තිබෙන්නේ මෙය කළ නොහැක්කක් බවයි.

හැබැයි, අපි ඒ අයට කියනවා, අප ආරම්භ කර තිබෙන මේ කටයුත්ත අවසන් කිරීමකින් තොරව අතරමඟ නවතා දමන්නේ නැහැ කියලා. අපි මේක සම්පූර්ණ ක්‍රියාවලියක් බවට පත් කරනවා. අපි මේ වැඩසටහන ආරම්භ කළේ ජනවාරි 01වැනි දා නොවෙයි. අපි රාජ්‍යයක් හැටියට ඒ පිළිබඳව ජනවාරි 01වැනි දා නිල වශයෙන් ප්‍රකාශයට පත් කළාට, පසුගිය ජනාධිපතිවරණය වනවිටත්, ඊට පෙරත් අපට තිබුණේ මේ රට, මේ දේශපාලන සංස්කෘතිය පිරිසිදු කරනවා කියන අරමුණ. ඒ වෙනුවෙන් අපි පෙළ ගැසී හිටියා. ඒ වෙලාවේදීත් ඇතැම් අය පුනපුනා කිව්වා, ආණ්ඩු බලය ගන්න එක, ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන එක අපට කළ නොහැක්කක් බව. හැබැයි, අපි ලැබූ ජන වරම මත එය අපට කළ හැක්කක් බව අපි මේ රටට සහතික කර, තහවුරු කර පෙන්වා තිබෙනවා. අපට මහ මැතිවරණය ජයග්‍රහණය කරන්න බැරි බවත් කියා තිබුණා. හැබැයි, අපි ලැබූ ජන වරම තුළින් අපි නැවත නැවතත් ප්‍රත්‍යක්ෂ කර තිබෙන්නේ අපට කළ හැකි බවයි.

විපක්ෂයේ සිටින චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා, අසවලාගෙන් නොවෙයි මෙන්න මෙයාගෙන් "ගේම" ඉල්ලන්න කියලා. අපි කියනවා, අපට කිසිවෙක් සමඟ තරගයක් හෝ තරහක් නොවෙයි මේ තිබෙන්නේ කියන එක. අපට තිබෙන්නේ ඒ දේශපාලන සංස්කෘතිය පරාජය කිරීමේ ඕනෑකමයි. අපි ඒ ක්‍රියාවලිය ආරම්භ කළා. ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී අප ලැබූ ජන වරම තුළින් අපි ඉතා පැහැදිලිව එම කටයුත්ත මේ රට තුළ තහවුරු කර තිබෙනවා. අපට මේ ජන වරම ලැබී තිබෙන්නේ ඉදිරි වසර පහ තුළදී පිරිසිදු ශ්‍රී ලංකාවක්, අලුත් දේශපාලන සංස්කෘතියක්, ලස්සන රටක් හැදීම වෙනුවෙන්. ඒ නිසා අපි දිනා ගත් ජන වරම හරහා මේ පාර්ලිමේන්තුව තුළදී සිදු කරන මේ රාජ්‍යයම පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය Clean Sri Lanka වැඩසටහන හරහා තව තවත් සහතික කරනවා කියන පණිවුඩය අපි මේ වෙලාවේ ලබා දෙනවා.

විපක්ෂයේ අය අපට දීලා තිබුණේ මාස දෙකක් වැනි ඉතාම සුළු කාලයක්. මාස දෙකක් යනකොට ආණ්ඩුව කඩා වැටෙනවා, පඩි ගෙවා ගන්න බැරි වෙනවා, තෙල්වලට, ගෑස්වලට පෝලිමේ ඉන්න සිද්ධ වෙනවා, ජාත්‍යන්තර ආයෝජකයෝ නැති වෙනවා, රට කඩා වැටෙනවා කියලා ඒ අය බලාපොරොත්තුවෙන් සිටියා. ජන වරමකින් අවුරුදු පහකට බලයට පත් වෙච්ච අපි මාස දෙකකින් ආණ්ඩුව දමා දුවනකම් බලා හිටපු මේ විපක්ෂයේ අයට අපට කියන්න තිබෙන්නේ ඔබ ඒ බලාපොරොත්තු වුණු දේ අවුරුදු පහක් යනතුරුම ඔබට සිහිනයක් පමණයි කියන කාරණයයි. අපි නැවත නැවතත් කියනවා, බංකොලොත් රාජ්‍යයක් බවට ලේබල් ගසා තිබුණු මේ ශ්‍රී ලංකාව මේ මාස දෙක තුළ නැවත ණය ගෙවිය හැකි රාජ්‍යයක්, ආර්ථික ස්ථාවරත්වයට පත් වෙච්ච රාජ්‍යයක්, ආර්ථික නැඟිටීමකට ලක් වෙච්ච රාජ්‍යයක්, ජාත්‍යන්තර ප්‍රසාදයට පත් වෙච්ච රාජ්‍යයක්, කලාපීය වාගේම කලාපයෙන් බැහැර රටවල විශ්වාසය දිනාගත් රාජ්‍යයක් බවට පත් කරන්න අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙන බව. ඒ බව අපි මේ රටේ ජනතාවට සහතික කරනවා.

රටක් හැටියට ගත්තොත් මේ වෙලාවේ අපි කිසිදු ආපදාවකට, ස්වාභාවික හෝ කෘත්‍රිමව ආපදාමය තත්ත්වයකට ලක් වෙලා නැහැ. ඒ වාගේම ආර්ථිකය කඩා වැටීමකට ලක් වෙලා නැහැ. අපි මුදල් අච්චු ගහලා රාජ්‍ය සේවක වැටුප් ගෙවන තත්ත්වයකට පත් වෙලා නැහැ. අපි රාජ්‍ය සේවකයන්ට ලබා දීපු පොරොන්දු ඉටු කරමින් පවතිනවා. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් අත්හිටුවන්න, සහනාධාර ලබන ජනතාවට ලබා දෙන සහනාධාර කප්පාදු කරන්න, අපේ රටට එදිනෙදා අත්‍යවශ්‍ය සේවා අඩාළ කරන්න මේ මාස දෙක තුළ කිසිම අවස්ථාවක අපි කටයුතු කරලා නැහැ. ජනතාව බලාපොරොත්තු වූ ආකාරයට මේ රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවගේ අයිතීන් තහවුරු කිරීම සඳහා වන ක්‍රියාවලියේ ඉතා ශීඝ්‍ර සංවර්ධනයක් අපි මේ මාස දෙක තුළ පෙන්වා තිබෙනවා. රාජ්‍ය සේවකයන්ට අපි ලබා දුන් පොරොන්දු ඒ ආකාරයෙන්ම අප ඉටු කරමින් තිබෙනවා. සහනාධාර ලබන ජනතාවට, විශේෂයෙන්ම අස්වැසුම ප්‍රතිලාභ ලබා ගන්නා ජනතාවට එම ප්‍රතිලාභ වැඩි කර දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ ප්‍රතිලාභ ලබා දෙන කාල සීමාවත් වැඩි කර තිබෙනවා. ඒ වාගේම තමයි ගොවි ජනතාවට ලබා දුන් පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කර තිබෙනවා. විශ්‍රාමික ජනතාව ලබන විශ්‍රාම වැටුප රුපියල් 3,000කින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම ආරක්ෂක අංශයේ නිලධාරින්ට හිඟ බටා දීමනාව ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා. ධීවර ජනතාවට සහනාධාර ලබා දීලා තිබෙනවා. අක්කරයකට කිලෝග්‍රෑම් 22.5 බැගින් එම්ඕපී පොහොර ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා. අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල්වල දරුවන් විතරක් නොවෙයි, ළමයින් 300ට අඩු පාසල්වල ඉගෙනුම ලබන දරුවන් ද ඇතුළුව පාසල් දරුවන් 800,000කට පාසල් පොත් මිලදී ගැනීම සඳහා රුපියල් 6,000ක දීමනාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, බාල්දු වෙමින් තිබුණු රුපියල ස්ථාවර අගයකට අපි ගෙනැවිත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු අගමැතිතුමිය මේ ගරු සභාවේ නැති වුණත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, අග්‍රාමාත්‍යතුමිය වෙනුවෙන් වෙන් කර තිබුණු සෞඛ්‍ය ඒකකය විසුරුවා හැර එම සෞඛ්‍ය උපකරණ, ගිලන් රථ ජාතික රෝහලට පරිත්‍යාග කරමින් අපි මේ රටේ නාස්තිය, දූෂණය පිටුදැක තිබෙන බව.

ජනාධිපතිතුමාගේ, අග්‍රාමාත්‍යතුමියගේ ඉඳන් සියලු අමාත්‍යවරුන්ගේ වියදම් අඩු කරමින් මේ රටේ මුදල් නාස්තිය අපි පිටු දැකලා තිබෙනවා. ඒ වාගේම, වසර 120කට පස්සේ ඉතිහාසය තුළ අත්පත් කරගත් වැඩිම සුරාබදු ප්‍රමාණය අය කරගෙන තිබෙන්නේ මේ මාස දෙක ඇතුළේ කියන එක අපි ඉතා සතුටින් දැනුම් දෙනවා. ජොන්ස්ටන් ප්‍රනාන්දු හිඟ මුදල් සහ දඩ සහිතව සුරාබදු ගෙවන තත්ත්වයට පත් කර ගත්තේ අපේ රජයකින් මිසක් වෙන කවුරුවත් නොවෙයි කියන එක අපි මේ වෙලාවේ ජනතාවට මතක් කරලා දෙනවා. ඒ වාගේම තමයි සුරාබදු නොගෙවා පැහැර හැර හිටපු අර්ජුන් ඇලෝෂියස්ලාට අපි නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ කිසිම ආකාරයක ආගම්වාදී, ජාතිවාදී කුමන්ත්‍රණයකට හෝ කකුලෙන් ඇදලා මේ ආණ්ඩුව වට්ටන්න අපි ඉඩ තියන්නේ නැහැ. අරුගම්බේ සිදුවීම ගැනත් මම මතක් කරන්න කැමැතියි. ඒ වෙලාවේ ඉතාම කාර්යක්ෂමව වාගේම, ඉතාම කෙටි කලකින්

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

රාජ්‍ය නායකත්වය සමඟ මැදිහත් වෙලා, සියලු ආරක්ෂක අංශ ක්‍රියාත්මක වෙලා මේ රටේ ක්‍රියාත්මක කරන්න හදපු ඒ කුමන්ත්‍රණය පරාජය කරලා, මේ රට ස්ථාවර රාජ්‍යයක් කියන එක පෙන්වලා තිබෙනවා. නැවත ඒ ආකාරයේ කුමන්ත්‍රණවලට ඉඩ නැහැ කියන සහතිකය අපි රජයක් හැටියට ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම, එළඹෙන අය වැයේදීත් තව වාසි විශාල ප්‍රමාණයක් ජනතාවට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ජනතාවාදී රජයක් හැටියට ජනතාවට සහන ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම, මේ මොහොත වනකොට අපේ රටේ ආයෝජනය කරන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ කර්මාන්තශාලා ආරම්භ කරන්න මුල්ගල තබා තිබෙනවා. එප්පාවල පොස්පේට් නිධියේ වැඩ ආරම්භ කරලා තිබෙනවා. වාලච්චේන කඩදාසි කම්හල නැවත ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, අධික මිලකට අළෙවි වෙලා තිබුණු පිළිකා ඖෂධවල මිල අද වනකොට විශාල ලෙස අඩුවීමක් සිදු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රුපියල් 76,000කට අළෙවි වෙලා තිබුණු පිළිකාව සඳහා වන ඖෂධ ඒ තරගකාරිත්වය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ඖෂධ සමාගම් තුනක් හරහා මිල කැඳවලා මේ වෙනකොට ඉතාම අඩු මිලකට ජනතාවට අවශ්‍ය විධියට ලබා ගැනීමේ අවස්ථාව සපයා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අත්‍යවශ්‍ය ඖෂධ 90ක මිල අඩු වෙලා තිබෙනවා. මේවා ජනතාවට ලබා දීපු සහන. මාස දෙකක් වැනි කෙටි කාලයක් තුළ අපි රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට ජනතාවට ලබා දීලා තිබෙන ප්‍රතිපාදන. අපි දන්නවා, එදා තිබුණු ආණ්ඩුව උපයන විට බද්ද රුපියල් ලක්ෂය දක්වා අඩු කරලා රටේ ජනතාවට ජීවත් වෙන්න බැරිම කරලා තිබුණු බව. මේ වනකොට ඒක එක්ලක්ෂ පනස්දාහ දක්වා වැඩි කරලා උපයන විට බද්දෙන් ජනතාවට සහනයක් ලබා දීමට අපි ක්‍රියා කරලා තිබෙනවා. අස්වැසුම දීමනාව අපි වැඩි කරලා දීලා තිබෙනවා. අපි දන්නවා, අස්වැසුම ක්‍රියාවලිය ඇතුළේ යම්කිසි දෝෂයක් තිබෙන බව. පසුගිය රජය විසින් නිර්මාණය කරපු දත්ත පද්ධතිය තමයි අපට මේ අවස්ථාවේ පාවිච්චි කර ගන්නට සිදු වුණේ. ඒ දත්ත පද්ධතිය දූෂිතයි සහ ඒ දත්ත පද්ධතිය වඩාත් නිරවද්‍ය නැහැ කියන කාරණාව අපි දන්නවා. හැබැයි, අපි ඉතාම විශ්වසනීයව සහ ඉතා වගකීමෙන් කියනවා, ඉදිරි මාස දෙක තුන ඇතුළතදී ඒ දත්ත පද්ධතිය වඩාත් නිවැරැදිව හා විධිමත්ව සකස් කරලා ජනතාවට ඵලදායීව සහ ප්‍රතිලාභ ලැබෙන පරිදි විධිමත් කරනවාය කියලා. වඩාත් විධිමත් සේවාවක් ලබා දෙන්න ඒ අදාළ සහනාධාර අදාළ කණ්ඩායම් වෙත ළඟා වෙන විධියේ දත්ත පද්ධතියක් සකස් කරනවාය කියන සහතිකය අපි මේ අවස්ථාවේ ලබා දෙනවා.

Clean Sri Lanka කියන්නේ අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ පරිසරය පිරිසිදු කරන එක විතරක් නොවෙයි; කානු පද්ධතිය පිරිසිදු කරන එක විතරක් නොවෙයි; ඇළ මාර්ග සුද්ද කරන එක විතරක් නොවෙයි; මහා මාර්ග සුද්ද කරන එක විතරක් නොවෙයි. ඇත්තටම ගත්තොත්, Clean Sri Lanka ව්‍යාපෘතිය කියන්නේ, මේ විපක්ෂය ආණ්ඩු පක්ෂයේ ඉඳන් අවුරුදු 76ක් තිස්සේ ඔවුන්ගේ දේශපාලන සංස්කෘතිය විසින් විනාශ කරලා දාපු ශ්‍රී ලාංකීය මාතෘ භූමියේ අනන්‍යතාව, ජනතාවගේ ජීවත් වීමේ අයිතිය, ජාතික සහජීවනය, ආගමික සංහිඳියාව නැවත ඇති කිරීමේ ක්‍රියාවලියයි. එය Clean Sri Lanka ව්‍යාපෘතිය තුළ තිබෙනවා කියන සහතිකය අපි ලබා දෙනවා. Clean Sri Lanka කියන්නේ පාරිසරික පවිත්‍රතාව විතරක් නොවෙයි. ඒක social, ethical and environmental cleanliness එකක්. අපි social cleanliness කියන එකත් බලාපොරොත්තු වෙනවා. අපි සමාජය ඇතුළේ ඒ පවිත්‍රතාව කියන එක ඇති කරමින් දේශපාලන පදනම් වෙනුවෙන් ආගම්වාදය, ජාතිවාදය භාවිත කරමින් මේ රටේ දේශපාලන කැලඹිලි ඇති කරන්න කිසිසේත්ම ඉඩ තබන්නේ නැහැ කියන සහතිකය මේ වෙලාවේ ආණ්ඩුව හැටියට ලබා දෙනවා.

ඒ විතරක් නොවෙයි. අපට ආකල්පමය පරිවර්තනයක් අවශ්‍ය වෙනවා. අන්න, ඒ ආකල්පමය පරිවර්තනය තමයි අපි බලාපොරොත්තු වන්නේ.

විශේෂයෙන්ම එකිනෙකාට ගරුත්වය ලබාදෙන සමාජයක් අපි නිර්මාණය කරන්න ඕනෑ. අවසානයට අපි බලාපොරොත්තු වන දේ සමාජයීය ආකල්මය සහ පාරිසරික පවිත්‍රතාවයි. අපේ ව්‍යාපෘතිය ඇතුළේ අපි පාසල් 1,000ක් තෝරාගෙන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. එ් වාගේම අධ්‍යාපනයේ විෂය මාලාව තුළට අපි කොයි විධියට ද මේ කරුණු ඇතුළත් කළ යුතු වන්නේ, අපි කොහොමද රටක් හැටියට සංවර්ධනය විය යුතු වන්නේ, අපි කොයි විධියටද Clean Sri Lanka කියන ව්‍යාපෘතිය බද්ධ කරලා අනාගතයේ බිහිවන දරුවන් රට ගැන සැබෑ හැඟීමෙන්, පවිත්‍රතාවෙන්, ආකල්පමය සංවර්ධනයෙන්, ගතිගුණ අතින් ගුණාත්මක පුරවැසියන් බවට පත් කරන්නේ කියන එක මේ වැඩ පිළිවෙළ තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි වැඩිහිටි ජනතාව රැකගන්න පුළුවන්, තරුණ තරුණියන්ට සාමූහිකව හා සතුටින් ජීවත් වෙන්න පුළුවන්, කාන්තාවන්ට හා දරුවන්ට හිංසනයෙන් තොරව ජීවත් වෙන්න පුළුවන්, ඒ වාගේම අම්මාගේ තාත්තාගේ පොකට් එකේ මුදල මත දරුවන්ගේ අධ්‍යාපනය තීරණය වෙන්නේ නැති, සැමට සුරක්ෂිත සමාජයක් නිර්මාණය කරන්න අපි උත්සාහ කරන්නේ. අන්න ඒ සතුටුදායක ශ්‍රී ලංකාව අපි නිර්මාණය කරනවා. අපි කියන ඒ පොහොසත් රට වෙනුවෙන්, ලස්සන ජීවිතය වෙනුවෙන් Clean Sri Lanka ව්‍යාපෘතිය තුළින් /අපේ රට මෙහෙය වනවා. ඒ සඳහා වන දේශපාලන නායකත්වය අපි බාර ගන්නවා කියන සහතිකය අපි ජනතාවට ලබා දෙනවා. ඒ සඳහා අපි මේ සා විශාල කාර්යභාරයක් කර තිබෙනවා.

සහල් ප්‍රශ්නය නිර්මාණය කළේ විපක්ෂයේ ඔබයි. අපි ඒකට උත්තර හොයනවා. මේ රටේ ජනතාවට ජීවත්වීමට බැරි කළේ විපක්ෂයේ ඔබයි. අපි ඒ සඳහා විසඳුම් සොයමින් ඉන්නවා. අපි මේ ආරම්භ කළා පමණයි. අපි අනිවාර්යයෙන්ම මේවා ජයග්‍රහණයෙන් කෙළවර කරනවා. අපි ජනතා විශ්වාසය දිනා ගන්නවා. ජනතාවට අලුත් රටක් වෙනුවෙන් අපි එකට පෙළ ගැසී ඉන්නවා කියන පොරොන්දුව ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[2.52 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, I think I may have to raise a few matters quickly while the Hon. Minister of Justice and National Integration is here.

In trying to understand the concept of Clean Sri Lanka, let us get into a little serious discussion. I have looked at the concept paper and also at the particular Gazette Notification issued under Article 33(h) of the Constitution. You are very well aware that under Article 33(h), the President has exercised his powers. Clean Sri Lanka is based on three pillars. While I do not think anybody could make any reservations about that concept, we have serious issues about its implementation mechanism.

Sir, I am compelled to speak a few words in Tamil because I do not have the benefit of doing it in both languages.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த Clean Sri Lanka என்ற கோட்பாடு அரசியல் யாப்பின் 33ஆம் உறுப்புரையின் கீழான அதிகாரத்தின் அடிப்படையில்தான் கொண்டுவரப்பட்டிருக்கின்றது. அது மூன்று பிரிவுகளாகப் பிரிக்கப்பட்டிருக்கின்றது. There are three pillars. அதில் ஒன்று சமூக ரீதியான விடயம்; அடுத்தது environmental பற்றிய விடயம்; அடுத்த விடயம் ethical பற்றியது. இதில் சமூக ரீதியானவை என்ற வகையில் public toilets, வீதிகளைப் பராமரித்தல் மற்றும் அழகுபடுத்தல் போன்ற விடயங்கள் குறிப்பிடப்பட்டிருக்கின்றன. அவை தமிழ் மொழியில் குறிப்பிடப்படவில்லை; சிங்களத்தில்தான் குறிப்பிடப்பட்டிருந்தது. இது எப்படி நடைமுறைப்படுத்தப்படும் என்பது பற்றி chart ஒன்றின்மூலம் குறிப்பிடப்பட்டிருக்கின்றது. இந்த Clean Sri Lanka திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு சனாதிபதி காரியாலயம் විශේෂ කාර්ය බලකායක් ஒன்றை உருவாக்கியிருக்கின்றது. ஆனால், இந்தக் கௌரவ சபைக்கு நான் ஒரு விடயத்தைச் சொல்லவேண்டும். இந்தச் செயற்றிட்டங்கள் எல்லாம் வழமையாக உள்ளூராட்சி மன்றங்களால் நடைமுறைப்படுத்தப்படுகின்ற விடயங்கள்; පළාත් පාලන ආයතනයට අයිති විෂයක්.

அதுமாத்திரமல்ல, இவை யாவும் அந்தந்த மாகாண சபைகளுக்குப் பொறுப்பளிக்கப்பட்ட விடயங்கள். இதை நீங்கள் ஒரு கொள்கையாக வைத்திருப்பதில் எங்களுக்கு எந்தப் பிரச்சினையும் கிடையாது. இதற்காக முழு ஒத்துழைப்பையும் கொடுக்கவேண்டிய கடமைப்பாடு எமக்கு இருக்கின்றது. ஆனால், அதை நடைமுறைப்படுத்துவதில் உள்ளூராட்சி மன்றங்களுக்கு உள்ள அதிகாரத்தை எந்த அடிப்படையில் சனாதிபதியவர்கள் பெற்றுக்கொள்ள முடியும்? அது மிகவும் முக்கியமானது. ஏனென்றால், அதிகாரப் பரவலாக்கல் சம்பந்தமாக இன்னும் இந்த அரசாங்கம் தன்னுடைய நிலைப்பாட்டைத் தெளிவாக எங்களுக்குச் சொல்லவில்லை. இந்தச் சூழ்நிலையில், நூற்றுக்கு நூறு மாகாண சபையின் கீழ் உள்ளூராட்சி மன்றங்களுக்குக் கொடுக்கப்பட்டிருக்கின்ற அந்த அதிகாரத்தை சனாதிபதியவர்கள் தனது செயலகத்தின்மூலம் அமுல்படுத்துவதென்பது ஒரு பாரிய பிரச்சினையாக இருக்கின்றது. நான் நம்புகின்றேன், இது போன்ற ஒரு விடயத்தை முன்னைய அரசாங்கத்தில் அமைச்சராகவிருந்த பெஸில் ராஜபக்ஷகூட செய்ய எத்தனித்தார். அதாவது, உள்ளூராட்சி மன்றங்களுக்குக் கீழ் வருகின்ற விடயங்களை 'வீதி அபிவிருத்தி' என்ற அடிப்படையில் சனாதிபதி செயலகத்திற்குக் கீழ்க் கொண்டுவந்து அதன்மூலம் நேரடியாக அமுல்படுத்துகின்ற வகையில் சில திட்டங்களைக் கொண்டுவந்தார். So, this is a matter that we have to take seriously. அதாவது, அந்தக் கொள்கையை நடைமுறைப்படுத்துகின்ற விதம் சம்பந்தமாகத்தான் பிரச்சினை இருக்கின்றதே ஒழிய, கொள்கையில் எங்களுக்குப் பிரச்சினை இல்லை!

இன்னும் ஒரு விடயத்தை நான் அவசியமாகச் சொல்லவேண்டும். இப்பொழுது நீங்கள் இந்த Clean Sri Lanka திட்டத்தில் சொல்லுகின்ற விடயந்தான் "வளமான நாடு! மகிழ்ச்சியான மக்கள்!" என்பது. It is a very good thing. பொது இடங்களை அழகாக வைத்திருப்போம் என்று நீங்கள் சொல்லுகின்றபோது, நானும் அது சம்பந்தமாக ஒரு யோசனையைச் சொல்ல விரும்புகின்றேன்; நான் இதிலே உங்களைக் குற்றஞ் சாட்டவில்லை. இன்று உங்களுடைய அமைச்சர் ஒருவரும் தனது பயணத்துக்குப் பொதுப் போக்குவரத்துச் சாதனமான trainஐப் பயன்படுத்தியிருந்தார். நானும் மட்டக்களப்பிலிருந்து கொழும்புக்கு trainஇல் உள்ள berthஇல் கீழ்த்தட்டில் பயணத்தை மேற்கொண்டிருந்தேன். உங்களுக்குத் தெரியுமா, இந்தப் புகையிரத வண்டிகளிலுள்ள கழிப்பிடங்கள் - It is not water - sealed என்று. අපිට හරි කනගාටුයි. මට ඒ ටික කියන්න වෙනවා, අනෙක් කට්ටියට තේරෙන්න. අද අපි පාවිච්චි කරන දුම්රිය ගත්තොත්, ඒවායේ කිසිම වැසිකිළියක් ජල මුද්‍රිත වැසිකිළි නොවෙයි.

I am so happy to speak after the Hon. Minister (Mrs.) Saroja Savithri Paulraj. මගේ නෝනා මහත්තයා ඒවායේ යනකොට ඒවායේ වැසිකිළියට යන්නේ නැහැ. පොදු ප්‍රවාහන සේවාවල ගමන් කරන කට්ටියට වැසිකිළි යෑමේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන්නේ ජනාධිපතිතුමාත් ඒක කිව්වා. මගේ නෝනා මහත්තයා අහනවා, "මම වැසිකිළියට ගියාම ඒවා පාරට වැටෙනවා කියලා දැන දැන මම කොහොමද ඕක පාවිච්චි කරන්නේ" කියලා. How many times does this train go through towns and cities? මම මේ ඔබතුමාගේ වරදක් කියනවා නොවෙයි. ගරු දයාසිරි මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමහර දේවල් අපි හඳුනා ගන්න ඕනෑ.

அடுத்து, நான் அம்பாறை மாவட்டத்தைச் சேர்ந்தவன் என்ற அடிப்படையில், இந்த 'Clean Sri Lanka' தொடர்பாகக் குறிப்பிட விரும்புகின்ற முக்கியமான விடயம், கல்லோயா சேனாநாயக்க சமுத்திரத்தில் ஏற்பட்டிருக்கின்ற வெள்ளம் சம்பந்தமானது. எங்களுடைய பிரதி அமைச்சர் கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்களுக்கு இவ்விடயத்தில் உண்மையிலே நான் நன்றி சொல்லவேண்டும். ஏனென்றால், அவர் இது சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் குறிப்பிட்டிருக்கின்றார். ஒருவேளை நாங்கள் இந்த விவாதத்தை உடனடியாக நிறுத்திவிட்டு அம்பாறைக்குப் போகவேண்டிய ஒரு சூழ்நிலை ஏற்படுமோ என்றுகூட நான் நினைத்தேன். ஏனென்றால், இன்று மூன்று பிரதேசங்கள் அங்கே breach பண்ணப்பட்டிருக்கின்றது: ஒன்று, சம்மாந்துறையில் மொரவில் ஆறு; அடுத்தது, இறக்காமம் DS Divisionஇல் நெய்னாகாடு; அடுத்தது, Oluvilஇல் உள்ள Oluvil Anicut. அதன் காரணமாக அங்கு ஆயிரக்கணக்கான ஏக்கரிலுள்ள சகல வேளாண்மைகளும் தண்ணீரில் மூழ்கி அழிந்துவிடக்கூடிய நிலைமை காணப்படுகின்றது.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

கல்லோயா நீர்ப்பாசனத் திட்டத்தின்கீழ் உள்ள அம்பாறை மாவட்டக் கரையோரப் பிரதேசங்களின் வலதுகரை மற்றும் இடதுகரை வாய்க்கால்களில் ஒவ்வொரு வெள்ளக் காலத்தின்போதும் நீர் வழிந்தோடுவதில் தடை இருப்பதனால் பல்லாயிரக்கணக்கான நெற்காணிகள் பாதிக்கப்படுவதனால் அம்மாவட்டத்தின் பொருளாதாரம் பாரிய நெருக்கடிக்குள்ளாகின்றது. இதை நிவர்த்தி செய்வதற்கு இந்த Clean Sri Lanka திட்டத்தில் உடனடியாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும். நான் நம்புகின்றேன், கௌரவ பிரதி அமைச்சர் வசந்த பியதிஸ்ஸவாக இருக்கலாம், கௌரவ உறுப்பினர் ஆதம்பாவா அபூபக்கராக இருக்கலாம், எங்களுடைய கட்சியைச் சேர்ந்த கௌரவ உறுப்பினர் எம்.எஸ். உதுமாலெப்பையாக இருக்கலாம், அல்லது கௌரவ பாராளுமன்ற உறுப்பினர் கவீந்திரன் கோடீஸ்வரனாக இருக்கலாம், நாங்கள் எல்லோரும் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, just give me one more minute.

இந்தப் பிரச்சினையை உடனடியாக நிவர்த்தி செய்வதற்காக ஒன்றுசேரத் தயாராக இருக்கின்றோம். ஆகவே, தயவுசெய்து ஜனாதிபதி செயலகத்திலிருந்து அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்களுக்கு அதற்கான சகல வசதிகளையும் பெற்றுத் தருமாறு கேட்டுக்கொண்டு, எனது பேச்சை முடித்துக்கொள்கின்றேன். Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පොහොසත් රටක්,ලස්සන ජීවිතයක්" වෙනුවෙන් වර්තමාන රජය ගෙන යන මේ වැඩ පිළිවෙළේ මූලික කාරණා වනවා, Clean Sri Lanka වැඩසටහන, ඩිජිටල්කරණය සහ දූප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන. පසුගිය සැප්තැම්බර් 21වැනි දා බලයට ආ ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමාගේ සංකල්පයක් අනුව මේ වැඩසටහන ඉස්සරහට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජයට පැවරිලා තිබෙන්නේ අපේ රටේ අවුරුදු 76ක දේශපාලන ඉතිහාසය ආපස්සට හරවලා ප්‍රතිනිර්මාණය කිරීමයි. මේ Clean Sri Lanka කියන වැඩසටහන, මේ වැඩ පිළිවෙළ ගැන විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ අර්ථකථන දැක්වූවා. හැබැයි අපි කවුරුත් දන්නවා, වර්තමාන රජයේ බලාපොරොත්තුව මානව ගුණාංගවලින් පිරිච්ච මනුස්සයෙකු හැදීම බව. අපි මේ කටයුත්ත කරන්නේ ආකල්පමය වශයෙන් වෙනස් මනුස්සයෙකු, රටේ වෙනස් තත්ත්වයක් ඇති කිරීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ අපේ රට ප්‍රචලිත වුණේ ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලායි. මේ රට තමයි චීනයට බත සපයපු රට. මේ රට තමයි ලෝක පුදුම නිර්මාණ බිහි කරපු රට. මේක සීගිරිය, මහා පරාක්‍රම සමුද්‍රය, යෝධ ඇළ, අවුකන පිළිම වහන්සේ වැනි අදටත් ලෝකය මවිත වන නිර්මාණ බිහි කරපු රට. ඒ තරම් වටිනා, ඉතා සුන්දර මේ රටේ ඉතිහාසය පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් විතරක් නොව, ඉන් පසුව අවුරුදු 76ක් මේ රට පාලනය කරපු පාලකයෝත් ආපස්සට හැරෙව්වා. ඒ අය දැන් අපෙන් අහනවා, අවුරුදු 76ක ඒ ඉතිහාසය මාස දෙකක්, තුනක් ඇතුළත නිවැරදි කළා ද කියලා.

අපි දැන් මෙතැනට ආවා, Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ ගැන කථා කරන්න. නමුත්, විපක්ෂයේ මන්ත්‍රීවරු අහන්න පටන් ගත්තා, කෝ හාල් කියලා. පොහොර ටික හදන පොහොර කර්මාන්තශාලා වහලා වධකාගාර දාපු පාලකයෝ අහනවා, කෝ පොහොර කියලා. වී ගබඩා ටිකේ වතුපාළු හැදෙන කල්, මානා වැවෙන කල්, යකඩ ටික දිරලා පොළොවට සමතලා වන කල් ඉඳලා අපෙන් අහනවා, කෝ හාල් කියලා. බීජ ගොවිපළවල් ටික විකුණලා, සත්ව ගොවිපළවල් ටික විකුණලා, ගබඩා ටික විකුණලා. ඒවායේ යකඩ විතරක් නොව බිමත් එක්කම විකුණලා තිබෙන්නේ. මම ඉස්කෝලේ ගිය කාලයේ ගාල්ලේ බස් එක නවත්තන තැන පිටුපස තිබුණු වී ගබඩාව අද බිමත් එක්කම විකුණලා තිබෙනවා. එහෙම විකුණාගෙන කාපු කට්ටිය දැන් අහනවා, කෝ හාල් කියලා. අද ඒ වාගේ තර්ක ගේනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කරන්න තිබෙන්නේ ඒ අහිමි කළ දේශය නැවත ගොඩ නැඟීමයි. ඒ විනාශ කළ තාක්ෂණය, ඒ විනාශ කළ දේශය නැවත ගොඩ නඟන එක අපේ වර්තමාන රජයේ වගකීමක්. ගරු අනුර දිසානායක මැතිතුමා ජනාධිපති ධුරයට පත් වෙලා දිවුරුම් දුන් දවසේම මෙම වැඩසටහනෙහි මූලික කටයුත්ත වන මේ දේශපාලනය clean කරන වැඩේ අපි පටන් ගත්තා. ජනාධිපතිතුමා දිවුරුම් දීලා පැවැති දේශපාලනය clean කරන්න පටන් ගත්තා.

එතුමා දිවුරුම් දුන්නු දවසේ අපි දැක්කේ නැහැ වෙනත් කාලවල සිදු වුණු දේවල්. වෙන කාලවල නම් ජනාධිපතිවරයා දිවුරුම් දෙන දවසට රතු පලස් එළනවා, වෙඩි මුර පවත්වනවා, ආර්යාවත් එනවා, දොරවල් ඇරලා පිළිගන්නවා. එහෙම තමයි වැඩ පටන් ගත්තේ. හැබැයි, අපේ වර්තමාන රජය බලයට පත් වෙලා ඒ තත්ත්වය clean කළා. අඩුම ගාණේ එතැන වතුර බෝතලයක්වත් තිබෙනවා අපි දැක්කේ නැහැ. කලින් පැවැති අනුහස් සහිත, රැස් වළලු සහිත දේශපාලනය අපි වෙනස් කළා.

දැන් ගොඩක් කට්ටිය විවිධ දේවල් කථා කරනවා. ඒ අය මේ දේශපාලනය clean කිරීම ගැන බය වෙලා ඉන්නේ. ඒ දවස්වල මේ දේශපාලන පිටිය කොහොමද තිබුණේ කියන එක දැන් ගොඩක් කට්ටියට අමතක වෙලා තිබෙනවා. ඒකට පාතාල නායකයෝ - ජුලම්පිටියේ අමරෙලා, ගෝනවල සුනිල්ලා, සොත්ති උපාලිලා, බැද්දගානේ සංජීවලා - තමයි ආරක්ෂාව දුන්නේ. එහෙම තිබ්බ දේශපාලන සංස්කෘතියක් තමයි මේ clean කරගෙන යන්නේ. ඒ නිසා සමහරුන්ට මේ ගැන රිදිලා තිබෙනවා.

අපට මතකයි, යම් කාලයකදී මේ දේශපාලන සංස්කෘතිය ගමන් කළේ කොහේටද කියලා. අපට මතකයි, රාජ්‍ය සේවකයන් ගස් බැඳපු ඇමතිවරු හිටිය බව. එහෙම තමයි එදා දේශපාලන ගමන ගියේ. සමහර ප්‍රාදේශීය සභාවල සභාපතිවරුත් එහෙමයි. තංගල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් විදේශීය කාන්තාවක් දූෂණය කළා. අපට මතකයි, අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක්, කාන්තාවන් සියදෙනෙක් දූෂණය

කරලා ඒ සියවැන්න සමරන්න පාටි දමපු බව. එවැනි දේශපාලන සංස්කෘතියක් තමයි තිබුණේ. එම දේශපාලන සංස්කෘතිය තමයි වර්තමාන රජය මේ වෙනස් කරමින් යන්නේ. පැවැති දේශපාලන සංස්කෘතිය විපක්ෂයේ කාටත් අද අමතක වෙලා. ඒ නිසා අපේ ආණ්ඩුව කරන වැඩ ගැන අද ඒ කාටත් රිදෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල අපි දැක්කා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මේ උත්තරීතර සභා ගර්භයට උදේ ආපු ගමන් මොකක් හරි බොරුවක් කියලා, මයික් එකට කථා කරලා රටේ පොදු ජනතාවට විවිධ පණිවුඩ දෙන ආකාරය. මීට පෙර දවසකත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා, බොරුවක් කියලා දැඟලුවා. එතුමා ඇවිත් කිව්වා, Clean Sri Lanka සමාරම්භක උත්සවයට රුපියල් ලක්ෂ 70ක් ගියා කියලා. ඊට පස්සේ ඒ බොරුව අතේ පත්තු වුණා. අදත් වෙන එකක් කියලා ගියා. ඉතින් සමහර උදවිය හිතනවා, මේ පාර්ලිමේන්තුවේ රූපවාහිනී සජීවී විකාශනය වන නිසා මෙතැනට ඇවිත් කියන හැම එකක්ම ඇත්ත කියලා. සමහර උදවිය එහෙම තේරුම් ගන්නවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ රටේ ජනතාව නොමඟ යවන්න හදන්නේ එහෙමයි. හැබැයි අපි විශ්වාස කරනවා, මේ රටේ පොදු ජනතාව එහෙම රවට්ටන්න බැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ ඉතාම වේගයෙන් වැළඳ ගනිමින් ඉන්නවා කියා අපි දන්නවා. Clean Sri Lanka ජාතික වැඩ පිළිවෙළට සමගාමීව ගාල්ල දිස්ත්‍රික් වැඩසටහන අපි පසුගිය 12වැනි දා පටන් ගත්තා. ඒ, අලුත්ගම ඉඳලා මාතර මායිම -ගොවියාපාන- දක්වා වෙරළ තීරය කිලෝමීටර 75ක් ස්ථාන 51කදී පිරිසිදු කිරීමයි. ඇමතිවරු, මන්ත්‍රීවරු, දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු, හමුදාවේ කර්නල්වරු, ස්වේච්ඡා සංවිධාන, පොදු ජනතාව එකට එකතු වෙලා බෙන්තර පාලමේ ඉඳලා ගොවියාපාන දක්වා කිලෝමීටර 75ක් ස්ථාන 51කදී පිරිසිදු කළා. මේ වැඩ පිළිවෙළට බය වෙච්ච විපක්ෂය අද විවිධ අභූත චෝදනා එල්ල කරනවා. ඒ වාගේම, ඇතැම් මාධ්‍යවලටත් මේවා වැඩිය පේන්නේ නැහැ කියා අපි දන්නවා. හැබැයි, මොකක්හරි චූටි හෝ අඩුවක් තිබුණොත් තමයි මාධ්‍යයට වුණත් පේන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චීනයේ නායකයකු වශයෙන් හිටපු මාඕ සේතුං මෙන්න මෙහෙම කියා තිබෙනවා.

"සතුරා විසින් පහර දෙනු ලැබීම නරක දෙයක් නොව හොඳ දෙයකි. පුද්ගලයන් පිළිබඳවත්, දේශපාලන පක්ෂයක් පිළිබඳවත් මෙය සහතිකයි. සතුරා අපට පහර දෙන විට එයින් හැඟවෙන්නේ අප නිවැරදි බවයි. සතුරා සහ අපත් අතර පැහැදිලි බෙදා වෙන් කිරීමක් ඇති බවයි. සතුරා අප වඩ වඩාත් කළු කර පෙන්වයි නම් එය වඩාත්ම හොඳය."

දැන් අපි දන්නවා, විපක්ෂය බොහොම කලබල වෙලා තිබෙන බව. නමුත්, අපි කලබල වෙන්නේ නැහැ. මේ රටේ ඉතිහාසය දෙස බලන්න. අපේ රට ලෝකය පුදුම කරපු රටක්; ලෝකය මවිත වන නිර්මාණ හදපු රටක්. අපේ රට චීනයටත් බත සපයපු රටක්. එම නිසා ශක්තිමත් ආර්ථිකයක්, සුන්දර ලංකාවක් ජාතික ජන බලවේගයේ පාලනයක් යටතේ ගොඩ නඟනවා කියන සහතිකය තමයි අපි දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.11]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் இச்சபையில் நடைபெறுகின்ற Clean Sri Lanka - தூய்மையான இலங்கை - வேலைத்திட்டம் தொடர்பான சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

இன்று பேசுபொருளாக இருக்கின்ற Clean Sri Lanka வேலைத்திட்டம் என்னவென்று தெரியாத நிலையில் பலர் இருந்துகொண்டு இருக்கின்றார்கள். அரசாங்கத்திலுள்ள அமைச்சர்களாக இருக்கலாம், ஆளுந்தரப்பு பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், இந்த Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் எதைச் சொல்ல வருகின்றார்கள் என்பதை அவர்களே இன்னும் விளங்கிக்கொள்ளாத நிலையில் காணப்படுகின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று Clean Sri Lanka திட்டத்தைச் சிலர் பிழையாக விளங்கி இருக்கின்றார்களா? அல்லது அரசாங்கத்தின் உண்மையான Clean Sri Lanka திட்டமே இதுதானா? என நாங்கள் கேட்கின்றோம். இன்று வைத்தியசாலைகளில் இருக்கின்ற குப்பைகூளங்களைப் பற்றவைத்துவிட்டு, அதை Clean Sri Lankaஇன் ஒரு செயற்பாடாகக் காட்டுகின்றார்கள். சுகாதாரத் துறையில் காணப்படுகின்ற ஊழல்களை எவ்வாறு ஒழிக்க முடியும், குறைபாடுகளை எவ்வாறு நிவர்த்திசெய்ய முடியும் என்பதைத்தான் நாங்கள் இந்த Clean Sri Lanka திட்டத்தின்மூலம் பார்க்க வேண்டும். அதைவிடுத்து, வைத்தியசாலை வளாகத்தில் அல்லது அதன் வரையறைக்குள் காணப்படுகின்ற கடதாசிகளையும் குப்பைகளையும் எரித்துவிட்டு, "நாங்கள் துப்புரவாக்கிவிட்டோம்; தூய்மைப்படுத்திவிட்டோம்" என்று சொல்லக்கூடாது. அவ்வாறு சொல்வதுதான் உங்களுடைய Clean Sri Lanka திட்டமா? என நாங்கள் கேட்க விரும்புகின்றோம்.

அடுத்து, இந்த அரசாங்கம் Clean Sri Lanka திட்டத்தை எவ்வாறு ஆரம்பித்தது என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். வாகனங்களில் குறிப்பாக, three-wheelers மற்றும் பஸ்களில் கவர்ச்சிக்காகப் பொருத்தப்பட்டிருக்கின்ற மேலதிக உதிரிப்பாகங்களை அகற்றுகின்ற விடயம் பரவலாக எல்லா இடங்களிலும் மேற்கொள்ளப்பட்டு வந்தது. இப்பொழுது அந்தச் செயற்பாடும் இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. எனவே, இந்த Clean Sri Lanka திட்டம் என்ன என்பதை நீங்கள் சரியாக விளங்கப்படுத்த வேண்டுமென நாங்கள் கேட்கின்றோம். நீங்கள் Clean Sri Lanka திட்டம் சம்பந்தமாக ஒரு குழுவை நியமித்து இருக்கின்றீர்கள். அந்தக் குழுவுக்கு 18 உறுப்பினர்களை நீங்கள் நியமித்திருந்தாலும், அதில் தமிழ் பேசும் ஒருவர்கூட உள்வாங்கப்படவில்லை. இது நாங்கள் கேள்வி எழுப்பவேண்டிய விடயம்; எல்லோரும் விளங்கவேண்டிய விடயம்! ஏன், நீங்கள் இந்தக் குழுவில் தமிழ் பேசும் ஒருவரை உள்வாங்கவில்லை என நாங்கள் கேட்டால், அதற்கு நீங்கள் எங்களைப் பார்த்து, "இனவாதம் பேசுகின்றீர்கள்; தயவுசெய்து, இனவாதம் பேசாதீர்கள்" என்று சொல்வீர்கள்! இதைத்தான் நீங்கள் தொடர்ச்சியாகச் செய்துகொண்டு வருகின்றீர்கள்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கிழக்கு மாகாணத்தில் சில அரச அதிகாரிகளுடைய இடமாற்றம் கேள்விக்குறியாகக் காணப்படுகின்றது. எந்த அடிப்படையில் இடமாற்றங்கள் வழங்கப்படுகின்றனவென்று நாங்கள் கேட்க விரும்புகின்றோம். ஒரு முஸ்லிம் அதிகாரி இல்லை அல்லது ஒரு தமிழ் அதிகாரி இல்லையென்று நாங்கள் சொன்னால், உடனே நீங்கள் அதை இனவாதம் என்று சொல்கின்றீர்கள். தயவுசெய்து, இந்த விடயத்தையும் நீங்கள் கருத்திற்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இரண்டு மாதங்களுக்குப் பிறகு, மாண்புமிகு சனாதிபதி அவர்கள் மக்கள் சந்திப்பில் பல்வேறு விடயங்களைப் பேசியிருக்கிறார். இன்று அவர் seasonக்காகப் பேசுகின்ற ஒரு சனாதிபதியாக மாறியிருக்கிறார். மக்களைச் சந்திக்கும்போது அல்லது தேர்தல் நெருங்கும்போதுதான் அவருக்குப் பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் அமைச்சர்களுடைய கொடுப்பனவு, முன்னாள் சனாதிபதிகளுடைய கொடுப்பனவு என்பன ஞாபகம் வருகின்றதா? என நாங்கள் கேட்க விரும்புகின்றோம். இன்று முன்னாள் சனாதிபதிகளின் சிறப்புரிமைகள், பாதுகாப்பு, கொடுப்பனவு சம்பந்தமாகப் பேசப்படுகின்றன. இவற்றை மக்கள் மத்தியில் பேசி, அவர்களைச் சந்தோஷப்படுத்தி, அவர்களிடமிருந்து வாக்குகளைப் பெறுவதற்காகவா முனைகின்றீர்கள்? என நாங்கள் கேட்கின்றோம். ஏனெனில், மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்றத்தில் பேசும்போது, பாராளுமன்ற உறுப்பினர்கள் சம்பந்தமாக எதுவும் பேசுவதில்லை. இந்த விடயங்களை இங்கிருக்கின்ற உறுப்பினர்களுக்குச் சொல்ல வேண்டும்; அமைச்சர்களுக்குச் சொல்ல வேண்டும்; Cabinetமூலம் அவை தொடர்பான தீர்மானங்களை எடுக்க வேண்டும்.

நாங்கள் உள்ளூராட்சி மன்றத் தேர்தலுக்கு முகங்கொடுக்கப் போகின்றோம். அதிலும் மக்களின் ஆதரவைப் பெற வேண்டும் என்பதற்காகத்தான் நீங்கள் மீண்டும் இந்த அரசியல் பயணத்தை ஆரம்பித்து இருக்கின்றீர்கள். இவ்வாறு நீங்கள் செய்வது சரியா? என நாங்கள் கேட்கின்றோம். புதிய அரசியல் கலாசாரத்தை உருவாக்க வேண்டும் என்பதற்காக வந்த நீங்கள், இன்று எவ்வாறான அரசியல் கலாசாரத்தோடு பயணிக்கின்றீர்கள்? என நாங்கள் கேட்கின்றோம். இன்று உங்களுடைய பிரதேசங்களில் நடைபெறுகின்ற ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்கள் - DCC - எவ்வாறு நடைபெறுகின்றன? என்பதை நீங்கள் எல்லோரும் புரிந்துகொள்ள வேண்டும். நீங்கள் அவற்றை அரசியல் இலாபத்துக்காக நடத்துகின்றீர்களா அல்லது உண்மையாகவே மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்காக நடத்துகின்றீர்களா அல்லது எதிர்வருகின்ற உள்ளூராட்சி மன்றத் தேர்தலில் உங்களுடைய கட்சி சார்பான உறுப்பினர்களை அதிகரிப்பதற்காக நடத்துகின்றீர்களா? என நாங்கள் கேட்கின்றோம். அதுமாத்திரமன்றி, மக்கள் உங்களுக்குத் தந்திருக்கின்ற ஆதரவை நீங்கள் சரியாகப் பயன்படுத்துகின்றீர்களா? என்பதையும் நாங்கள் தெரிந்துகொள்ள வேண்டும்.

இன்று இச்சபையில் இருக்கின்ற பல உறுப்பினர்கள் குறிப்பாக, ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் இந்த அரசாங்கத்தில் என்ன நடக்கின்றது என்றுகூடத் தெரியாமல் இந்த இடத்தில் இருந்துகொண்டு இருக்கின்றார்கள். அரசாங்க விடயங்களைப் பேச வேண்டுமென்றால், அவர்கள் சிலரிடம் அனுமதி பெறவேண்டிய சூழல் காணப்படுகின்றது. கடந்த காலங்களில் இருந்த அரசியல் கலாசாரத்தைப் போன்றுதான் இன்று உங்களுடைய அரசியல் கலாசாரமும் இருக்கின்றது என்பதைத்தான் இது எடுத்துக் காட்டுகின்றது.

இன்று மக்கள் பல்வேறு எதிர்பார்ப்புகளுடனேயே உங்களிடம் அதிகாரத்தை கையளித்து இருக்கின்றார்கள். இன்று பாராளுமன்றத்தில் உங்களுக்கு மூன்றில் இரண்டு பெரும்பான்மைப் பலம் இருக்கின்றது. உங்களுடைய கட்சியைச் சேர்ந்தவர்தான் சனாதிபதியாக இருக்கின்றார். இவற்றுக்கு மேலதிகமாக, உள்ளூராட்சி மன்றங்களின் அதிகாரத்தையும் மாகாண சபைகளின் அதிகாரத்தையும் தந்தால்தான் தங்களால் எல்லா விடயங்களையும் செய்யலாம் என்று நீங்கள் கருதுகின்றீர்களா? என நாங்கள் கேட்க விரும்புகின்றோம். தயவுசெய்து, மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்கின்ற விடயங்களை மேற்கொள்ளுங்கள்! தாங்கள் ஆளும் கட்சியில் இருக்கின்றோம் என்பதைக்கூட சில உறுப்பினர்கள் மறந்து விட்டார்கள். உண்மையிலேயே மாண்புமிகு சனாதிபதி அவர்கள் பேசுகின்ற விடயங்கள் எல்லாம் சரியானவை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරනවා.

ஆனால், இன்னும் எதிர்க்கட்சியில் இருந்ததைப் போன்று பேசிக்கொண்டு இருக்க முடியாது. மாறாக, சில விடயங்களை அமுல்படுத்த வேண்டும். சனாதிபதிக்கு ஒதுக்கப்படுகின்ற நிதி குறைக்கப்பட்டிருந்தால், அதன்மூலம் மக்களுக்கு ஏதாவது நன்மை நடந்திருக்கின்றதா? என நாங்கள் கேட்கின்றோம். முன்னாள் சனாதிபதிகளின் பாதுகாப்பைக் குறைத்திருப்பதாக நீங்கள் சொல்கின்றீர்கள். இன்று பல்வேறு இடங்களிலும் துப்பாக்கிச்சூடு இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. இவ்வாறான விடயங்களைக் கருத்திற்கொண்டு, இன்னும் கதை சொல்கின்ற அரசியலைத் தொடராமல், மக்களுக்குச் சேவையாற்றுகின்ற, அவர்களுடைய பிரச்சினைகளைத் தீர்க்கின்ற விடயங்களை முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ලෙස ඉදිරිපත් වුණු Clean Sri Lanka ව්‍යාපෘතිය පිළිබඳව තමයි මේ විවාදය පවත්වන්නේ. අද උදෑසන සිටම අපි මේ ගැන කථා කරනවා. නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේ ගරු සභාවේ දිවුරුම් දීලා, මේ ව්‍යවස්ථාදායකය ගොඩ නහලා හරියටම

අදට මාස දෙකක් වෙනවා. ගෙවුණු මාස දෙක පුරාවට අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මර ළතෝනියක් තමයි අපට අහන්න ලැබුණේ. අපේ නව රජය, අපේ ආණ්ඩුව කිසි කලබලයක් නැතිව, ස්ථාවරව, සැලසුම් සහගතව අපේ සැලසුම් ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන වෙලාවක තමයි අද අපි මේ විවාදය කරගෙන යන්නේ.

ගෙවුණු දශක 7කට වැඩි දේශපාලන ඉතිහාසය ඇතුළේ මේ රටේ සිටි පාලකයෝ අපේ රටේ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතියට සිදු කර තිබෙන හතර නස්පැත්තිය අපි දන්නවා. ඒ හරහා මගේ රටේ ජනතාවගේත්, නුපත් ජනතාවගේත් බලාපොරොත්තු ඉෂ්ට නොවන තත්ත්වයකට අපේ රටේ පාලකයෝ වැඩ කරලා තිබුණා. අද ඒ සියල්ලම අමතක වෙලා, ඒ සියල්ලම අමතක කරලා, ඒ කිසි දෙයක් මතක නැති ගානට තමයි මේ සභාව තුළ කාලයක් තිස්සේ මන්ත්‍රීකම් දරපු, ඇමතිකම් දරපු උදවිය කථා කරන්නේ. මෙන්න මෙහෙම බිඳ වැටුණු, බිඳ වට්ටපු දේශයක දුක් විඳින ජනතාවගේ ජීවිත යහපත් කිරීමේ අරමුණ සහිතව තමයි අද අපට Clean Sri Lanka වැඩසටහන පිළිබඳව සාකච්ඡා කරන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ අනුව මේ සුන්දර දිවයින ප්‍රීතිමත් ජනතාවක් ජීවත් වන රටක් බවට පත් කිරීමේ අභිලාෂය, අරමුණ පෙරදැරි කරගෙන තමයි අපි Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කරමින් සිටින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ Clean Sri Lanka වැඩසටහනට පදනම සකස් වෙන්නේ කොහොමද? Clean Sri Lanka වැඩසටහන වැනි දැවැන්ත ව්‍යාපෘතියක් අපට ඕනෑ වෙලා තිබෙන්නේ ඇයි? පසුගිය මැතිවරණයේදී අපේ ජාතික ජන බලවේගයේ නව ආණ්ඩුවට උතුරේ ජනතාවගේ සහාය තිබුණා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ ජීවත් වන සියලු ජනතාවගේ සහාය අපට ලැබිලා තිබුණා. ඒ වාගේම කඳුරට ජනතාවගේ සහාය උපරිම වශයෙන් අපට ලැබිලා තිබුණා. රට පුරා සිටින සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජනතාව කිව්වේ මොකක්ද? රටක් විධියට ජාති භේද, ආගම් භේද, වර්ග භේද, කුලමල සියල්ල පසෙකලා මේ රට ගොඩ නැඟීමේ හැකියාව, ශක්තිය තිබෙන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකට කියන පණිවුඩය තමයි ඒ සහාය තුළ තිබුණේ. අපට පැවරිලා තිබෙන කාර්යභාරය සුළුපටු නැහැ. ඒ මැතිවරණයේදී දීලා තිබෙන පණිවුඩය අපි ඉතා නිවැරදිව කියවාගෙන තිබෙනවා. ඒ පණිවුඩය අරගෙන තමයි අපි අපේ ඉදිරි සැලසුම් සකස් කරලා තිබෙන්නේ. ලස්සන සුන්දර ජීවිතයක් උදා කර ගන්න, ලස්සන රටක, පොහොසත් රටක ලස්සන ජීවිතයක් උදා කර ගන්න අපේ ප්‍රතිපත්ති රාමුව ඇතුළේ තිබෙන ප්‍රබලම, ප්‍රධානතම ව්‍යාපෘතියක් ලෙස Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කරගෙන අපි ඉදිරියට යනවා. විශේෂයෙන්ම Clean Sri Lanka වැඩසටහන විශාල ප්‍රදේශයක පැතිරුණු ව්‍යාපාතියක් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ඒක සුළු කරලා, පටු කරලා තේරුම් ගන්න බැහැ. මේ සමාජයේ සෑම සියලු ක්ෂේත්‍රයක්ම පරිහානියට පත් වෙලා තිබෙන තත්ත්වයක් තුළ ඒ සියල්ලම නැවත යථාවත් කිරීමේ වුවමනාව තිබෙනවා. අන්න එය පෙරදැරි කරගෙන තමයි Clean Sri Lanka වැඩසටහන සකස් වෙලා තිබෙන්නේ. ඒ සඳහා අපේ රටේ දූෂණය සහමුලින්ම පරාජයට පත් කරන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවට ජනතාවගේ අභිලාෂයන් සහ අරමුණු අපේ රටේ නැවත ක්‍රියාත්මක කරන්න ඕනෑකම තිබෙනවා. අපේ තිබුණු පැරණි ක්‍රමයට, අපේ හිටපු පාලකයෝ අරගෙන ගිය ක්‍රමයට මේ රට ඉදිරියට අරගෙන යන්න අපේ නව ආණ්ඩුව සූදානම් නැහැ. පසුගිය පාලන කාලයන් තුළ රට තිබුණේ කොහොමද කියලා ඔබතුමන්ලාත්, අපිත් හැමෝම දන්නවා. නමුත්, කිව්වේ කොහොමද? බොහොම හොඳට තිබුණු රටක්, මේ. හරි අපූරු රටක් තිබුණේ කිව්වා. එහෙම තමයි කිව්වේ. වාහන අවභාවිත කරලා තිබුණේ කොහොමද කියන එක අපි දැක්කා. මේ රටේ මහජන දේපොළ - පොදු දේපොළ - අවභාවිත කරලා තිබුණේ කොහොමද කියන එක අපි දැක්කා. හිටපු අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු වරප්‍රසාදවලට මුවා වෙලා පොදු ජන දේපොළ අවභාවිත කරලා තිබුණු හැටි අපි දැක්කා. හොරකම්, වංචා, කොමිස් ගැහිලි වාගේම පගා ගැහිලි ඇති තරම් මේ රටේ හෙළිදරව් වුණු හැටි අපි දැක්කා. ඒ වාගේම සුදු ලූනු වංචාව පිළිබඳව අපි ඕනෑ තරම් මේ රටේ කථා කරලා තිබෙනවා. සීනි බදු වංචාව, ව්‍යාපෘතිවලින් කොමිස් ගැසීම් වැනි දූෂණ කටයුතු මේ රටේ ඇති තරම් සිද්ධ වෙලා තිබුණා. එහෙම ඉතිහාසයක් තමයි තිබුණේ. එතකොට ඒ තිබුණු ඉතිහාසය වෙනස් කරලා අලුත් මානයකට මේ රට අරගෙන යන්න, රටට අවශ්‍ය වැඩ පිළිවෙළ මෙන්න මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ තුළ තිබෙනවා.

ඒ වාගේම අපි කවුරුත් දන්නවා, අද අපේ ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ ජනතාවගේ අලුත් - නැවුම් - බලාපොරොත්තු ඉටු කරන්න බව. අපි එහෙම ගමනක් යනකොට විශේෂයෙන්ම මෙතැන හිටපු සමහර මන්ත්‍රීවරු, ඒ වාගේම හිටපු ඇමතිවරු එතුමන්ලාගේ අදහස් දැක්වීම්වල දී පුදුම විධියට කලබල වෙලා තිබෙන බව අපි දැක්කා. ඇයි මේ කලබල? අපි දන්නවා, මේ කලබලය මොකක්ද කියලා. නොබෝ දිනකින් ඔවුන්ගේ මන්ත්‍රී ධුර පිළිබඳ ප්‍රශ්න එනවා. බොරුවෙන් මේ රටේ ජනතාවට වහන් වෙලා කරපු ක්‍රියාකාරකම් ටික රට ඉස්සරහා හෙළිදරව් වෙනකොට අන්න ඒවාට මුහුණ දෙන්න බැරි නිසා තමයි මේ කලබල වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ගත්තාම ජන වහරේ මෙන්න මෙහෙම කථාවක් තිබෙනවා. නයාට පුළුවන්, පෙණයක් තිබෙන නිසා පෙණය පුප්පලා මෙන්න මගේ පෙණය කියලා පෙන්වන්න. හැබැයි, ගැරඬියාට පෙණයක් නැහැ. ඒ නිසා ගැරඬියා පෙණය පුප්පන්න ගියොත් මුළු රටම දැන ගන්නවා, ගැරඬියාට පෙණයක් නැහැ කියලා. සමහර මන්ත්‍රීවරු කරපු පව් ඔවුන් පසුපසින් එනවා අපි උදේ වරුවේ මෙතැන දැක්කා. ඒ නිසා, "කරන කලට පව් මීරිය මී සේ - විඳින කලට දුක් ඇවිළෙයි ගිනි සේ" කියලා තමයි අපට කියන්න වෙන්නේ. අන්න ඒගොල්ලන්ටත් ඒ ඉරණම අත්පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට මෙතැනට වැටෙන්න ඕනෑ රටක් නොවෙයි කියන එක අපි දන්නවා. ස්වාභාවික සම්පත්වලින් පිරිපුන්, ඒ වාගේම ඉතා දියුණු මානව සම්පතකින් පිරිපුන් රටක් විධියට තමයි අපේ රට අපි හඳුනා ගෙන තිබෙන්නේ. ඒ නිසා මේ රට ගොඩනඟන්න යනකොට අපට නිසි දැක්මක් සහ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අන්න ඒක ඉස්සරහට අරගෙන යන්න නම් අපි මේ රටේ තිබෙන සෑම ක්ෂේත්‍රයක්ම පිරිසිදු කරන්න ඕනෑ. Clean Sri Lanka වැඩසටහනේ මූලික පරමාර්ථ මේවා බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි ක්ෂේත්‍ර ගණනාවකින්ම, පැති ගණනාවකින්ම මේ Clean Sri Lanka වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන්න කටයුතු කරගෙන තිබෙනවා. ජනවාරි පළමුවෙනි දා ආරම්භ කරපු Clean Sri Lanka වැඩසටහන තුළ මේ වෙනකොට රාජ්‍ය ආයතන මට්ටමින් වාගේම, ගම්වල පොදු සමිති, ස්වේච්ඡා සංවිධාන සහ අනෙකුත් සියලු ව්‍යුහ සමඟ අපි මේ පිළිබඳ සාකච්ඡා කරනවා. ජනවාරි මාසය පුරාවටම අපි මේ සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් ටික කරගෙන යනවා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, Clean Sri Lanka වැඩසටහනට දැක්මක් නැහැ කියලා. Clean Sri Lanka වැඩසටහනට දැක්මකුත් - vision එකකුත් - තිබෙනවා; mission එකකුත් තිබෙනවා. Clean Sri Lanka වැඩසටහනට දැක්මක් තිබෙනවා වාගේම guide එකකුත් තිබෙනවා. ඒ නිසා මේක අයාලේ, ඉබාගාතේ කරන වැඩසටහනක් නොවෙයි. වඩාත් පුළුල් ලෙස හිතලා සාකච්ඡා කර සකස් කර ගත්ත වැඩ පිළිවෙළක් තමයි මේ තිබෙන්නේ.

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වත්මන් ආණ්ඩුව ජනතාවට මොකුත් කරලා නැහැ කියලා සමාජගත කරන්න පසුගිය කාලය පුරාම විපක්ෂයේ මන්ත්‍රීවරු උත්සාහ කළ බව අපි දන්නවා.

අද උදේ සිටම ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරු මේ කෙටි කාලය තුළ අපේ ආණ්ඩුව ජනතාවට මොන තරම් සහන ලබා දීලා තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් පැති ගණනාවකින් කරුණු ඉදිරිපත් කළා. ජනතාව ගොඩනඟා ගත් මේ ආණ්ඩුව නිවැරදි පාරේ ගමන් කරමින්, ජනතාවට එරෙහි නොවන, ජනතාවාදී ගමනක යනවාය කියලා ජනතාව හොඳටම දන්නවා. අන්න ඒකට බය වෙච්ච විපක්ෂයේ මන්ත්‍රීවරු ටික තමයි මේ කලබල වෙලා තිබෙන්නේ. නමුත් අපට නම් කිසි කලබලයක් නැහැ. අපට කලබල වෙන්න හේතුවකුත් නැහැ. අද අපේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මේ මන්ත්‍රීවරුන්ගෙන් සාතිශය බහුතරයක් බොහෝ කැපකිරීම් කරලා තමයි අපේ රටේ මේ පරිවර්තනය කර ගත්තේ. ඒ වාගේම ඉදිරියටත් අපි අපේ අරමුණු දක්වා යන්න අවශ්‍ය ඕනෑම කැපකිරීමක් කරනවා. අපේ රැකියාව, අපේ තානාන්තර සියල්ල කැපකරලා මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළට උරදෙන්න, කරදෙන්න අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට, ඇමතිවරු විධියට, නියෝජ්‍ය ඇමතිවරු විධියට කැපවෙලා සිටිනවා. අපි සුළුපටු විධියට කල්පනා කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. ඓතිහාසික තත්ත්ව තුළ අපට පවරපු වගකීමක් තිබෙනවා. අන්න ඒ වගකීම ඉෂ්ට කිරීම වෙනුවෙන් තමයි අපි මේ ගරු සභාව නියෝජනය කරන්නේ. ඒ වාගේම අපේ ජනතාවත් අප කෙරෙහි ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. අපි ඒ විශ්වාසයත් රකින්න ඕනෑ.

විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මම කියන්න ඕනෑ, කෑගල්ලේ ජනතාව බරපතළ ලෙස පීඩාවට පත්ව තිබෙන වන සත්ව උවදුරෙන්, රිළා උවදුරෙන් එම ජනතාව ගලවා ගැනීමට අඩු ගණනේ යෝජනාවක් ගෙනැල්ලා සාකච්ඡා කරන්නවත් පසුගිය කාලයේ හිටපු පාලකයන්ට, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරපු, මේ සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන්ට බැරි වුණු බව. අද අපි ඒ ජනතාවත් එක්ක සාකච්ඡා කරමින්, ගමෙන් ගමට ගිහිල්ලා ඒ වෙනුවෙන් විවිධ කමිටු ගොඩනඟා ගනිමින්, වගාව ආරක්ෂා කරගන්නේ කොහොමද, මේ වන සත්ව උවදුරෙන් ගැලවෙන්නේ කොහොමද කියන සාකච්ඡාව ගොඩනඟා ගනිමින් ඉන්නවා. පෙබරවාරි මාසයේ සිට අපි ඊට නිසි ක්‍රියාමාර්ග තෝරා ගනිමින්, වන සතුන්ගේ ග්‍රහණයෙන් අපේ දිස්ත්‍රික්කයේ ජනතාවත්, ඒ වාගේම වන සත්ව උවදුරට නතුවෙලා තිබෙන අනෙකුත් දිස්ත්‍රික්කවල ජනතාවත් මුදා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. Clean Sri Lanka වැඩසටහනට අපට ඒකත් ඇතුළත් කරගන්න පුළුවන්. මොකද, ජනතාව ඔවුන් මුහුණපා සිටින අර්බුදවලින් ගොඩ ගැනීමත් අපේ මේ වැඩසටහනේ එක අරමුණක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරනවා.

විශේෂයෙන්ම අද සභාව කල්තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනාවේ, ඉදිරි කාලයේදී මේ රට වඩා හොඳ තැනකට ගෙන යන්න අපට ඕනෑ වෙලා තිබෙන නිසා. ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ගෙන්, ඇමතිවරුන්ගෙන්, නියෝජ්‍ය ඇමතිවරුන්ගෙන් වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් අන්න ඒ වෙනුවෙන් මා ඉල්ලීමක් කරනවා. රටේ ජනතාවට වඩා යහපත් හෙට දිනක් උදා කරදීම වෙනුවෙන් මේ Clean Sri Lanka වැඩසටහනේ හරය නිවැරදිව තේරුම් අරගෙන කටයුතු කරමු කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பි.ப. 3.31]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, Clean Sri Lanka திட்டம் தொடர்பாக இன்று நடைபெறும் ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் உரையாற்றுவதில் மகிழ்ச்சியடைகின்றேன். Clean Sri Lanka என்ற இந்தத் திட்டமானது நமது நாட்டின் மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களினால் 'அழகான நாடு! புன்னகைக்கும் மக்கள்!' எனும் தொனிப்பொருளில் உருவாக்கப்பட்டிருக்கின்றது. இந்தத் திட்டத்தில் பல நல்ல விடயங்கள் இருக்கின்றன. உண்மையிலேயே நமது பிரதேசங்கள் சுத்தமாக இருக்கவேண்டும் என்று எல்லா சமயங்களும் சொல்கின்றன. குறிப்பாக, "சுத்தம் ஈமானின் பாதி" என்று எமது புனித இஸ்லாம் மார்க்கம் சொல்கின்றது. எனவே, இந்தத் திட்டத்தினூடாக நீங்கள் நல்ல விடயங்களை மேற்கொள்ள வேண்டுமென்று நாங்கள் கேட்டுக்கொள்கின்றோம். நல்ல விடயங்களுக்கு ஒத்துழைப்பு வழங்குவதற்கு நாங்கள் எல்லோரும் தயாராக இருக்கின்றோம். அவ்வாறு கடந்த காலங்களிலும் இந்தப் பாராளுமன்றத்தில் எதிர்க்கட்சியினர் ஒத்துழைப்பு வழங்கியிருக்கின்றனர்.

ஆனால், இன்று காலையிலிருந்து இங்கு நடக்கின்ற சில விடயங்களைப் பார்க்கின்றபோது எங்களுக்குக் கவலையாக இருக்கின்றது. பாராளுமன்றத்திற்கு வந்து புதிய விடயங்களை, நல்ல விடயங்களைப் பேசுவதற்குப் பதிலாக, இங்கு ஆளும் கட்சியும் எதிர்க்கட்சியும் முட்டி மோதுகின்ற வகையிலான செயற்பாடுகள் இடம்பெறுவது எங்களுக்குக் கவலையை ஏற்படுத்துகின்றது. நடந்தவை நடந்தவையாக இருக்கட்டும்! இப்போது மக்களுக்கு நல்லவற்றைச் செய்வதற்கு ஒத்துழைப்பு வழங்கும் செயற்பாடுகளில் நாங்கள் எல்லோரும் ஈடுபடவேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். மிக முக்கியமாக Clean Sri Lanka என்ற எண்ணம் நமது மனங்களில் வரவேண்டும்.

நான் இந்தச் சபையில் ஆளும் கட்சியினரிடம் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். அதாவது, இந்த நாட்டிலே நல்லதொரு நோக்கத்திற்காக உருவாக்கப்பட்ட இந்தத் திட்டத்திற்கான செயலணியில் 18 பேர் உறுப்பினர்களாக நியமிக்கப்பட்டிருக்கின்றார்கள். இந்த

நாட்டுக்கும் நாட்டின் சுதந்திரத்துக்கும் சமாதானத்துக்கும் உதவி செய்த தமிழ் பேசும் சமூகத்தைச் சேர்ந்த எவரும் அந்தச் செயலணியில் நியமிக்கப்படவில்லை; இது கவலையான விடயமாகும். எனவே, Clean Sri Lanka என்பதை உண்மையிலே உள்ளத்தால் உணர்ந்து உருவாக்குவதென்றால், தமிழ் பேசும் இரண்டு சமூகங்களையும் சேர்ந்த தமிழர் ஒருவரையும் முஸ்லிம் ஒருவரையும் Clean Sri Lanka ஜனாதிபதி செயலணிக்கு நியமித்து, அந்தத் திட்டத்தை உயிரோட்டமுடையதாக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, நமது நாட்டிலே நடைபெறுகின்ற சில விடயங்களைப் பார்க்கின்றபோது மிகவும் கவலையாக இருக்கின்றது. இந்தப் புதிய அரசாங்கத்திற்கு இந்த நாட்டிலே வாழுகின்ற சிறுபான்மை மக்கள் - ஏறத்தாழ 12 இலட்சம் பேர் - வாக்களித்திருக்கின்றார்கள். உண்மையிலேயே இதுவொரு பெரிய விடயம். அவர்கள் அவ்வாறு உங்களுக்கு வாக்களித்ததற்குக் காரணம் இருக்கின்றது.

கடந்த பொதுத் தேர்தலில் சிறுபான்மை முஸ்லிம் மக்களுடைய பிரதிநிதிகளாக இரண்டு கட்சிகளின் தலைவர்கள் பாராளுமன்றத்திற்குத் தெரிவாகியிருக் கின்றார்கள். ஒருவர் ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியினுடைய தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள்; அடுத்தவர் அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியினுடைய தலைவர் றிஸாட் பதியுதீன் அவர்கள். அவர்கள் இரண்டுபேரும்தான் கடந்த காலத்தில் இடம்பெற்ற முஸ்லிம் சமூகத்திற்கு எதிரான ஜனாஸா எரிப்புச் சம்பவத்தின்போது இந்தச் சபையில் எங்களுடைய சமூகத்திற்காகக் குரல் கொடுத்திருந்தார்கள். ஏனையவர்கள் எங்களுடைய சமூகத்தின் உரிமைகளைப் பற்றி இந்தப் பாராளுமன்றத்தில் பேசாது அன்றைய ஆட்சியாளர்களுடன் இணைந்து மௌனிகளானார்கள். ஆனால், அன்று இதுபற்றிப் பேசாதிருந்த முஸ்லிம் சமூக மக்கள் பிரதிநிதிகளுக்குப் பதிலாக மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களும் எங்களுடைய எதிர்க்கட்சித் தலைவர் மற்றும் எதிர்க்கட்சியிலிருந்த பலரும் பேசினார்கள். அதுமட்டுமல்ல, இந்த நாட்டிலுள்ள மக்கள் எல்லோரும் இதுபற்றிப் பேசக்கூடியதொரு நிலைமையை அவர்கள் உருவாக்கினார்கள். அன்று யார் யார் எல்லாம் முஸ்லிம் மக்களின் ஜனாஸாவை எரிப்பதற்கு முன்னாள் ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுடன் ஒத்துழைத்தார்களோ அவர்கள் எல்லோரையும் கடந்த நாடாளுமன்றத் தேர்தலின்போது தோற்கடித்து, தற்போது Clean ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸாக இந்தப் பாராளுமன்றத்தில் 5 முஸ்லிம் மக்கள் பிரதிநிதிகள் இருக்கிறோம். தலைவர் உட்பட அந்த ஐந்து பேரும் தெரிவுசெய்யப்பட்டு, தற்போது ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் clean செய்யப்பட்டிருக்கிறது. எனவே, நாங்கள் முதலில் கட்சி ரீதியாக cleaning செய்ய வேண்டும்; எங்களுடைய மனநிலையில் மாற்றங்களை ஏற்படுத்த வேண்டும்.

அண்மையிலே இடம்பெற்ற உயர் நீதிமன்ற நீதியரசர் நியமனத்தின்போது இந்த நாட்டிலே வாழ்கின்ற முஸ்லிம் சமூகத்திற்குப் பாரபட்சம் நடைபெற்றிருக்கின்றது. இதைப்பற்றி உங்களுக்கு வாக்களித்த முஸ்லிம் சமூகத்தினர் எங்களிடம் வந்து கேட்கிறார்கள். மேன்முறையீட்டு நீதிமன்ற நீதியரசராகக் கடமையாற்றிய எம்.டி.எம். லபார் என்பவர் அண்மையில் வழங்கப்பட்ட உயர் நீதிமன்ற நீதியரசர் நியமனத்தின்போது புறக்கணிக்கப்பட்டிருக்கிறார். தனிப்பட்ட முறையில் அவர் யார் என்பது எனக்குத் தெரியாது. அவர் நீதியான, நாட்டுப்பற்றுள்ள ஒருவர். அவருக்குக் கிடைக்கவேண்டிய அந்தப் பதவி அவருக்கு அடுத்ததாக இருப்பவர்களுக்கு வழங்கப்பட்டிருக்கின்றது. இவ்வாறான நியமனங்களின்போதும் நீங்கள் Clean Sri Lankaவைப் பாவிக்கவேண்டும். இந்த நாட்டின் நீதித்துறையை நாங்கள் நீதியாக நடத்தவேண்டும். உள்ளத்தில் வேறு விடயங்களை வைத்துக்கொண்டு வெளியே Clean Sri Lanka என்று சொல்ல முடியாது. இது எங்களுடைய சமூகத்தின் கோரிக்கை; இதனை நீங்கள் செய்யவேண்டும்.

இந்த நாட்டின் அரசியல் வரலாற்றிலே முஸ்லிம் சமூகமானது நாட்டின் சுதந்திரத்திற்கும் ஐக்கியத்திற்கும் மிகவும் உதவிசெய்த ஒரு சமூகமாகக் காணப்படுகின்றது. முஸ்லிம் சமூகம் ஒருநாளும் பயங்கரவாதத்தையும் தீவிரவாதத்தையும் ஆதரித்தது கிடையாது. இதனை நாங்கள் very clearஆக உங்களுக்குச் சொல்கின்றோம். அவ்வாறான முஸ்லிம் சமூகத்தின் ஒரு முஸ்லிம் பிரதிநிதியைக்கூட இந்த அரசின் அமைச்சரவையில் இதுவரையும் நீங்கள் நியமிக்காமல் இருக்கின்றீர்கள். எனவே, தயவுசெய்து அவர்களில் ஒருவரை அமைச்சர் பதவிக்கு நியமித்து, இந்த நாட்டை Clean Sri Lanka ஆக மாற்ற வேண்டும். ஏனென்றால், எங்களுடைய சமூகம் தொடர்பான விடயங்களைப் பற்றி பேசுவதற்காக. அந்தப் பதவியை எங்களுக்குத் தரும்படி நாங்கள் கேட்கவில்லை; உங்களுடன் இருக்கின்ற முக்கியமானவர்களுக்குக் கொடுங்கள்! ஒரு சகோதரர் சொல்லியிருந்தார், "முஸ்லிம் MPக்களுக்குத் தகுதியில்லை" என்று. ஏன் இல்லாமல்? மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி அவர்கள் பிரதிச் சபாநாயகராக இருக்கிறார்; ஏனையவர்களில் பிரதி அமைச்சராக ஒருவர் இருக்கின்றார்.

කරුණාකර, මුස්ලිම් ජනතාව වෙනුවෙන් ඇමතිවරයෙක් කැබිනට් මණ්ඩලයට පත් කරන්න කියලා ආණ්ඩු පක්ෂයෙන් මම ඉල්ලීමක් කරනවා. இது எங்களுடைய கோரிக்கையல்ல. உங்களுக்கு வாக்களித்த முஸ்லிம் சகோதரர்கள் எங்களிடம் வந்து செல்கின்றார்கள், "இதனை நீங்கள்தான் பாராளுமன்றத்தில் பேசலாம்; எனவே, இதுபற்றிப் பேசி எங்கள் முஸ்லிம் பிரதிநிதிகளில் ஒருவரை அமைச்சராக்குங்கள்!" என்று. அதனை நீங்கள் செய்யவேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

'கொவிட்' தகனத்தின்போது முஸ்லிம் மக்களுடைய ஜனாஸா எரிக்கப்பட்ட விடயம் தொடர்பாக மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களும் மாண்புமிகு பிரதம மந்திரி அவர்களும் நிறைய சந்தர்ப்பங்களில் பேசியிருந்தார்கள். இந்த விடயம் தொடர்பில் எல்லோரும் எங்களுக்கு ஒத்துழைப்பு வழங்கியிருந்தார்கள். எதிர்க்கட்சித் தலைவர் அவர்கள் மக்கள் மத்தியிலிருந்து தனது எதிர்ப்பைத் தெரிவித்திருந்தார். கோட்டாபய அரசாங்கம் முஸ்லிம் சமூகம் தங்களுக்கு வாக்களிக்கவில்லை என்பதற்காகத்தான் அவர்களுடைய ஜனாஸாக்களை எரித்தது. எங்களுடைய கட்சியின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் MP அவர்கள், 'கொவிட்' தொற்று காலப்பகுதியில் எரிக்கப்பட்ட ஜனாஸாக்களின் பெயர்ப் பட்டியலைக் கேட்டிருந்தார். இதுவரையில் நீங்கள் அதுபற்றிய விபரங்களைத் தருவதற்குத் தாமதிக்கின்றீர்கள். குறித்த பெயர்ப் பட்டியல் பிழை என்று சொல்கிறீர்கள். இவ்வாறான செயல் முஸ்லிம் சமூகத்திற்கு நடந்தது பிழை என்றும், இதனால் முஸ்லிம் சமூகத்திற்கு அநியாயம் நடந்திருக்கின்றது என்பதையும் நீங்கள் ஏற்றுக்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

கொள்கின்றீர்கள். ஆனால், எரிக்கப்பட்ட எங்களுடைய முஸ்லிம் சகோதரர்களின் பெயர்ப் பட்டியலைத் தருவதற்கு நீங்கள் முன்வரவில்லை. இதற்கு என்ன காரணம்? எனவே, அது தொடர்பான விபரங்களை நீங்கள் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பித்து, Clean Sri Lanka என்ற வேலைத்திட்டத்தை வலுப்படுத்த வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னுமொரு விடயத்தை மாத்திரம் கூறிவிட்டு எனது பேச்சை முடித்துக் கொள்கின்றேன். சவுதி அரசாங்கத்தினால் அம்பாறை மாவட்டத்திலே பல கோடி ரூபாய் நிதி ஒதுக்கப்பட்டு, அங்கு 500 வீடுகள் கட்டப்பட்டு இருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කරුණාකරලා මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ஒருநாளும் முஸ்லிம் நாடுகள் வட்டிக்குப் பணம் தருவதில்லை. சவுதி அரசாங்கத்தினுடைய High Commissioner அவர்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களைச் சந்தித்தபோது, விரைவில் அந்த வீடுகளை மக்களுக்கு வழங்குவதற்கான நடவடிக்கைகளை எடுக்கும்படி கேட்டிருந்தார். கௌரவ வெளிநாட்டு அமைச்சர் அவர்களைச் சந்தித்தபோதுகூட சவுதி தூதுவர் அவர்கள் இதுபற்றிச் சொல்லியிருக்கின்றார். அக்கரைப்பற்றுப் பிரதேசத்திலே சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்கு 20 ஆண்டு காலமாக வீடுகள் இல்லாமல் இருக்கின்றது. எனவே, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுடைய சனத்தொகைக்கேற்ப ஏதோவோர் அடிப்படையில் இந்த வீடுகளை நீங்கள் கொடுத்து, அந்த மக்களுடைய வீட்டுப் பிரச்சினையைத் தீர்க்கவேண்டுமென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.40]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ආණ්ඩුව විසින්, අපේ රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් ආරම්භක අදියරේ තිබෙන Clean Sri Lanka ජාතික වැඩසටහන පිළිබඳවයි අද මේ විවාදය පැවැත්වෙන්නේ. අද උදෑසන පටන් ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ අත්දැකීම් සහිත මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු විවිධ අදහස්වලට අපි සවන් දෙමින් හිටියා. ඒ අවස්ථාවේදී මතු වෙච්ච කාරණා කිහිපයක් පිළිබඳව මූලික වශයෙන් පිළිතුරක් දෙමින්, මාගේ අදහස් ප්‍රකාශ කිරීමට මා සූදානම් වෙනවා. එතුමන්ලා මේ ගරු සභාව තුළ විවිධ අදහස් මතු කළා. මේ රට ගොඩනඟන්න අපි ඉදිරිපත් කර තිබෙන වැඩසටහන විවේචනය කරලා, එහි තිබෙන අඩුපාඩු කියලා, බොහෝ ශබ්ද නැඟුවා. නමුත්, එතුමන්ලා කියපු ඒ දේවල් සම්බන්ධයෙන් ආණ්ඩුවේ මන්ත්‍රීවරු පිළිතුරු ලබා දෙන විට අහගෙන ඉන්න මේ මොහොතේ මේ සභාවේ විපක්ෂයේ කවුරුවත් නැතිවීම ගැන මා කනගාටු වෙනවා. එහෙත්, මේ අවස්ථාවේදී මේ රටේ ජනතාව අප දෙස බලාගෙන ඉන්නවා, ඔවුන්ගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර එවපු අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොනවාද කරන්නේ කියලා.

විපක්ෂයේ මන්ත්‍රීවරු අද උදෑසන ඉඳන්ම මේ වැඩසටහනේ බොහෝ අඩුපාඩු තමයි දැක්කේ. අවස්ථා දෙකකදී, තුනකදී විතර තරමක් ධනාත්මක අදහස් ඉදිරිපත් වුණා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. එක්තරා මන්ත්‍රීවරයෙක්, "ඔබතුමන්ලාගේ වතුකරයේ ජනතාව, ඔබතුමන්ලාගේ කොළඹ වතු ජනතාව" ආදී වශයෙන් හැම වෙලාවේම ප්‍රකාශ කළා. එයින් එක දෙයක් පැහැදිලි වෙනවා. මේ රටේ දුක් විඳින ජනතාව, වතුකරයේ අනන්ත අප්‍රමාණ දුක් විඳින ජනතාව, අවුරුදු ගණනාවක් මේ රටේ ආණ්ඩු කරලා දැන් විපක්ෂයේ ඉන්න ඒ මන්ත්‍රීවරුන්ට නොපෙනුණු ජනතාව ඔවුන්ගේ නොවෙයි, අපේ ආණ්ඩු පක්ෂයේ ජනතාව විධියට තමයි එතුමන්ලා හඳුන්වන්නේ. ඒක හොඳයි. ඔව්, ඒ අපේ ජනතාව තමයි. අපි ඒ ජනතාව පිළිබඳව අවධානය යොමු කළ නිසා තමයි, මේ Clean Sri Lanka වැඩසටහන ගොඩනඟලා, ඒ වාගේම තවත් වැඩසටහන් ගණනාවක් ආරම්භ කරලා ක්‍රියාත්මක කරමින් ඉන්නේ. ඒ දුක් විඳින ජනතාව නිකම් දුක් විඳිනවා නොවෙයි. ඔවුන් දුක් විඳින්නට සැලැස්වූ ජනතාවක්. ඒ මිනිසුන්ට දුක් විඳින්නට සැලැස්වූ පිරිස තමයි අද මේ විවේචනය ගෙන එන්නේ. එම නිසා අපි ඒ ජනතාවගේ වගකීම භාර ගන්නවා; භාරගෙන තිබෙනවා. Clean Sri Lanka වැඩසටහන තුළින් මේ ක්‍රියාත්මක කරමින් ඉන්නේ, ඔවුන් ගොඩනඟන වැඩසටහන තමයි කියන එක මා කියන්න කැමැතියි. ඒ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරු නින්දෙන් ඇහැරිලා වාගේ කථා කරන්න පටන් ගත්තා; අදහස් ඉදිරිපත් කරන්න පටන් ගත්තා. මේ ජාතික වැඩසටහන කිසිදු පදනමක් නැති, කිසිදු අරමුණක් නැති, කිසිදු දැක්මක් නැති දෙයක් වශයෙන්, තමයි එතුමන්ලා ප්‍රකාශ කළේ. ඇත්ත වශයෙන්ම අපේ ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය කිව්වා වාගේ, අපි මේක අද ඊයේ පටන් ගත්ත වැඩසටහනක් නොවෙයි.

මේ රට හදන්න ඕනෑය කියන අදහස, මේ රට හදන්න ඕනෑය කියන දැක්ම, වැඩ පිළිවෙළ අපි ඉදිරිපත් කළේ මීට අවුරුදු ගණනාවකට කලින්. ඒකට අදාළ තත්ත්ව විශ්ලේෂණයක් - situational analysis - මනාව සකස් කරගෙන තමයි අපි මේ වැඩසටහන ගොඩනැඟුවේ. අපි අද මේ සංවාදය තුළින්, මේ විවාදය තුළින් උත්සාහ කරන්නේ, මේ වැඩසටහනේ අරමුණු මූලිකව හඳුන්වා දීමටයි. ඒක විපක්ෂයේ මන්ත්‍රීවරු තේරුම් ගත යුතු වෙනවා. මේ වැඩසටහනේ දැක්මක් නැහැ කියලා එතුමන්ලා කිව්ව නිසා මම එක අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ වැඩසටහනේ මූලික දැක්ම තමයි "සුන්දර දිවයිනක් - ප්‍රීතිමත් ජනතාවක්" කියන සංකල්පය. ඒ දැක්ම යටතේ, විසල් අර්ථයක් සහිතව, විසල් වැඩ පිළිවෙළක් සහිතව ව්‍යාපෘති ගණනාවක්, activities ගණනාවක් සහිත වැඩසටහනක් විධියට තමයි අපි මේ වැඩසටහන හඳුන්වා දීලා තිබෙන්නේ. ඒ වාගේම මේ වැඩසටහනේ මෙහෙවර විධියට අපි දක්වා තිබෙන්නේ, "පාරිසරික, සමාජමය හා ආචාරධාර්මික මූලාරම්භයන් හා ජාතික තලයේ කැපවීම තුළින් සංවර්ධිත ජාතියක් ලෙස ශ්‍රී ලංකාව ඉහළ තලයකට ඔසවා තැබීම" කියන කාරණය. ඒ නිසා ඒවා හරියට අධ්‍යයනය කරනවා නම් හොඳයි. අපේ ආණ්ඩු පක්ෂයේ මැති-ඇමතිවරු හැමදෙනාම මේ විවාදය ආරම්භයේ ඉඳලා මේ

වැඩසටහනේ දැක්මේ ඉඳලා, විවිධ activities එක්ක එය බිමේ පැළ කරන ආකාරය දක්වාම සැලසුම්සහගතව කරුණු ඉදිරිපත් කළා.

අඩුම ගණනේ ඒ කථා මනාව අහගෙන හිටියා නම් එතුමන්ලා පැහැදිලි කර ගනීවි, මේ වැඩසටහන ඉතා හොඳ දැක්මක්, ඉතා හොඳ පදනමක් සහිතව ක්‍රියාත්මක කරන වැඩසටහනක් බව. නමුත් එතුමන්ලා ඒකට සූදානම් නැහැ. අපට පෙනෙන්නේ එතුමන්ලා නැති බැරිකම් පිළිබඳව කථා කරමින් මේ වැඩසටහනට අකුල් හෙළනවා කියන එකයි. ඒක තමයි අපට පැහැදිලි වෙන්නේ. මොකද, මෙහි ඇති කරුණු අසා සිටීමට සූදානම් නැති බවින් අපට පෙනෙන්නේ ඒකයි. නමුත් අපි මේ වැඩසටහන ඉතා හොඳ දැක්මක් සහිතව, ඉතා හොඳ මෙහෙවරක් සහිතව ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම මේ වැඩසටහනට කිසිම මූල්‍ය සැලැස්මක් නැහැයි කියාත් එතුමන්ලා අදහස් දක්වා තිබෙනවා. අපි දන්නවා, මේ වාගේ ජාතික තලයේ වැඩසටහනක් - national programme - ක්‍රියාත්මක කරනකොට, රජය විධියට අපි උපාය මාර්ගික වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන බව. ඒක තුළ projects සිය ගණනක්, දහස් ගණනක් තිබෙනවා. ඒ වාගේම ඒ projects ඇතුළේ තවත් විවිධ ක්‍රියාකාරකම් - activities - ලක්ෂ ගණනක් තිබෙන්නට පුළුවන්. එම නිසා මේ වාගේ හඳුන්වා දීමේ අදියරකදී ඒ වාගේ දේවල් සම්බන්ධයෙන් පැහැදිලි මූල්‍ය සැලැස්මක් ඉදිරිපත් කරන්න අපට හැකියාව නැහැ. එහෙත් අපි ඉඟියක් දීලා තිබෙනවා, මේ වැඩසටහන සඳහා අරමුදල් වෙන් කරනු ලබන්නේ අය වැය ප්‍රතිපාදන සහ පරිත්‍යාග මඟින් කියලා. ඒ වාගේම තවත් විස්තර ඉදිරිපත් කරලා තිබෙනවා. මෙන්න මේවා අනුව මේ Clean Sri Lanka වැඩසටහන අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ ජාතික තලයේ පුළුල් අරමුණු ගණනාවක් ඉටු කර ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි මෙම වැඩසටහන කුලුනු තුනක් මත දියත් කරනවාය කියන කාරණය මේ සභාව තුළදී සාකච්ඡා කළා. එහිදී අපි විශේෂයෙන්ම සමාජයීය ප්‍රවේශයක් සහිතව, ආචාරධර්මීය ප්‍රවේශයක් සහිතව, පාරිසරික ප්‍රවේශයක් සහිතව මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තිබෙනවා. ලංකාවේ සමහර ප්‍රදේශවල හඳුනා ගත් ප්‍රදේශ තුළ මේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපට ඒවා ප්‍රතික්ෂේප කරන්න බැහැ; අපට ඒවා එපා කියන්න බැහැ. හැබැයි, මේ වැඩසටහන ඒ විධියට කොහෙන් හෝ ආරම්භ වීම තුළ අපට පෙනෙනවා, මේ රටේ ජනතාව මෙම වැඩසටහන පිළිබඳව දක්වන උනන්දුව කොච්චරද කියලා. එම නිසා කොහෙන් හෝ තැනකින් මේ රට පිරිසිදු වෙන්න ඕනෑ, මේ රටේ දේශපාලන සංස්කෘතිය මීට වඩා දියුණු වෙන්න ඕනෑ, වෙනස් වෙන්න ඕනෑ කියලා මිනිස්සු, එක එක සංවිධාන වාගේම ආයතන කල්පනා කරමින් ක්‍රියාත්මක වෙනවා නම්, අපි රජයක් විධියට ඒවා කඩා බිඳ දමන්න සූදානම් නැහැ. ඒක ඇතුළේ මේ තුළ තිබෙන අරමුණ සම්පූර්ණයෙන්ම නැත්නම් හොඳින්ම තහවුරු වෙලා නැති වෙන්න පුළුවන්. හැබැයි, ඒ ප්‍රවේශය අපට ඉතා වැදගත්. එම නිසා ආරංචි මාර්ගයෙන් හෝ මේ වැඩසටහන හඳුනාගෙන ජනතාව ක්‍රියාත්මක වන ආකාරයෙන්ම, ඔවුන් මේ රට පිරිසිදු රටක් විධියට, දියුණු රටක් විධියට ගොඩනහන්න ඕනෑය කියන ඉතා සුන්දර බලාපොරොත්තුව, අනාගතවාදී බලාපොරොත්තුව ඇතිව ක්‍රියාත්මක වෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ පිළිබඳව අපි ඒ ජනතාවට ස්තුතිවන්ත වෙනවා; ඒ ආයතනවලට ස්තුතිවන්ත වෙනවා; ඒ සංවිධානවලට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ඔබතුමන්ලා මේ සංකල්පය පිළිබඳව, මේ වැඩ පිළිවෙළ පිළිබඳව වඩ-වඩාත් හදාරන්න, හොඳින් තවදුරටත් හදාරන්න කියලා ආරාධනා කරන්න කැමැතියි. එලෙස හදාරලා මේක ඇතුළේ තිබෙන හද බස හොඳින් කියවන්න. මේ රට ගොඩනහන්න ඕනෑ කරන වැඩසටහන තමයි මේක ඇතුළේ තිබෙන්නේ. එම නිසා අපි මේ වැඩසටහන ක්‍රියාත්මක කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
පැරණි කියමනක් ඇසුරින් මගේ අදහස් දැක්වීම අවසන් කරන්න මම කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ලාඕ ට්සු" නමැති විද්වතා මෙන්න මෙහෙම දෙයක් කියලා තිබෙනවා.

"ඔබ දන්නා දෙයින් පටන් ගන්න, ඔබ සතු දෙයින් ගොඩනහන්න"; "Start with what they know, build with what they have".

අපි දන්නා දෙයින්, අපි සතු දෙයින් මේ රට ගොඩනහන්න ඕනෑ, මේ රට දියුණු කරන්න ඕනෑය කියන අරමුණ අපට තිබෙනවා. මේ රටේ ජනතාවට දුක් විඳින්නට ඉඩ සැලැස්වූ කාලය, මිනිසුන්ගේ ජීවිත අහිමි කළ කාලය අවසන්කොට, මිනිසුන්ගේ ජීවිත නැවත දියුණු තත්ත්වයට පත් කරන්න ඕනෑය කියන උදාර, උත්තුංග අරමුණින් අපි ආරම්භ කළ මෙම වැඩසටහන අකුරක් නෑර ක්‍රියාත්මක කරලා මේ රට සුන්දර දිවයිනක් බවට පත් කරලා, මේ රටේ මිනිසුන්ට ලස්සන ජීවිත ගෙනැවිත් දෙනවාය කියන බලාපොරොත්තුව දල්වාගෙන මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 3.52]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව අද වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳවත් මම සතුටට පත් වෙනවා.

නමුත්, මම මතක් කරන්නට කැමැතියි, -ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ සම්බන්ධයෙන් අදහස් පළ කළා- මේ වැඩසටහනට හොඳ කියන අය විතරක් නොවෙයි මේ සම්බන්ධයෙන් සතුටු වෙන්නේ කියලා. මේ ගැන අපටත් ධනාත්මක ආකල්පයක් ඉදිරිපත් කළ හැකියි; විවේචන ඉදිරිපත් කළ හැකියි. ඒ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපටත් අයිතිය තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, එසේ කථා කිරීමෙන් අදහස් වන්නේ නැහැ, අපි රටට ආදරේ නැහැ කියා හෝ මේ වැඩසටහන අසාර්ථක වේවා යැයි අපි ප්‍රාර්ථනා කරනවා කියලා. මම ඒ කාරණයත් ඔබතුමියට ගෞරවයෙන් මතක් කරනවා.

Clean Sri Lanka කියන වැඩසටහනේ නමේ ඉඳලාම සම්පූර්ණයෙන්ම වෙනත් තැනකින් ආනයනය කළාය, වෙනත් තැනකින් පිටපත් කළාය කියලා කථාවක් යනවා. මම අහගෙන සිටියා, මන්ත්‍රීවරයෙක්, දෙන්නෙක් ඒ ගැන කථා කළා. විශේෂයෙන් සිංගප්පූරුවේ "Keep Singapore Clean" කියන වැඩසටහන, ඉන්දියාවේ "Swachh Bharat Abhiyan" කියන වැඩසටහන, ඇමෙරිකාවේ "Keep America Beautiful" කියන වැඩසටහන, ජර්මනියේ "Green Dot Initiative" කියන වැඩසටහන, ඕස්ට්‍රේලියාවේ "Clean Up Australia" වැඩසටහන කියන මේ සියලු දේවල් අරගෙන තිබෙනවා. හැබැයි, මට කියන්නට තිබෙන්නේ, කොහෙන් නම ගත්තත් ඒක අපට අදාළ වෙන්නේ නැති බවයි. මෙතැන තිබෙන්නේ නම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. මේ වැඩසටහන සම්පූර්ණයෙන් පිටපත් කරලා ගත්තත් කිසි කෙනෙකු ඒක ප්‍රශ්නයක් කරගන්නට අවශ්‍ය නැහැ. මොකද, මේ වැඩේ සිද්ධ වෙන්නයි අවශ්‍ය. වැඩේ හරියට සිද්ධ වෙනවා නම් ශ්‍රී ලාංකිකයන් විධියට හැමදෙනාටම සතුටු වෙන්න පුළුවන් තත්ත්වයකට කටයුතු කරන්න කියන එක තමයි අපේ ඉල්ලීම.

මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා, මේක ඉතාම හොඳ framework එකක් ඇතුළේ, plan එකක් ඇතුළේ ගෙනැවිත් තිබෙනවාය කියලා පුන පුනා කියන්නට යෙදුණා. නමුත් අපට නම් එහෙම පෙනෙන්නට නැහැ කියන එක මම මතක් කරන්නට කැමැතියි. විශේෂයෙන් මේකට කාල රාමුවක් නැහැ. ඒක මම නොවෙයි කියන්නේ. මේ සඳහා පත් කළ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජික අපේ චමින්ද ජයසූරිය මැතිතුමා ටීවී එකට ඇවිල්ලා කියනවා මම දැක්කා, අඩු ගණනේ මේ යෝජනා කරන වැසිකිළි පද්ධතිය හදන්නවත් කාල රාමුවක් ගැන අපෙන් අහන්න එපා, කාල රාමුවක් දෙන්න බැහැ කියලා. කාල රාමුවක් නැහැ එතැනටවත්. එතුමා ඒක පිළිගත්තා අපි දැක්කා. ඒ නිසා මේ වැඩසටහන ඉතාම හදිසියේ ගෙන ආ බවක් පෙනෙන්නට තිබෙනවා. ඒකේ වරද ආණ්ඩුව පැත්තේ තිබෙන්නේ. මේ වැඩසටහන ඉතාම සාර්ථක වැඩසටහනක් කරගන්නට අවශ්‍ය නම් ඒ අඩුපාඩු ටික හදාගන්න වෙයි කියන එක මම කියන්න කැමැතියි. මේක ඉතාම කලබලයේ ගෙනාවා කියලා පෙනෙන්න තියන්න හොඳ නැහැ කියන එකයි මගේ අදහස. ඇත්තම කියනවා නම් මේ ආණ්ඩුව පත් වෙලා ගත වුණු මේ මාස දෙක ඇතුළත project එකක් විධියට හරියට ගෙනැවිත් තිබෙන්නේ මේක තමයි. කලින් තිබුණු project එක තමයි 76 වසරක සාපය කියන එක. පැවති ඔක්කොම ආණ්ඩුවලට ගහගෙන යන එක තමයි main project එක. ඒක අවසන් වෙන්නේ කවදාද කියාත් කාල රාමුවක් මට නම් හිතාගන්න බැහැ. ඒ අතර මේ වාගේ project එකක් ගෙනැල්ලා ඉස්සරහට අරගෙන යන එක ගැන අපි සන්තෝෂ වෙනවා. එහි අඩුපාඩු තිබෙනවා නම් ඒවා පෙන්වාදෙන එක, ඒවාට යෝජනා ඉදිරිපත් කරන එක තමයි අපේ වගකීම වෙන්නේ.

ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කළ රාජාසන කථාවේදී එතුමා ඉතාම පැහැදිලිව කිව්වා මේක තමයි අපේ වැඩසටහන කියලා. මම හිතන විධියට එතුමාගේ ඔළුවේ විතරයි දැනටත් මේක තිබෙන්නේ. මේක දන්නා වෙනත් කෙනෙක් ඉන්නවා නම් හොයලා සම්මානයක් දෙන්න වටිනවා. මොකද, ජනාධිපතිතුමා කියන දේ නොවෙයි අනික් අය කියන්නේ. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ දේ නොවෙයි ජනවාරි මාසයේ සිද්ධ වුණේ. පොළොන්නරුවේද, අනුරාධපුරයේද මම දන්නේ නැහැ, නියෝජ්‍ය ඇමතිතුමෙක් mediaත් අරගෙන ගිහිල්ලා, වැවක බැහැගෙන ජපන් ජබර ගලවලා එළියට ඇවිල්ලා කිව්වේ, මේක Clean Sri Lanka යටතේ කරනවා කියලායි. එහෙම තමයි එතුමා කිව්වේ. හැබැයි, දැන් කියනවා ජනවාරි මාසයේ කෙරෙන්නේ මේ ගැන දැනුවත් කිරීම පමණයි, පෙබරවාරි මාසයේ සිට මේක ඉස්සරහට කරගෙන යනවා කියලා. මම දන්නා තරමින් නම් මේවා group meetingsවල තමයි කථා වෙන්නේ.

දැන් මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා මීට පෙර දිනක ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්නයක් අහලා, එතුමිය ඉතාම ලස්සන දේශනයක් කළා Clean Sri Lanka ගැන. ඒගොල්ලන්ම ප්‍රශ්න අහනවා, ඒ ගොල්ලන්ම උත්තරය දෙනවා. ඒ නිසා මට තේරෙන විධියට මේ වැඩසටහන තුළින් මොකක්ද වෙන්නේ කියන එක තවමත් සැක සහිතයි. හැබැයි, එක හොඳ දෙයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ තමයි, දැන් සියලුදෙනාට එක හඬින්, එක වචනයෙන් කියන්න උගන්වලා තිබෙනවා, මුළු ජනවාරි මාසයේම අපි මේ ගැන දැනුවත් කිරීම පමණයි කරන්නේ, පෙබරවාරි මාසයේ ඉඳන් පටන් ගන්නවා, පොඩ්ඩක් ඉන්න කියලා. දැන් අඩු ගණනේ එහෙම හෝ කියනවා. අර බස් ගැමුණු මහතාගේ ප්‍රශ්නයෙන් පසුව තමයි එහෙමවත් කිව්වේ. එතුමා ළඟ දණ නවන්න සිද්ධ වුණාට පසුව තමයි අඩු ගණනේ මේකවත් කිව්වේ, පෙබරවාරි මාසයේ ඉඳලා මේක පටන් ගන්නවා, දැනට දැනුවත් කිරීම පමණයි කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් පත් කළ කාර්ය සාධක බලකාය පිළිබඳවත් යම් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. එහි ත්‍රිවිධ හමුදාපතිවරු ඉන්නවා, විවිධ ක්‍රියාකාරිකයන් ඉන්නවා, වෘත්තියවේදීන් ඉන්නවා. ඔවුන් ස්වේච්ඡා සේවකයන් කියලා කියනවා. වැඩ කරන්නේත් ස්වේච්ඡාවෙන් කියලා කියනවා. ජනවාරි 08වැනි දා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීතුමෙක් කථාවක් කරමින් කිව්වා, "159දෙනෙක් ස්වේච්ඡාවෙන් මෙතැන වැඩ කරනවා, 159දෙනෙක් ස්වේච්ඡාවෙන් වැඩ කරද්දී පඩි ගන්න ඔයාලා වාගේ නොවෙයි, අපි මේ ආණ්ඩුව වට්ටන්න දෙන්නේ නැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම දැන ගන්න කැමැතියි ස්වේච්ඡා කියන වචනයේ තේරුම මොකක්ද කියලා. ස්වේච්ඡා කියන වචනයේ තේරුම අපට ආණ්ඩුව පැහැදිලි කරලා දුන්නොත්, අපට දැන ගන්නට පුළුවන් ජනාධිපති කාර්ය සාධක බලකායේ ස්වේච්ඡා කියන්නේ NPP ස්වේච්ඡාද, - ඒ කියන්නේ, පඩිය පැලවත්තට හැරවෙන ස්වේච්ඡාවද - එහෙම නැත්නම් ඇත්තම ස්වේච්ඡාවද කියලා. මොකද, ස්වේච්ඡා කියන්නේ පඩිය පැලවත්තට හැරෙන එක නොවෙයි. ඒ නිසා මම දැන ගන්න කැමැතියි මේ මිනිස්සුත් වැඩ කරන්නේ ඇත්තටම ස්වේච්ඡාවෙන්ද කියලා. මොකද, ස්වේච්ඡාවෙන් කියන්නේ, සත

පහක දීමනාවක් හෝ පඩියක් නැතුව වැඩ කිරීම. ඇත්තම ස්වේච්ඡා නම් මම හිතන විධියට ඒක ඊට වඩා හයානකයි. මොකද, මේ වාගේ ජාතික ව්‍යාපාරයක්, වැඩසටහනක් කරන්න වැඩ කරන මිනිස්සු තමන්ගේ කාලය, ධනය හා ශ්‍රමය වැය කරලා එනවා නම් අඩුම ගණනේ ඔවුන්ට දීමනාවක් දීලා ඒක බලා ගන්න ඕනෑ. මොකද, එතැන තමයි මෙහි තිබෙන ඉහළම තැන. මම එය සියලුදෙනාට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ස්වේච්ඡා ප්‍රශ්නය ඇදුණු වෙලාවේ අපි බාධා කළේ නැහැ. ඒ මොකවත් නිසා නොවෙයි. ඒ කථාව එතුමාගේ මංගල කථාව ද දන්නේ නැති නිසා. නැත්නම් මට මේ ප්‍රශ්නය ඒ වෙලාවේත් අහන්න හිතුණා. අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය දන්නවා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව, මංගල කථාවට බාධා කරන්නේ නැහැ. අපි ඒක දන්නවා. පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් ටිකත් කැඩීගෙන, කැඩීගෙන යන මේ වෙලාවේ අපි හෝ ඒක ආරක්ෂා කරන්නට කැමැතියි. අපි දැක්කා පාර්ලිමේන්තු සංසදවලදී, ඒ සම්ප්‍රදායයන් කඩන්න බලාගෙනත් කට්ටිය ආව බව. ඊළඟට, මිත්‍රත්ව සංසද ටික තිබෙනවා. ඒවාටත් ඒ විධියටම කරන්න කට්ටිය බලාපොරොත්තුවෙන් ඉන්නවා. මම හිතන විධියට දැන් මෙතැන එතුමා නැහැ. එතුමාට මම මතක් කරන්න කැමැතියි, සම්ප්‍රදාය අනුව හිතලා අපි එදා බාධා නොකළත් "ස්වේච්ඡාවෙන්" කියලා කියනවා නම්, අනිවාර්යයෙන්ම මහා භාණ්ඩාගාරයට ආපහු සල්ලි යන්න ඕනෑ. එහෙම නැතිව ඒවා පැලවත්තට ගියොත් ඒක ස්වේච්ඡා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම දාම බැන්නේ මීට කලින් තිබුණු ආණ්ඩුවලට නේ. Clean Sri Lanka වැඩසටහන යටතේ ඇත්තටම මුලින්ම කළ යුත්තේ මොකක්ද? මෙය සිංගප්පූරුවෙන් හෝ කොහෙන් කොපි කළත් කමක් නැහැ. සිංගප්පූරුවේ වුණේ, ඇත්තටම මුලින්ම තමන්ගේ ඇතුළෙන් clean වුණු එක. තමන්ගේ පක්ෂය, තමන්ගේ දේශපාලන නායකයන්, තමන්ගේ වැඩ කරන මිනිස්සු ටික clean කර ගන්න එක තමයි මුලින් කළේ.

හිටපු කථානායකතුමාගේ ප්‍රශ්නය ගැන කිව්වොත්, අපට එතුමාත් එක්ක කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, මීට පෙර තිබුණු ආණ්ඩුවක මෙවැනි සිද්ධියක් වුණා නම් ඒ ප්‍රශ්නය පාරටත් ගෙනියලා, ඒ මන්ත්‍රීවරයා ඉල්ලා අස් වන කල් විශාල කලබගෑනියක් කරනවා. එදා විපක්ෂයේ හිටපු තුන්දෙනා හිටියත් ඒ අය ඒක කරනවා. හැබැයි, අද එතුමා ඉතා ලස්සනට ආසනයේ වාඩි වෙලා ඉන්නවා. මට එතුමා සමඟ පෞද්ගලික ගැටලුවක් නැහැ. එතුමා කථානායක ධුරයෙන් ඉල්ලා අස් වුණා. ඒ කථාව එතැනින් අවසන්. මම කියන්නේ, මේ රට clean කරන්න ඕනෑ නම්, දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා කියලා බලයට ආවා නම්, - එතුමන්ලා ඡන්දය ඉල්ලුවේ එහෙම කියලා - කරුණාකරලා දේශපාලන සංස්කෘතියට නව ආදර්ශයක් ලබා දීලා, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වෙන්න කියලා මම මතක් කරනවා. පක්ෂය වෙනුවෙන් ඔබතුමන්ලා සියලුදෙනාත් ඒ ගැන කථා කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. අතිගරු ජනාධිපතිතුමා රාජාසන කථාවේදී Clean Sri Lanka වැඩසටහන හඳුන්වා දෙමින් ඉතා පැහැදිලිව කිව්වා, පුරවැසියන්ගේ යහපත් පරිවර්තනයක් නැතුව මේක ආණ්ඩුවට විතරක් කරන්න බැහැ, මේක තනියම ආණ්ඩුවට විතරක්, දේශපාලන අධිකාරියට විතරක්, නිලධාරින්ට විතරක් කරන්න බැහැ, පුරවැසියන්ගේ දායකත්වය අනිවාර්යයෙන්ම අවශ්‍යයි කියලා. මම එම ප්‍රකාශය ඉතා ආදරයෙන් පිළිගන්නවා. පුරවැසියන්ගේ අවශ්‍යතාව ඡන්දයේදී පෙන්වූවා. පුරවැසියන්ගේ යහපත් පරිවර්තනය දැන් පෙන්වලා තිබෙනවා. ඒක තමයි මම නැවත නැවත කියන්නේ, ඒ දේශපාලන සංස්කෘතිය වෙනුවෙන් ඔබතුමන්ලාත් පෙනී ඉන්න කියලා. ඒ දේශපාලන සංස්කෘතිය පක්ෂය ඇතුළෙන් කරලා පෙන්වන්න. ඔබතුමන්ලාට තවත් කාලය දීලා තිබෙනවා. විපක්ෂයේ වුණත් අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ වෙලාවේත් ජනතාව යම්තාක් දුරට ඔබතුමන්ලා සමඟ ඉන්නවා. බොරු පොරොන්දු දීලා අතේ මාට්ටු වෙලා තිබියදීත් රටේ ජනතාව තවම බලාගෙන ඉන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, යහපත් පරිවර්තනය වෙලා තිබෙන නිසා. එම නිසා ඒ යහපත් පරිවර්තනයට ඔබ සියලුදෙනා ගරු කරන්න කියලාත් ඉතාම ආදරයෙන්, කරුණාවෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අද සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා, මේ වැඩසටහන ගැන ගරු අග්‍රාමාත්‍යතුමියට ප්‍රශ්නයක් ඉදිරිපත් කළ අවස්ථාවේ ගරු අග්‍රාමාත්‍යතුමිය මෙහි අරමුණු පැහැදිලි කළා. එහි 4වන අරමුණ තමයි, සිනහ වෙන මිනිසුන් පිරිසක් බිහි කිරීම. මම හිතන්නේ ඒ අරමුණ නම් මේ වනකොටත් - මාස දෙකක් යද්දී - සාක්ෂාත් වෙලා තිබෙනවා. මොකද, ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දැන් කරන වැඩ ටික දිහා බැලුවාම හැමදෙනාම හිනා වන තත්ත්වයට නම් දැන් පත් වෙලා තිබෙනවා. ඒ කාරණයත් මතක් කරමින්, මට මේ කාලය ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේ ප්‍රධාන සාකච්ඡාව බවට පත් වෙලා තිබෙන්නේ, වත්මන් ජාතික ජන බලවේග ආණ්ඩුවේ මූලික උපාය මාර්ගවලින් එකක් වූ Clean Sri Lanka වැඩසටහන ගැනයි. ජාතික ජන බලවේගය හැටියට අපි මේ රට භාර ගනිද්දී මේ රට ආර්ථික වශයෙන් බංකොලොත් රටක් විතරක් නොවෙයි, සමාජයීය සහ සාරධර්ම වශයෙනුත් බිඳ වැටුණු රටක් බවට පත් වෙලා තිබුණ බව අපි දන්නවා.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ පරිසරය මුළුමනින්ම විනාශය වෙත අරගෙන යන තැනකට පත් කරලායි තිබුණේ. අන්න එවැනි වටපිටාවක් හමුවේ තමයි ජාතික ජන බලවේගය තීරණය කරන්නේ Clean Sri Lanka වැනි වැඩසටහනක් හඳුන්වා දෙන්න. Clean Sri Lanka වැඩසටහන ඇතුළේ අප බලාපොරොත්තු වන්නේ මේකයි. මෙහි ප්‍රධාන කුලුනු 3යි. පාරිසරික, සමාජීය හා සදාචාරාත්මක සංවර්ධනය මේ රට තුළ ඇති කිරීම තමයි අප කරන්න බලාපොරොත්තු වෙලා ඉන්නේ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එක්කෝ මේක තේරුම් ගන්න බැහැ. එහෙම නැත්නම්, එතුමන්ලා මේක තේරුම් ගන්න උත්සාහ කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, වඩාත්ම වෙන්න පුළුවන් දේ මා කියන්නම්. මේ Clean Sri Lanka වැඩසටහන ගැන විපක්ෂය බියට පත් වෙලා ඉන්නවා. එහෙම බියට පත් වෙලා ඉන්නේ මොකද? අපි මේ Clean Sri Lanka වැඩසටහන පරිසරය පිරිසිදු කිරීමට පමණක් සීමා කරලා නැහැ. සමාජීය වශයෙනුත්, සාරධර්ම වශයෙනුත් මේ රට ගොඩ නගන්න තීරණය කරලා තිබෙනවා. ඒ කරුණ නිසා තමයි විපක්ෂය බියට පත් වෙලා ඉන්නේ. අපි දන්නවා, මේ රට සදාචාරාත්මකව ඉදිරියට යද්දී, සමාජීය වශයෙන් ඉදිරියට යද්දී, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා ]

සමාජයේ තිබෙන තැන නැති වීමේ අභියෝගයට මුහුණ පාමින් සිටින බව. ඒ නිසා තමයි ඒගොල්ලන් මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව වඩාත්ම බියට පත් වෙලා ඉන්නේ.

මා දන්නා, මේ රටට ආදරය කරන පුරවැසියෙක් පසුගිය දවසක මට කිව්වා, "ඇමතිතුමා, අපි Clean Sri Lanka වැඩසටහන පටන් ගත්තේ ආණ්ඩුව Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න කලින්. අපි Clean Sri Lanka වැඩසටහන පටන් ගත්තේ පසුගිය ජනාධිපතිවරණයේදී. පසුගිය සැප්තැම්බර් 21වන දා තිබ්බ ජනාධිපතිවරණයෙන් තමයි අපි මේ රට clean කරන්න පටන් ගත්තේ. ඒ නිසා ඔබතුමා බය නැතුව පාර්ලිමේන්තුවේදී මේ කථාව කියන්න" කියලා. ඔව්, මේ රටේ ජනතාව මේ Clean Sri Lanka වැඩසටහන පටන් ගත්තේ පසුගිය සැප්තැම්බර් 21වන දා පැවැත්වුණු ජනාධිපතිවරණයත්, ඒ වාගේම නොවැම්බර් 14වන දා පැවැත්වුණු මහ මැතිවරණයත් පාදක කරගෙනයි. මේ රටේ තිබ්බ දූෂිත පාලනය, මේ රටේ ගෙන ගිය ඒ අතීතික පාලනය, ඒ සඳහා මැදිහත් වෙච්ච, ඒ සඳහා නායකත්වය දුන් කණ්ඩායම් clean කරලා තමයි Clean Sri Lanka වැඩසටහන මේ රටේ ජනතාව පටන් ගත්තේ. ඒ නිසා මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳ බියට පත් වෙච්ච කණ්ඩායම් දැන් මේ සම්බන්ධයෙන් අවඥාවෙන් ප්‍රකාශ නිකුත් කරන්න පටන් ගෙන තිබෙනවා; මේක හැල්ලු කරන්න උත්සාහ කරමින් සිටිනවා. නමුත් ස්ථිරසාර ලෙසම අපි කියනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ Clean Sri Lanka වැඩසටහන ඉතාම ස්ථාවර ලෙස, ඉතාම පිළිවෙළකට, සැලසුමක් සහිතව ක්‍රියාත්මක කරමින් ඉන්නවා කියලා. ඒ විතරක් නොවෙයි, අපි මේ Clean Sri Lanka වැඩසටහන අවසන් කරනවා. අප මේ Clean Sri Lanka වැඩසටහන අවසන් කරන්නේ මේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් ගොඩනගලා දීලායි; ඒ විතරක් නොව පොහොසත් රටක් ගොඩනගලා දීලායි. අන්න ඒ විශ්වාසය අපි මේ වෙලාවේ ඇති කරන්න ඕනෑ.

Clean Sri Lanka වැඩසටහන ගැන විපක්ෂයේ මන්ත්‍රීවරු තම තමන්ගේ නැණ පමණින් විවිධ දේ ප්‍රකාශයට පත් කරන්න පටන් ගෙන තිබෙනවා. නමුත් Clean Sri Lanka කියන්නේ ඔවුන් අදහස් කරනවාට වඩා පුළුල් වැඩසටහනක්. බොහෝ දෙනෙක් මේ Clean Sri Lanka වැඩසටහන ගැන පැහැදිලි කිරීම කරන්න උත්සාහ කරන්නේ 1968 ඔක්තෝබර් 01වන දා සිංගප්පූරුවේ ආරම්භ කරපු "Keep Singapore Clean" Movement එක පාදක කරගෙනයි. 1968 ඔක්තෝබර් 01වන දා ආරම්භ කරපු ඒ "Keep Singapore Clean" Movement එක කියන්නේ, මූලික වශයෙන්ම පරිසරය පිරිසිදු කර ගැනීම ඉලක්ක කරගත්තු වැඩසටහනක්. නමුත් ජාතික ජන බලවේගය මේ හඳුන්වා දීලා තිබෙන Clean Sri Lanka වැඩසටහන ඊට වඩා පුළුල් වැඩසටහනක්. ඒක සමාජීය වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, පාරිසරික වශයෙන් මේ කියන අංශ විතරක් නොවෙයි, මේ අංශ හා බැඳුණු පුළුල් පරාසයක් තුළ ක්‍රියාත්මක වන දැක්මක් සහිත වැඩ පිළිවෙළක්. එවැනි දැක්මක් ඇතුව තමයි අප මේ Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙන්නේ.

නමුත්, මේ Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් අනියත බියක්, අනියත සැකක් ඇති කරන්න වාගේම සැලසුම් සහගත නැති බවක් ප්‍රකාශ කරන්න සමහරු උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka කියන්නේ, පසුගිය කාලයේ මේ රට මුහුණ දුන් බංකොලොත්භාවය, සමාජ බේදවාචකයන් ඇතුළු ඒ සියලු අත්දැකීම් පිළිබඳ ඉතා හොඳ අධ්‍යයනයක් සහිතව, මේ සමාජය වෙනස් කරන්න ඕනෑ පැති ගැන ඉතා හොඳ අධ්‍යයනයක් සහිතව ඉදිරිපත් වෙච්ච වැඩසටහනක්. ඒ නිසා තමයි මේක සිංගප්පූරුවේ ක්‍රියාත්මක කරපු "Keep Singapore Clean" වැඩසටහනට වඩා පුළුල් වැඩසටහනක් බවට පත් වන්නේ. ඒ නිසා තමයි, Clean Sri Lanka වැඩසටහන ජනාධිපති කාර්ය සාධක බලකායක් යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනක් බවට පත් වන්නේ. මෙය ජනාධිපති කාර්ය සාධක බලකායක් යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනක්. ඊට පසුව මෙය ලේකම් මණ්ඩලයක් මඟින් විමර්ශනය කරන, අධීක්ෂණය කරන වැඩසටහනක් බවට පත් වෙලා, රාජ්‍ය පරිපාලන ව්‍යුහය හරහා පහළට ගිහිල්ලා, දිස්ත්‍රික් සභා, ගම් මට්ටමින් සභා හැදිලා ජනතාව සහභාගි කරවාගෙන ඉදිරියට යනවා. එක පැත්තකින් රාජ්‍ය යන්ත්‍රණයත්, අනෙක් පැත්තෙන් රාජ්‍ය නොවන ආයතනත්, ඒ වාගේම පුරවැසියාත් සම්බන්ධ කරගත් පුළුල් වැඩසටහනක් බවට Clean Sri Lanka වැඩසටහන පත් කර තිබෙන්නේ ඒ සැලසුම් සහගත බව නිසා තමයි.

මේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ එක පැත්තකින් අපි බලාපොරොත්තු වෙනවා, සමාජයීය වශයෙන් මේ රට පිරිසිදු කරන්න. පිරිසිදු හා ආරක්ෂිත මාර්ග, පිරිසිදු පොදු වැසිකිළි සහ සනීපාරක්ෂක පහසුකම්, ආහාරවල ගුණාත්මකභාවය හා ආරක්ෂාව, ආබාධිත අය සඳහා හිතකාමී නගර, නළා ශබ්දවලින් තොර කලාප ඇති කිරීම වැනි ගොඩනැඟීම් කරලා සමාජයීය වශයෙන් සංවර්ධනයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි, සදාචාරාත්මක පැත්තෙනුත් මේ සමාජය ගොඩ නඟන්න ඕනෑ. පසුගිය කාලයේ අපි දැක්කා, සදාචාරාත්මක වශයෙන් අපේ රටේ බරපතළ කඩා වැටීමක් සිද්ධ වෙලා තිබුණු ආකාරය. පසුගිය කාලයේ අපි දැක්කා, අපේ සමාජය බරපතළ බිඳ වැටීමකට ලක්ව තිබුණු ආකාරය. ජනතා නියෝජිත යැයි කියා ගත් අය ගුරුවරුන් දණ ගැස්සුවා; ගුරුවරුන්ට දඬුවම් කළා. ඒ විතරක් නොවෙයි, මාධ්‍යවේදීන් මරා දැම්මා. හොරට නීතිඥ විභාග ලියලා නීතිඥයන් බවට පත් වෙලා පුරසාරම් දෙඩුවා. ඒ විතරක් ද නොවෙයි, තමන්ට එරෙහි මාධ්‍යවේදීන් ඝාතනය කළා; තමන්ට එරෙහි ක්‍රීඩකයන් ඝාතනය කළා. සමාජීය වශයෙන්, සදාචාරාත්මක වශයෙන් කඩා වට්ටලා තිබුණු සමාජයක් එදා තිබුණේ. අන්න ඒ සමාජය ගොඩ නැඟීමේ වගකීමයි ජාතික ජන බලවේගය භාරගෙන තිබෙන්නේ. ඒ නිසා අපට පැහැදිලි වගකීමක් තිබෙනවා, මේ සමාජය වෙනස් කිරීම සඳහා. අපි මේ සමාජය සදාචාරාත්මක වශයෙන් ගොඩ නඟන්න ඕනෑ; මේ සමාජයේ තිබෙන දූෂණය මුළුමනින් පිටු දකින්න ඕනෑ; නීති රීති, රෙගුලාසි බලගන්වන්න ඕනෑ; පුරවැසියන්ගේ චර්යාත්මක වෙනස්කම් ප්‍රවර්ධනය කිරීමට මැදිහත් වෙන්න ඕනෑ. පුද්ගලයන්ට ගරු කිරීම ඇතුළු මානව වටිනාකම් අපි මේ සමාජය තුළ ගොඩ නඟන්න ඕනෑ. ඒවා ගොඩ නඟද්දී රජයක් හැටියට අපට විශේෂ කාර්යභාරයක් කරන්න තිබෙනවා. අපි එක පැත්තකින්, අපේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කරන ගමන්ම ඊට සමාන්තරව මේ සමාජය සාරධර්ම පැත්තෙන්, සදාචාරාත්මක පැත්තෙන් ගොඩ නැඟිය යුතු වෙනවා. අන්න ඒ සඳහා තමයි Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන්නේ. නමුත් toilets ශුද්ධ කිරීම වාගේ පටු දෙයක් තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේකෙන් තේරෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka වැඩසටහන කියන්නේ, toilets ශුද්ධ කිරීමට එහා ගිය, සමාජයක් හැටියටම clean කරන, සමාජයක් හැටියටම ගොඩ නඟන, වටිනාකම් ඉහළ දමන සදාචාරාත්මක, පාරිසරික, සමාජයීය වශයෙන් සමාජය ඉහළ තැනකට ගෙන එන වැඩසටහනක්. පසුගිය දශක ගණනාව තිස්සේ අපේ රට පාලනය කරපු පාලනයන් විසින් අපේ රටේ පරිසරය බරපතළ විධියට කඩා වට්ටලා තිබෙන බව අපි දන්නවා. මේ පරිසරය බිඳ වට්ටලා තිබෙනවා.

අද වනකොට අපේ රට වන සතුන්ට ජීවත් වීමට බැරි තැනක්, ඒ වාගේම මිනිසුන්ට ජීවත් වීමට බැරි තැනක් බවට පත් කරලා තිබෙනවා. පාරිසරික සමතුලිතතාව බිඳ දමලා තිබෙනවා. මෙන්න මේ පාරිසරික සමතුලිතතාව ඇති කරන්න ඕනෑ. මේ රට තුළ පරිසර පද්ධති අතර ඇති සමතුලිතතාව ගොඩ නහන්න ඕනෑ. එම නිසා මේ Clean Sri Lanka වැඩසටහනේ ප්‍රධාන අරමුණක් තමයි මේ පාරිසරික විනාශය නවත්වලා, වන සතුන්ට, මිනිසුන්ට, ගහකොළට සමතුලිතභාවයෙන් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් මේ රටේ ගොඩ නැඟීම. Clean Sri Lanka වැඩසටහන යටතේ ඒ සඳහා දැවැන්ත මැදිහත්වීමක් අපි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව ජාතික ජන බලවේගය සමඟ අත්වැල් බැඳගෙන ඉන්නවා කියලා අපි දන්නවා. මේ වෙනස ඇති කරන්න ජාතික ජන බලවේගයට මේ සා විශාල ජනවරමක් මේ රටේ ජනතාව ලබා දුන්නේ හුදු ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා විතරක් නොවෙයි, සමාජයීය වශයෙන්, සාරධර්ම වශයෙන් මේ රටේ වටිනාකම් ගොඩ නැඟීම සඳහා. ඒ වෙනුවෙන් හඳුපු වැඩසටහන තමයි, සැලැස්මක් ඇතිව පියවරින් පියවර, පඩියෙන් පඩිය නැඟලා ඉස්සරහට යන මේ රට ගොඩ නඟන වැඩ පිළිවෙළ තමයි Clean Sri Lanka වැඩසටහන හැටියට අපි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණය, මේ රටේ ස්වේච්ඡා කණ්ඩායම්, සමිති සමාගම්, සාමාන්‍ය ජනතාව - මේ සියල්ල - ඒකාබද්ධ කරමින් මේ ගමන ඉස්සරහට යන්න.

දැන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් බිය වැදිලා ඉන්නවා. දැන් ඒ ගොල්ලන්ට නැවත වතාවක් පරණ පුරුදු විධියට පරිසරය විනාශ කරන්න ලැබෙන්නේ නැහැ. දැන් අල්ලස, දූෂණය හා නාස්තිය රජ කරන්නට ලැබෙන්නේ නැහැ. මේ රටේ වටිනාකම්, සදාචාරය පරණ පුරුදු විධියට බිඳ වැටීමකට පත් වෙන්නේ නැහැ. ඒ නිසා විපක්ෂය අරගෙන ගිය වැඩ ඒ පිළිවෙළ නැවත වතාවක් මේ රට තුළ ජයග්‍රහණය කරවන්න ලැබෙන්නේ නැහැ. අන්න ඒ භීතිය තමයි මේ තිබෙන්නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපි විශ්වාසයෙන් කියනවා, ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් යටතේ මේ Clean Sri Lanka වැඩසටහන අපි අනිවාර්යයෙන් ක්‍රියාත්මක කරනවා, ක්‍රියාත්මක කරලා පොහොසත් රටක් ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට ලබා දෙනවා කියලා. එසේ ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දේශපාලනයේ පරිවර්තනීය වෙනසක් බලාපොරොත්තුවෙන් මේ රටේ ජනතාව මීට දින 120කට කලින් ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපතිවරයෙකුත්, මාලිමාවේ ආණ්ඩුවකුත් බලයට රැගෙන ඇවිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුවත්, ජනාධිපතිවරයාත් පත් කරලා දින 120ක්, එහෙම නැත්නම් කාර්තුවක කාලයක් ගෙවිලා යන වෙලාවක, මාස හතරක ප්‍රගති වාර්තාවක් බලන්න ඕනෑ වෙලාවක තමයි අද මේ ආණ්ඩුවේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳ විවාදයක් පවත්වන්නට කටයුතු යොදලා තිබෙන්නේ.

Clean Sri Lanka වැඩසටහන ගැන කථා කරද්දී, ජනවාරි පළමුවැනි දා ජනාධිපතිවරයා විසින් මාධ්‍ය ගෙන්වලා සමාරම්භක උත්සවයක් පවත්වලා Clean Sri Lanka වැඩසටහන ජනගත කළා. ජනවාරි පළමුවැනි දා Clean Sri Lanka වැඩසටහන එළිදැක්වීමත්, අද Clean Sri Lanka වැඩසටහන පිළිබඳ රටේ ඇතිවී තිබෙන තත්ත්වයත් පිළිබඳ කල්පනා කරද්දී විශාල කනගාටුදායක තත්ත්වයක් තමයි දකින්න ලැබෙන්නේ. මෙවන් වැඩසටහනක් සාර්ථක වීමට නම් ශ්‍රී ලාංකීය සමාජයට අවශ්‍ය කුමන විධියේ වැඩසටහනක්ද යන්න පිළිබඳ හොඳ යෝජනා කිහිපයක් විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මම ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. සැබෑ ලෙසම Clean Sri Lanka වැඩසටහන සාර්ථක වීමට නම් මේ කරුණු කාරණා පිළිබඳව සැලකිලිමත් වන ලෙසත් අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී මහජන දැනුවත්භාවය කියන එක ඉතාම වැදගත්. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මහජන දැනුවත්භාවය කියන කාරණය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව ඉතාම අසමත් කියන කාරණය අපට පෙන්වා දෙන්න සිද්ධ වෙනවා.

Clean Sri Lanka වැඩසටහන ගැන විශේෂයෙන්ම ඇමති මණ්ඩලය ඇතුළතත්, මන්ත්‍රී කණ්ඩායම ඇතුළතත් කිසිම අවබෝධයක් නොමැති බව අපට පෙනෙන්න තිබෙන කාරණාවක්. අමාත්‍ය මණ්ඩලයේ සිටින ඇමතිවරුන් කල්පනා කරනවා, Clean Sri Lanka කියන්නේ වැවට බැහැලා පාසි අයින් කරන එක, කානු ශුද්ධ කරන එක, වෙරළ ශුද්ධ කරන එක කියලා. අපි ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, ඔබේ Clean Sri Lanka වැඩසටහන ඒකද කියලා. ඒවා නම් නගර සභාවේ සේවක මහත්වරුන්ට වුණත් කරන්න පුළුවන් කියන කාරණය විශේෂයෙන්ම අපි මතක් කරනවා.

අනෙක් පැත්තෙන් පොලීසිය කල්පනා කරනවා, Clean Sri Lanka කියන්නේ බස්වල කැලි ගලවන එක, ත්‍රී-වීලර්වල කැලි ගලවන එක, පාරේ වෙළෙඳාම් කරන අහිංසක මිනිස්සු ඒ තැන්වලින් ඉවත් කරන එක කියලා. ඒ නිසා මේ වැඩසටහන ගැන සමාජයේ දැනුවත්භාවයේ පොඩි gap එකක් තිබෙනවා; මේ සම්බන්ධව සමාජය තුළ තිබෙන දැනුවත්භාවයේ පොඩි අඩු පාඩුවක් තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉතා ඉක්මනින්, හරියාකාරව ඒ පිළිබඳව සමාජයට දැනුවත්භාවය ලබා දෙන්න, ඒ වාගේම ආණ්ඩුව ඇතුළතත් ඒ දැනුවත්භාවය තබා ගන්න කියලා.

ඒ වාගේම, මෙවන් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන්ම මේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම අපි කරනවා. මේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුයි; කසළ නිසියාකාරව බැහැර කළ යුතුයි. ඒ වාගේම කැළි කසළ උපයෝගී කරගෙන බලශක්තිය උත්පාදනය කිරීමත් අත්‍යවශ්‍ය කාරණයක්. ඒ නිසා ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරන්න කියන ගමන්ම, විශේෂයෙන්ම අද මේ රටේ ප්‍රධානතම ආදායම් මාර්ගයක් වෙලා තිබෙන සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අපේ රටට පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් නිසි පරිදි සැපයීමේ වැඩ පිළිවෙළක් හරියාකාරව ක්‍රියාත්මක කරන්න කියාත් අපි ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පදවිය වාගේ ඈත දුෂ්කර ගම්මානවල අපේ දූවා-දරුවන් ඉන්නවා, හරියාකාරව සනීපාරක්ෂක පහසුකම් ටික සපයා ගන්න බැරිව. ඒ නිසා Clean Sri Lanka වැඩසටහන තුළින් ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ

[ගරු සුරංග රත්නායක මහතා]

අවධානය යොමු කරන්න කියන විශේෂ ඉල්ලීම අපි කරන්න කැමැතියි.

ඒ වාගේම, මේ වැඩසටහන සාර්ථක වෙන්න නම් අඛණ්ඩතාවෙන් මේ වැඩසටහන පවත්වා ගෙන යා යුතුයි. මේ වැඩසටහන සාර්ථකවීමට නම්, අඛණ්ඩතාවෙන් පවත්වා ගෙන යෑමට නම් හොඳ සැලසුමක් තිබෙන්නත් ඕනෑ; එක දිගට ගලා ගෙන යන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අද බොහෝදෙනා ප්‍රකාශ කළා, සිංගප්පූරුවේ "Clean Singapore" වැඩසටහන පිළිබඳව. හැබැයි, "Clean Singapore" වැඩසටහනින් ඉස්සෙල්ලාම තමන්ගේ පක්ෂය ශුද්ධ කිරීම තමයි පටන් ගත්තේ. අද ඔබතුමන්ලාටත් තිබෙනවා එවැනි අවස්ථාවක්. පසුගිය මහ මැතිවරණයේදී මේ රටේ ජනතාවට බොරු අධ්‍යාපන සුදුසුකම් පෙන්වලා මේ රටේ ජනතාවගෙන් බලය ගත්ත ඔබතුමන්ලාගේ පක්ෂය ඇතුළේ ඉන්න ඒ දේශපාලනඥයන්ගෙන් ඔබට මේ ශුද්ධ කිරීම පටන් ගන්න පුළුවන්. එහෙම කළොත් ඒක මේ සමාජයට විශාල ආදර්ශයක් වෙනවාය කියන කාරණයත් අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මෙවන් වැඩසටහනකට නීතිමය තත්ත්වයක් ඇති කිරීම පිළිබඳවත් ඔබතුමන්ලා සැලකිලිමත් වෙන්න ඕනෑ. මොකද, මේ වැඩ පිළිවෙළේ නීතිමය තත්ත්වය තුළ තිබෙන පරස්පරතා අපට පෙනෙනවා. ඒක නිසා ඒ නීතිමය තත්ත්වය පිළිබඳව හරියාකාරව, නිසියාකාරව අවබෝධය ලබා ගන්න කියන ඉල්ලීමත් අපි කරනවා.

ඊළඟට, නාස්තිය සහ දූෂණය ගැනත් සඳහන් කළ යුතුයි. මෙවන් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී රටේ පවතින නාස්තිය සහ දූෂණය වළක්වා, ඒ පිළිබඳව සමාජයට හොඳ මතවාදයක් ලබා දීම අත්‍යවශ්‍ය කාරණයක්. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළත්, දේශපාලන ක්ෂේත්‍රය තුළත් ඇති නාස්තිය හා දූෂණය මුලිනුපුටා දැමීම ඉතා වැදගත්. හැබැයි, එතැනදී අවවාදයට වඩා ආදර්ශය උතුම් යන තේමාව ක්‍රියාත්මක කළ යුතුයි. මොකද, මේ වනවිටත් මේ වැඩසටහනේ සමාරම්භක උත්සවයට රුපියල් ලක්ෂ 70ක මුදලක් වැය කිරීම ගැන කතිකාවක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා විනිවිදභාවයෙන් තොරව වැඩ කටයුතු කිරීම තුළින් මෙවන් වැඩසටහන් පිළිබඳව තිබෙන මහජන විශ්වාසය බිඳ වැටෙනවා කියන කාරණය අපි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම තමයි,-

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු මන්ත්‍රීතුමා, එම කාරණය මතු කළ චාමර සම්පත් මන්ත්‍රීතුමාට අපි කිව්වා, ඒ ගැන මොනවා හෝ තොරතුරු තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා. නමුත් තව වෙනකම් එවැන්නක් ඉදිරිපත් කළේ නැහැ. ඒ නිසා එතුමා ඒක පදනමක් නැතුව ඉදිරිපත් කළ කථාවක් කියන එක පෙනෙනවා. දැන් ඔබතුමා එවැනි කතිකාවක් තිබෙනවා කියලා නැවත කිව්වාට, එතැන පදනමක් නැහැ. කොහේ හරි ඒ ගැන තොරතුරු තිබෙනවා නම් ඔබතුමා පදනමක් සහිතව ඒවා ඉදිරිපත් කළා නම් හරි.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

දැනට කතිකාවක් නිර්මාණය වෙලා තිබෙනවා, මෙවන් වැඩසටහනක් -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මම ඔබතුමාට අවධාරණය කළේ මෙයයි. ඔබතුමා කතිකාවක් තිබෙනවා කියලා කොහේ හරි තිබෙන එකක් ගැන පාර්ලිමේන්තුවේ නැවත නැවත කිව්වාම සාධාරණයක් වන්න එපා යැ. එදත් කිව්වා, තිබෙනවා නම් කියන්න කියලා. අදත් ඔබතුමා කියනවා කතිකාවක් නිර්මාණය වෙලා තිබෙනවා කියලා. එහෙම තැනක් තිබෙනවා නම් කියන්න ඕනෑ. එහෙම නැතිව ඒ ගැන කථා කරන එක සාධාරණ නැහැ.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ඒ වාගේම රටේ අල්ලස් ලබා ගැනීමේ මාර්ග සියල්ල වසා දමන්න ඕනෑ. ඒ කටයුතු කරන්න කියන ඉල්ලීම අපි විශේෂයෙන්ම කරනවා. දුර්වල කළමනාකාරිත්වය - mismanagement - පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. දුර්වල කළමනාකාරිත්වය කොච්චරද කිව්වොත්, සහල් අර්බුදය විශාල දවසක් තිස්සේ ඇදිලා යනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට සහල් අර්බුදය විසඳා ගන්න නොහැකි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි පිට රටින් හාල් ගෙන්වන ටෙන්ඩරය හතර වතාවක් අසමත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට එය ක්‍රියාත්මක කර ගන්න බැරි වෙලා තිබෙනවා. පොහොර සහනාධාරය නිසි වෙලාවට ලබා දෙන්නට ඔබතුමන්ලාට -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, ටෙන්ඩරය හතර වතාවක් reject වෙලා නැහැ. අපරාදේ, ඔබතුමාගේ කාලය අඩු වෙනවා. නමුත් මට ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න වෙනවා. ඔබතුමාට මම පැහැදිලි කරන්න ඕනෑද? හතර වතාවක් ටෙන්ඩරයක් reject වෙලා නැහැ. මම තවදුරටත් පැහැදිලි කරන්නද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාටත් දැන ගන්න අවශ්‍ය නිසා මම පැහැදිලි කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සතොස ටෙන්ඩරය පළමුවැනි ටෙන්ඩරයයි. එය සහල් මෙට්‍රික් ටොන් 5,200ක් ගෙන්වීම සඳහා දාපු ටෙන්ඩරයක්. රජයේ පටිපාටිය අනුව අපි ටෙන්ඩරය දැම්මා. මෙට්‍රික් ටොන් 5,200ක් ලබා දීම සඳහා ටෙන්ඩර්කරුවන් දෙන්නෙක් ටෙන්ඩර් ඉදිරිපත් කළා. ඒ අනුව එක් අයෙක් මෙට්‍රික් ටොන් 3,750කට ටෙන්ඩරය දැම්මා. දෙවැනියා දැම්මේ මෙට්‍රික් ටොන් 1,500කටයි. රජයේ ටෙන්ඩර් පටිපාටිය අනුව මෙට්‍රික් ටොන් 5,200ක් එකවර ලබා දෙන්න ඕනෑ. ඒක නිසා දෙන්නෙකුට දෙන්න බැහැ. ඒ අනුව සැපයුම්කරුවන්ට සපයන්න බැරිව ගියා මිස ටෙන්ඩරය reject වුණේ නැහැ. සැපයුම්කරුවන් ටෙන්ඩර් පටිපාටියට අදාළව apply කරලා තිබුණේ නැහැ. ඒකයි වුණේ. දෙවැනි ටෙන්ඩරයට සැපයුම්කරුවන් ඉදිරිපත් වුණේ නැහැ. තුන්වැනි ටෙන්ඩරයට අදාළව, එය reject වුණේ එහි quality එක නිසා. එහෙම නැතුව ටෙන්ඩරය reject වුණා නොවෙයි.

**ගරු සුරංග රත්නායක මහතා**
**(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)**
(The Hon. Suranga Rathnayaka)

කොහොම වුණත්, අපි ආණ්ඩුවට යෝජනා කරන්නේ මේ දූර්වල කළමනාකාරිත්වයෙන් තොරව කටයුතු කරන්න කියලායි. මේ ආණ්ඩුව ජනතාවට විශාල බලාපොරොත්තු දීලා තමයි බලයට ඇවිල්ලා තිබෙන්නේ. මැතිවරණය වෙලාවේදී ඔබතුමන්ලා පොරොන්දු විශාල ප්‍රමාණයක් දීලා තිබෙනවා. ඒ පොරොන්දු ඉෂ්ට කරන්න කියලා අපි විශේෂයෙන් ආණ්ඩුවට යෝජනා කරන්න කැමැතියි. මොකද ඔබතුමන්ලා බලයට ආවේ මහා පරිමාණ වංචා, දූෂණවලට වග කිව යුතු අය ඉතා ඉක්මනින් නීතිය හමුවට අරගෙන එනවා කියලා; පැය 48ක් ඇතුළත මහ බැංකු හොරකමට අදාළ පුද්ගලයන්ව නීතිය හමුවට ඉදිරිපත් කරනවා කියලා. ෆයිල් 400ක් තිබෙනවා; ඒ ෆයිල් 400ට අදාළ වූදිතයන්ව නීතිය හමුවට ගෙනෙනවා කියලා. ඒවා පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ජනතාව බලාපොරොත්තු වුණේ ඒ කාරණා ඉටු වෙයි කියලා. ඔබතුමන්ලා බලයට ආවේ, "විදුලි බිල තුනෙන් එකක් අඩු කරන්න පුළුවන්. ඉන්ධනවලින් ඇමතිවරයාට කොමිස් මුදල් යනවා. ඒවා නැති කරලා ඉන්ධන ලීටරයක් රුපියල් එකසිය ගණනට අඩු කරන්න පුළුවන්" කියලා. මේවා තමයි ජනතාවට දීපු පොරොන්දු. ඒ පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ වැඩකටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
**(மாண்புமிகு தேவானந்த சுரவீர)**
(The Hon. Dewananda Suraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේග ආණ්ඩුව ඉදිරි වසර පහ ඉලක්ක කරගෙන තමයි අපේ රට ඉදිරියට මෙහෙයවන්නේ. ගෙවුණු අඳුරු කාල පරිච්ඡේදය විසින් අපේ සමාජයට, පරිසරයට, මිනිස් අධ්‍යාත්මයට කරපු දැවැන්ත අපරාධය තුළින් රට අරගෙන යමින් තිබුණේ අපේ ශිෂ්ටාචාරගත විනාශයක් සඳහායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි වටපිටාවක් ඇතුළේ තමයි ජාතික ජන බලවේගය විසින් ඒ ශිෂ්ටාචාර විනාශකාරී ගමන නතර කරන්න සැප්තැම්බර් 21 සහ නොවැම්බර් 14 මේ රට භාර ගත්තේ.

එදා මෙදාතුර රටක් විධියට, රටේ ජනතාව විධියට අපි ඉදිරියට යන්නේ කොහොමද, ඒ සඳහා රට ගොඩනැඟිය යුතු දිසාව කුමක්ද කියන එක පිළිබඳව ජාතික ජන බලවේගය විධියට අපට අදහසක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ ඉදිරි වසර 5 ඉලක්ක කරගෙන සැලසුම් සහගත ලෙස ගොඩ නඟලා තිබෙන Clean Sri Lanka ව්‍යාපෘතිය පිළිබඳව අද උදේ ඉඳලා මේ සභාව ඇතුළේ අපි සාකච්ඡා කරනවා. අද උදේ ඉඳලා මේ සභාව ඇතුළේ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළත්, මොකක්දෝ අවාසනාවකට විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට ඒක තේරෙන්නේ නැහැ. විශේෂයෙන්ම ශිෂ්ටසම්පන්න සමාජයක් ගොඩනඟන්න අපි යෝජනා කරනවා. හැබැයි, ශිෂ්ටසම්පන්න සමාජයක් ගොඩනඟන්න අපි යෝජනා කරනකොට, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒක තේරෙන්නේ නැහැ. අද විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු තමයි ශිෂ්ටාචාරගත විනාශයක් සඳහා මේ රට අරගෙන ගියේ. අපේ රටට කරපු හානිය, අපේ රටේ පරිසරයට කරපු හානිය, අපේ රටේ මිනිසුන්ට කරපු හානිය, අපේ රටේ මිනිස් සම්බන්ධතාවලට කරපු හානිය පිළිබඳව නොතේරෙන තොත්ත බබාලාට ජාතික ජන බලවේගය Clean Sri Lanka වැඩ පිළිවෙළ පිළිබඳව උදේ ඉඳලා පැහැදිලි කර දෙනවා, නමුත් තවමත් ඒක ඔවුන්ට තේරුම් ගන්න බැරිව ඉන්නවා. ඒ නිසා විවිධ මතවාද, විවිධ අවලාද අද ජාතික ජන බලවේගය සම්බන්ධයෙන් ගොඩ නඟනවා; ජාතික ජන බලවේගයට එරෙහිව ගොඩ නඟනවා. ජාතික ජන බලවේගය කියන්නේ මේ රටේ බලයට පත් වූ මොහොතේ සිටත්, බලය ලබා ගැනීමට පෙරත් මේ රටට ආදර්ශ සපයපු, පරමාදර්ශ සපයපු ව්‍යාපාරයක්. විශේෂයෙන්ම ඉතිහාසය පුරා; වසර 76ක් පුරා අපේ රට වට්ටමින් දැවැන්ත විධියට මේ රට විනාශ කරපු බලවේග අද විවිධ කවි කතන්දර කියමින් ජාතික ජන බලවේගයට ඇඟිල්ල දිගු කරනවා. මේ රට දැන් ශිෂ්ටසම්පන්න සමාජයක් කරා යමින් තිබෙනවා කියලා ඒ ගොල්ලන්ට දැන් හොඳටම දැනෙමින් පවතිනවා. පරණ කියමනක් තිබෙනවා නේ, "ගලිවර්ලා නැඟිටිනකොට ලිලිපුට්ටො බයේ වෙවුලනවා" කියලා. මේ රට විනාශ කරපු, අපේ රටේ ජනතාවගේ රිරි මාංශ උරාබීපු, මේ රට ගඳ ගහන කුණු තුවාලයක් බවට පත් කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු අද ලාම්පු තෙල් වැදිච්ච ගැරඬි වාගේ දඟලන්න පටන් අරගෙන තිබෙනවා. ඒක තමයි මෙතැන තිබෙන ඇත්ත කතන්දරය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාතික ජන බලවේගයේ අපට මේ රට ගොඩනැඟීම පිළිබඳව මධ්‍යගත සැලැස්මක් තිබෙනවා. ඒ නිසා Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ තිබෙන්නේ විශේෂයෙන්ම අපේ රටේ භෞතික සංවර්ධනය වාගේම අධ්‍යාත්මික සංවර්ධනයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපේ රටේ ජනතාවගේ මිනිස් අධ්‍යාත්මයට කරපු බලපෑම, පරිසරයට සහ ශරීරයට කරපු බලපෑමට එහා ගිය බලපෑමක්. අද දවසේ අපි මේ රට ඉදිරියට අරගෙන යන්න, මේ රට ගොඩ නඟන්න යෝජනා ඉදිරිපත් කරනකොට, ඒ යෝජනාවලට උදව් කරනවා වෙනුවට, රට ගොඩ නඟන්න උදව් කරනවා වෙනුවට අද විපක්ෂය කලබල වෙලා දඟලනවා. අද විපක්ෂය කලබල වෙලා තමයි මේ දඟලන්නේ. නොයෙක් අවලාද, මඩවලින් දමා ගසන තත්ත්වයක් තිබෙන්නේ. ජාතික ජන බලවේගයේ අපි බොහොම පැහැදිලි ලෙස මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. ඒගොල්ලන් ගොඩනඟපු මේ රටේ දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න වත්මන් ජනාධිපතිතුමාගේ දිවුරුම් දීමේ උත්සවයේ සිට මේ වනතෙක්ම අපි පියවර අරගෙන තිබෙනවා.

පළමුවෙන්ම අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ කාරණය කියන්න ඕනෑ. වත්මන් ජනාධිපතිතුමා දිවුරුම් දුන්නා. ඒකට කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වියදම් කළේ නැහැ. දැවැන්ත උත්සව ගත්තේ නැහැ. එතුමා සරලව ඒක කළා. ජාතික ජන බලවේගයේ අපේක්ෂකයින් 159දෙනෙක් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු ලෙස තේරී පත් වුණා. හැබැයි, ජාතික ජන බලවේගයේ ඇමතිවරු දිවුරුම් දෙනකොට දැවැන්ත මුදල් විනාශ කිරීමක් කළේ නැහැ; රටේ ජනතාවගේ බදු මුදල් විනාශ කළේ නැහැ. සරලව ඒක සිදු කළා. ඒ වාගේම තමයි, Clean Sri Lanka වැඩ පිළිවෙළ. ඒ ගැන නැවත නැවත කියද්දී බිහිරන්ට කියනවා වාගේ හයියෙන් කියන්න වෙනවා. බිහිරන්ට ඇහෙන්න නම් හයියෙන් කියන්න වෙනවා. මෙච්චර කියලා තිබියදීත් තවම මඩ අවලාදවලින් ගහනවා. අපට Clean Sri Lanka ව්‍යාපෘතියට වියදම් ලෙස ලක්ෂ 70ක් ගියා ලු. කවුද මේක කියන්නේ? චාමර සම්පත් කියන මන්ත්‍රීවරයා තමයි මේ චෝදනාව කළේ. ඔහු ඒ චෝදනාව කරනකොට අපට අභියෝගයක් කළා. ඔහු කියා සිටියා, "Clean Sri Lanka ව්‍යාපෘතියට ලක්ෂ 70ක් වියදම් කළා; ඒක එසේ නොවුණොත් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙනවා" කියලා. චාමර සම්පත් හිටපු රාජ්‍ය ඇමතිවරයා පට්ටපල් බොරුවක් කිව්වා අද වන විට රජයෙන් කියලා තිබෙනවා, අපට ඒ

[ගරු දේවානන්ද සුරවීර මහතා]

වෙනුවෙන් වියදම් වෙලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 9යි කියලා. එහෙම නම් ඒ මන්ත්‍රීවරයා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙන්න ඕනෑ. ඔහු සදාචාරසම්පන්න මන්ත්‍රීවරයෙක් නම්, ඔහු තම මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්විය යුතු තැනට අද පත්වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ අපට Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ දැවැන්ත වැඩ කොටසක් කරන්න තිබෙනවා. විනාශ කරපු රටක්; වට්ටපු රටක් මේක. මේ රට ඇතුළේ ඉන්න මිනිසුන්ගේ මිනිස් සන්තාන දූෂණය කරලා තිබෙන්නේ. එකිනෙකාට එරෙහිව මේ පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් වාද විවාද කරලා තිබෙනවා. ඉතිහාසයේ අපේ රටට කරපු අපරාධ ගැන මේ පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් කථා කරලා තිබෙනවා. හැබැයි, අද අපිට උපදෙස් දෙන විපක්ෂයේ මන්ත්‍රීවරු මේ රටට කරලා තිබෙන හානිය පිළිබඳව අපට අදහසක් තිබෙනවා.

Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ එක පැත්තකින් අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ජනතාවට එරෙහිව කරන අපරාධ නතර කරන්න. අද තමන්ගේ පෞද්ගලික ලාභය වෙනුවෙන් ඇන්ටිජන් කට්ටල ගෙනැල්ලා, ඒවා හොරට විකුණලා, වැඩි මුදලට විකුණලා ලාභ ගන්න පුළුවන් නම්, මම කියන්නේ ඒ මනෝභාවයම අපි වෙනස් කරන්න ඕනෑය කියලායි. මොකද, ඒක Clean Sri Lanka නොවෙයි. තව කෙනෙකුට වස පොවන එක, අඩුවට භාණ්ඩයක් ගෙනැත් වැඩි මුදලට විකුණන එක clean වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපේ රටේ දැවැන්ත මත් ද්‍රව්‍ය උවදුරක් තිබෙනවා. අපේ රටේ තරුණයා විතරක් නොවෙයි, වැඩිහිටියා, පාසල් ළමුන් මේ මත් ද්‍රව්‍ය උවදුරේ ගොදුරක් බවට පත් කරලා තිබෙනවා. ඒ මොකක් සඳහාද? ලාභය සඳහා; නැවත නැවත ලාභය සඳහා. කවුද මේවා පිටුපස ඉන්නේ? දැවැන්ත ජුණ්ටාවක් ඉන්නවා. එහෙනම් ඒක clean කරගන්න ඕනෑ. මේ රට ඉදිරියට අරගෙන යන්න, මේ රට ගොඩනඟන්න අපේ රටේ ජීවනාලිය බඳු තරුණයන්ට වස පොවන්න පුළුවන් මනසක් තිබෙන මිනිහෙක් ගොඩනඟලා තිබෙනවා, ඉතිහාසය ඇතුළේ. ඒ ඉතිහාසය ඇතුළේ ගොඩනැඟුණු මිනිහෙක් අද අපට උපදෙස් දෙනවා. මිනිස්සුන්ගේ ආහාරවලට වස එකතු කරලා ලාභ උපයන මිනිහෙක් ඒ ඉතිහාසය හදලා තිබෙනවා. තරුණයාට මත් ද්‍රව්‍ය පොවලා ලාභ උපයන වෙළෙන්දෙක් ඒ ඉතිහාසය හදලා තිබෙනවා. අවාසනාවකට, පාර්ලිමේන්තුව ඇතුළේත් මේ රටට විස කවන මන්ත්‍රීවරු තවම ඉන්නවා. ඉතිහාසය තුළ අපේ රට ලබපු මොකක් හෝ නමක් තිබුණා නම්, අපේ රටට යම් අභිමානයක් තිබුණා නම් ඒ සියල්ල සුන්නද්දූලි කරලා මේ ඉතිහාසගත පාලකයන් විසින් කරන්න පුළුවන් සකලවිධ අනතුරු මේ වෙනකොට ඇති කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ අපට ඕනෑකමක් තිබෙනවා, අරමුණක් තිබෙනවා, ලෝකය ඉදිරියේ දියුණු රාජ්‍යයක් බවට, ආසියාවේ යෝධයෙක් බවට මේ රට පත් කිරීමට. Clean Sri Lanka වැඩ පිළිවෙළ එක කාල වකවානුවකට - දවසකට, දෙකකට, මාසයකට, අවුරුද්දකට - හදපු එකක් නොවෙයි. මේක දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්. මේක රට ගඩොලින් ගඩොල, ගඩොලින් ගඩොල ගොඩනඟන වැඩ පිළිවෙළක්. Clean Sri Lanka කියන්නේ විනාශ කරපු මේ රට නැවත ගොඩනඟන වැඩ පිළිවෙළක්. දූෂිත මනස වෙනස් කර නිසි පරිදි නැවත ගොඩනඟන වැඩ පිළිවෙළ තමයි, මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ තිබෙන්නේ.

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම මේ වෙනකොට මේ වැඩසටහනේ සාර්ථකත්වය විඳදරාගන්න බැරිව දඟලන මන්ත්‍රීවරුන්ට මම කියනවා, ඔබතුමන්ලා ඕනෑතරම් දඟලන්න, ඔබතුමන්ලා ඕනෑතරම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය කොච්චර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ජාතික ජන බලවේගයේ අපි මේ ගමන යන්න ලෑස්තියි කියලා.

ඉතිහාසයේ එක වෙලාවක වින්ස්ටන් චර්චිල් කියන අගමැතිවරයා ප්‍රකාශයක් කරලා තිබුණා මට මතකයි. "අපි ගමනක් යන්න පටන් ගන්නකොට බල්ලෝ බුරන්න ගන්නවා, ඒක තමයි ස්වභාවය. බල්ලෝ බුරනවා, විවිධ වර්ගයේ බල්ලෝ බුරන්න ගන්නවා, හැබැයි අපි ගල් ගහන්නේ නැහැ, ගල් ගැසිය යුතුත් නැහැ, ඒ බුරන හැම බල්ලෙකුටම අපි ගල් ගහන්න ඕනෑ නැහැ" කියලා එතුමා පවසා තිබුණා. හැබැයි බුරන බල්ලන්ගෙන් ගහන්න ඕනෑ බල්ලා පිළිබඳවත් ජාතික ජන බලවේගයේ අපට අදහසක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ජාතික ජන බලවේගයට ඇති පදම් මඩවලින් දමා ගහන්න. සුභාෂිතයේ කවියක් තිබෙනවා නේ, "දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ - සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ" කියලා. ඔව්, අපි කියනවා, ජාතික ජන බලවේගය මේ ශිෂ්ටාචාරගත විනාශය නතර කරලා, අපේ රට ශිෂ්ට සම්පන්න සමාජයකට අරගෙන යන්න පළමුවැනි පියවර තබා තිබෙනවා කියලා. මොනතරම් මඩ ගැහුවත්, අවලාද නැඟුවත්, සඳුන් ගහක් කපන්න-කපන්න, කපන්න-කපන්න සුවඳ විහිදෙනවා වාගේ අපේ රටේ අපට ඡන්දය දුන් නොදුන් මිනිස්සුන්ගේ, ජාත්‍යන්තරයේ රාජ්‍ය තාන්ත්‍රික විශ්වාසය දිනාගෙන ජාතික ජන බලවේගයේ අපි මේ රට ගොඩනඟනවා, මේ රට ගොඩනඟන කාර්යභාරය අපට තිබෙනවා, අපි ආපහු හැරෙන්නේ නැහැ කියන පණිවුඩය දෙමින්, කථා කරන්න මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.38]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற Clean Sri Lanka வேலைத்திட்டம் சம்பந்தமான ஒத்திவைப்பு வேளைப் பிரேரணைமீதான விவாதத்தில் கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். விசேடமாக, Clean Sri Lanka திட்டத்தினூடாக இந்த நாட்டைச் சிறப்பாக்குவதற்காக முன்னெடுக்கப்படுகின்ற அனைத்து நடவடிக்கைகளுக்கும் எங்களாலான அனைத்து ஒத்துழைப்புகளையும் வழங்குவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்.

இன்று Clean Sri Lanka திட்டத்தின் அடிப்படையில், பெரிய நீலாவணையில் அமைக்கப்பட்டுள்ள மதுபானசாலையை அகற்றுமாறு கோரி, கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்கு முன்பாக 500க்கும் மேற்பட்ட பொதுமக்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருக்கிறார்கள். அந்த இடத்தில் மதுபானசாலை திறக்கப்படுமாக இருந்தால், அங்குள்ள பாடசாலை மாணவர்களும் அன்றாடம் கூலிவேலை செய்கின்ற வர்க்கத்தினரும் மிகவும் பாதிப்புக்குள்ளாகக்கூடிய சூழ்நிலை ஏற்படுவதற்கு வாய்ப்புள்ளது. மூன்று மாதங்களுக்கு முன்னர், அங்கு அந்த மதுபானசாலை திறக்கப்பட்டிருந்தது. மக்களின் எதிர்ப்பு காரணமாக அது மூடப்பட்டது. தற்பொழுது, அதனை மீண்டும் திறப்பதற்கான முன்னேற்பாடுகளை Kegalle Beverages Company Limited செய்துகொண்டு இருக்கின்றது. அதற்கு எதிராகவே அம்மக்கள் இன்று ஆர்ப்பாட்டம் செய்துகொண்டு இருக்கின்றார்கள். அந்த மக்களுக்குரிய ஒத்துழைப்பை இந்த அரசாங்கம் வழங்க வேண்டும்.

ஏனென்றால், "புதிதாக வழங்கப்பட்டுள்ள மதுபானசாலை அனுமதிப் பத்திரங்களை இரத்துச் செய்வோம், மதுபானசாலைகளை ஒழிப்போம்" என்று சொல்லித்தான் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தது. பாராளுமன்றத் தேர்தல் நடைபெற்று, இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னரே, இந்த மதுபானசாலையை அந்த இடத்தில் மீளத் திறப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்பட்டு வருகின்றது. இதனைத் தடுத்து நிறுத்தவேண்டிய கடமைப்பாடு எமக்கு இருக்கின்றது. ஏனென்றால், இது மக்களின் பொருளாதாரத்தில் பெரும் தாக்கத்தை ஏற்படுத்துவதோடு, மாணவர்களிடத்திலும் அன்றாடம் கூலித் தொழில் செய்பவர்களிடத்திலும் பாதிப்பை ஏற்படுத்தும். எனவே, நீங்கள் நிச்சயமாக இந்த மதுபானசாலையை ஒழிக்க வேண்டும். தென்பகுதியில் இருக்கின்ற மதுபானசாலை உரிமைப்பத்திரம் உடையவர்கள் கல்முனைப் பிரதேசத்தில் அந்த மதுபானசாலையைத் திறப்பதற்கான திட்டங்களை வகுத்துக்கொண்டு இருக்கின்றார்கள். நீங்கள் இதனைக் கருத்திற்கொண்டு, உரிய நடவடிக்கை எடுக்க வேண்டும். குறிப்பாக, அந்த மதுபானசாலையை பெரிய நீலாவணைப் பிரதேசத்திலிருந்து அகற்றுவதற்கான சகல நடவடிக்கைகளையும் எடுக்க வேண்டும்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව මම මේ කාරණය ගැන පැහැදිලි කරන්නම්. ඒ සඳහා එතුමාගේ කාලය ගන්නේ නැතුව අපේ ආණ්ඩු පක්ෂයෙන් විනාඩියක් ගන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව කිසිම මත්පැන් බලපත්‍රයක් අලුතින් ලබා දී නැහැ. දෙවැනි කාරණය මෙයයි. ඔය ලබා දී තිබෙන බලපත්‍ර අතරින් බොහොමයක්, මන්ත්‍රීවරු මිලදී ගැනීම සඳහා විශේෂයෙන්ම හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අවසාන මාස ගණනාව තුළදී ලබා දුන්නු බලපත්‍ර. ඒවා තමයි ඔතැනින් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ. ඔක්කොම නොවෙයි, වැඩි ප්‍රමාණයක් තිබුණේ එහෙම ඒවා. අපි ඒ පිළිබඳ විස්තර හැන්සාඩ්ගත කර තිබෙනවා.

තුන්වැනි කාරණය මෙයයි, ගරු මන්ත්‍රීතුමනි. බලපත්‍රයක් නීත්‍යනුකූලව ලබා දුන්නාට පසුව ඒක නීතිමය ලියවිල්ලක්. අපි දේශපාලන වශයෙන් ඒකට අකැමැති වුණාට ඒක අහෝසි කිරීම කියන්නේ, නීතිමය කටයුත්තක්. ඒ නිසා ආණ්ඩුවකට ඒක බලහත්කාරයෙන් වහන්න බැහැ. හැබැයි, ඒ වෙනුවෙන් ඔබතුමාට කළ හැකි පරිපාලනමය පියවර තිබෙනවා. මට ඒ ගැන මෙතැනදී පැහැදිලි කරන්න අමාරුයි. ඔබතුමා මට මුණ ගැහුණොත්, මේ කටයුත්ත නතර කිරීම සඳහා පරිපාලනමය වශයෙන්, සමාජයීය වශයෙන් කරන්න ඕනෑ දේවල් පිළිබඳව මා දන්නා ප්‍රමාණයෙන් ඔබතුමාට කියන්න පුළුවන්. අපි රටක් වශයෙන් මේ clean කරන්න හදන්නේ පරණ කුණු කන්දල්. මේවා තමයි කරපු විනාශ. අපි ආණ්ඩුවක් වශයෙන් කිසිසේත්ම අලුතින් මත්පැන් බලපත්‍ර ලබා දෙන්නේ නැති වුණත්, නීත්‍යනුකූලව ලබා දුන්නු ඒවා බලහත්කාරයෙන් නතර කරන්න ගියොත් එතැනදී නීතිමය ගැටලුවක් පැනනඟිනවා. හැබැයි, පරිපාලනමය වශයෙන් සහ සමාජයීය වශයෙන් කළ හැකි යම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයෙන් මේ කාලය අඩු කරන්න. බොහොම ස්තුතියි.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

அந்த மதுபானசாலையைத் திறப்பதனால் அந்தப் பிரதேசத்து மக்கள் மிகவும் பாதிப்புக்கு உள்ளாகுவார்கள்; பொருளாதார ரீதியான அழிவுகளைச் சந்திக்க நேரிடுவார்கள். அதுமாத்திரமன்றி, மாணவர்களும் பாதிப்படைவார்கள். ஆகவே, நீங்கள் இதனைச் சட்டத்துக்கு உட்பட்ட வகையில், மாண்புமிகு சனாதிபதிக்கு இருக்கின்ற அதிகாரத்தைக்கொண்டு தடுத்து நிறுத்த வேண்டும். இந்த மதுபானசாலைக்கான உரிமப் பத்திரம் சட்டரீதியாக வழங்கப்பட்டிருப்பதால், அதனை இலகுவாக இரத்துச் செய்ய முடியாது என்கிறீர்கள். கடந்த ஆட்சிக் காலத்தில் செய்யப்பட்ட தவறுகளை நிவர்த்தி செய்வதற்காகத்தான் மக்கள் உங்களுக்கு ஆணை வழங்கியிருக்கிறார்கள்; பாராளுமன்றத்தில் 159 உறுப்பினர்களைத் தந்திருக்கிறார்கள். எனவே, நீங்கள் இப்படியான இடங்களில் இருக்கின்ற மதுபானசாலைகளை அகற்றுவதற்கான முழு முயற்சியையும் மேற்கொள்ள வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, தனிப்பட்ட முறையில் சந்திக்குமாறு நீங்கள் சொன்னீர்கள். நிச்சயமாக நான் உங்களைச் சந்திப்பேன். அந்த மதுபானசாலையை அகற்றுவதற்கு நிர்வாக மற்றும் சமூக ரீதியாக முன்னெடுக்கவேண்டிய விடயங்களை நீங்கள் என்னிடம் தெளிவுபடுத்தினால், நிச்சயமாக நான் என்னுடைய மக்களோடு சேர்ந்து உரிய நடவடிக்கை எடுப்பேன். அந்த மக்கள் கடந்த பொதுத் தேர்தலில் உங்களுடைய கட்சியினருக்குத்தான் கூடுதலான வாக்குகளை அளித்தார்கள். எனினும், இன்று அவர்கள் ஏமாற்றத்துடன் இருக்கின்றார்கள். இதனைக் கருத்திற்கொண்டு, அந்த மதுபானசாலையைத் திறப்பதைத் தடுத்து நிறுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

அடுத்து, ஆலையடிவேம்பு பிரதேசத்தில் இருக்கின்ற பலநோக்குக் கூட்டுறவுச் சங்கத்துக்கு - co-operative society - சொந்தமான இரண்டு காணிகளையும் 100x40 பரப்பளவுடைய இரண்டு கட்டிடங்களையும் இயக்குநர் சபையினதும் பொதுச் சபையினதும் அனுமதியில்லாமல், 2020ஆம் ஆண்டு சின்ன முகத்துவாரத்தில் இருக்கின்ற இலங்கைத் தரைப்படை - Sri Lanka Army - வலுக்கட்டாயமாக அபகரித்திருக்கிறது. 1969ஆம் ஆண்டிலிருந்து அவற்றைப் பலநோக்குக் கூட்டுறவுச் சங்கத்தினர் பராமரித்து வந்திருக்கிறார்கள். அதற்காக அவர்கள் கூட்ட தீர்மானத்தினூடாக இலட்சக் கணக்கான ரூபாய்களைச் செலவுசெய்தும் இருக்கிறார்கள்.

அதேபோல், அவர்கள் 1991ஆம் ஆண்டு அதற்கான இயந்திர உபகரணங்களை - நெல் சுத்திகரிப்பதற்கான, கொள்வனவு செய்வதற்கான உபகரணங்களை - அதில் அமைத்திருந்தார்கள். அவற்றை எல்லாம் இல்லாமல் செய்துவிட்டு, ஏற்றுக்கொள்ள முடியாத வகையில், அந்தக் காணியை அபகரித்திருப்பது உண்மையிலேயே கவலைக்குரிய விடயமாக இருக்கின்றது. அந்தக் காணியானது, ஆலையடிவேம்பிலுள்ள பொது மக்களுக்குரிய சொத்தாகும்; அவர்களுடைய சந்தாப் பணத்திலிருந்து வந்த சொத்தாகும்; co-operative societyக்குரிய சொத்தாகும். அதுமட்டுமல்ல, அரசாங்க அதிபர், பிரதேச செயலாளர், கூட்டுறவு அபிவிருத்தி ஆணையாளரின் அனுமதியோடு, அவர்கள் நெல்லைக் கொள்வனவு செய்து, கட்டுப்பாட்டு விலையில் அரிசியை பொது மக்களுக்கு விநியோகித்தும் வந்தார்கள். ஆனால், 2023ஆம் ஆண்டு இராணுவத்தினர் அவற்றை வலுக்கட்டாயமாக எடுத்திருக்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Sir, please give me one more minute.

2010ஆம் ஆண்டு தரைப்படையின் தலைமை அலுவலகமானது, co-operative societyக்குரிய அந்தக் காணியைக் கொடுக்கும்படி இராணுவ தலைமையகத்துக்கு அறிவித்திருந்தது. பாதுகாப்பு அமைச்சின் செயலாளர் அந்த அறிவுறுத்தலை விடுத்திருந்தார். இராணுவ கட்டளைத் தளபதிகூட, அந்தக் காணியை co-operative societyக்குத் திருப்பி வழங்கியிருந்தார். இவ்வாறான நிலையில், மீண்டும் 2023ஆம் ஆண்டு அதனைப் பெற்றுக்கொள்கின்றார்கள். இலட்சக் கணக்கான ரூபாய் செலவழித்து, அவர்கள் அந்த நிலையத்தை உருவாக்கியிருந்தார்கள். தயவுசெய்து, நீங்கள் இதனைக் கருத்திற்கொள்ள வேண்டும். ஆலையடிவேம்பு பிரதேச மக்களுக்குரிய அந்த சொத்தைக் கொடுங்கள்! ஏனென்றால், அதில் 50க்கும் மேற்பட்டவர்கள் தொழில்வாய்ப்பைப் பெற்றிருந்தார்கள். இன்று அவர்கள் எல்லோரும் அவற்றை இழந்த நிலையில் இருக்கின்றார்கள். அவர்களுக்கான தொழில்வாய்ப்பை மீண்டும் வழங்க வேண்டும். இந்த நாட்டிலுள்ள விவசாயிகளையும் நெல் உற்பத்தியையும் பாதுகாக்க வேண்டுமென நீங்கள் சொல்கின்றீர்கள். தயவுசெய்து, இவற்றைக் கருத்திலெடுத்துச் செயற்பட வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අදහස් දැක්වූ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කර සිටියා, මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව. ආණ්ඩු පක්ෂයේ අපේ සහෝදර මන්ත්‍රීවරු මේ ගැන කොතරම් පැහැදිලි කළත් එතුමන්ලාට මේ පිළිබඳව අදහසක් නැති ආකාරයට තමයි -සුළු වශයෙන් සාධනීය විවේචන කිහිපයකට අමතරව- දිගින් දිගටම අදහස් ප්‍රකාශ කළේ. ඒ හින්දා අපි මේ රට භාර ගත්තේ මොන වාගේ පසුබිමක සිටද කියන එක පිළිබඳවත් අදහසක් ඇතිව මගේ අදහස් ඉදිරිපත් කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ඔබතුමන්ලා දන්නවා, අපි මේ රට භාර ගන්න විට එක පැත්තකින් මේ රටේ තිබුණේ බංකොලොත් ආර්ථිකයක් බව. අනෙක් පැත්තෙන් තිබුණේ සදාචාරාත්මක වශයෙන් පරිහානියක්; පාරිසරික වශයෙන් පරිහානියක්; සමාජයීය වශයෙන් පරිහානියක්; අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය රැකවරණය බිඳ දමා බාල බෙහෙත් ගෙනැත් දීලා ඔවුන් මරණයට පත් කිරීම දක්වා ක්‍රියාත්මක වුණු තත්ත්වයක් තිබුණා. අධ්‍යාපනය බිඳ වට්ටලා දරුවන් පාසල්වලින් ඉවත් කිරීම දක්වා මේ තත්ත්වය පරිවර්තනය වෙලා තිබුණා. ඒ විතරක් නොවෙයි. ආර්ථික බංකොලොත්භාවය නිසා මිනිස්සු සමහර වෙලාවට සිය දිවි හානි කරගත් තත්ත්වයක් දක්නට තිබුණා. මේ රට සදාචාරාත්මක වශයෙන් පිරිහිලා තිබුණා; අපරාධකරුවන්ගේ දේශයක් බවට පත් වෙලා තිබුණා. කාලයේ වැලි තලාවෙන් යට වෙලා ගිය අපරාධ මේ භූමිය තුළ ඇති තරම් සිද්ධ වෙලා තිබුණා. එවැනි පරිසරයක් තුළ තමයි අපි මේ රට භාර ගත්තේ. ඒ පරිසරය -ඒ වටපිටාව- පිළිබඳව කිසිදු හැඟීමක්, දැනීමක් නැතිව තමයි බොහෝ අය මේ සභාවේදී අද කරුණු කාරණා ඉදිරිපත් කළේ. ඒ හින්දා අපි පළමුවෙන්ම ඔබතුමන්ලාට, මේ රටට කියන්න අවශ්‍යයි, අපි භාර ගත්ත මේ රට මොන ආකාරයේ රටක්ද, ඒ රට තමයි අපි මේ ක්‍රම ක්‍රමයෙන් යථාවත් කරමින් ඉන්නේ කියන එක.

ඔබතුමන්ලා දන්නවා, Clean Sri Lanka වැඩසටහන අපේ ආණ්ඩුවේ -අපේ රජයේ- ප්‍රධාන වැඩසටහනක් බව. මේ වැඩසටහන ගැන බොහෝදෙනා පරිසරය පිරිසිදු කිරීමය, වැව පිරිසිදු කිරීමය, පොලීසිය විසින් මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගයි කියමින්, එවැනි දේවල්වලට ලඝු කරමින් කථා කළා. ඇත්ත වශයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කළා. ආර්ථික හා භෞතික සංවර්ධනයෙන් ඔබ්බට ගිහිල්ලා මේ රටේ ජන ජීවිත සුරක්ෂිත කිරීම සඳහා සමාජයීය වශයෙනුත්, ආචාරධාර්මික වශයෙනුත්, පාරිසරික වශයෙනුත් නව වෙනස්කම් ඇති කරමින් ශ්‍රී ලාංකීය සමාජ ප්‍රතිබිම්බයක්, එහෙම නැත්නම් ශ්‍රී ලාංකීය අනන්‍යතාවට නව සන්නාමයක් එකතු කිරීම සඳහා වූ සමස්ත වැඩ පිළිවෙළක් තමයි මේ Clean Sri Lanka වැඩසටහන යටතේ අපි ඉදිරිපත් කර තිබෙන්නේ. මේ සඳහා සියලු අමාත්‍යාංශ දායක වෙනවා; ආයතන දායක වෙනවා. ප්‍රජා සංවිධාන, පෞද්ගලික අංශ, ව්‍යාපාරිකයන්, වෘත්තිකයන් වාගේම ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය

නොවන සංවිධාන, පොදු ජනතාව ඇතුළු සියලු පාර්ශ්වවල එකඟත්වය සහිතව සියලුදෙනා සහභාගිත්වයෙන් සිද්ධ වෙන වැඩසටහනක් හැටියට තමයි Clean Sri Lanka වැඩසටහන අපි ඉදිරිපත් කර තිබෙන්නේ. පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් අත්කර ගැනීම සඳහා සියලු ක්ෂේත්‍රවල සිදු කරනු ලබන පුළුල් පරිවර්තනීය ක්‍රියාවලියක් තමයි Clean Sri Lanka කියන්නේ.

පොඩි පොඩි කාරණාවලට ලඝු කරලා මේකේ වටිනාකම හීන කරන්න සමහර මන්ත්‍රීවරු අදහස් දැක්වූවා. හැබැයි, මේ වැඩසටහන, සමස්ත සමාජ ක්‍රියාවලිය, හැම සමාජ තීරුවකම පරිවර්තන ක්‍රියාවලියක් හැටියටයි හඳුනා ගන්නේ. අතිගරු ජනාධිපතිතුමා Clean Sri Lanka වැඩසටහන ඉදිරිපත් කරන අවස්ථාවේ මේ සමාජයට අවධාරණය කළා සේම, වැඩ පිළිවෙළක්, සැලැස්මක්, දැක්මක්, මාර්ග සිතියමක් සහිතව තමයි මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා කිසිවෙකුටත් කියන්න බැහැ මේකට වැඩ පිළිවෙළක් නැහැ, සැලැස්මක් නැහැ, දැක්මක් නැහැ කියලා. ඒ පිළිබඳ අනවබෝධයෙන් කටයුතු කිරීම නිසා තමයි එවැනි ප්‍රකාශ මේ සභාවට ඉදිරිපත් කළේ.

මහජන ආරක්ෂක ඇමතිවරයා හැටියට මම පිළිතුරු දිය යුතු කාරණා රාශියක් මේ විවාදය තුළ මතු වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ රටේ අල්ලස, දූෂණය, වංචාව, මැරකම්, හොරකම්, මත්ද්‍රව්‍ය, පාතාල ක්‍රියාකාරකම් ගැන අදහස් බොහොමයක් මේ සභාවට ඉදිරිපත් වුණා. ඇත්ත වශයෙන්ම කියන්න සතුටුයි මේ වෙනකොට පොලීසිය ඒ සම්බන්ධයෙන් යම් සාධනීය මැදිහත්වීමක් කරමින් ඉන්න බව. අපි මේ වෙනකොට පොලීසිය දේශපාලනීකරණයෙන් මුදා හැර තිබෙනවා, ඔවුන්ගේ හැකියාව, දක්ෂතාව, මැදිහත්වීම සහ නීති රීති පදනම් කරගෙන තීන්දු තීරණ ගන්න. එහෙම වැඩ පිළිවෙළක් අපි හදලා තිබෙනවා පොලීසිය වෙනුවෙන්. පොලීසිය මේ මාස දෙක තුන ඇතුළත ඒ අනුව ක්‍රියාත්මක වෙලා සුවිශේෂී කාර්යයක් ඉෂ්ට කරලා තිබෙනවා. එසේ තිබියදීත් සමහර මන්ත්‍රීවරු, විශේෂයෙන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා වාහනවල අනවශ්‍ය කොටස් ගලවන එක මුදලක් දුන්නාම නතර කර ගන්න පුළුවන් වාගේ අදහසක් මේ සභාවට ඒත්තු ගන්වන්න ක්‍රියා කළා. පොලීසිය හෝ රජයේ කිසිදු ආයතනයක් හෝ මේ රජය Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ නැහැ මහ ජනයාගේ අනුදැනුමකින් තොරව. අපි මේ රටේ ජනයාට වාගේම මේ සභාවට අවධාරණය කරන්න කැමැතියි මේ රජයේ සියලු ක්‍රියාකාරකම් සිද්ධ වෙන්නේ ජනයාගේ එකඟත්වය, මැදිහත්වීම සහ සහභාගිත්වය සහිතව කියලා. එක එක මන්ත්‍රීවරු ලඝු කරන්න හදන ආකාරයට එක එක ක්‍රියාවලි, activities පමණක් නොවෙයි Clean Sri Lanka කියන්නේ. සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රයේ නව සාධනීය පරිවර්තනයක් වෙනුවෙන් තමයි මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙන්නේ, ජාතික ජන බලවේගයේ ප්‍රධාන වැඩ පිළිවෙළක් හැටියට. ඒ හින්දා මම නැවතත් අවධාරණය කරන්න කැමැතියි සැලැස්මක්, දැක්මක්, වැඩ පිළිවෙළක්, මාර්ග සිතියමක් සහිතවයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතින්නේ කියලා.

මම විශේෂයෙන් මේ වෙලාවේ අවධාරණය කරන්න කැමැතියි, පොලීසිය ගත්ත යම් යම් ක්‍රියාමාර්ග නිසා පසුගිය දවස් කිහිපය තුළ මාර්ග අනතුරු යම් ප්‍රමාණයකින් පහළ බැහැලා තිබුණු බව. සමහර දවස්වල මාර්ග අනතුරු හේතුවෙන් හයදෙනකු, හත්දෙනකු, අටදෙනකු, නවදෙනකු මිය ගිහින් තිබෙනවා. ඒ හේතුවෙන් වසරකට 2,500කට ආසන්න පිරිසක් මිය යනවා. ඒ වාගේම විශාල පිරිසක් ආබාධිත තත්ත්වයට පත් වෙනවා. අද ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ඇඳන්වල සියයට 75ක් විතර ඉන්නේ මේ අනතුරුවලින් ආබාධිත තත්ත්වයට පත් වෙන පුද්ගලයෝ. ඒ හින්දා අපට අවශ්‍යයි මාර්ග අනතුරු ප්‍රමාණය වළක්වා ගන්න. පසුගිය දවස්වල, මාර්ග අනතුරු වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග හරහා ඒ අනතුරු ප්‍රමාණය පහළ බැහැලා තිබෙනවා, තුනක් හතරක් දක්වා. ජාතික රෝහලේ ICU එකේ, නැත්නම් දැඩිසත්කාර ඒකකයේ එක ඇඳක් වෙනුවෙන් දවසකට රුපියල් ලක්ෂයක් වැය කරන්න වෙනවා. මාර්ග අනතුරුවලට ලක්වන්නන්ගෙන් සියයට 70ක් ආබාධිත තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා අපට අවශ්‍යයි මේ රටේ මගී ජනයාත්, පදිකයාත්, රියදුරාත් ඇතුළු සමස්ත ජනයා මාර්ග අනතුරුවලින් වළක්වා ගැනීමට. ඒක තමයි අපේ වුවමනාව. ඒක එක කාරණයක් පමණයි. Clean Sri Lanka වැඩසටහන යටතේ බොහෝ අය එක එක කාරණා ගෙනැල්ලා කථා කරනවා. නමුත් මේ අවස්ථාවේ මේ වැඩසටහන ගැන ජනතාව දැනුවත් කරමින් ක්‍රියාත්මක තලයට ගෙනැවිත් දවස් 20ක් වාගේ සුළු කාලයක් තමයි ගතවෙලා තිබෙන්නේ. මේ රටේ ජනතාවත්, ආයතනත් තම තමන්ට හැකි පමණින්, තම තමන් අවබෝධ කර ගත් පමණින් මෙයට දායක වෙමින් ඉන්නවා. එහෙම දායක වෙන කොටසක් අල්ලාගෙන විපක්ෂයේ මන්ත්‍රීවරු එතුමන්ලා අවබෝධ කර ගත්ත Clean Sri Lanka වැඩසටහන සමාජයට ඒත්තු ගන්වන්න උත්සාහ කරමින් ඉන්නවා.

විශේෂයෙන් අද උදෑසන මන්ත්‍රීවරු කිහිපදෙනෙකු පසුගිය අපරාධ, පසුගිය මාස දෙක ඇතුළත සිදු වූ අපරාධ පිළිබඳව කථා කළා. විශේෂයෙන් ඔබතුමන්ලා දන්නවා මේ රට අපරාධ දේශයක් බවට පරිවර්තනය වෙලා තිබුණු බව.

ඒකට හේතු තිබෙනවා. දැන් මේ සිදු වෙන අපරාධ -මිනී මැරුම්, වෙඩි තැබීම්- මොන ආකාරයේ අපරාධ ද කියන එක සම්බන්ධයෙන් පොඩ්ඩක් ගැඹුරින් අවධානය යොමු කරන්න අවශ්‍යයි. පසුගිය සැප්තැම්බර් 23වෙනි දා ඉඳලා මේ ගෙවී ගිය කාලය තුළ එවැනි අපරාධවලට සම්බන්ධ වෙලා තිබෙන පුද්ගලයන් කවුද කියලා සොයා බැලුවාම අපට පෙනී යන කරුණක් තිබෙනවා. යුද හමුදාව සහ පොලීසිය මේ රටටත්, සමාජයටත් විශාල කාර්යභාරයක් ඉටු කරනවා. ඔවුන් ඉතා පරිත්‍යාගශීලිව, කැපවීමෙන්, මැදිහත්වීමෙන් කරනු ලබන ඒ සියලු සේවාවට නිගරු වන ආකාරයෙන් එක්කෙනෙකු, දෙදෙනෙකු යුද හමුදා සේවයේ සිටියදීම මේ කාර්යවල නිරත වෙන බව අපට පෙනී යනවා. මේ වෙනකොට යුද හමුදා මේජර්වරයෙකු මේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම නිසා අත්අඩංගුවට ගෙන තිබෙනවා. යුද හමුදාවේ සෙසු නිලයන් දරන හයදෙනෙකු මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. පොලිස් නිලධාරියෙකු අත්අඩංගුවට අරගෙන තිබෙනවා. සිවිල් ආරක්ෂක නිලධාරියෙකු අත්අඩංගුවට අරගෙන තිබෙනවා. සංවිධානාත්මක අපරාධකරුවන් 15දෙනෙකු සහ ඊට අනුබල දීම සම්බන්ධව තවත් පුද්ගලයන් 15දෙනෙකු අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අය තමයි මේ අපරාධවලට සම්බන්ධ වෙලා තිබෙන්නේ. මේකෙන් ඔබතුමන්ලාට හැඟී යනවා ඇති, මේ රට අපරාධ දේශයක් බවට පත් කරන්න සමහර අය ඒවාට සම්බන්ධ වෙලා තිබෙන්නේ මොන ආකාරයෙන් ද කියලා.

අපි බලයට පත් වුණාට පසු, මේ පසුගිය දින කිහිපය තුළ T-56 අවි 07ක්, පිස්තෝල 10ක්, රිවෝල්වර 14ක්, බෙහෙත් කොටන තුවක්කු 461ක්, බෝර 12 තුවක්කු 58ක්, ගල්කටස් 13ක්, repeaters 2ක් වශයෙන් ආයුධ හොයා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර තිබෙනවා. මේ මාස දෙක තුනට පමණක් වැටලීම් කරලා හෙරොයින් කිලෝග්‍රෑම් 354ක්, කේරළ ගංජා කිලෝග්‍රෑම් 3,847ක්, කොකේන් කිලෝග්‍රෑම් 3.8ක්, හෂීස් කිලෝග්‍රෑම් 181.9ක්, අයිස් කිලෝග්‍රෑම් 759ක් අල්ලාගෙන තිබෙනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගරු සභාවට තව කාරණයක් අවධාරණය කරන්න කැමැතියි. රජයක් හැටියට අපි මේ ගරු සභාවට පොරොන්දු වෙනවා කාලයේ වැලි තලාවට යට වෙමින් තිබෙන මේ රටේ සියලු අපරාධ සම්බන්ධයෙන් හොඳ විමර්ශනයක් කරන බවට. මේ වෙනකොට පොලීසිය ඒ සඳහා සූදානම් වෙලා තිබෙනවා. මෙතැන කථා වුණා එවැනි ෆයිල් 400ක්, 500ක් ගැන. ෆයිල් 400ක්, 500ක් නොවෙයි, CID එකේ ෆයිල් 29,000ක් තිබෙනවා. අපි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ලබන සතියේ නැවත ස්ථාපිත කරලා ඒ ෆයිල් 29,000න් මූල්‍ය අපරාධ සම්බන්ධයෙන් වන ෆයිල් ඒ කොට්ඨාසයට භාර දෙනවා. ඒ සියලු විමර්ශන කරලා මේ රටේ ජනතාවගේ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරනවාය කියන කාරණය මා කියන්න කැමැතියි.

මේ රටේ මත්ද්‍රව්‍ය සහ පාතාල ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම සඳහා අපි සැලසුම් සකස් කර තිබෙනවා, ඒ සඳහා මැදිහත් වෙනවා. මේ වෙනකොටත් අපි විශේෂ කාර්ය බලකාය යොදා ගෙන මෙම ක්‍රියාකාරකම් මැඩලීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. මම මගේ කථාව ආරම්භයේදී කිව්වා වාගේම, පසුගිය පාලන සමයේ මේ රටේ නිර්මාණය කරපු දැවැන්ත සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදය හමුවේ නිර්මාණය වූ ඒ සමාජ වටපිටාව තුළයි අපි ජාතික ජන බලවේගය විධියට මේ රටේ බලය අරගෙන මේ සියලු ක්‍රියාකාරකම් කරන්නේ. ඒ නිසා මේ සභාවේදී මේ රටටත්, ජනතාවටත් පොරෙ◌ාන්දුවක් දෙනවා ජනතාව ලබා දුන් වරමේ හරය හොඳින් තේරුම් අරගෙන, ඒ අරමුණ, අපේක්ෂාව, බලාපොරොත්තු හොඳින් තේරුම් අරගෙන අපි කටයුතු කරන බව. ඒ අනුව මේ වැඩසටහන මේ රටේ ජනතාවගේ ඉදිරි යහ පැවැත්ම වෙනුවෙන් ක්‍රියාත්මක කරන බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.01]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ යම් අදහස් දැක්වීමකට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා ජනවාරි පළමුවෙනි දා මේ වැඩ පිළිවෙළ එළිදක්වමින් කරපු කථාවේ සිට මේ දක්වා මේ ගරු සභා ගැබේ ඉන්න අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් සියල්ල යම් ආකාරයකින් සාවධානව අහගෙන හිටියාම මට තේරෙන විධිය මෙකයි. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු නිතරම කියන්න ගත්තා, විපක්ෂයේ මන්ත්‍රීවරු මේක වැරදි පැත්තෙන් දකින්නේ කියලා. ඇත්තටම මම ඔබ සියලුදෙනාගෙන් කාරණයක් අහන්න කැමැතියි. මෙතෙක් කරපු ඒ සෑම කථාවක්ම ගත්තාම, මේ ව්‍යාපෘතිය ගැන කිසි ප්‍රශ්නයක් නැහැ, මෙහි අරමුණ, ඉලක්කය ගැන කිසි ගැටලුවක් නැහැ. හැබැයි, දැක්ම, මෙහෙවර සහ පරමාර්ථය පිළිබඳ ගැටලුවක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මේ ඉලක්ක සම්පූර්ණ කරගන්න, මේ ඉලක්කය කරා යන්න ඔබේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක පිළිබඳවයි ගැටලුව තිබෙන්නේ.

මා උදාහරණයක් ගන්නම්. දැන් අපි දකිනවා, දිස්ත්‍රික්ක පුරා යම් යම් තැන්වල නගර පිරිසිදු කිරීම්, වෙරළ පිරිසිදු කිරීම් වාගේ දේවල් කරන ආකාරය. ඒක නිකම් දවසක ශ්‍රමදානයක් කළා හා සමානව සමාරම්භක උත්සවයක් විධියට කෙරුණා. හැබැයි, එතැනින් එහා මේ කටයුත්ත කොහොමද ක්‍රියාත්මක වෙන්නේ, maintain වෙන්නේ කියන එක පිළිබඳ වැඩ පිළිවෙළක් නැති බවයි අපි මේ කියන්නේ.

මා තවත් උදාහරණයක් ගන්නම්. අපි සම්බන්ධීකරණ කමිටුවල වාඩි වෙනවා. ඒවායෙහි සිටින මන්ත්‍රීවරුන්ගේ අදහස් හා ප්‍රකාශ අනුව අපට පෙනෙන දෙයක් තමයි එතැනින් එහා ගමන ප්‍රශ්නාර්ථයක් කියන කාරණය. උත්සවශ්‍රීයෙන් ඒ වැඩසටහන ආරම්භ කළා. නමුත්, එතැනින් එහාට ගිහින්, යම් යම් තැන්වලට අනවසරයෙන් කසළ බැහැර කිරීම නවත්වන්නේ කොහොමද, කසළ වෙන් කරලා පොදු ස්ථානවල එකතු කර ගන්නේ කොහොමද කියන අභියෝග ජය ගන්නේ කොහොමද කියන එක පිළිබඳ වැඩ පිළිවෙළක් නැහැ කියන කාරණාවයි අපි මේ කියන්න උත්සාහ කරන්නේ. මා ඒ සරල උදාහරණයක් කිව්වේ. මේ සඳහා මම ම වැඩ පිළිවෙළක් කියන්නම්. උදාහරණයක් විධියට පාසල් පද්ධතියේ ඉන්න දරුවන් ගනිමු. පාසල්වල පරිසර හට කණ්ඩායම් ඉන්නවා; බාලදක්ෂ කණ්ඩායම් ඉන්නවා. ඊට අමතරව පරිසර පොලීසියත් ඉන්නවා. හැම දාම වාගේ අනවසරයෙන් කුණු දමන ස්ථානවල කාලයක් -මාසයක් වාගේ කාලයක්- පුරා රැකගෙන හිටියොත්, ඒ ස්ථානයේ රැඳී සිටියොත් හෝ වෙනත් මොකක් හරි ක්‍රමයක් යෙදුවොත්, ඒ තැන්වලට කුණු දමන එක නවත්වා ගන්න අපට හැකියාව ලැබෙනවා. මිනිස්සු ඒ ඒ තැන්වලට කුණු කසළ බැහැර කරන්න පුරුදු වෙලා ඉන්න පුළුවන්. එම ස්ථාන රැකගෙන සිටීමේ කටයුත්ත නිසා ඒ පුරුද්ද නැති කරන්න පුළුවන්. මම මේ කියන්නේ පොඩි, සරල උදාහරණයක්. මේ වාගේ කාරණා ඇතුළත් වැඩ පිළිවෙළ මොකක්ද කියන එකයි මෙතැන තිබෙන ගැටලුව. ඒ හැර මේ ව්‍යාපෘතිය පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. ආණ්ඩු පක්ෂය, විපක්ෂය විතරක් නොවෙයි, මුළු රටේම ජනතාව පිරිසිදු ශ්‍රී ලංකාවක් බලාපොරොත්තුවෙන් තමයි ඔබතුමන්ලාට ඇතුළුව මේ රටේ පැවැති හැම ආණ්ඩුවකටම ඡන්දය දුන්නේ.

ඔබතුමන්ලා කියන මේ වැඩ පිළිවෙළ වෙනත් රටවලත් ක්‍රියාත්මක වෙලා තිබෙන බව අපි දන්නවා. උදාහරණයක් විධියට සිංගප්පූරුව ගත්තොත්, සිංගප්පූරුවේ තැන් තැන්වල කෙළ ගසන එක වළක්වාලීම වෙනුවෙන් තමයි ඔවුන් 1992දී ආරම්භයක් විධියට "Singapore Green Plan" කියන ව්‍යාපෘතිය ගෙනාවේ. අද ඒක විකාශනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඩෙංගු මර්දනය, පොදු වැසිකිළිවල පිරිසිදුභාවය, කසළ අවම කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය දක්වාම අද ඔවුන් ඉලක්ක සපුරා ගෙන පිරිසිදු සිංගප්පූරුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට ඔවුන්ට වැඩ පිළිවෙළක් තිබෙනවා; නිසි වැඩ පිළිවෙළක් තිබෙනවා. ඉන්දියාව ගත්තත් එහෙමයි. ඉන්දියාවේත් 2014 වර්ෂයේදී "Swachh Bharat" කියන ව්‍යාපෘතිය ආරම්භ කළේ, එළියේ මලපහ කිරීම වළක්වන්නයි. ඒ රටේ යම් යම් ප්‍රාන්තවල එළියේ මලපහ කිරීම හේතුවෙන් ජනතාව විශාල වශයෙන් සනීපාරක්ෂක ගැටලුවලට මුහුණ දුන් නිසා තමයි "Swachh Bharat" ව්‍යාපෘතිය ආරම්භ කළේ. 2021 වර්ෂය වන කොට "Swachh Bharat" ව්‍යාපෘතිය හරහා වැසිකිළි පද්ධති මිලියන 100ක් හදලා ඒ අර්බුදයට යම් විසඳුමක් දෙන්න ඔවුන් උත්සාහ කර තිබෙනවා. මේ වන විට විශේෂයෙන් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ තැනකට ගෙන එන්න එමඟින් ඔවුන්ට හැකියාවක් ලැබුණා කියා ඔවුන් තහවුරු කරගෙන තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ වාගේම "Swachh Bharat Mission 2.0" කියන ව්‍යාපෘතිය හරහා ඔවුන් නාගරික කසළ කළමනාකරණය පිළිබඳ වැඩ පිළිවෙළකුත් මේ වන විට ක්‍රියාත්මක කරගෙන යනවා. මා කියන්න උත්සාහ

කළේ, "Singapore Green Plan" සහ "Swachh Bharat" කියන ව්‍යාපෘති පැහැදිලිවම පරිසරයේ පිරිසිදුභාවය වෙනුවෙන් කරපු ව්‍යාපෘති බවයි. හැබැයි ඔවුන්ට ඒකට නිශ්චිත වැඩ පිළිවෙළක් තිබුණා. ඔවුන් ඒ ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළා. ඒ නිසා ඔවුන්ට අද එහි ප්‍රතිඵල අත් වෙලා තිබෙනවා.

Clean Sri Lanka ව්‍යාපෘතිය ගත්තොත්, මෙය පරිසරයේ පිරිසිදුකමටත් එහා ගිහින් සමාජයේ සදාචාරාත්මක පිරිසිදුභාවය කියන ප්‍රතිඵලයත් අපේක්ෂාවෙන් ගෙනාපු ව්‍යාපෘතියක්. ඒක ඉතා හොඳ දෙයක්. ඒ කියන්නේ, එය මා කලින් සඳහන් කළ රටවල ක්‍රියාත්මක වෙච්ච ව්‍යාපෘතිවලටත් එහා ගිය, පුළුල් පරාසයක් තුළ දිවෙන ව්‍යාපෘතියක්. අන්න ඒ පුළුල්භාවය නිසාම තමයි අද විශේෂයෙන්ම අප ඇතුළු මේ රටේ ජනතාව තුළ මේ ව්‍යාපෘතිය සහ මේ කාරණාව ගැන යම් අපැහැදිලිභාවයක් තිබෙන්නේ. මේ ව්‍යාපෘතිය හොඳයි. මෙය සාර්ථක විය යුතුයි. මෙහි ඉලක්ක සම්පූර්ණ කරගත යුතුයි. නමුත් ඒ සඳහා වන වැඩ පිළිවෙළ කුමක්ද කියන එකයි අපට දැන ගන්න ඕනෑ. Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ තිබෙන ගොඩක් කාරණා අනුව එය රටේ පරිපාලනයේ පහළම ආයතනය වන පළාත් පාලන ආයතන හරහා සිදු කරන ව්‍යාපෘතියක් විධියට අපි දකිනවා. නමුත් ඔබතුමන්ලාගේ මේ concept paper එකේ තිබෙන ආකාරයට Clean Sri Lanka ග්‍රාමීය කමිටු කියලා වෙනම ක්‍රමයක් ගොඩ නඟන්න ඔබතුමන්ලා උත්සාහ කරන බව පෙනෙනවා. ඉතිහාසයේ ඉඳන්ම එක් එක් රජයන් බලයට පත් වුණාම ඒ ඒ රජයවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ගම්වල ඔය වාගේ කමිටු නිර්මාණය කළ ආකාරය අපි දැක තිබෙනවා. ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. හැබැයි ඒ එකක්වත් බිම් මට්ටමින් සාර්ථක වුණේ නැහැ. මොකද, ඒවාට නිසි ව්‍යවස්ථාපිත ආවරණයක් ලැබුණේ නැහැ. ඉතින් මේ වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී විශේෂයෙන්ම පළාත් පාලන ආයතන හරහා ස්ථාපිත ග්‍රාමීය කමිටු ක්‍රියාත්මක වුණොත් අපට නිසි ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්, මේ වැඩසටහන සාර්ථක කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

වර්තමාන රජයට මා තවත් දෙයක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා හැම තිස්සේම දකින්නේ, විපක්ෂය විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කරනවා කියලායි. ඒ නිසා මම මේ අවස්ථාවේදී ආණ්ඩුවට කාරණා කිහිපයක් ගැන යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

එතැනදී විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණය ගැන කථා කරනකොට, clean ශ්‍රී ලංකාවක් වාගේම clear ශ්‍රී ලංකාවක් වෙන්නත් ඕනෑ කියලා මම විශ්වාස කරනවා. ඒක මගේ පෞද්ගලික මතයක්. අපේ මැතිවරණ ක්‍රමය පිළිබඳව මට ඇත්තටම යම් ගැටලුසහගත තත්ත්වයක් තිබෙනවා. මමත් පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වෙලා නගර සභාවට ගිහිල්ලා, එතැනින් පළාත් සභාවටත් ගිහිල්ලා තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. හැබැයි, මේ කොට්ඨාස ක්‍රමය, මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳව පෞද්ගලිකව මට ගැටලුවක් තිබෙනවා. මොකද, එයින් බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක සපුරා ගන්න පුළුවන්ද කියන ගැටලුව තිබෙනවා. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා. අපි බලාපොරොත්තු වන්නේ මේ රටට නායකයෝ හැදෙන්න ඕනෑ කියලායි. නමුත්, මේ තිබෙන ක්‍රමය යටතේ එවැනි නායකයෝ බිහි වෙන්නේ නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. මම දන්නවා, රජය පුළුවන් තරම් ඉක්මනින් මේ මැතිවරණය පවත්වන්න කටයුතු කරයි කියලා. හැබැයි, රටට හරි දේ කරන්න ඔබතුමන්ලා ඉදිරිපත් වෙන්න. මොකද, මේ රටේ ජනතාව දෙන්න පුළුවන් උපරිම ශක්තිය, හයිය ඔබතුමන්ලාට දීලා තිබෙනවා. ඒ නිසා රටට සුදුසුම දේ, සුදුසුම ක්‍රමය වෙනුවෙන් ඔබතුමන්ලා කටයුතු කරන්න. කෙසේ වෙතත්, මම විශ්වාස කරනවා, අපි නැවත වතාවක් පැරණි සමානුපාතික මැතිවරණ ක්‍රමයට යා යුතුයි කියලා. ඒ මගේ පෞද්ගලික මතය. ඒකට හේතු කාරණා ගොඩක් තිබෙනවා. විවාදයක් දෙනවා නම්, කථා කරන්න අවස්ථාව දෙනවා නම් ඒ ගැන ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්.

මේ රජය පත් කරන්න අපේ රටේ ජනතාව බොහෝදෙනෙක් උනන්දු වුණා; සහයෝගය දැක්වුවා. හැබැයි, මේ වෙනකොට ජනතාවට එදා වේල කන්න අමාරු තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා Clean Sri Lanka කියන හොඳ ව්‍යාපෘති හරහා ජනතාවට යමක් කියන්න හැදුවත්, ඔවුන්ගේ බඩට වැදිලා තිබෙන නිසා මේවා ඔළුවට යන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. අද හාල් කිලෝ දෙකක්, පොල් ගෙඩි දෙකක් ගත්තොත් ඒ මනුස්සයාගේ රුපියල් 1,000ක් ඉවරයි. ඒ නිසා දවසේ වැටුප් ලබන, කුලියට වැඩ කරන මනුස්සයෙක් ඉතාම අසීරුවෙන් ජීවත් වෙන්නේ. මේ වෙනකොට හාල් ප්‍රශ්නය නිසා අපේ රටේ ජනතාව අති දැවැන්ත ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

අද සහල් මාෆියාව ගැන හැමෝම කථා වෙනවා. ඒ සහල් මාෆියාව නැති කරන්න මීට පෙර රජයන් ගත්ත එක තීන්දුවක් තිබෙනවා. මේ වෙනකොට ඒක අතරමඟ නැවතිලා තිබෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ මහත්මයා විසින් යාන්ත්‍රික වායු සංසරණ ක්‍රමය යොදාගෙන ගබඩා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් 2012දී නියමු ව්‍යාපෘතියක් විධියට ආරම්භ කරලා තිබෙනවා. වී ගබඩා කිරීමට නොවෙයි, සහල් ගබඩා කිරීමට අවශ්‍ය ගබඩා නිර්මාණය කරලා, ඒක pilot project එකක් විධියට ආරම්භ කරලා තිබෙනවා. අද මේ සහල් ප්‍රශ්නයට විසඳුම විධියට ඇතැම් අය, වී ගබඩා කිරීම සහ දත්ත පද්ධතිය සකස් කිරීම වැනි කරුණු ගැන කථා කරන එක තමයි අපට අසන්නට ලැබුණේ. නමුත්, සහල් තොග ගබඩා කරන්න පුළුවන් තාක්ෂණය මේ රටේ හදලා තිබෙනවා. එවැනි තාක්ෂණයක් හදපු ඔවුන්ගෙන් අද වැඩක් අරගෙන නැහැ. වෙයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයට යාබදව තිබෙන, දෙවැනි ලෝක යුද්ධයේදී aircraft hangers විධියට පාවිච්චි කරපු ස්ථානවල තමයි ඉතාම අඩු මුදලක් යටතේ ඒ pilot project එක කරලා තිබෙන්නේ. එම නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් මේ ස්ථානවල සහල් තොග ගබඩා කරලා මේ රටේ සහල් ප්‍රශ්නයට අනාගතයේදී ස්ථිරසාර විසඳුමක් ලබාදීම සඳහා කටයුතු කරන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවෙන් Clean Sri Lanka වැඩසටහනට මේ ගරු පාර්ලිමේන්තුවේත්, මේ රටේ ජනතාවගේත් සම්පූර්ණ සහයෝගය ඉල්ලමින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේත් විවිධ අදහස් හා පැහැදිලි කිරීම් කළා. ඒ අනුව මේ යෝජනාවේ තිබෙන්නේ Clean Sri Lanka වැඩසටහනට මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාම සහයෝගය ලබා දිය යුතුයි කියන කාරණය. ඒක තමයි අද මේ ගරු පාර්ලිමේන්තුව ඇතුළේ සාකච්ඡා වන කාරණය. ඒ අනුව විපක්ෂය පැත්තෙන් කාරණා කිහිපයක් ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. විශේෂයෙන්ම විපක්ෂයේ ස්ථාවරය වුණේ මේ Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් ආණ්ඩුවට පැහැදිලි අදහසක් නැති බවයි. මෙය පැහැදිලි අදහසක් නැති වැඩසටහනක් බව තමයි උදේ ඉඳන් සවස් වනතුරුම එතුමන්ලා කියාගෙන ආවේ. හැබැයි, අද අන්තිමටම අදහස් ඉදිරිපත් කරනු ලැබූ ගරු මන්ත්‍රීවරු කියන්නේ, වැඩසටහන හොඳයි, පැහැදිලියි, පෙනෙන්න තිබෙනවා, නමුත් කරන්නේ කොහොමද කියන එක නැහැ කියලා.

ඊට කලින් කථාවේදී කියැවුණු කාරණය තමයි, "වැඩසටහන පැහැදිලි නැහැ" කියන එක. ඒ අනුව අපට පැහැදිලි වෙන කාරණය තමයි, අඩුම තරමින් ගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ගැසට් පත්‍රයවත් මේ විපක්ෂයේ මන්ත්‍රීවරු එකතුවෙලා කියෙව්වා නම් මෙහි අදහස තේරුම් ගන්න ඉඩ තිබුණාය කියන එක.

මම පැහැදිලිව කියනවා, අපේ රටේ සංස්කෘතිකමය වශයෙන් කඩා වැටීමක් තිබෙන බව, ආර්ථිකමය වශයෙන් කඩා වැටීමක් තිබෙන බව, දේශපාලනික වශයෙන් කඩා වැටීමක් තිබෙන බව. එම නිසා අපේ රටට නව පරිවර්තනයක් ඕනෑය කියන කාරණය කාලාන්තරයක් තිස්සේ දේශපාලන ව්‍යාපාරයක් විධියටත්, බලය ලබා ගැනීම අරමුණු කරගෙනත්, ඒ වාගේම බලය ලබා ගැනීමෙන් පස්සේත්, ආණ්ඩු පිහිටෙව්වාට පස්සේත් අපි කියාගෙන ආවා. ඒ අනුව අපි විශ්වාස කළා, මේ රටට ප්‍රථමයෙන්ම දේශපාලන පරිවර්තනයක්, සංස්කෘතිමය පරිවර්තනයක් අවශ්‍යයි කියලා. ඒ නිසා තමයි අපි අපේ දේශපාලන ව්‍යාපාරය තුළින් ප්‍රායෝගිකව පෙන්නුවේ, එහෙම නැත්නම් ආදර්ශය ලබා දෙමින් පෙන්නුවේ, මේ රටට අලුත් දේශපාලන සංස්කෘතියක අවශ්‍යතාව තිබෙන බවත්, එය ප්‍රායෝගිකව ඉටු කළ හැකි බවත්. ඒ අනුව තමයි ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට කිසිදු පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වාර්තා නොවුණු පශ්චාත් මැතිවරණ සමයක් උදා වුණේ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ කිසිදු තැනකදී විපක්ෂය කියනවා අහෙන්නේ නැහැ, "මේ තත්ත්වය හොඳයි, අපි පිළිගන්නවා, හොඳ දේවලුත් වුණා" කියලා. අඩුම තරමින් විපක්ෂයට ඒ වෙනස ගැන කියන්න තිබුණා. "කිසිදු පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වාර්තා වුණේ" නැහැ කියලා කියන්න තිබුණා. නමුත් අපට එහෙම කියනවා ඇහෙන්නේ නැහැ. එහෙම කිව්වා නම්, අපට ඒ කථා ඇහෙන්න ඕනෑ. විපක්ෂය වෙනස් වෙලා තිබෙනවා නම් අපට ඒ විධියේ කථා ඇහෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඔවුන්ට කියන්න තිබුණා, "මැතිවරණයෙන් පස්සේ ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් කියනවා, අඩුම තරමින් රාජ්‍ය දේපළ භාවිතාව සම්බන්ධයෙන් කථා කරන්නවත් අවශ්‍ය නැහැ කියලා" යනුවෙන්. නැත්නම් කියන්න තිබුණා, "පසුගිය මැතිවරණයේදී රාජ්‍ය දේපළ භාවිතාවක් සිද්ධ වුණේ නැහැ" කියලා. විපක්ෂය වෙනස් වෙලා තිබුණා නම් අපට ඒ වාගේ කථා ඇහෙන්න තිබුණා. නමුත් අපට එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. සාම්ප්‍රදායික විපක්ෂයක්මයි තවමත් අප ඉදිරියේ තිබෙන්නේ. ඒ අය වෙනස් වුණා නම් අපට ඒ වාගේ කථා ඇහෙන්න තිබුණා. නමුත් එවැනි කථා අපට ඇහෙන්නේ නැහැ. අපි කිව්වා, දේශපාලනමය සහ සංස්කෘතිමය වෙනසක් අපට අවශ්‍යයි කියලා. ඒ අවශ්‍යතාව අපි ක්‍රියාවෙනුත් ඔප්පු කරලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි කාර්යය තමයි දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම.

ඊට පස්සේ අපි පැහැදිලි කළා, මේ රට සමාජයීය, පාරිසරික සහ ආචාරධර්මීය වශයෙනුත් පරිවර්තනයකට ලක් වෙන්න ඕනෑ කියලා. එම පරිවර්තනය ලබා ගැනීම සඳහා තමයි මේ Clean Sri Lanka කියන වැඩසටහන එන්නේ. මේක සමාජ පරිවර්තනයක් සම්බන්ධ සාකච්ඡාවක්, මිනිසුන්ගේ ආකල්ප වෙනස් කිරීම සම්බන්ධ සාකච්ඡාවක්, මිනිසුන්ට ඇහෙන, මිනිසුන් දකින විධිය වෙනස් කිරීම සම්බන්ධ සාකච්ඡාවක්. ඒක ගණිතය වාගේ "එකයි, එකයි දෙකයි" කියලා, ඔක්කෝම ටික කොළයකට එකතු කරලා, සම්පූර්ණ ගණන් ටික හදලා, අවසානයට සුළු කරලා ඉවර කරන්න බැහැ. මේ වැඩ පිළිවෙළේදී සමාජමය වෙනස් වීමකුත් සිද්ධ වෙනවා. මේ වැඩ පිළිවෙළේ සමාජ විද්‍යාත්මක කරුණු තිබෙනවා, දේශපාලන විද්‍යාත්මක කරුණු තිබෙනවා. ඒ සියලු කාරණා වෙනස් වෙමින් ඉදිරියට යනවා. ඒ නිසා මෙතැන විවිධ කරුණු අඩංගු වෙනවා. ඒ වාගේම තමයි, ඉදිරියට යද්දී, සමාජය වෙනස් වෙද්දී, අවශ්‍යතා වෙනස් වෙද්දී මේකත් වෙනස් වෙනවා. ඒ නිසා තමයි Clean Sri Lanka වැඩසටහනට නිශ්චිත කාල රාමුවක් කියන්න බැරි. කාල රාමුවක් කියන්න තිබුණා යම් නිශ්චිත වැඩක් නම්. උදාහරණයක් විධියට, අද අපි සාකච්ඡා කරන්නේ දරුවන්ට ටැබ් පරිගණක යන්ත්‍ර ලබා දීමේ වැඩසටහනක් ගැන නම් අපට කියන්න තිබුණා, "වසර අවසන් වෙද්දී මෙච්චර ටැබ් යන්ත්‍ර ගේනවා, මෙච්චර ප්‍රමාණයක් භාර දෙනවා" කියලා. නැහැ, මේක එහෙම නොවෙයි. මේ වැඩ පිළිවෙළ මේ සමාජයේ මිනිස්සු හිතන පතන විධිය පවා වෙනස් කරන වැඩ පිළිවෙළක්. එම නිසා මේ වැඩ පිළිවෙළට නිශ්චිත කාල රාමුවක් නැහැ කියලා විපක්ෂය කරන කථාව ඇත්තටම පිළිගන්න පුළුවන් කථාවක් නොවෙයි. ඒ වාගේම Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් අද කළ සාකච්ඡාවේදී විපක්ෂය වැඩිපුරම මතු කරන්න උත්සාහ කළේ, සමජයත් වැඩිපුරම සාකච්ඡා කරන කාරණා. එකක් තමයි, බස් රථ ගැන කරන සාකච්ඡා. අනෙක් පැත්තෙන් ගරු ඇමතිවරයෙක්, නැත්නම් ගරු මන්ත්‍රීවරයෙක් වැවකට බැහැලා ශුද්ධ පවිත්‍ර කිරීමක් සම්බන්ධයෙන් කරන පැහැදිලි කිරීම. මේ සමාජයේ වැඩියෙන්ම සාකච්ඡා කරන දේවල්ම තමයි නැවත, නැවත මේ පාර්ලිමේන්තුව ඇතුළේත් කථා කරන්න උත්සාහ කරන්නේ. ඒ ඇයි? ඔවුන් හිතනවා, ඒක නැවත සමාජයට ගියාට පස්සේ - එළියට ගියාට පස්සේ - ඒ ගැන සාකච්ඡාවක් ගොඩනැඟෙයි කියලා. විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන් කර තිබෙන ප්‍රකාශ සම්බන්ධ news යනවා. බොහෝ අය බලාගෙන ඉන්නවා, අද දවසේත් news එකක් දෙන්න. අලුතින් headline එකක් දාලා news එකක් දෙන්න බොහෝ අයට වුවමනාව තිබෙනවා. එම නිසා තමන් කැමති ඕනෑම දෙයක් කියන්න කල්පනා කරනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි, "අහවලාට අදත් පාර්ලිමේන්තුවේදී මල පනියි" වාගේ headline එකක් සහිත news පළ වෙන්නේ. ඒ වාගේ අරමුණක් ඇතිව තමයි මේ පාර්ලිමේන්තුව ඇතුළට ඇවිල්ලා අදහස් ප්‍රකාශ කරන්නේ. එහෙම නැතුව එහි තිබෙන දිගක්, පළලක් සම්බන්ධයෙන්වත්, එහි තිබෙන සත්‍යතාව සම්බන්ධයෙන්වත්, එහි ඇත්ත නැත්ත සම්බන්ධයෙන්වත් ඔවුන්ට වැඩක් නැහැ. මේ

සභාවේ කුමන සාකච්ඡාවක් තිබුණත්, තමන් හිතන මාතෘකාව, වැඩියෙන්ම ප්‍රසිද්ධ වෙයි කියලා හිතන මාතෘකාව අරගෙන, එය මේ සාකච්ඡාවට එකතු කරලා කථා කරලා මෙතැනින් පිටවෙලා යනවා. නමුත් අද සාකච්ඡා කරන්න තිබුණේ, Clean Sri Lanka වැඩසටහන අපේ රටට කොයි තරම් දුරට වැදගත් වෙනවාද, නැද්ද යන කාරණයයි. මේ ගැසට් පත්‍රය කියෙව්වා නම්, අපි ඒ කරුණු පැහැදිලි කරලා තිබෙන බව අවබෝධ වෙයි. නමුත් එය කියවා නොමැති බව පැහැදිලියි. කියෙව්වා නම්, මේ වැඩසටහන පිළිබඳ අපැහැදිලිභාවයක් තිබෙන්න විධියක් නැහැ. මෙහි ඉතාම පැහැදිලිව කියනවා, මෙය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ ආදර්ශය ලබා දීමෙන්, පෙළඹවීමෙන්, මහපෙන්වීමෙන් සහ වෙනස් වීමේ ඇති අවශ්‍යතාව සමාජයට ඒත්තු ගන්වමින් බව.

